

විශිෂ්ටත්වයේ මායිම් ඉක්මවූ
සේවා සත්කාරයක්





# ලංකා විදුලිබල මණ්ඩලය
# වාර්ෂික වාර්තාව 2014



# පටුන


2014 වසරේ උද්දීපනයන් 4

ආයතනික තොරතුරු 7

සංවිධාන ව්‍යුහය 10

සභාපතිතුමාගේ සමාලෝචනය 14

සාමාන්‍යාධිකාරීගේ සමාලෝචනය 16

මෙහෙයුම් සමාලෝචනය 20

- ජනන අංශය 21
- සම්ප්‍රේෂණ අංශය 29
- බෙදාහැරීමේ අංශ 39
- ව්‍යාපෘති අංශය 51
- වත්කම් කළමනාකරණ අංශය 57
- ආයතනික ක්‍රමෝපාය අංශය 65
- මූල්‍ය අංශය 78

මූල්‍ය සමාලෝචනය 80

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව 82

ඒකාබද්ධ ආදායම් ප්‍රකාශය 83

ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය 84

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය 85

සමූහය - ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය 86

මණ්ඩලය - ස්කන්ධය වෙනස්වීමේ 90

ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය 92

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 93

විගණකාධිපතිගේ වාර්තාව 150

විගණකාධිපතිගේ වාර්තාවට පිළිතුරු 164

## අපගේ ඉදිරි දැක්ම

සසිරිමත් දිවියකට විදුලිය

## අපගේ මෙහෙවර

අපගේ සාරධර්මයන්ට අනුගත වෙමින් සමස්ත ශ්‍රී ලංකාවට කාර්යක්ෂම සමායෝජිත සහ සකසුරුවම් විදුලිය සැපයුමක් සංවර්ධනය කර පවත්වාගෙන යාම

## අපගේ සාරධර්ම

- ගුණාත්මක බව
- ජාතියට සේවා සැලසීම
- කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාව
- කැපවීම
- සුරක්ෂිත බව
- වෘත්තීය නිපුණතාව
- තිරසාර බව

# අපගේ පාරිසරික ප්‍රතිපත්තිය



බලශක්තිය නිදහසේ ගලායයි.

ලංකා විදුලිබල මණ්ඩලය එහි සියලු වාණිජ ක්‍රියාකාරකම් ඉටුකරන්නේ ස්වාභාවික පරිසරය සහ මිනිසා විසින් නිර්මිත පරිසරය ආරක්ෂා කරමින්, සංවර්ධනය සඳහා චිරස්ථායි දායකත්වයක් ලබා දෙමිනි. පාරිසරික ප්‍රශ්න සම්බන්ධයෙන් විවෘතව කටයුතු කිරීම මගින් මහජනතාව, පාරිභෝගිකයන්, අධිකාරීන්, සේවකයන් සහ අයිතිකරුවන් තුළ අපගේ ක්‍රියාකාරකම් සම්බන්ධ විශ්වාසයක් ඇති කිරීමට අපි බලාපොරොත්තු වෙමු. අපගේ ක්‍රියාකාරකම් සඳහා පාරිසරික වැදගත්කමින් යුත් කරුණු අන්තර්ගත කර ගැනීම සහ අනුකලනය සඳහා වූ ප්‍රතිපත්තියක් අපි ක්‍රියාශීලී ලෙස අනුගමනය කරමු.

# 2014 වර්ෂයේ උද්දීපනයන්

මෙගා වොට් 3x300 පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතියේ දෙවන අදියර මෙහෙවරෙහි යොදවන ලදී. ව්‍යාපෘතියේ මෙම අදියරට ඇතුළත් වන මෙගා වොට් 300 වාෂ්ප තලබමන ජනක ඒකක දෙක (ඒකක අංක 2 සහ 3) 2014 සැප්තැම්බර් 16 දින ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපති තුමා විසින් විවෘත කරන ලදී. මෙම ඒකක දෙකම, වර්ෂයකට එකකින් විදුලි බල ඒකක 1800 බැගින් ජනනය කරනු ඇතැයි අපේක්ෂිතය. වර්ෂය අවසාන වන විට, මෙරට විදුලිබල පරිභෝජනයෙන් 50%ක් පමණ වන ප්‍රමාණයක්, එනම් දිනකට විදුලිබල ඒකක මිලියන 18කට අධික ප්‍රමාණයක් මෙම බලාගාරය ජනනය කළේය.



පුත්තලම මෙගාවොට් 900 ලක්විජය ගල් අඟුරු බලාගාරය වෙරළට ඔබ්බෙන් පෙනෙන අයුරු

දුම්මලසූරිය, බදුල්ල, මාහෝ, නාඋල, පල්ලෙකැලේ, පොළොන්නරුව, වව්නතිවු කොටුමා උපපොල සහ ඒවා ආශ්‍රිත සම්ප්‍රේෂණ රැහැන් ඉදි කිරීම නිම කොට බලගන්වන ලදී.

හබරන, පුත්තලම, පානදුර සහ මාතර පවත්නා කොටුමා උපපොල වෘද්ධිකරණය සම්පූර්ණ කරන ලදී.

නව ලක්ෂපාන සහ විමලසුරේන්ද්‍ර බලාගාර පුනරුත්ථාපනය නිම කරන ලදී. වර්ෂය අවසාන වන විට නව ලක්ෂපාන උමග පුනරුත්ථාපනය කිරීමේ කටයුතු ඉටු වෙමින් පැවතුණි. රුපියල් මිලියන 6,660.00ක වියදමින්, පිළිවෙළින් නව ලක්ෂපාන බලාගාරයෙහි සහ විමලසුරේන්ද්‍ර බලාගාරයෙහි මෙගාවොට් 2X50 බලාගාර සහ මෙගාවොට් 2X25 බලාගාරවල ජනක යන්ත්‍ර, තලබමන, පාලක සහ ආධාරක නැවත සකස් කිරීම සහ නවීකරණය මෙම පුනරුත්ථාපනයට ඇතුළත් විය. කොටුදොර (penstock) ඝර්ෂණය අඩු කළ හැකි නව සැලසුමකින් යුත් ධාවක යොදා ගැනීමෙන් නව ලක්ෂපාන බලාගාරයෙහි එක් ඒකකයක ධාරිතාව මෙගාවොට් අට බැගින් වැඩි කරනු ලැබීය. ඒකක දෙකෙහි සම්පූර්ණ ධාරිතාව මෙගාවොට් 16කින් වැඩි කරන ලදී.

පරීක්ෂණය සහ ජල කාන්දුවට පිළියම් යෙදීම සඳහා නව ලක්ෂපාන භූගත උමගෙහි ජලය ඉවත් කරනු ලැබීය. සම්පූර්ණ වශයෙන් රුපියල් මිලියන 170ක වියදමක් දරා ගනිමින් බිම් විවරය සහ වානේ ආස්තරය අතර කොන්ක්‍රීට් ආස්තරයක් ද, බදාම ආලේපනයක් දළ දියර බදාම කැවීමක් ද, පර්වත බඳනයක් ද යොදා ගනු ලැබීය.



නාඋල කොටුමා උපපොල

## විදුලිබල ගාස්තු අඩු කිරීම

2012 වර්ෂයේ දී හඳුන්වා දෙන ලද ඉන්ධන ගැලපුම් ගාස්තුව ඉවත් කිරීමෙන් සියලුම වර්ගවල පාරිභෝගිකයන්ට මෙම වර්ෂයේ දී විදුලි ගාස්තු අඩු කිරීමක් ලබාදෙන ලදී.

ගෘහස්ථ පාරිභෝගිකයන්ට මෙම සහනය 2014 සැප්තැම්බර් 16 දින සිට ලැබුණ අතර, කර්මාන්ත, හෝටල්, පොදු කාර්යය සහ රාජ්‍ය අංශය (පාසල්, ආරෝග්‍යශාලා ආදිය) ඇතුළු වෙනත් සියලු ගෘහස්ථ නොවන වර්ගවල පාරිභෝගිකයන්ට මෙම සහනය 2014 නොවැම්බර් 15 දින සිට ලැබුණි.

## ගෘහස්ථයන්ට විදුලිබලය සැපයීම

වර්ෂය අවසාන වන විට මෙරට ගෘහස්ථයන් 98.4%කට විදුලිබලය සපයා තිබුණි. එක පුද්ගලයෙකු පරිභෝජනය කරන සාමාන්‍ය විදුලිබල ප්‍රමාණය වර්ෂය ආරම්භයේ දී ඒකක (එක් තැනැත්තෙකු පරිභෝජනය කරන කිලෝවොට් පැය ප්‍රමාණය) 519 ක් වූ අතර වර්ෂය අවසානයේ දී ඒකක 16 ක වැඩි වීමක් සහිතව ඒකක 535 ක් විය.

## පද්ධති බලශක්ති හානි

2000 වසරේ සිට ක්‍රමයෙන් අඩුවෙමින් පැවති පද්ධති බලශක්ති හානි වර්ෂය අවසාන වන විට 10.9%ක්ව පැවතුණි.




## පාරිභෝගික වර්ධනය

වර්ෂය අවසාන වන විට සමස්ත පාරිභෝගික සංඛ්‍යාව 5,417,532ක් විය. මේ අනුව වාර්ෂික වර්ධන අනුපාතය 4.0% කි. පාරිභෝගික සංඛ්‍යාව විවිධ අංශ අතර බෙදීගිය ආකාරය පහත දැක්වේ.

# 2014 වර්ෂයේ උද්දීපනයන්

| පාරිභෝගික වර්ගය | පාරිභෝගික සංඛ්‍යාව 2013/12/31 දිනට | පාරිභෝගික සංඛ්‍යාව 2014/12/31 දිනට |
|---|---|---|
| ගෘහස්ථ | 4,589,929 | 4,768,229 |
| ආගමික | 31,627 | 33,175 |
| පොදු කාර්යය | 535,267 | 559,401 |
| කර්මාන්ත | 53,162 | 54,577 |
| හෝටල් | 465 | 462 |
| රාජ්‍ය | 309 | 1,686 |
| **මුළු ගණන** | 5,210,759 | 5,417,530 |

වර්ෂය තුළ නව විදුලිබල සබඳතා 206,771 ක් ලබා දී ඇත. මේ අනුව මසකට ලබා දී ඇති සාමාන්‍ය නව විදුලිබල සබඳතා සංඛ්‍යාව 17,231 කි.

## විදුලිබල අලෙවිය




ඉකුත් වසරේ අලෙවි කළ සමස්ත විදුලිබල ප්‍රමාණය ගි.වො. පැය 10,621 ක් වූ අතර, මෙම වසරේ එය ගි.වො. පැය 11,063 දක්වා 4.2% ක ප්‍රතිශතයකින් වැඩි වී ඇත. මෙම වසරේ දී දෛනික සාමාන්‍ය විදුලිබල පරිභෝජනය ගි.වො. පැය 30.3 ක් වූ අතර, එය ඉකුත් වසරේ දී ගි.වො. පැය 29.1 ක් විය.




වැඩිම විදුලිබල පරිභෝජනය ගෘහස්ථ අංශය සහ ආගමික අංශයේ පාරිභෝගිකයන් විසිනි. එම අංශ දෙකේ පරිභෝජනය සම්පූර්ණ පරිභෝජනයෙන් 32.4% ක් වූ අතර, ඊළඟ ස්ථානයට පත්වූයේ සමස්ත පරිභෝජනයෙන් 31.6% ක් පරිභෝජනය කළ කර්මාන්ත අංශයයි. වාර්ෂික වර්ධන වේගය 6.6% ක් වූ පොදු කාර්යය අංශය පරිභෝජනය කළ ප්‍රමාණය සමස්ත පරිභෝජනයෙන් 19.8% ක් පමණි.

## ආදායම

ඉකුත් වසරේ විදුලිබල අලෙවියෙන් ලද වාර්ෂික ආදායම රුපියල් මිලියන 194,147 ක් වූ අතර, 2014 වසරේ දී ලද ආදායම රුපියල් මිලියන 202,645 ක් දක්වා වැඩි විය. මේ අනුව ලබා ඇති වර්ධනය 4% කි.







ඉහළම ආදායම ලැබුණේ පොදු කාර්යය පාරිභෝගිකයන්ගෙන් වන අතර, දෙවනුවට වැඩිම ආදායම ලැබුණේ කර්මාන්ත සඳහා විදුලිබලය ලබාගත් පාරිභෝගිකයන්ගෙනි. ආගමික කටයුතු ඇතුළු ගෘහස්ථ අංශයෙන් සමස්ත ආදායමට ලැබුණ දායකත්වය 26.4%කි.

## සමස්ත බලශක්ති සංචිතය

වර්ෂය ආරම්භයේ දී විදුලිය ජනනය සඳහා වූ ජල සංචිතය ගිගා වොට් පැය (ගි.වො.පැ.) 659 ක් වූ අතර, එය පූර්ණ ධාරිතා ප්‍රමාණයෙන් 52.4% කි. ඉකුත් වසර ආරම්භයේ දී පැවති ජල සංචිතය 83.4% ක් විය. තව ද, වසරේ ආරම්භක මාස කීපය තුළ අදාළ ජලාශවලට ගලා ආ ජල ප්‍රමාණය 2013 වසරේ එම කාලය තුළ ගලා ආ ජල ප්‍රමාණයට වඩා අඩුය. එහි ප්‍රතිඵල වශයෙන් ජල විදුලිය ජනනය සඳහා වන ජල සංචිතය හීන විය. 2014 අප්‍රේල් 21 දින වන විට ජල සංචිතය ගි.වො.පැ. 287.9 ක් විය. ඉකුත් වසරෙහි මෙන් නොව මෙම වසරෙහි නිරත දිග මෝසම් වැසි ප්‍රමාණවත් නොවීම නිසා 2014 අගෝස්තු 23 දින පැවති ජල සංචිතයෙහි ප්‍රමාණය ගි.වො. පැය 696.9 ක් විය. කෙසේ වුව ද, ඊසාන දිග මෝසමේ ආරම්භයත් සමග අවුරුද්දේ අවසාන කාර්තුවේ දී ජල විදුලි

# 2014 වර්ෂයේ උද්දීපනයන්

ජනනය සඳහා වූ ජලාශවලට ගලා එන ජල ප්‍රමාණය වැඩි විය. 2014 දෙසැම්බර් 27 දින වාර්තාගත උපරිම ජල සංචිතය ගි.වො. පැය 1190.3 ක් (සම්පූර්ණ සංචිත ප්‍රමාණයෙන් 94.58 ක්) වූ අතර, වසර අවසානයේ ජල සංචිතය ගි.වො. පැය 1180.5 ක් විය.

## දළ බලශක්ති ජනනය




වර්ෂය අවසාන වන විට සම්පූර්ණ විදුලිබල ජනනය 4% කින් වැඩි වී තිබුණි. ඒ අනුව 2013 දී ගි.වො. පැය 11,962 ක් වූ ජනනය 2014 දී ගි.වො. පැය 12,423 ක් බවට පත්විය.

## විදුලිබල ජනන ප්‍රභවයන්

වර්ෂය තුළ ජලාශයන්හී ජලය පහළ මට්ටමක පැවති බැවින්, කුඩා ජල විදුලි බලාගාර ඇතුළු ජල විදුලි බලාගාරවලින් ජනනය කිරීමට හැකි වූයේ මෙරට සම්පූර්ණ විදුලිබල ජනනයෙන් 37%ක් පමණි. මෙය 2013 වසරේ දී ජල විදුලි බලාගාරවලින් ලැබුණ ජනනය හා සසඳන කළ 21% ක අඩු වීමකි.




2014 වසරේ දී සම්පූර්ණ බලශක්ති ජනනයෙන් 61% ක් තාප බලාගාරවලින් ලබා ගත් නමුත් 2013 වසරේ දී එමගින් ලබාගෙන ඇත්තේ 40% ක් පමණි.




## විදුලිබල ජනනය අයිතිය අනුව වර්ගීකරණය

2014 වසරේ දී ස්වාධීන බලශක්ති නිෂ්පාදකයන් (කුඩා ජලවිදුලි බලාගාර සහ තාප බලශක්ති බලාගාර) සම්පූර්ණ වාර්ෂික බලශක්ති නිෂ්පාදනයෙන් 31% ක් ජනනය කළ නමුත්, 2013 වසරේ දී එමගින් ලබාගෙන ඇත්තේ 27% ක් පමණි.







## උපරිම ඉල්ලුම

2014 වර්ෂය තුළ වාර්තා වූ උපරිම ඉල්ලුම මෙගා වොට් 2151.7ක් වන අතර 2013 දී එය මෙග වොට් 2,164.2 කි. මෙම සංඛ්‍යාව 2013 වසරට වඩා 0.60% ක අඩු වීමකිත එනම් මෙගා වොට් 12.5 ක අඩුවීමකි.

# ආයතනික තොරතුරු

### නෛතික ස්වභාවය

ලංකා විදුලිබල මණ්ඩලය, 1969 අංක 31, 1979 අංක 29, 1988 අංක 32 සහ 2009 අංක 20 දරන පනත් මගින් සංශෝධිත, 1969 අංක 17 දරණ පාර්ලිමේන්තු පනත මගින් ශ්‍රී ලංකාවේ ස්ථාපිත, සංස්ථාපිත මණ්ඩලයකි.

### මණ්ඩලයේ සාමාජිකයෝ

**සභාපති**
ඩබ්.බී. ගනේගල මහතා

**උප සභාපති**

| | |
|---|---|
| ටී.එම්. හේරත් මහතා | (2014 මාර්තු 19 දක්වා) |
| මහාචාර්ය කේ.කේ.සී.කේ. පෙරේරා මහතා | (2014 මාර්තු 20 සිට) |

**සාමාජික/ක්‍රියාකාරී අධ්‍යක්ෂ**
කේ.අයි.ඩී.පී. කුලරත්න මහතා

**මහා භාණ්ඩාගාරය නියෝජනය කරන සාමාජික**
එම්.ටී.අයි.වී. අමරසේකර මිය

**මණ්ඩලයේ සාමාජිකයෝ**

| | |
|---|---|
| ආර්.ඒ.ඒ.කේ. රණවක මහතා | |
| එස්. විරිත්තමුල්ල මහතා | |
| ඩබ්.ඩී. ජයසිංහ මහතා | (2014 ජුනි 22 දක්වා) |
| ටී.ඩී.එස්.පී. පෙරේරා මහතා | (2014 ජුලි 02 සිට) |

**මණ්ඩලයේ ලේකම්**

| | |
|---|---|
| මිහිරි සේනාරත්න මිය | (2014 පෙබරවාරි 12 දක්වා) |
| ඩී. කුඹලාතර මිය | (2014 මාර්තු 04 සිට) |

**සාමාන්‍යාධිකාරී**
ඩබ්.ජේ.එල්.එස්. ප්‍රනාන්දු මහතා

**විගණකවරු**
විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව
අංක 306/72, පොල්දූව පාර
බත්තරමුල්ල.

**බැංකු කරුවෝ**
මහජන බැංකුව
අංක 75, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.

**ප්‍රධාන කාර්යාලය**
අංක 50, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02
දුරකථන : (011) 232 4471 (රැහැන් 8 යි)
ෆැක්ස් : (011) 244 9572
වෙබ් අඩවිය : www.ceb.lk

# ආයතනික තොරතුරු

### ආයතන කළමනාකරණය

**අතිරේක සාමාන්‍යාධිකාරී (ජනන)**
එම්.සී. වික්‍රමසේකර මහතා

**අතිරේක සාමාන්‍යාධිකාරී (සම්ප්‍රේෂණ)**
වයි.එම්. සමරසිංහ මහත්මිය (2014 දෙසැම්බර් 19 දක්වා)
ජී.එස්.පී. මෙන්ඩිස් මහතා (2014 දෙසැම්බර් 20 සිට)

**අතිරේක සාමාන්‍යාධිකාරී - (බෙදාහැරීමේ අංශය 1)**
යූ.කේ.ඩබ්. සිල්වා මහතා (2014 දෙසැම්බර් 19 දක්වා)
වයි.එම්. සමරසිංහ මහත්මිය (2014 දෙසැම්බර් 20 සිට)

**අතිරේක සාමාන්‍යාධිකාරී - (බෙදාහැරීමේ අංශය 2)**
ජේ.ඒ.එස්. පෙරේරා මහතා (2014 අප්‍රේල් 02 දක්වා)
ඩබ්.ආර්.ඒ. පෙරේරා මහතා (2014 අප්‍රේල් 03 සිට 2014 මැයි 12 දක්වා)
ඩී.සී.ජේ. සේරම් මහතා (2014 ජුනි 13 සිට)

**අතිරේක සාමාන්‍යාධිකාරී - (බෙදාහැරීමේ අංශය 3)**
බී.පී.එන්. මෙන්ඩිස් මහත්මිය

**අතිරේක සාමාන්‍යාධිකාරී - (බෙදාහැරීමේ අංශය 4)**
එම්.ජී. තිලකරත්න මහතා

**අතිරේක සාමාන්‍යාධිකාරී (වත්කම් කළමනාකරණ)**
ජේ.එස්. විතානගේ මහතා (2014 පෙබරවාරි 01 දක්වා)
පී.එස්. රණසිංහ මහතා (2014 පෙබරවාරි 03 සිට 2014 ජූලි 08 දක්වා)
ඩී.පී.ඩබ්. අකරවිට මහතා (2014 ජූලි 09 සිට)

**අතිරේක සාමාන්‍යාධිකාරී (ආයතනික ක්‍රමෝපාය)**
ඩී.කේ.බී.එස්. තිලකසේන මහතා

**අතිරේක සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති)**
එල්.ඒ.එස්. ප්‍රනාන්දු මහතා

**මූල්‍ය කළමනාකරු**
ටී.කේ. ලියනගේ මහතා (2014 ජුනි 09 දක්වා වැඩ බැලීම සහ 2014 ජුනි 10 සිට ස්ථිර තනතුරට පත්වීම)



## ජල විදුලිය*

1,655 මෙගාවොට්

මුළු ජනන ධාරිතාව

4,534 ගිගාවොට් පැය

වර්ෂය තුළ ජනනය
කරන ලද බලශක්තිය

## තාප විදුලිය*

2,155 මෙගාවොට්

මුළු ජනන ධාරිතාව

7,507 ගිගාවොට් පැය

වර්ෂය තුළ ජනනය
කරන ලද බලශක්තිය

## සූර්ය, ජෛව ස්කන්ධ හා සුළං විදුලිය*

153 මෙගාවොට්

මුළු ජනන ධාරිතාව

315 ගිගාවොට් පැය

වර්ෂය තුළ ජනනය
කරන ලද බලශක්තිය

*ලංවිම සහ ස්වාධීන බලශක්ති නිපැයුම්වල (IPP) එකතුව

# 2014 සංවිධාන ව්‍යුහය



**අතිරේක සාමාන්‍යාධිකාරී (ආයතනික ක්‍රමෝපාය)**
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ආයතනික ක්‍රමෝපාය හා නියාමන කටයුතු)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාපාර හා මෙහෙයුම් ක්‍රමෝපාය)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ක්‍රියාකාරී ක්‍රමෝපාය හා කාර්යක්‍රම ප්‍රවර්ධන)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්‍ෂණ)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පර්යේෂණ හා සංවර්ධන)

**අතිරේක සාමාන්‍යාධිකාරී (ජනන)**
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මහවැලි සංකීර්ණය)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සමනල සංකීර්ණය)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ලක්‍ෂපාන සංකීර්ණය)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (තාපබල සංකීර්ණය)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ලක්විජය විදුලි බලාගාරය)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වත්කම් කළමනාකරණ, ජල විදුලි)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වත්කම් කළමනාකරණ, ජලවිදුලි යාන්ත්‍රික)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වත්කම් කළමනාකරණ, තාප විදුලි)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වත්කම් කළමනාකරණ, තාප විදුලි-යාන්ත්‍රික)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ජනන ව්‍යාපෘති)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ආයතනික කටයුතු)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බලශක්ති විකුණුම්)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පරිසර, සිවිල් නඩත්තු හා වේලි ආරක්‍ෂණ)
- අතිරේක මූල්‍ය කළමනාකරු (ජනන)

**අතිරේක සාමාන්‍යාධිකාරී (සම්ප්‍රේෂණ)**
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බලශක්ති මිලදී ගැනුම්)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සම්ප්‍රේෂණ හා ජනන සැලසුම්කරණ)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සම්ප්‍රේෂණ සැලසුම් හා පරිසර)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ආයතනික හා නියාමන සබඳතා)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සම්ප්‍රේෂණ මෙහෙයුම් හා නඩත්තු)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වත්කම් කළමනාකරණ)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සම්ප්‍රේෂණ ව්‍යාපෘති)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පද්ධති පාලන)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සන්නිවේදන)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බලශක්ති අලෙවිකරණ)
- අතිරේක මූල්‍ය කළමනාකරු (සම්ප්‍රේෂණ)

**අතිරේක සාමාන්‍යාධිකාරී (බෙදාහැරීමේ අංශය 1)**
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ හා ආයතනික)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති හා අධිසැර නඩත්තු)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැලසුම් හා සංවර්ධන)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (කොළඹ නගරය)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වයඹ පළාත)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (උතුරු මැද පළාත)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (උතුරු පළාත)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බෙදාහැරීම් සම්බන්ධීකරණ)
- අතිරේක මූල්‍ය කළමනාකරු (බෙදාහැරීමේ අංශය 01)

**අතිරේක සාමාන්‍යාධිකාරී (බෙදාහැරීමේ අංශය 2)**
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ හා ආයතනික)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති හා අධිසැර නඩත්තු)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැලසුම් හා සංවර්ධන)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මධ්‍යම පළාත)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බස්නාහිර පළාත උතුර)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නැගෙනහිර පළාත)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මධ්‍යම වෝල්ටීයතා ඉදිකිරීම් හා නඩත්තු)
- අතිරේක මූල්‍ය කළමනාකරු (බෙදාහැරීමේ අංශය 02)

**අතිරේක සාමාන්‍යාධිකාරී (බෙදාහැරීමේ අංශය 3)**
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ හා ආයතනික)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති හා අධිසැර නඩත්තු)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැලසුම් හා සංවර්ධන)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බස්නාහිර පළාත දකුණ 11)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සබරගමු පළාත)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඌව පළාත)
- ව්‍යාපෘති අධ්‍යක්‍ෂ (විදුලමු ලංකා රත්නපුර ව්‍යාපෘතිය )
- අතිරේක මූල්‍ය කළමනාකරු (බෙදාහැරීමේ අංශය 03)

**අතිරේක සාමාන්‍යාධිකාරී (බෙදාහැරීමේ අංශය 4)**
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ හා ආයතනික)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති හා අධිසැර නඩත්තු)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැලසුම් හා සංවර්ධන)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බස්නාහිර පළාත දකුණ 1)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (දකුණු පළාත)
- අතිරේක මූල්‍ය කළමනාකරු (බෙදාහැරීමේ අංශය 04)

**අතිරේක සාමාන්‍යාධිකාරී (වත්කම් කළමනාකරණ)**
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වත්කම් කළමනාකරණ හා ආයතනික)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පුහුණු)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සිවිල් වැඩ හා ගොඩනැගිලි)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වැඩපොළ හා උපකාරක සේවා)
- ව්‍යාපෘති අධ්‍යක්‍ෂ (විදුලක්පාය)
- අතිරේක මූල්‍ය කළමනාකරු (වත්කම් කළමනාකරණ)
- ආරක්‍ෂක කළමනාකරු

**අතිරේක සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති)**
- ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති අධ්‍යක්‍ෂ (පුත්තලම ගල් අගුරු බලශක්ති ව්‍යාපෘතිය)
- ව්‍යාපෘති අධ්‍යක්‍ෂ (ඉහළ කොත්මලේ විදුලිබල ව්‍යාපෘතිය)
- ව්‍යාපෘති අධ්‍යක්‍ෂ (කොළඹ නගර විදුලිබල බෙදාහැරීමේ සංවර්ධන ව්‍යාපෘතිය)
- ව්‍යාපෘති අධ්‍යක්‍ෂ (ත්‍රිකුණාමල ගල්අගුරු විදුලිබල ව්‍යාපෘතිය)
- ව්‍යාපෘති අධ්‍යක්‍ෂ (බ්‍රෝඩ්ලෑන්ඩ්ස් ජලවිදුලි බලාගාර ව්‍යාපෘතිය)
- ව්‍යාපෘති අධ්‍යක්‍ෂ (උමා ඔය ජලවිදුලි බලාගාර ව්‍යාපෘතිය)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සම්ප්‍රේෂණ ව්‍යාපෘති)
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සම්ප්‍රේෂණ තැනීම් ව්‍යාපෘති)
- අතිරේක මූල්‍ය කළමනාකරු (ව්‍යාපෘති)

**මූල්‍ය කළමනාකරු**
- අතිරේක මූල්‍ය කළමනාකරු (මූලස්ථාන)
- අතිරේක මූල්‍ය කළමනාකරු (ආයතනික)
- ලේකම් - විශ්‍රාම වැටුප් අරමුදල
- ලේකම් - අර්ථසාධක අරමුදල

- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්)
- කළමනාකරු - විමර්ශන



# කළමනාකරණ සමාලෝචනය


සභාපතිතුමාගේ සමාලෝචනය 14 - 15
සාමාන්‍යාධිකාරිගේ සමාලෝචනය 16 - 18

# සභාපතිතුමාගේ සමාලෝචනය



2013 වසර සඳහා මෙන්ම 2014 වසර සඳහා ද, ලංකා විදුලිබල මණ්ඩලය ඉටු කළ වාර්ෂික කාර්යසාධනය ගැන සිහිපත් කොට සමාලෝචනයක් සපයන්ට ලැබීම ගැන මම බෙහෙවින් සතුටු වෙමි. 2014 වසර බහුවිධ ජයග්‍රහනයන් ලබාගත් වර්ෂයකි. ''මහින්ද චින්තන - අනාගතය සඳහා දර්ශනයක්'' යන මාර්ගෝපදේශක පාඨය යටතේ හැඩගස්වන ලද ප්‍රතිපත්ති රාමුව තුළ ක්‍රියාත්මක වෙමින්, විදුලිබල සහ බලශක්ති ඇමතිනී ගරු පවිත්‍රා වන්නිආරච්චි මහත්මියගේ මගපෙන්වීම යටතේ මෙම වසර සඳහා තේමාව වූ ''සැමට සැමදා විදුලිබලය'' යථාර්ථයක් කර ගැනීමට හැකි විය.

සේවයෙහි පරිමාව, වාර්ෂික ආදායම, පිරිවැටුම සහ ජාතිය කෙරෙහි පවත්නා වගකීම යන කරුණු අතින් ලංකා විදුලිබල මණ්ඩලය රාජ්‍ය අංශයේ මෙරට විශාලතම වාණිජ ව්‍යවසාය බවට පත්ව ඇත. මෙම ආයතනය ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් විදුලිබලය ලබන ප්‍රතිශතය 98.4 දක්වා නංවා ඇත. මෙම ප්‍රතිශතයට දකුණු ආසියා කලාපයෙහි කවර රටකට වුව ද, ළඟා වීමට නොහැකි වී ඇත. මෙම තත්ත්වයට ළඟා වීමට හැකි වූයේ ලංකා විදුලිබල මණ්ඩලයේ සෑම මට්ටමකම සේවකයන්ගේ ඒකාබද්ධ ප්‍රයත්නය නිසාය. වර්ෂය තුළ ලබාදුන් නව සේවා සබඳතා 206,771ක් වන අතර සම්පූර්ණ පාරිභෝගික සංඛ්‍යාව 5,417,530 දක්වා වැඩි වී ඇත. 16,000ක් පමණ වන ස්ථිර සේවකයන් ඇතුළු 5,000ක් පමණ වන මිනිස් බල සේවා සහභාගිත්වයත් මෙම අරමුණු සාර්ථක කර ගැනීම සඳහා ලබාදුන් දායකත්වය ප්‍රසංශනීය වේ. ජනන අංශයෙහි පුත්තලම (නොරොච්චෝල) ලක්විජය බලාගාරයෙහි දෙවන අදියරෙහි දෙවන හා තුන්වන ඒකක මගින් මෙග වොට් 600ක් පද්ධතියට එකතු කරමින් මෙහෙවරෙහි යෙදවීම ලංකා විදුලිබල මණ්ඩලයේ ඉතා වැදගත් කාර්යසාධනයකි. සම්ප්‍රේෂණ අංශයෙහි, පුත්තලම සිට අනුරාධපුර දක්වා කි.මී. 67ක් දිග සම්ප්‍රේෂණ රැහැන විවිධ පාර්ශ්වයන්ගේ විරෝධතා සහ නොකමැත්ත නිසා අවුරුදු 1 1/2කට වැඩි කාලයක් ප්‍රමාද වූ නමුත්, සීමිත කාලයක් තුළ ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහ අනෙක් අදාළ අයගේ සහාය ඇතිව ඉදිකරන ලදී. මෙය වර්ෂය තුළ ලංකා විදුලිබල මණ්ඩලය ජයගත් විශේෂ අභියෝගයකි.

මණ්ඩලය එළඹුන තවත් වැදගත් තීරණයක් නම්, කුකුලෙ ගඟ භූගත බලාගාරයෙහි සමස්ත අළුත්වැඩියාව සිදු කිරීමට විදේශ සමාගම් කීපයක්ම මැලිකම් දක්වද්දී, අපගේම ඉංජිනේරුවන්ට එය පැවරීමට තීරණය කිරීමය. එම ඉංජිනේරුවෝ අළුත්වැඩියාව සිදුකොට බලාග ාරයෙහි සම්පූර්ණ ධාරිතාව ප්‍රතිෂ්ඨාපනය කිරීමට සමත් වූහ. මේ අනුව ලංකා විදුලිබල මණ්ඩලයට රුපියල් මිලියන 100ක් පමණ ඉතිරි විය. තව ද, ලක්විජය බලාගාරයෙහි නව උමග පිළිසකර කළ අතරම, උමග පිරික්සා එහි තබ්බූ වතුර කාන්දුවකට පිළියම් කිරීමට හැකි වීම 2014 තුළ ලංකා විදුලිබල මණ්ඩලයේ ඉංජිනේරුවන් මුහුණ දුන් වැදගත් අභියෝගාත්මක කර්තව්‍යයකි.

විදුලිබලය සැපයීම ආශ්‍රිතව නවතම නවෝත්පාදක සේවාවන් සපයමින් පාරිභෝගික සේවය වඩාත් සුවපහසු කොට ජාතික ආර්ථික දියුණුවට දායක වීමෙහි ලා වැදගත් මෙහෙවරක් ලංකා විදුලිබල මණ්ඩලය ඉටු කළේය.

# සභාපතිතුමාගේ සමාලෝචනය

2013 මැයි 01 දින සිදුකළ පාරිභෝගික අයකුම සංශෝධනය මසකට ඒකක 60කට අඩුවෙන් පරිභෝජනය කරන අඩු ආදායම්ලාභී පවුල් 2,799,098කට බලපෑවේ නැත. මෙම අඩු ආදායම් ලබන දේශීය ගෘහීය පාරිභෝගික පවුල්වලට සහනාධාර වශයෙන් රුපියල් මිලියන 16,431ක් ලබා දීමට ලංකා විදුලිබල මණ්ඩලයට හැකි විය. තව ද, පාරිභෝගිකයන්ට පිරිනමන අමතර සහනයක් වශයෙන්, ශ්‍රී ලංකාවේ සහ චීනයේ අතිගරු ජනාධිපතිවරුන් දෙපල විසින් 2014 සැප්තැම්බර් 16 දින පුත්තලම ලක්විජය බලාගාරයේ දෙවන අදියර මෙහෙවරෙහි යෙදවීම නිමිති කොට ගෙන මාසික විදුලි බිල්පතෙන් 25%ක් අඩු කිරීම සඳහා වන ඓතිහාසික මිල අඩු කිරීම රජය විසින් ලබා දෙන ලදී. අයකුමයෙහි මෙම අඩු කිරීම, මසකට ඒකක 90ක අඩුවෙන් පරිභෝජනය කරන පාරිභෝගිකයන්ට පිරිනමන රුපියල් මිලියන 24,751ක සහනාධාරය එලෙසම තබාගන්නා අතරම, ඉහළ මට්ටමේ පරිභෝගිකයන් ඇතුළුව 4,768,229ක් පමණ වන සියලු පරිභෝගිකයන්ට මෙම අයකුම අඩු කිරීම පිරිනමන ලදී. වසර පුරාම සාපේක්ෂ වශයෙන් දරාගත හැකි මිලකට විදුලිබලය සැපයීමට ලංකා විදුලිබල මණ්ඩලය අඛණ්ඩව උත්සාහ කර ඇත.

වෘත්තීය සමිති ගැටළු සම්බන්ධයෙන්, මාස කීපයක්ම දැඩි වෙහෙසක් දරා සියලුම ක්‍රියාකාරී වෘත්තීය සමිති සමග සාකච්ඡා කොට දැවෙන ප්‍රශ්න බොහොමයක් නිරාකරණය කිරීමට මණ්ඩලයට හැකි වූ බව සතුටින් සඳහන් කරමි. විශේෂයෙන්ම වැටුප් සහ වාර්ෂික බෝනස් ගෙවීම සම්බන්ධයෙන් ප්‍රථමවරට වෘත්තීය සමිති සමග සමූහ එකඟතාවක් ඇති කිරීමට හැකි වීම අසාමාන්‍ය ජයග්‍රහණයකි. ලංකා විදුලිබල මණ්ඩලය තුළ සමූහ එකඟතා සංකල්පය ඇති කිරීමට උත්සාහ කළ යුතු බවට මහා භාණ්ඩාගාරය වසර කීපයක සිටම බලපෑම් කළ නමුත් ඵලදායී පියවරක් ගෙන තිබුණේ නැත. කෙසේ වුව ද, මණ්ඩලය 2013 අවසාන භාගයේ සිට සියලු පාර්ශවකරුවන් සමග සාකච්ඡා කොට ඉමහත් වෙහෙසක් දැරීමෙන් අනතුරුව 2014 අවසානයේ දී එම එකඟතාවය ඇති කර ගැනීමට හැකි වීම කළමනාකාරිත්වය සහ සේවක පිරිස ලද සුවිශේෂ ජයග්‍රහනයකි. එම ගිවිසුම 2015, 2016 සහ 2017 සඳහා බලාත්මක වන අතර 2017 අවසානයේ දී නැවත සමාලෝචනයට භාජන වේ. විධායක නොවන ශ්‍රේණියේ 15,000ක් වූ සියලු සේවකයන් කෙරෙහි බලපැවැත්වෙන, 2012 අප්‍රේල් මාසයේ දී ඇති වූ වැටුප් විෂමතාවය, අදාළ වෘත්තීය සමිති සමග වසරක් පුරා පැවති සාකච්ඡා මාලාවකින් අනතුරුව විසඳන ලදී. මෙම ගැටළු විසඳීම සම්බන්ධයෙන් අප හා නම්‍යශීලීව සහයෝගයෙන් කටයුතු කළ සියලු වෘත්තීය සමිති නායකයන්ට අපගේ ප්‍රසංශාව හිමිවේ.

මානව සම්පත් කළමනාකරණය සම්බන්ධ සේවයෙහි ගුණාත්මකභාවය දියුණු කිරීම සඳහා පියවර රැසක් තබන ලදී. විනය පිළිබඳ ක්‍රියාමාර්ග ගැන පුහුණු පාඨමාලාවක් වෘත්තීය සමිති නායකයන් සඳහා පවත්වන ලදුව, එම නායකයෝ මෙම පාඨමාලාව තම විෂය පථයට අදාළ බැවින් පාඨමාලාව පැවැත්වීම ගැන ප්‍රසාදය පල කළහ. විදුලි අධිකාරීන් ඇතුළු විධායක සහ මධ්‍ය මට්ටමේ නිලධාරීන් සඳහා ධනාත්මක චින්තනය ගැන බුද්ධි ආලෝකන සැසිවාර පවත්වන ලදුව, එම සැසිවාර ලංකා විදුලිබල මණ්ඩලයේ පාරිභෝගික සත්කාරය වැඩි දියුණු කිරීමට උපකාරී වන බැවින් සහභාගී වූවන්ගේ ප්‍රසංශාවට පාත්‍ර විය.

මහජන බැංකුව, ඩයලොග් ඇක්සියටා සහ මොබිටෙල් ආයතන සමග පාර්ශ්වීය සබඳතා ගොඩනගා ගැනීම ආදායම් එකතු කිරීමෙහි ඵලදායීතාව වැඩි කළ අතරම, ලංකා විදුලිබල මණ්ඩල පාරිභෝගිකයන්ට තවදුරටත් පහසුකම් සලසා දුන්නේය. මහජන බැංකුවේ සහාය ඇතිව විදුලිබලය සඳහා තත්‍යකාල (OLRT) ගෙවීම් ක්‍රමය අනුව යාවත්කාලීන කිරීම පාරිභෝගිකයන් වෙත යොමු වූ උපායමාර්ගික පියවරකි. මේ අනුව ගෙවීම් මධ්‍යස්ථානවලට නොගොස් විදුලි බිල්පත් සඳහා ගෙවීමට පාරිභෝගිකයන්ට හැකි විය. තව ද, ඩයලොග් සහ මොබිටෙල් එකතු කිරීමේ නියෝජිතයන් 10,000කට වැඩි සංඛ්‍යාවක් දිවයින පුරා පත් කිරීම කාර්යක්ෂම ලෙස කාලීනව විදුලි බිල්පත් ගෙවීමට තැබූ සාර්ථක පියවරක් විය. පාරිභෝගික සත්කාරය සඳහා තැබූ මෙම පියවර ගෙවීම් ක්‍රමයෙහි නම්‍යතාවය සහ පාරිභෝගිකයන්ට සැපයූ සැලසුම් සහගත පහසුකම් නිසා තවදුරටත් තහවුරු විය.

මෙම සියලු කාර්යසාධනයන් මණ්ඩලයේ සාමාජිකයන් සහ ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී මහතාගේ නායකත්වය යටතේ සේවය කළ සියලුම සේවකයන් කැපවීමෙන් කළ සේවය නිසා ඉටු කරගත හැකි වූ බව අවසාන වශයෙන් සතුටින් සඳහන් කරමි. එම සියලු දෙනාටම ස්තූති කරමින් ඔවුනට යහපතක්ම වේවායි ප්‍රාර්ථනා කරමි.

ඩබ්ලිව්.බී. ගනේගල
සභාපති

# සාමාන්‍යාධිකාරිගේ සමාලෝචනය



ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන විධායක නිලධාරී හැටියට 2014 වර්ෂය තුළ ලංකා විදුලිබල මණ්ඩලය ලැබූ ප්‍රගතිය මා සමාලෝචනය කරන්නේ ඉමහත් සතුටිනි.

මෙහෙයුම්, තාක්‍ෂණික සහ මූල්‍ය ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් මුඛ්‍ය වෙනස්කම් රාශියක් සිදු වී ඇති බැවින් මෙම වර්ෂය ලංකා විදුලිබල මණ්ඩලය සම්බන්ධයෙන් සුවිශේෂ වැදගත්කමක් උසුලයි.

ඉකුත් වසරේ දී සන්ධිස්ථාන කීපයක්ම පසු කොට අපේක්‍ෂිත තාක්‍ෂණික කාර්යසාධනය විශිෂ්ටත්වය කරා ගෙන ගොස් මූල්‍යමය ලාභ උපයා දීමෙන් පසු ලංකා විදුලිබල මණ්ඩලය වර්තමාන වර්ෂයේ දී තම ආදායම උපයා දෙන අගනා පාරිභෝගිකයන් සමග සබඳතා වැඩි දියුණු කිරීමට අවධානය යොමු කළේය. සම්ප්‍රදායික ඒකාධිකාරී උපයෝජ්‍යතාවක්ව පැවති තත්ත්වයේ සිට සැබවින්ම පාරිභෝගික මිත්‍ර උපයෝජ්‍යතාවක් හැටියට හැඳින්විය හැකි තත්ත්වයට පත්වීමේ ගමන් මගට ලංකා විදුලිබල මණ්ඩලය මේ වසරේ දී පිවිසියේය. සියලුම පාරිභෝගිකයන්ට වඩා හොඳ වැඩි දියුණු කළ සේවයක් ලබාදීමේ අරමුණ ඇතිව විප්ලවීය පියවර රැසක් ලංකා විදුලිබල මණ්ඩලය මෙම අවුරුද්දේ දී තැබුවේය.

ශ්‍රී ලංකාවේ වඩාත්ම පාරිභෝගික මිත්‍ර උපයෝජ්‍යතාව බවට පත්වීමේ ඉලක්කය වර්ෂය ආරම්භයේ දී ම ලංකා විදුලිබල මණ්ඩලය පිහිටුවා ගත්තේය. මෙම වර්ෂය ප්‍රශස්ත පාරිභෝගික සේවා සත්කාරයේ වර්ෂය හැටියට ප්‍රකාශයට පත් කරන ලදී. ලංකා විදුලිබල මණ්ඩලයේ පාරිභෝගික මිත්‍ර පරිසරය වැඩි දියුණු කළ හැකි අයුරින් මහජනයාට පිරිනැමිය හැකි සේවාවන් 25ක ගොනුවක් කල් ඇතිව හඳුනා ගැනීම උදෙසා සාමූහික තීරණයකට එළඹෙන ලදී. ආයතනික ක්‍රමෝපාය අංශය විසින් පෙරමුණෙහි තබාගත් මුලපිරීම් අතර, කාර්ය බහුල වූ තොරතුරු තාක්‍ෂණයට රුචියක් දක්වන්නන් සඳහා තොරතුර තාක්‍ෂණය සහ ජංගම සේවය ආශ්‍රිත විසඳුම් හඳුන්වා දීම ඇතුළත් විය.

එදිනෙදා වැඩකටයුතු සඳහා තොරතුරු තාක්‍ෂණය හඳුන්වා දෙන ලදී. පැමිණිලිවලට ප්‍රතිචාර වශයෙන් බිඳවැටීම් ගැන සංවිධානාත්මකව සහ ඵලදායී ලෙස ක්‍රියා කළ හැකි වන දත්ත සහ තොරතුරු මාරුව කාර්යක්‍ෂම ලෙස හැසිරවිය හැකි ගෘහස්ථ බිඳවැටීම් කළමනාකරණ පද්ධතියක් යොදා ගනිමින් පළාත් රාශියක බෙදාහැරීමේ අංශයන්හී මෙහෙයුම් බාධකවලින් තොරව ඉටු කිරීම සඳහා පිළිවෙත් යොදන ලදී.

වෙනසක් ඇති කිරීම සඳහා මුඛ්‍ය කාර්යමණ්ඩලයේ මානසික හැඩගැස්ම පරිනාමනයට සහාය පිණිස ප්‍රකට ආයතනික පුහුණුකරුවකු

# සාමාන්‍යාධිකාරිගේ සමාලෝචනය

වන ධම්මික කලපුගේ මහතාගේ සේවය ලබා ගන්නා ලදී. අපගේ උපායමාර්ගික වෙනසට මුහුණ දීමට කාර්යමණ්ඩලය සූදානම් කිරීම සඳහා අප ගත් ප්‍රථම පියවර මෙය වේ. ලංකා විදුලිබල මණ්ඩල සේවක හරස්කඩකට ප්‍රශස්ත පාරිභෝගික සේවා සත්කාරය ගැන සැසිවාර කිපයක් කලපුගේ මහතා විසින් මෙහෙයවන ලදී. වර්ෂය අවසාන වන විට ඉහළ කළමනාකාරීත්වය, පාරිභෝගිකයන් හා ගැටෙන ලංකා විදුලිබල මණ්ඩලයේ කාර්යමණ්ඩලය, ලංකා විදුලිබල මණ්ඩලයේ වෘත්තීය සමිති නායකයන් ඇතුළු විවිධ කාර්යමණ්ඩල කොටස්වලට එක් දින සැසිවාර 15 කට අධික සංඛ්‍යාවක් පවත්වා තිබුණි. මෙම ක්‍රියාමාර්ගය අතිශයින්ම සාර්ථක විය. විවිධ අංශවලින් ධනාත්මක ප්‍රතිපෝෂණයක් ලැබුණි. ලංකා විදුලිබල මණ්ඩල කාර්යමණ්ඩලය තම ඉල්ලීම් ඉටු කළ ආකාරය ගැන පුදුම වූ තෘප්තිමත් පාරිභෝගිකයන් කිප දෙනෙකුගෙන් දුරකථන ඇමතුම රැසක්ම මට පෞද්ගලිකව ලැබී ඇත. දුරකථනයෙන් මට ලැබුණු එක් ඇමතුමක් මෙසේය. "මම හැමින්ඩන් පටුමගෙහි ජීවත්වන කෙනෙක්, මම ඔබගේ ............... කාර්යාලයට ගියෙමි. ඔබගේ නිලධාරීන් මා පිළිගෙන මට සැලකු මිත්‍රශීලී ආකාරය ගැන අවුරුදු 40 කට වැඩි කාලයක් රජයේ සේවයෙහි යෙදීමෙන් ලැබූ අත්දැකීම් ඇති කෙනෙකු වශයෙන් ඇත්ත වශයෙන්ම පුදුම වූයෙමි. අවසාන වශයෙන් ඔවුන් එහි රැඳී සිටින්නේ ඔවුන්ගේ පාරිභෝගිකයන් වන අපට සේවය පිණිස බව ඔවුන් තේරුම් ගෙන ඇත. ඔවුන්ගෙන් මට ලැබුණු සැලකිල්ල ගැන මම බෙහෙවින් ප්‍රීතියට පත්වීමි". එතරම් ප්‍රශංසනාත්මක නොවන අදහස් දැක්වීම් ද තිබුණි. එයින් අදහස් වන්නේ අපගේ සේවය තවදුරටත් වැඩි දියුණු කිරීමට ඉඩ තිබෙන බවය. කෙසේ වුවු ද, පොදුවේ සලකා බලන කල වර්ෂය තුළ කිසියම් දුරකට අපගේ ඉලක්ක සපුරාගෙන තිබීම ගැන අපට සෑහීමට පත්විය හැක.

රජයේ 'සැමට විදුලිය' ප්‍රතිපත්තිය විසින් මෙහෙයවනු ලැබ, වර්ෂය තුළ ලංකා විදුලිබල මණ්ඩලය සිය පාඩු අඩු කොට අනාගත පාරිභෝගිකයන් වෙත ළඟා වීමට තවදුරටත් උද්යෝගයෙන් කටයුතු කළේය. වර්ෂය අවසාන වන විට විදුලියනය 98.4% දක්වා වැඩි කිරීමට හැකි විය. වැළැක්විය නොහැකි කෙටි කාලීන බිඳවැටීම් හැරුන විට පැය 24 පුරාම තම පාරිභෝගිකයන්ට විදුලිබලය ලබාදීමට ලංකා විදුලිබල මණ්ඩලයට හැකි විය. මෙම තත්ත්වයට ළඟා වීමට කලාපයේ සංවර්ධනය වන කවර රටකට වුව ද උපයෝජ්‍යතාවයකට නොහැකි වී ඇත. මෙම කාර්යසාධනය ගැන ලංකා විදුලිබල මණ්ඩලයට සත්‍ය වශයෙන්ම ආඩම්බර විය හැක.

පුත්තලමේ මෙ.වො. 3 X 300 ලක්විජය ගල් අඟුරු බලාගාරයේ II වන අදියර සම්පූර්ණ කොට මෙහෙවරෙහි යෙදවීමට හැකි වීම වර්ෂය තුළ ලැබූ ඉතා වැදගත් තාක්ෂණික ජයග්‍රහණයකි. මෙම බලාගාරයේ මෙ.වො. 300 වාෂ්ප තලබමන - ජනක ඒකක දෙක (ඒකක අංක 2 සහ 3) ශ්‍රී ලංකා ජනරජයේ සහ චීන මහජන සමූහාණ්ඩුවේ අතිගරු ජනාධිපතිවරුන් දෙදෙනා එකතුව 2014 සැප්තැම්බර් 16 දින විවෘත කරන ලදී. මෙම ජනක ඒකක දෙකම එකතුව මෙ.වො. 600ක් ලංකා විදුලිබල මණ්ඩලයේ සම්පූර්ණ ධාරිතාවට එකතු කළේය. මේ අනුව අපගේ ජනක ප්‍රභේද එකතුවට ගල් අඟුරුවල දහනයෙන් ලැබෙන බලශක්තියෙහි ප්‍රතිශතය වැඩි වීම නිසා තාප බලාගාර ක්‍රියාකරවීමට අවශ්‍ය අධික වියදමක් සහිත තෙල් සඳහා යන වියදම අවම කොට සුවිශේෂී පිරිවැය ඉතුරුවක් ලංකා විදුලිබල මණ්ඩලයට ලබා දුන්නේය. එක් මෙ.වො. 300 ජනකයකින් වසරකට අපේක්ෂිත විදුලිබල ඒකක ප්‍රමාණය මිලියන 1,800කි. වසර අවසාන වන විට මෙම ගල් අඟුරු බලාගාරය දිනකට ජනනය කළ විදුලිබල ප්‍රමාණය ඒකක මිලියන 18කි. මෙම ප්‍රමාණය මෙරට දිනකට පරිභෝජනය කරන විදුලිබල ප්‍රමාණයෙන් 50%කි.

වර්ෂය අවසාන වන විට සම්පූර්ණ බලශක්ති ජනනයෙන් 26%ක් ලක්විජය ගල් අඟුරු බලාගාරය විසින් ද, 30%ක් ජල විදුලි බලාගාර විසින් ද, 35%ක් තෙල් භාවිතා කළ තාප බලාගාර විසින් ද ජනනය කරනු ලැබීය. හිඟ ප්‍රමාණය වූ 10% සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් ලබා ගන්නා ලදී. ගල් අඟුරු බලශක්ති ජනනයෙන් ඉතිරි වූ සාමාන්‍ය පිරිවැය ප්‍රමාණය කි.වො. පැයකට රු. 20/-කට වැඩි විය. මේ අනුව සෘජු ජනන පිරිවැය සුවිශේෂී ලෙස අඩු විය. කෙසේ වුව ද, තෙල් භාවිතා කළ තාපබල ජනනය, ජල විදුලිබල ජනනය අඩු වීම නිසා වැඩි කළ යුතු විය. මේ නිසා සිදු වූ පාඩුව ගල් අඟුරු බලශක්ති ජනනය නිසා සිදු වූ ඉතුරුව අභිබවා ගිය බැවින් විකුණුම් පිරිවැය 27% කින් වැඩි විය. 2014 වසරේ දී විකුණුම් පිරිවැය රුපියල් මිලියන 210,850ක් වූ අතර, 2013 වසරේ දී එම වියදම රුපියල් මිලියන 165,508ක් විය. මෙයට හේතුව නම් මෙතෙක් වාර්තා වී ඇති වැඩිම ජල විදුලිබල ජනනය 2013 වසරේ දී ලබාගත හැකි වීමයි.

වර්ෂය තුළ අඩු වෝල්ටීයතා රැහැන් කි.මී. 5,972 කින් වර්ධනය කරනු ලැබීය. පද්ධතියට එකතු කරන ලද නව බෙදාහැරීමේ උපපොළ සංඛ්‍යාව 1,401 කි. පාරිභෝගික සංඛ්‍යාව 206,771 කින් වැඩි විය. උඩින් එළන කි.වෝ. 132 සම්ප්‍රේෂණ රැහැන්වල සම්පූර්ණ දිග වර්ෂය අවසාන වන විට කි.මී. 2,206 ක් විය. එම සංඛ්‍යාව ඉකුත් වසරේ අනුරූප සංඛ්‍යාවට වඩා කි.මී. 321 ක වැඩි වීමක් පෙන්නුම් කරයි. මෙම වර්ධනය සම්ප්‍රේෂණ පද්ධතිය වැඩි දියුණු කොට, සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ හානි අඩු කිරීමට දායක විය. දුම්මලසූරිය, බදුල්ල, මාහෝ, නාඋල, පල්ලේකැලේ, පොළොන්නරුව සහ වව්නතිව් හී පිහිටි කොටුමා උපපොළ සහ ඒවා ආශ්‍රිත සම්ප්‍රේෂණ රැහැන් අදාළ ඉදිකිරීම් අවසානයේ දී වර්ෂය තුළ දී බලගන්වනු ලැබීය. මෙම නව කොටුමා උපපොළ පද්ධතියට එකතුවීමත් සමග දිවයිනේ පවත්නා සම්පූර්ණ කොටුමා උපපොළ සංඛ්‍යාව 67 දක්වා වැඩි විය. හබරණ, පුත්තලම, පානදුර සහ මාතර පවත්නා කොටුමා උපපොළ ධාරිතාව වර්ධනය කරනු ලැබීය.

2014 වර්ෂය ආරම්භයේ දී නව ලක්ෂපාන බලාගාරයෙහි (මෙ.වො. 2 X 50) අංක 1 ඒකකය පුනරුත්ථාපනය කිරීම සිදුවෙමින් පැවතුණි. එම කටයුතු මෙම වසර තුළ අවසන් විය. එම බලාගාරයෙහි අංක 2 ඒකකය පුනරුත්ථාපනය 2014 ජනවාරි - අගෝස්තු කාලය තුළ ආරම්භ කොට අවසන් කරන ලදී. නව සැලැස්මක් අනුව සකස් කළ ධාවකයන් යොදා ගැනීම කොටු දොර (Penstock) ඝර්ෂණය අඩු කිරීම හේතු කොට ගෙන එක් ඒකකයක ජනන හැකියාව මෙ.වො. 8 බැගින් වැඩි වී පුනරුත්ථාපිත නව ලක්ෂපාන බලාගාරයෙහි සම්පූර්ණ ජනන හැකියාව මෙ.වො. 16 කින් වැඩි විය. පරීක්ෂණ පහසුව සහ ජල කාන්දුවට පිළියම් යෙදීමට මග පෑදීම සඳහා නව ලක්ෂපාන බලාගාරයෙහි උමග ජලහරණයට භාජන කිරීම ද 2014 වසර තුළ සිදුවිය. එයට පිළියම් වශයෙන් කරන ලද කාර්යයන් වන්නේ බිම් විවරය සහ වානේ ආස්තරය අතර කොන්ක්‍රීට් ආස්තරයක් දැමීම ද, බදාම ආලේපනය ද, දියර බදාම කැවීම ද, පර්වත බඳනය ද වේ. ඉතා ඉක්මනින් සිදුවිය හැකිව තිබූ විනාශයක් වැළැක්වීමට ඉටු කළ මෙම කටයුතු සඳහා දරන්නට සිදු වූ පිරිවැය රුපියල් මිලියන 170කි.

විමලසුරේන්ද්‍ර බලාගාරයෙහි ද (මෙ.වො. 2 X 25) වසර තුළ පුනරුත්ථාපන කටයුතු සිදුවිය. විමලසුරේන්ද්‍ර සහ නව ලක්ෂපාන

# සාමාන්‍යාධිකාරිගේ සමාලෝචනය

බලාගාර දෙක සහ ඒ ආශ්‍රිත ජනක යන්ත්‍ර, තලබමන, පාලක සහ උපකාරක අංග පුනරුත්ථාපනයට දරන්නට සිදු වූ පිරිවැය රුපියල් මිලියන 6,660 කි.

ගල් අඟුරු බලාගාරය විවෘත කිරීමට සමපාතව 2014 සැප්තැම්බර් 16 දින සිට බලපැවැත්වෙන පරිදි ගෘහස්ථ පාරිභෝගිකයන් සඳහා ගාස්තු සංශෝධනයක් ක්‍රියාත්මක කරන ලදී. කර්මාන්ත, හෝටල්, පොදු කාර්යය සහ (පාසල්, ආරෝග්‍යශාලා වැනි) රාජ්‍ය අංශයේ පාරිභෝගිකයන් ඇතුළු අනෙක් සියලු වර්ගවලට අයත් පාරිභෝගිකයන් සඳහා 2014 නොවැම්බර් 15 දින සිට බලපැවැත්වෙන පරිදි ගාස්තු සංශෝධනයක් සිදුවිය. මෙම ගාස්තු සංශෝධන දෙක නිසා සියලුම වර්ගවල පාරිභෝජිකයන්ට ප්‍රතිලාභයක් අත් වූ නමුත් ලංකා විදුලිබල මණ්ඩලය වර්ෂයේ අවසාන කාර්තුවේ දී කි.වො. පැයකට ඉපයූ ආදායම රු. 19.00 සිට රු. 15.60 දක්වා අඩු විය. වර්ෂය තුළ කි.වො. පැයක සාමාන්‍ය මිල රු. 18.50ක් වශයෙන් පැවතුණි.

වර්ෂයේ පළමු අර්ධය තුළ ජලාශවලට ලැබුණ වර්ෂාපතනය ප්‍රමාණවත් නොවූ බැවින් ජල විදුලිය ජනනය අඩු විය. මෙය ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය කාර්යසාධනය කෙරෙහි අහිතකර ලෙස බලපෑවේය. කෙසේ වුව ද, වර්ෂයේ අපර භාගයේ දී කාලගුණ තත්ත්වය වඩා යහපත් වීමත් සමග මූල්‍ය තත්ත්වය ද දියුණු විය. වසර අවසානයේ පැවති ශුද්ධ අලාභය රුපියල් මිලියන 14,605ක් වූ අතර ඉකුත් වසර අවසානයේ දී වාර්තා වූ පුනප්‍රකාශිත ශුද්ධ ලාභය රුපියල් මිලියන 20,900ක් විය. මෙය මූල්‍ය කාර්යසාධනයෙහි සැලකිය යුතු පසුබෑමකි. කි.වො. පැයක් ජනනය කිරීම සඳහා වන සාමාන්‍ය පිරිවැය ඉකුත් වසරේ රු. 11.38ක් වූ අතර, 2014 වසරේ එය රු. 14.81ක් විය. මෙය 2013 හා සසඳන කළ 2014 වසරේ දී ජල විදුලිය ජනනය 39% කින් අඩුවීමේ ප්‍රතිඵලයකි. ජල විදුලිය ජනනය අඩු වීම නිසා දිවයින පුරා අඛණ්ඩ විදුලිබල සැපයුමක් පවත්වා ගැනීමට තාපබල ප්‍රභවයන් මත රඳා පැවතීමට ලංකා විදුලිබල මණ්ඩලයට සිදු වූ බැවින් විදුලිබල ජනනයෙහි සෘජු පිරිවැය 37% කින් වැඩි විය.

වර්ෂය අවසාන වන විට මෙරට විදුලියන මට්ටම 98% ඉක්ම වූ අතර, අලෙවිය ගි.වො. පැය 11,063 දක්වා වැඩි විය. ඉකුත් වසරේ අලෙවිය ගි.වො. පැය 10,621 කි. මේ අනුව වර්ධන වේගය 4% කි. සංශෝධිත අය ක්‍රමය නිසා ලැබුණ මාසික ආදායම ආසන්න වශයෙන් රුපියල් මිලියන 15,000 ක් වූ අතර, එම මට්ටම අනුව ලංකා විදුලිබල මණ්ඩලය වැඩිම වාර්ෂික පිරිවැටුමක් සහිත පොදු ව්‍යවසාය බවට පත්විය. 2014 දී ආදායම් එකතුව විකුණුම් අගයෙන් 104% ක් විය. මේ අනුව වාර්ෂික ආදායම් එකතුව රුපියල් බිලියන 213 ක් විය.

ලංකා විදුලිබල මණ්ඩලයට මූල්‍ය සහනයක් සැලැස්වීමේ පියවරක් වශයෙන් 2013 දෙසැම්බර් 31 දිනට පැවති පියවා නැති භාණ්ඩාගාර ණය රජයේ ප්‍රාග්ධන කොටස් බවට පත් කරන ලෙස 2014 අයවැය යෝජනා ඉදිරිපත් කරමින් යෝජනා කරන ලදී. අයවැය සම්මත වීමෙන් පසු රුපියල් මිලියන 161,707 ක් ප්‍රාග්ධන කොටස් බවට පත් කිරීමට භාණ්ඩාගාර අනුමැතිය ලැබුණි. එම මුදල දීර්ඝ කාලීන පොලී සහිත ණය හැටියට 2013 ශේෂ පත්‍රයෙහි දක්වා තිබුනි. රුපියල් මිලියන 32,333 ක් වූ ණය පිරිවැය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 23 (LKAS 23) අනුව ගණන් බලන ලදුව භාණ්ඩාගාරයේ ඉහත තීරණය පරිදි ගිණුම් පොත්වලින් ප්‍රතිවර්තනය කරන ලදී.

2014 වර්ෂයේ දී ලංකා විදුලිබල මණ්ඩලය අලාභ ලැබූ නමුත් තම ණය කරුවන්ට ගෙවිය යුතු මුදල සතුටුදායක මට්ටමක තබා ගැනීමට ලංකා විදුලිබල මණ්ඩලයට හැකි විය. වසර ආරම්භයේ දී ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු වූ ණය මුදල රුපියල් මිලියන 6358 ක් වූ අතර, වසර තුළ දී ණය පියවීම සඳහා රුපියල් මිලියන 54,170 ක් ගෙවූ බැවින් වසර අවසාන වන විට ගෙවන්නට ඉතිරි වූ මුදල රුපියල් මිලියන 2,221 ක් විය. වසර ආරම්භයේ දී ස්වාධීන බලශක්ති නිෂ්පාදකයන්ට ගෙවිය යුතු මුදල රුපියල් මිලියන 17,592 ක් වූ නමුත්, රුපියල් මිලියන 86,580 ක් වසර තුළ දී ගෙවා නිම කළ බැවින් වසර අවසාන වන විට ගෙවිය යුතු මුදල රුපියල් මිලියන 13,919 දක්වා අඩු විය. වසර අවසාන වන විට බැංකු අයිරාව රුපියල් මිලියන 320ක් විය. අනුමත අයිරා සීමාව රුපියල් මිලියන 800 ක් විය.

ශේෂ පත්‍රයට අනුව වසර අවසාන වන විට දැනට ඉටුවන වැඩ ඇතුළු ලංකා විදුලිබල මණ්ඩලයේ සම්පූර්ණ ස්ථාවර වත්කම් එකතුව රුපියල් මිලියන 686,471 කි. මෙය ලංකා විදුලිබල මණ්ඩලයේ සම්පූර්ණ වත්කම්වලින් 89% කි. 2014 වර්ෂයේ මූල්‍ය වාර්තාවල වාර්තා කර ඇති රුපියල් මිලියන 14,605 ක් වන ගිණුම්ගත පාඩුවට රුපියල් මිලියන 21,361 ක් වන වාර්ෂික ක්ෂය වීම ඇතුළත් විය.

සමාලෝචනයට භාජන වන මෙම වර්ෂය තුළ දුෂ්කරතා රැසක් මැද ලංකා විදුලිබල මණ්ඩලය ළඟා කරගත් සතුටුදායක තාක්ෂණික සහ මූල්‍යමය කාර්යසාධනය ලංකා විදුලිබල මණ්ඩලයේ සේවයෙහි නියුතු වූ මගේ පූර්වගාමීන්, අතිරේක සාමාන්‍යාධිකාරීවරුන්, මූල්‍ය කළමනාකරු සහ අනෙක් සේවක පිරිස තම තමන්ගේ සේවාවන් තුළ දැක්වූ කැපවීම සහ උනන්දුව නොවන්නට, සාක්ෂාත් කර ගැනීමට නොහැකි වන්නට ඉඩ තිබුණි. එම සියලු දෙනාටම මාගේ කෘතඥතාවය හිමි වේ.

ඩබ්.ජේ.එල්.එස්. ප්‍රනාන්දු
සාමාන්‍යාධිකාරී

# ලංවිම සම්ප්‍රේෂණ ජාලය





# මෙහෙයුම්
## සමාලෝචනය



# ජනන අංශය

# ජනන අංශය

ලංකා විදුලිබල මණ්ඩලයට අයත් තාප සහ ජල විදුලි බලාගාර සහ සුළං විදුලි බලාගාර ක්‍රියා කරවීම සහ නඩත්තු කිරීම ජනන අංශය සතු වගකීමකි. මෙගවොට් 1382.1 ක සම්පූර්ණ ස්ථාපිත ධාරිතාවක් සහිත විශාල ජල විදුලි බලාගාර 17 ක්, මෙගවොට් 544 ක සම්පූර්ණ ස්ථාපිත ධාරිතාවක් සහිත තෙල් දහනයෙන් ක්‍රියාකරන විශාල තාප විදුලි බලාගාර 6 ක්, මෙගවොට් 900 ක් ජනනය කළ හැකි ගල් අඟුරු දහනයෙන් ක්‍රියාකරන තාප බලාගාර එකක් සහ මෙගවොට් 3 ක් ජනනය කළ හැකි සුළං බලයෙන් ක්‍රියාකරන බලාගාරයක්, 2014 වර්ෂයේ දී ලංකා විදුලිබල මණ්ඩලයේ වත්කම් විය. තව ද, යාපනය අර්ධද්වීපය සහ අවට පිහිටි දූපත් ආශ්‍රිතව ඇති හුදකලා ජාලවලින් ක්‍රියාත්මක විදුලි බලාගාර කීපයක් ද ලංකා විදුලිබල මණ්ඩලය සතු ය. ඒවා ද ඇතුළුව 2014 වසර අවසන් වන විට ලංකා විදුලිබල මණ්ඩලය සතු විදුලි බලාගාරවල පූර්ණ ස්ථාපිත ධාරිතාව මෙගවොට් 2,829.1 ක් විය.

විවිධ වගකීම් දරණ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන් 13 දෙනෙකුගේ සහාය ඇතිව අතිරේක සාමාන්‍යාධිකාරීවරයෙක් මෙම අංශය කළමනාකරණය කරයි. මෙම අංශයේ විෂය පාත්‍රතාවට අංශ 09 ක් සහ ජනන සංකීර්ණ 5ක් ඇතුළත් ය. ඒවා, මහවැලි, ලක්ෂපාන, තාප, සමනල සහ ගල් අඟුරු යන ජනන සංකීර්ණ වේ. සමාලෝචිත වර්ෂය තුළ කාර්යසාධනය පහත සඳහන් පරිදි වේ.

## ජනන ව්‍යාපෘති ශාඛාව

ජනන අංශයේ විෂය පථය යටතේ පවත්නා බලාගාර පුනරුත්ථාපන ව්‍යාපෘති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම ජනන ව්‍යාපෘති අංශය උසුලයි. තව ද, ජනන අංශයට විදේශවලින් මිලට ගත යුතු භාණ්ඩ සහ සේවා මිලට ගැනීම ද මෙම අංශය විසින් මෙහෙයවනු ලබයි.



නව ලක්ෂපාන බලාගාරයෙහි නව ධාවකය

## නව ලක්ෂපාන සහ විමලසුරේන්ද්‍ර බලාගාර පුනරුත්ථාපනය

මෙ.වො. 2X50 නව ලක්ෂපාන සහ මෙ.වො. 2X25 විමලසුරේන්ද්‍ර බලාගාර පුනරුත්ථාපනය කොට නවීකරණය කරන ලදී. මෙම බලාගාරවල ජනන යන්ත්‍ර, තලබමන, පාලක සහ උපකාරක සේවා රුපියල් මිලියන 6,660 ක පිරිවැයකින් ප්‍රතිස්ථාපනය සහ නැවත සකස් කිරීම සිදුවිය.

නව ලක්ෂපාන බලාගාරයෙහි අංක 2 යන්ත්‍රය පුනරුත්ථාපනය (ව්‍යාපෘතිය යටතේ පුනරුත්ථාපනය කරන ලද යන්ත්‍ර හතරෙන් අවසන් වරට පුනරුත්ථාපනය කළ යන්ත්‍රය) 2014 ජනවාරි සිට අගෝස්තු දක්වා සිදුවිය. අවුරුද්ද අවසාන වන විට මෙම යන්ත්‍රය දෝෂ පාත්‍රතා කාලය තුළ ක්‍රියා කළේය. බලාගාරයේ අංක 1 යන්ත්‍රයේ දෝෂ පාත්‍රතා කාලය 2014 ජනවාරි මස අවසන් විය. ව්‍යාපෘතිය යටතේ නව ලක්ෂපාන බලාගාරයේ ශක්‍යතාව මෙ.වො. 16 කින් වැඩි විය. කොටු දොරෙන් (penstock) ඝර්ෂණය අඩු කරන සැලසුමකින් යුත් ධාවකයන් යෙදීම නිසා ඒකක දෙකෙහිම එක් ඒකකයක ශක්‍යතාව මෙ.වො. 8 බැගින් වැඩි විය. උපරිම ශුද්ධ ජල එසවුම (net head) මීටර් 536.1 ව පවතින විට සහතික කළ බර තැබූ සාමාන්‍ය කාර්යක්ෂමතාව 89.753% ක් වන බව තලබමන කාර්යක්ෂමතා පරීක්ෂණයේ දී හෙළි විය.

2014 වර්ෂය තුළ බලාගාර නඩත්තුව සඳහා අවශ්‍ය අමතර කොටස් සහ සේවා ලබා ගැනීම සඳහා විදේශීය නිෂ්පාදකයන් වෙත රුපියල් මිලියන 3,042ක අගයක් සහිත ඇණවුම් 317 ක් ඉදිරිපත් කර ඇත.

## පරිසර, සිවිල් නඩත්තු හා වේලි ආරක්ෂණ ශාඛාව

පරිසර, සිවිල් නඩත්තු හා වේලි ආරක්ෂණ ශාඛාව මෙම වර්ෂය තුළ වේලි, ජලාශ, බලාගාර උමං සහ විදුලිබල ජනනයට සම්බන්ධ වෙනත් ආශ්‍රිත ව්‍යුහයන් නඩත්තුව සහ අඛණ්ඩ සුපරීක්ෂාව සිදු කළේය. ලක්විජය බලාගාරයෙහි දෙවන අදියරෙහි සේවකයන් සඳහා නිවාස සහ වෙනත් යටිතල පහසුකම් මෙම අංශය විසින් ඉදිකරන ලදී.

වර්ෂය තුළ රුපියල් මිලියන 500කට අධික පිරිවැයක් සහිත පහත සඳහන් ප්‍රධාන ඉදිකිරීම් සහ නඩත්තු කටයුතු මෙම අංශය විසින් නිම කරන ලදී.

- ලක්විජය බලාගාරය සඳහා පෙර - සැකසූ සයනාගාර (Pre-fabricated dormitories) හතරක් රුපියල් මිලියන 212 ක පිරිවැයකින් ඉදිකිරීම.
- 2014 අප්‍රේල් මස රුපියල් මිලියන 228 ක් වැය වන සම්ප්‍රදායික සයනාගාර (Conventional dormitories) දෙකක් ඉදිකිරීම සඳහා වන කොන්ත්‍රාත්තුවක් පිරිනැමීම.
- පරීක්ෂණය සහ ජල කාන්දුවකට පිළියම් යෙදීමට ඉඩ ලබාදීම සඳහා නව ලක්ෂපාන බලාගාරයේ උමගෙහි ජලය ඉවත් කිරීම

## ජනන අංශය

සිදු විය. රුපියල් මිලියන 170 ක පිරිවැයක් සහිතව ඉටු කරන ලද මෙම පිළියම් කිරීමේ කටයුතුවලට බිම් විවරය සහ වානේ ආස්තරය අතර කොන්ක්‍රීට් දැමීම, බදාම ආලේපනය, දියර බදාම කැවීම සහ පර්වත බඳනය ඇතුළත් විය.

- රුපියල් මිලියන 50 ක පිරිවැයකින් යුත් පසුවිපරම් මෙවලම් සවි කිරීම, බැහැරණ ව්‍යුහයන් පුනරුත්ථාපනය සහ දත්ත සම්ප්‍රේෂණ පද්ධති සැපයීම මගින් ලක්ෂපාන කැනියොන් සහ නෝර්ටන් බලාගාරවල වේලි ආරක්ෂණය උසස් තත්ත්වයකට පත් කිරීම.

### බලශක්ති විකුණුම් ශාඛාව

ශ්‍රී ලංකාවේ බලශක්ති කර්මාන්තයට නියාමන රාමුවක් හඳුන්වා දීමත් සමග, ජනන අංශයේ බලශක්ති විකුණුම් ශාඛාවට, ලංකා විදුලිබල මණ්ඩලයට ලබා දී ඇති ජනන බලපත්‍රයෙහි සඳහන් කොන්දේසි පරිදි නියාමන කරුණුවලට අදාළ ක්‍රියාකාරකම් පවරා ඇත. ලංකා විදුලිබල මණ්ඩලයේ සෑම බලාගාරයක් සඳහාම වාර්ෂිකව ශක්‍යතා සහ බලශක්ති මිල සම්පාදනය කිරීම සහ ලංකා විදුලිබල මණ්ඩලයේ සම්ප්‍රේෂණ බලපත්‍ර ලාභීන්ට මාසිකව සම්ප්‍රේෂණය කරන ලද විදුලිබලය ගැන මාසික සම්ප්‍රේෂණ සටහන් නිකුත් කිරීම මෙම කටයුතුවලට ඇතුළත්ය.

ලංකා විදුලිබල මණ්ඩලය බලාගාර වෙත සපයන ලද අයවැය පදනම් කොට ගෙන වර්ෂයට අදාළ ශක්‍යතා සහ බලශක්ති ගාස්තු ගණන් බලන ලදුව, එම තොරතුරු ශ්‍රී ලංකා පොදු උපයෝගීතා කොමිසමට ඉදිරිපත් කිරීම සඳහා සම්ප්‍රේෂණ බලපත්‍රලාභීන්ට ඉදිරිපත් කරන ලදී. 2015 වර්ෂයට අදාළව පුරෝකථනය කරන ලද අයවැය පදනම් කොට ගෙන 2015 වර්ෂය සඳහා ගණනය කරන ලද ශක්‍යතා සහ බලශක්ති ගාස්තු ද, සම්ප්‍රේෂණ බලපත්‍රලාභීන් වෙත ඉදිරිපත් කරන ලදී.

ගාස්තු වකවානු තුන සඳහා බලශක්ති තොරතුරු එකතුව වසර තුළ අරඹන ලදුව දත්ත පදනමක් ස්ථාපනය කරන ලදී.

### ආයතනික කටයුතු ශාඛාව

මානව සම්පත් කළමනාකරණය, සංවර්ධනය සහ කාර්යමණ්ඩල ප්‍රභේද සැලසුම්කරණය, ජනන අංශයේ ආයතනික කටයුතු ශාඛාවේ වගකීම් විය. වර්ෂය අවසාන වන විට ජනන අංශයේ කාර්යමණ්ඩල සංඛ්‍යාව 2,405ක් විය. කාර්යමණ්ඩල කළමනාකරණය කිරීමට අමතරව සේවක මණ්ඩලයේ ඵලදායීතාව වැඩි කිරීම අරමුණු කොට ගෙන, ඔවුන්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප වැඩි දියුණු කිරීමට, වර්ෂය තුළ වෘත්තීය සංවර්ධන වැඩසටහන් සහ වැඩමුළු මෙම ශාඛාව විසින් අඛණ්ඩව පවත්වන ලදී. අංශයේ සේවකයන් 1263 දෙනෙකු සඳහා විශේෂිත පුහුණු අවස්ථා ශාඛාව විසින් සැලසුම් කරනු ලැබීය.

### තාප / ජල විදුලි වත්කම් කළමනාකරණ ශාඛා

බලාපොරොත්තු විරහිත සේවා බිඳවැටීම් සහ බලවත් විනාශයන් වැළැක්වීම සඳහා දියුණු තත්ත්ව විපරම් තාක්‍ෂණය යොදා ගනිමින් ජනන යන්ත්‍රාගාර සහ උපකරණවල තත්ත්වය මෙම ශාඛාවන් විසින් පසු විපරම් කරන ලදී.

මෙම ශාඛාවන් විසින් වර්ෂය තුළ ඉටු කළ කාර්යයන් අතර කැනියොන් බලාගාරයෙහි සිදුවූ ප්‍රධාන අළුත්වැඩියාව සහ කොත්මලේ බලාගාරයෙහි අංක 1 ඒකකයේ සහ රන්දෙනිගල බලාගාරයෙහි ඒකක දෙකෙහි සිදුවූ ආරක්‍ෂක පද්ධති ප්‍රති-පිරිවැද්දුම ඇතුළත්ය. මෙම වකවානුව තුළ ඉටු කළ තවත් ඉතා වැදගත් කාර්යයක් නම් සමනලවැව බලාගාරයේ පැවති පාලක පද්ධතිය ඉවත් කොට ඒ වෙනුවට යෙදූ පාලක පද්ධතිය සැලසුම් කිරීමය.

### ලක්‍ෂපාන සංකීර්ණය

කුරු කපාටය අළුත්වැඩියා කිරීමේ දී අපේක්‍ෂා කළ හැකි හදිසි ගංවතුර පාලනය කිරීමට අඟල් 28 ක උසින් පිහිටන පරිදි කාසල්රී බැම්මෙහි වහරු 14 කින් යුත් ෆ්ලැෂ් පුවරුවෙහි වහරු දෙකක් වෙනස් කරන ලදී.

I වන අදියරඃ ඒකක තුනෙහි සම්පූර්ණ ක්‍රියාත්මක කාලය පැය 24,681 ක් වූ අතර, සැලසුම් ගතව විදුලිබලය ඇනහිටවූ කාලය පැය 46 කි. වර්ෂය තුළ ජනනය කළ අතිරේක බලශක්තිය ගිගාවොට් පැය 14.84 කි. එය පෙර වසරෙහි බලාගාරය පුනරුත්ථාපනය කිරීමෙන් පසුව ඇති වූ ශක්‍යතා වර්ධනයේ ප්‍රතිඵලයකි. කාර්යසාධනය වඩා යහපත් තත්ත්වයට පත් කළ පැරණි ලක්‍ෂපාන බලාගාරයේ පළමු අදියරෙන් වසරකට කුළුග උත්වීම සඳහා අවම වශයෙන් ගි.වො. පැය 18ක් ලබා ගැනීමේ හැකියාව ඇත.

ප්‍රධාන පරිණාමක (transformers), ධාරිත්‍රක (capacitor), වෝල්ටීයතා පරිණාමක සහ කොටු දොර (penstock) රක්නා (guard) වැල්ව ප්‍රතිස්ථාපනය වර්ෂය තුළ නිම කරන ලදී. මෙම කාලය තුළ කොටු දොරවල ඇතුල් මුහුණත පිත්තාරු කිරීම ද අවසන් කරනු ලැබීය.

II වන අදියරඃ ඒකක දෙකෙහි සම්පූර්ණ ක්‍රියාත්මක කාලය පැය 14,479.10 ක් වූ අතර, සැලසුම්ගතව විදුලිබලය ඇණහිටවූ කාලය පැය 109.41 කි. ඒකක 4 ක් සහ 5 කින් යුත් ජනන පරිණාමක සමූහ දෙක නවතම හුදකලා 3 x 11 එස් පරිණාමක සමූහයක් මගින් ප්‍රතිස්ථාපනය කරන ලදී.

වර්ෂය තුළ මෙ.වො. 2 x 58 (මෙ.වො. 2 x 50 සිට) ඒකකයන්ගේ ශක්‍යතා වර්ධනයෙන් ජනනය වූ අතිරේක බලශක්තිය ගිගාවොට් පැය 19කි. තත්ත්වය උසස් කළ නව ලක්‍ෂපාන බලාගාරයෙන් උපරිම ඉල්ලුම සඳහා වසරකට අවම වශයෙන් ගි.වො. පැය 50ක් ලබා ගැනීමේ හැකියාව තිබේ.

# ජනන අංශය

| වසර තුළ ලක්ෂපාන සංකීර්ණයේ කාර්යසාධනය | | | | | |
|---|---|---|---|---|---|
| විදුලි බලාගාරය | ස්ථාපිත ධාරිතාව මෙ.වො. | වර්ෂය තුළ ජනනය කළ බලශක්තිය ගි.වො. පැය | උපයෝජ්‍යතා සාධකය % | බලාගාර සාධකය % | දෝෂ සාධකය % |
| පැරණි ලක්ෂපාන - 1 වන අදියර | 28.8 | 168.155 | 98.82 | 67.35 | 0.19 |
| පැරණි ලක්ෂපාන - II වන අදියර | 25 | 124.154 | 93.82 | 56.69 | 0.75 |
| නව ලක්ෂපාන | 116 | 304.073 | 45.67 | 30.13 | 0.68 |
| විමලසුරේන්ද්‍ර | 50 | 114.893 | 92.42 | 26.23 | 0.25 |
| සමනල (පොල්පිටිය) | 75 | 332.491 | 95.18 | 50.61 | 1.27 |
| කැනියොන් | 60 | 101.248 | 87.17 | 19.26 | 0.09 |
| **මුළු ගණන** | **354.8** | **1,145.01** | **85.51** | **41.71** | **0.54** |

උමගෙහි ඇණහිට වීම සහ අංක 2 ඒකකය පුනරුත්ථාපනය සිදු වූ බැවින් වසර තුළ සම්පූර්ණ ජනනය අඩු විය. නව ලක්ෂපාන බලාගාරය 2014 තුළ ජනනය කළ බලශක්ති ප්‍රමාණය ගි.වො. පැය 304,073 කි. සැලසුම්ගත විදුලිබල ඇණහිටවීම් පැය 54.93 ක් සහිතව ඒකක දෙක සම්පූර්ණයෙන් ක්‍රියාත්මක වූ කාලය පැය 8,000.86 කි.

වර්ෂය තුළ අංක 1 ඒකකය තුළ ප්‍රධාන පරිණාමක ප්‍රතිස්ථාපනය කිරීම ද, කොටු දොරටුවල ඇතුල් සහ පිට මුහුණත පිත්තාරු කිරීම ද නිමවිය. උපකාරක පරිණාමක ප්‍රතිස්ථාපනය ද නිම කරන ලදී.

නව ලක්ෂපාන උමග පරීක්ෂණය සහ පිළිසකර කිරීම 2014 ජනි 30 දින අවසන් විය. ඉපිලුම් දණ්ඩ (surge shaft) සහ කොටු දොරටු ආරක්ෂක වැල්ව අතර පැයකට ඝන මීටර් 1,000 ක ජල කාන්දුවක් තිබුණි. මෙම කාන්දුව නිසා වසරකට සිදුවූ බලශක්ති හානිය අවම වශයෙන් ගි.වො. පැය 9 ක් වූ අතර, උමග පිළිසකර නොකළේ නම් ඉතා බරපතල විනාශයක් වන්නට ඉඩ තිබුණි. පිළිසකර කිරීමෙන් පසුව කාන්දුව සිදුවූ කොටස අඛණ්ඩව පසුවිපරම් කරන ලදී. කාන්දුවක ලකුණු නොතිබුණ බැවින් පිළිසකර කිරීම සාර්ථක බව නිගමනය කරන ලදී.

සමනලවැව බලාගාරය ක්‍රියාත්මක සම්පූර්ණ කාලය පැය 13,649.52 ක් වූ අතර, සැලසුම්ගතව විදුලිබලය ඇණහිටවූ කාලය පැය 175.25 කි. සමනලවැව බලාගාරයෙහි අංක 1 ඒකකයෙහි කි.වො. 12.5 ජනන සැරි සිඳුව නව සිඳුවක් මගින් ප්‍රතිස්ථාපනය කරන ලදී.

විමලසුරේන්ද්‍ර බලාගාරයෙහි සම්පූර්ණ ක්‍රියාත්මක පැය ගණන 6,616.78 ක් විය. සැලසුම්ගත විදුලිබල ඇණහිටවීම පැය 16.77 කි.

කැනියොන් බලාගාරයෙහි සම්පූර්ණ ක්‍රියාත්මක කාලය පැය 5,636.9 ක් වූ අතර, සැලසුම්ගතව විදුලිබලය ඇණහිටවූ කාලය පැය 5.26 කි. බලාගාරයෙහි අංක 1 ඒකකයෙහි ප්‍රධාන පිළිසකර කිරීමක් සිදුවූ අතර, අධිවෝල්ටීයතා විදුලිබල පරිණාමකය ප්‍රතිස්ථාපනය කිරීම වසර තුළ නිම විය.



නව ලක්ෂපාන බලාගාර උමග පිළිසකර කිරීමෙන් පසු



නව ලක්ෂපාන බලාගාරයෙහි උමග පිළිසකර කිරීම

## මහවැලි සංකීර්ණය

ජල පිවිසුම් පෙරහන (intake screen) අවහිර වීම වැළැක්වීම සඳහා උකුවෙල බලාගාරයෙහි පොල්ගොල්ල පිවිසුමෙහි සිදුකළ රොන්මඩ ඉවත් කිරීම 2014 ඔක්තෝබර් මාසයේ දී අවසන් විය. ජල පිවිසුම් පෙරහන අවහිර වීම නිසා ජල ශීර්ෂ හානියක්

# ජනන අංශය

| වර්ෂය තුළ මහවැලි සංකීර්ණයේ විදුලි බලාගාරවල කාර්යසාධනය පහත සඳහන් පරිදි විය. | | | | | |
|---|---|---|---|---|---|
| විදුලි බලාගාරය | ස්ථාපිත ධාරිතාව මෙ.වො. | ජනනය කළ බලශක්ති ගි.වො. පැය | උපයෝජ්‍යතා සාධකය % | බලාගාර සාධකය % | දෝෂ සාධකය % |
| වික්ටෝරියා | 210 | 548.371 | 92.34 | 29.81 | 3.79 |
| කොත්මලේ | 201 | 384.450 | 90.92 | 21.83 | 1.40 |
| ඉහළ කොත්මලේ | 150 | 362.834 | 99.77 | 27.61 | 0.00 |
| රන්දෙනිගල | 122 | 250.241 | 93.06 | 23.42 | 1.59 |
| රන්ටැඹේ | 49 | 127.848 | 98.12 | 29.78 | 2.42 |
| උකුවෙල | 40 | 136.803 | 90.52 | 39.04 | 8.17 |
| බෝවතැන්න | 40 | 63.289 | 90.43 | 18.06 | 2.11 |
| නිලඹේ | 3 | 6.299 | 98.48 | 21.66 | 3.01 |
| මුළු ගණන | 815 | 1,880.135 | 94.13 | 26.32 | 3.05 |

සිදුවී කීප වතාවක්ම වසා දැමීමට සිදු වූ බැවින් බලාගාරයෙහි ක්‍රියාකාරීත්වයට අහිතකර බලපෑමක් එල්ල විය.



නුවර පොල්ගොල්ල අංශයේ රුවන්ඔය සහ උමගට ජලය පිවිසෙන ප්‍රදේශයෙහි රොන් මඩ ඉවත් කිරීම

වික්ටෝරියා බලාගාරයෙහි අංක 1 ඒකකයෙහි සැකසුම් පෙති මුද්‍රාවන් 5ක් වර්ෂය තුළ තනා නිම කරන ලදී.

## සමනල සංකීර්ණය

2014 වසර තුළ සමනලවැව සංකීර්ණයෙහි ඉටු වූ ප්‍රධාන කටයුතු සමහරක් පහත දැක්වේ.

## කුකුලෙ ගඟ විදුලි බලාගාරය

බලශක්ති ජනනය ගැන සලකා බලන කල 2014 කුකුලෙ ගඟ විදුලි බලාගාරය සඳහා ඉතා හොඳම වර්ෂයක් විය. වසර අවසාන වන විට ජනනය කරන ලද සම්පූර්ණ විදුලිබල ප්‍රමාණය ගි.වො. පැය 341.6 කි. මෙය 2003 වර්ෂයේ මෙම බලාගාරය මෙහෙවරෙහි යෙදවූ පසු ජනනය කළ වාර්ෂික විදුලිබල මට්ටම් ගැන සලකන කල තුන්වන තැන උසුලයි. මෙම සාර්ථකත්වයට හේතු වූ ප්‍රධාන කරුණු අතරින් එකක් වූයේ 2013 ජුනි 8 දින හානි සිදු වූ අංක 2 ජනකයෙහි සේවය ලබා ගත හැකි වීමයි. කළමනාකාරිත්වයේ ප්‍රශස්ත තීරණ ගැනීම සහ කාර්යමණ්ඩලයේ කැපවීම නිසා, පිළිසකර කළ නොහැකි තත්ත්වයකට පත්ව ඇතැයි මුල් උපකරණ නිෂ්පාදකයා සහ ප්‍රකට ජනක නිෂ්පාදකයන් ප්‍රකාශ කර තිබිය දී, දුෂ්කර තාවකාලික පිළිසකර කිරීමකින් පසු අංක 2 ජනකය ක්‍රියා කරවිය හැකි තත්ත්වයට පත් කළ හැකි වීමයි. මෙම තාවකාලික පිළිසකර කිරීමෙන් පසු 2013 සැප්තැම්බර් 28 දින මෙහෙවරෙහි යොදවන ලදුව ස්ථිර පිළිසකර කිරීම දක්වා ක්‍රියා කරනු ඇතැයි අපේක්ෂා කරන ලදී. තාවකාලික පිළිසකර කිරීම කෙතරම් හොඳ වී ද යත් සැලකිය යුතු කරදරයකින් තොරව 87% ක උපයෝජ්‍යතා සාධකයකින් යුක්තව වසර පුරා එම ඒකකය ක්‍රියාත්මක විය. තවත් විශේෂිත කොට දැක්විය යුතු කාරණයක් නම් එම පිළිසකර කිරීම මගින් ගි.වො. පැය 124

| වසර තුළ සමනල සංකීර්ණයේ කාර්යසාධනය පහත සඳහන් පරිදි විය. | | | | | |
|---|---|---|---|---|---|
| විදුලි බලාගාරය | ස්ථාපිත ධාරිතාව මෙ.වො. | ජනනය කළ බලශක්තිය ගි.වො. පැය | උපයෝජ්‍යතා සාධකය % | බලාගාර සාධකය % | දෝෂ සාධකය % |
| සමනල වැව | 120 | 258.50 | 88.09 | 24.59 | 5.02 |
| කුකුලෙ ගඟ | 75 | 341.60 | 90.39 | 51.75 | 1.09 |
| උඩවලව | 6 | 8.17 | 40.57 | 21.25 | 49.95 |
| ඉගිනියාගල | 11.3 | 14.48 | 90.04 | 14.69 | 30 |
| හම්බන්තොට (සූළං බල) | 3 | 2.13 | 47.06 | 8.09 | 49.82 |
| මුළු ගණන | 215.3 | 624.88 | 71.23 | 24.074 | 27.2 |

# ජනන අංශය

ක් ඉතිරි වූ බවය. මෙසේ ඉතිරි වූ බලශක්තියෙහි වටිනාකම, ඒකකයක් රුපියල් 20/- ගණනේ රුපියල් මිලියන 2,480 ක් විය.

### සමනලවැව විදුලි බලාගාරය

කිලෝ වෝල්ට් 132 ඉම් ඇඳන සැරිසිඳුව (W10) සහ නව ජනන සැරි සිඳු ඒකක (M10 සහ M20) යොදා ගනිමින් ප්‍රතිස්ථාපනය කිරීම සාර්ථක ලෙස නිම විය. ඒ සමගම ඒකක අංක 1 සහ 2 තිරිංග පොට ඇණ ක්‍රියාවිරහිත වීම සහ පතුල් නියමු බෙයාරිම ක්‍රියාවිරහිත වීම පිළිබඳ වාර්ෂික නඩත්තුව ගැන ද අවශ්‍ය කටයුතු කරන ලදී.

කපුගල හා පඹහින්න සංචාරක බංගලා පිළිසකර කොට වඩා හොඳ පහසුකම් සපයන ලදී.


සමනලවැව බලාගාරයෙහි කි.වො. 132 සිඳු ස්ථාපනය :එ20 *


සමනලවැව බලාගාරයෙහි ඒකක අංක 2 ජනන පතුල් බෙයරින් එකලස පිළිසකර කිරීම

### උඩවලව බලාගාරය

2014 සැප්තැම්බර් මාසය තුළ ධාවක තල මුද්‍රාව පිළිසකර කරන ලදී.

### සුළං බලාගාරය

ඉන්දියාවේ වෙන්ටාස් එන්ජිනියරිං සමාගමේ සහාය ඇතිව අංක 2 තලබමනයේ ගියර පෙට්ටිය ප්‍රතිස්ථාපනය කිරීම 2014 මාර්තු මස තුළ ඉටු විය.

### ඉගිනියාගල බලාගාරය

වෙකොස්ලේවියානු කණ්ඩායමක් විසින් ඉගිනියාගල බලාගාරය සහ එහි ජල පිවිසුම් ව්‍යුහය ප්‍රතිස්ථාපනය කිරීම පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් සිදු කරන ලදී. 2014 අගෝස්තු මාසයේ දී උමගෙහි ජලය ඉවත් කර එම කණ්ඩායම උමගේ තත්ත්වය පරීක්ෂා කරන ලදී.

## තාපබල සංකීර්ණය

ඩීසල් යන්ත්‍ර මගින් බලගැන්වෙන ජනන කට්ටල සහිත සපුගස්කන්ද සහ ඊ විදුලි බලාගාර, කැලණිතිස්ස ඒකාබද්ධ චක්‍රීය විදුලි බලාගාරය, කැලණිතිස්ස සරල චක්‍රීය වායු තලබමන (Fiat GT and Frame V GTT) සහ ඩීසල් යන්ත්‍ර මගින් බලගැන්වෙන ජනන කට්ටල සහිත උතුරු ජනනී බලාගාරය, තාප බලාගාර සංකීර්ණයට අයත් ය. සංකීර්ණයේ සම්පූර්ණ ස්ථාපිත ධාරිතාව 2014 දී මෙගාවොට් 544 ක් වූ අතර, 2014 වර්ෂයේ දී ගිගාවොට් පැය 1,692.75 ක් ජනනය කරන ලදී. මෙම ප්‍රමාණය සම්පූර්ණ ජනනයෙන් 13.66% ක් විය.

සපුගස්කන්ද බලාගාරය වසර පුරාම මූලික ඉල්ලුම (පාදම බැර) මත මෙහෙයවන ලදී. මෙම බලාගාරය 35000 Sec දුස්ස්‍රාවිතාව සහිත බර ඉන්ධන වශයෙන් භාවිතා කළ බැවින් එම බලාගාරවල ජනන පිරිවැය සංකීර්ණයේ වෙනත් තාප බලාගාරවල පිරිවැයට වඩා සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු විය.

කැලණිතිස්ස පරිශ්‍රයෙහි පිහිටි මෙ.වො. 165 ඒකාබද්ධ චක්‍රීය බලාගාරය පද්ධතියේ අවශ්‍යතා අනුව පාදම බැර මත හෝ

සංකීර්ණය විසින් ජනනය කළ බලශක්තිය විවිධ බලාගාර අතර බෙදී ගිය අයුරු පහත දැක්වේ.

| විදුලි බලාගාරය | ස්ථාපිත ධාරිතාව (මෙගාවොට්) | ජනනය කළ බලශක්තිය (ගිගාවොට් පැය) | උපයෝජ්‍යතා සාධකය (%) | බලාගාර සාධකය (%) |
|---|---|---|---|---|
| සපුගස්කන්ද - A | 80 | 204.70 | 51.90 | 33.80 |
| සපුගස්කන්ද - B | 80 | 400.24 | 79.30 | 62.20 |
| කැලණිතිස්ස CCPP – GT | 110 | 531.78 | 90.83 | 57.82 |
| කැලණිතිස්ස CCPP – ST | 55 | 218.38 | 69.22 | 41.55 |
| කැලණිතිස්ස Fiat GT | 115 | 208.25 | 85.28 | 24.91 |
| කැලණිතිස්ස Frame V GTT | 80 | 33.63 | 74.12 | 6.60 |
| උතුරු ජනනී බලාගාරය | 24 | 95.77 | 72.05 | 45.99 |
| මුළු ගණන | 544 | 1692.75 | 74.7 | 39.0 |

# ජනන අංශය

අතරමැදි බැර මත මෙහෙයවන ලදී. මෙම බලාගාරය ඛනිජ තෙල් සංස්ථාවෙන් ලබාගන්නා ඩීසල් සහ රසායනික නැප්තා භාවිතා කරයි. ඒකාබද්ධ චක්‍රීය බලාගාරයෙහි සමස්ත ජනන පිරිවැය, සරල චක්‍රීය ප්‍රකාරය මත වායු තලබමන මගින් කරන ජනනයෙහි පිරිවැයට වඩා බෙහෙවින් අඩු ය.

පද්ධතියේ අවශ්‍යතා සපුරාලීමට වියළි කාලවලදී සහ හදිසි අවස්ථාවල දී කැලණිතිස්ස පරිශ්‍රයේ පවත්නා මෙගාවොට් 20 බැගින් වූ ධාරිතාවන් සහිත GE Frame V කුඩා ගෑස් ටර්බයින සහ මෙගාවොට් 115 ෆියට් වායු ටර්බයිනය ක්‍රියාත්මක කරන ලදී. මෙම බලාගාර ක්‍රියාත්මක කිරීමේ පිරිවැය සංසන්දනාත්මකව බලන කළ ඉහළ මට්ටමක පැවතුණි. එයට හේතුව නම් එම ටර්බයින ක්‍රියාත්මක කිරීමට ඩීසල් භාවිතා කිරීමයි. තව ද, පද්ධතියේ වෝල්ටීයතාව වැඩි දියුණු කිරීම සඳහා GE Frame V කුඩා ගෑස් ටර්බයින එකවර ක්‍රියාත්මක වන ධාරිත්‍රක ප්‍රකාරය මත ක්‍රියාත්මක කරන ලදී.

සපුගස්කන්ද කැළණිතිස්ස සහ උතුරු ජනනී බලාගාරවල සියලු ප්‍රධාන පිළිසකර කිරීම් / පරීක්ෂණ වර්ෂය තුළ නියමිත කාල වකවානුවල දී නිම කරන ලදී.

## පුත්තලමේ ගල් අඟුරු දහනයෙන් ක්‍රියාත්මක වන ලක්විජය බලාගාරය


පුත්තලමේ ගල් අඟුරු දහනයෙන් ක්‍රියාත්මක වන ලක්විජය බලාගාරය

2011 ජුලි මාසයේ දී මෙ.වො. 300 ප්‍රථම ඒකකය ලංකා විදුලිබල මණ්ඩලයට භාරදීමෙන් පසු, ලක්විජය බලාගාරයේ වැදගත් සන්ධිස්ථානයක් 2014 වසරේ දී සනිටුහන් විය. දෙවන අදියර යටතේ අංක 2 සහ 3 ඒකකවල ජනනය මෙම වසර තුළ ආරම්භ කළ අතර 2014 සැප්තැම්බර් 16 දින නිල වශයෙන් විවෘත කරන ලදී.

2014 වසර සඳහා පුරෝකථනය කරන ලද සම්පූර්ණ පද්ධති ඉල්ලුමෙන් 28% ක් පමණ ද, අපේක්ෂිත සම්පූර්ණ තාප බලශක්තියෙන් 51.7% ක් ද ලබා දෙමින් මෙම බලාගාරය 2014 වසර තුළ බලශක්ති පද්ධතියට ගි.වො. පැය 3,524.95 ක් සම්ප්‍රේෂණය කළේය. මෙම කාලය තුළ පරිභෝජනය කළ ගල් අඟුරු ප්‍රමාණය ටොන් 1,363,586 කි. බලාගාර උපයෝජ්‍යතා සාධකය 68.19% ක් විය. වසර තුළ පරිභෝජනය කළ ගල් අඟුරුවල පිරිවැය රුපියල් මිලියන 18,786 කි.

2014 වසර තුළ ලක්විජය බලාගාරයේ කාර්යසාධනය පහත සඳහන් පරිදි විය:

| | | අංක 1 ඒකකය | අංක 2 * ඒකකය | අංක 3 ** ඒකකය |
|---|---|---|---|---|
| දළ බලශක්තිය | ගි.වො. පැය | 1,661.13 | 1,347.44 | 516.38 |
| පිට කළ ශුද්ධ බලශක්තිය | ගි.වො. පැය | 1,508.2 | 1,224.9 | 469.1 |
| ගල් අඟුරු පරිභෝජනය | මෙට්‍රික් ටොන් | 676,024 | 498,674 | 188,888 |
| ඉන්ධන පිරිවැය (ගල් අඟුරු) | රු. මිලියන | 9,359 | 6,850 | 2,578 |
| සාමාන්‍ය ඉල්ලුම | මෙ.වො. | 233 | 266 | 244 |
| උපයෝජ්‍යතා සාධකය | % | 81.4 | 70.8 | 52.3 |

* - 2014 මැයි 4 දින අංක 2 ඒකකය වාණිජ මෙහෙයුම් සඳහා පවරා ගන්නා ලදී.

** - 2014 ඔක්තෝබර් 14 දින අංක 3 ඒකකය වාණිජ මෙහෙයුම සඳහා පවරා ගන්නා ලදී.

2015 වර්ෂයේ දී ඒකක තුනම ජාතික බලශක්ති අවශ්‍යතාවෙන් 55%ක් ලබාදීම අපේක්ෂිතය.

**ජනන පිරිවැය**

| තාක්ෂණය | ඉන්ධන පිරිවැය රු.මිලියන | අමතර කොටස් සහ වෙනත් නඩත්තු ද්‍රව්‍ය පිරිවැය | වෙනත් මෙහෙයුම් සහ නඩත්තු වියදම් රු. මිලියන | සම්පූර්ණ ජනන පිරිවැය රු. මිලියන | ඒකක ගි.වො. පැය | ඒකකයක් ජනනය සඳහා සාමාන්‍ය පිරිවැය රු./කි.වො. පැය |
|---|---|---|---|---|---|---|
| තාප - තෙල් | 46,128 | 1,048 | 6,169 | 53,345 | 1,745 | 30.56 |
| ජල විදුලි | - | 470 | 7,057 | 7,527 | 3,652 | 2.06 |
| තාප - ගල් අඟුරු | 17,485 | 240 | 4,885 | 22,611 | 3,108 | 7.28 |
| **මුළු ගණන** | 63,613 | 1,758 | 18,110 | 83,481 | 8,505 | 9.82 |

සටහන: ගල් අඟුරු බලාගාරයෙහි ඒකක 2 සහ 3 අත්හදා බැලීමට භාජන වන කාලයෙහි ප්‍රයෝජනයට ගත් ගල් අඟුරු සහ ජනනය කළ ඒකක ඉහත දැක්වෙන ගල් අඟුරු සහ ජනනය කළ ඒකකවල පිරිවැයට ඇතුළත් නොවේ.



# මෙහෙයුම් සමාලෝචනය



සම්ප්‍රේෂණ අංශය

# සම්ප්‍රේෂණ අංශය

ලංකා විදුලිබල මණ්ඩලයේ වෙනත් අංශයන්ට අදාළ සේවා සපයන අතරම, ලංකා විදුලිබල මණ්ඩලයේ සියළුම සම්ප්‍රේෂණ වත්කම් සැලසුම, සංවර්ධනය, මෙහෙයුම සහ නඩත්තුව සම්ප්‍රේෂණ අංශයෙන් ඉටු වේ.

ඵලදායීව සහ කාර්යක්ෂම සැලසුම්කරණයෙන් යුක්තව සම්ප්‍රේෂණ ජාලය සැලසුම් කොට, සංවර්ධනය කොට මෙහෙයවීමෙන් මෙම අංශය මගින් විශ්වසනීය වූ ද, ගුණාත්මක වූ ද, විදුලි බලය තොග වශයෙන් සම්ප්‍රේෂණය කෙරේ. නිපුණ හා අභිප්‍රේරිත සේවකයන් සමග ඵලදායී වූ සහභාගිත්වයක් පවත්වා ගනු ලැබීය. පිළිගත හැකි පාරිසරික ප්‍රමිති සුරකින අතරම සතුටුදායක පොලී අනුපාතයක් උපයමින් වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා මෙම අංශය විසින් යෝග්‍ය තාක්ෂණය යොදා ගන්නා ලදී.

අංශයේ මෙහෙයුම් අරමුණු මෙසේය:

- කාර්යක්ෂම, සමායෝජිත, විශ්වසනීය හා ආර්ථික වශයෙන් ලාබදායී වූ සම්ප්‍රේෂණ පද්ධතියක් වැඩි දියුණු කොට පවත්වාගෙන යාමග
- සුරක්ෂිත, විශ්වසනීය සහ ආර්ථික වශයෙන් ලාබදායී වූ විදුලි සැපයුමක් විදුලි පාරිභෝගිකයන්ට සැපයීම සහතික කළ හැකි පරිදි බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ට තොග වශයෙන් විදුලිය ප්‍රසම්පාදනය සහ විකිණීම.
- විදුලිය සඳහා, ඇතිවිය හැකි බවට සාධාරණව පුරෝකථනය කළහැකි ඉල්ලුම සපුරාලීමට හැකි වන සේ, උත්පාදන බලාගාරයන් හී ප්‍රමාණවත් ධාරිතාවක් පවත්වාගෙන යන බවට සහතික වීම.
- කිලෝ වෝල්ට් 132 සහ කිලෝවෝල්ට් 220 සඳහා ±1% ක් තුළ සහ හර්ට්ස් 50 පද්ධතියක් සඳහා ±1% ක වාර ගණනක් තුළ සම්ප්‍රේෂණ වෝල්ටීයතා විචලනයක් පවත්වාගෙන යාම.

## සම්ප්‍රේෂණ සහ ජනන සැලසුම් ශාඛාව

ලංකා විදුලිබල මණ්ඩලයට අයත් ජල විදුලි සහ තාප බල පද්ධති සමග සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලාගාර මුසුවෙහි සම්ප්‍රේෂණ සහ ජනන පද්ධති අධ්‍යයනය කොට සැලසුම් කිරීම මෙම ශාඛාවේ ප්‍රධාන අරමුණ වේ.

## ජනන සැලසුම්කරණය

- ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසමෙහි අනුමැතිය ලැබීමෙන් පසු 2013 - 2032 දීර්ඝ කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම 2014 අප්‍රේල් මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලදී. සැලැස්ම පරිදි ඉදිරි වසර 20 තුළ ආසන්න වශයෙන් මෙ.වො. 6,025 ක විදුලි බලයක් පද්ධතියට එකතු කිරීමට අපේක්ෂිතය. එම විදුලිබල ප්‍රමාණයෙන් මෙ.වො. 4,700 ක් ගල් අඟුරු දහනයෙන් ක්‍රියාත්මක වන තාප බලාගාරවලින් ලබා ගැනීමට අපේක්ෂිතය.
- ජපාන අන්තර්ජාතික සහයෝගිතා නියෝජිත ආයතනයෙහි සහයෝගය ඇතිව, උපරිම ඉල්ලුම සපුරාලීම සඳහා උපරිම බලශක්ති ජනනය උදෙසා සංවර්ධනය සැලසුම්කරණය පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් සිදු කරන ලදුව එහි අවසාන අධ්‍යයන වාර්තාව 2015 පෙබරවාරි මාසයේ දී ලැබෙනු ඇතැයි අපේක්ෂිතය.
- ආසියානු සංවර්ධන බැංකුවේ තාක්ෂණික සහාය ඇතිව මන්නාරම සඳහා පුනර්ජනනීය බලශක්ති මහා සැලැස්මක් සහ සුළං බලශක්ති සංවර්ධන මහා සැලැස්මක් සකස් කරන ලදී. මන්නාරමේ මෙ.වො. 100 ක සුළං බල උයනක් ඉදිකිරීම උදෙසා ශක්‍යතා අධ්‍යයනයක් සඳහා කටයුතු ආරම්භ විය.
- 'බලශක්ති සැලසුම්කරණය සහ න්‍යෂ්ටික බලය සහ මානව සම්පත් සංවර්ධනය සඳහා පූර්ව-ශක්‍යතා අධ්‍යයනය උදෙසා ආධාර කිරීම' යන ශීර්ෂය සහිත ව්‍යාපෘතිය යටතේ අන්තර්ජාතික පරමාණු බල නියෝජිත ආයතනයේ සපයන තාක්ෂණික සහයෝගිතාව ඇතිව සති දෙකක පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. මෙම වැඩසටහනට විදේශීය විශේෂඥයෝ ද සහභාගී වූහ.
- ලංකා විදුලිබල මණ්ඩලයේ අනාගත පුනර්ජනනීය ව්‍යාපෘති සඳහා දේශගුණ මූල්‍යය ලබා ගැනීම උදෙසා ශ්‍රී ලංකා චිරස්ථායී බලශක්ති අධිකාරිය සහ පාරිසරික අමාත්‍යාංශය සංවිධානය කළ වැඩසටහන්වලට ජනන සැලසුම් අංශය සහභාගී විය.

## ජනන සංවර්ධන අධ්‍යයනයන්

- ජපානයේ නව බලශක්ති සහ කාර්මික තාක්ෂණ සංවර්ධන සංවිධානයේ (NEDO) ප්‍රදාන සහාය ඇතිව ගල් අඟුරු දහනයෙන් ක්‍රියාත්මක තාප බලාගාර සඳහා යෝග්‍ය භූමි භාග තෝරා ගැනීමේ අධ්‍යයන සිදු කරන ලදී. විභව්‍ය භූමි භාග තුනක් හඳුනා ගැනීමෙන් පසුව ඒවා අතුරෙන් සාම්පූර් භූමි භාගය ශක්‍යතා අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලදී.
- ජපානයේ NEDO සංවිධානයෙන් ආධාර ලැබීමත් සමග මෙ.වො. 1,200 සාම්පූර් ගල් අඟුරු බල ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනය ආරම්භ විය. වැඩි කාර්යක්ෂමතාවයක් ඇති අත්‍යවශ්‍ය ගල් අඟුරු බලාගාරයක් ඉදිකිරීම යෝජනා වී තිබුණි.
- යෝජිත මෙ.වො. 20 සීතාවක ගඟ ජල විදුලි බලාගාරය සඳහා වන ශක්‍යතා අධ්‍යයනය සහ ආරම්භක පාරිසරික පරීක්ෂාව ආරම්භ විය.
- පාරිසරික අමාත්‍යාංශය යටතේ කටයුතු මෙහෙයවන දේශගුණ පරිවර්තන ලේකම් කාර්යාලය සමග, බලශක්ති අංශය කෙරෙහි දේශගුණ පරිවර්තනය ඇති කරන බලපෑම්

# සම්ප්‍රේෂණ අංශය

අඩු කරන හෝ එයට අනුහුරු විය හැකි ආකාරය ගැන අධ්‍යයනයක් සිදු කරන ලදී.

## සම්ප්‍රේෂණ සැලසුම්කරණය

2014 සිට 2022 දක්වා කාලය සඳහා සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘති 52 ක්, 2013 - 2022 දීර්ඝ කාලීන සම්ප්‍රේෂණ සංවර්ධන සැලැස්ම මගින් හඳුනාගෙන ඇත. ජපාන අන්තර්ජාතික සහයෝගිතා නියෝජිත ආයතනය (JICA), ආසියානු සංවර්ධන බැංකුව (ADB) සහ Agence Francaise De Development (AFD) වැනි ණය දෙන ආයතන සමග ඉහළ ප්‍රමුඛතාවක් ඇති ව්‍යාපෘති සඳහා අරමුදල් ලබා ගැනීම සැලසුම් කර ඇත.

- ජාතික සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ ව්‍යාපෘතිය සඳහා ජපාන අන්තර්ජාතික සහයෝගිතා නියෝජිත ආයතනය විසින් සපයනු ලබන 45 වන යෙන් ණය පැකේජය යටතේ අරමුදල් සපයන ලද මෙම ව්‍යාපෘතියට පහත සඳහන් ඉදිකිරීම් ඇතුළත් විය. කිරිඳිවැල කි.වෝ. 220/132/33 කොටුමා උපපොල ඉදිකිරීම, වේයන්ගොඩ තුල්හිරිය කි.වෝ. 132 සම්ප්‍රේෂණ රැහැන ඉදිකිරීම, බත්තරමුල්ල කොටුමා උපපොල ඉදිකිරීම, කොලොන්නාව - පන්නිපිටිය - රත්මලාන, පොල්පිටිය - නව හබරණ කි.වෝ. 132 සම්ප්‍රේෂණ රැහැන් නැවත ඉදිකිරීම සහ කොත්මලේ - නව පොල්පිටිය කි.වෝ. 220 සම්ප්‍රේෂණ රැහැන ඉදිකිරීම.

- හරිත බලශක්ති සංවර්ධනය සහ බලශක්ති කාර්යක්ෂමතා වර්ධන ආයෝජන වැඩසටහනේ 1 වන ණය කොටස යටතේ අනුරාධපුර, කටුනායක සහ කෙරවලපිටිය පවත්නා කොටුමා උපපොල වෘද්ධිකරණයට සහ කප්පල්තුරෙයි, කැස්බෑව සහ කළුතර නව කොටුමා උපපොල ඉදිකිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් වෙන්කරන ලදී.

- ප්‍රංශයේ Agence Francaise De Development ණය දෙන නියෝජිත ආයතනය මාලිම්බොඩ, වේවැල්වත්ත, නාවලපිටිය සහ රාගල කොටුමා උපපොල හතර ඉදිකිරීමට අරමුදල් සැපයීමට එකඟ විය.

- ප්‍රථමයෙන් කි.වෝ. 220 තත්ත්වයෙන් මෙහෙයවීමට නියමිත වූ කි.වෝ. 400 සාම්පූර් - හබරණ සම්ප්‍රේෂණ රැහැන සහ සාම්පූර් - කප්පල්තුරෙයි කි.වෝ. 220 සම්ප්‍රේෂණ රැහැන ඉදිකිරීම සඳහා 46 වන යෙන් ණය පැකේජය යටතේ මුදල් සැපයීම ගැන ජපාන අන්තර්ජාතික සහයෝගිතා නියෝජිත ආයතනය සමග සාකච්ඡා ආරම්භ විය.

- මන්නාරම - නාඩුකුඩා - සමනල වැව - ඇඹිලිපිටිය කි.වෝ. 132 සම්ප්‍රේෂණ රැහැන් ඉදිකිරීම, පන්නිපිටිය කොටුමා උපපොලෙහි MVAR SVC 100 ස්ථාපනය, බියගම, කොටුගොඩ, දෙහිවල සහ කොලොන්නාව කොටුමා උපපොල වෘද්ධිකරණය සහ කලවාන කි.වෝ. 132 / කි.වෝ. 33 කොටුමා උපපොල ඉදිකිරීම ආශ්‍රිත සම්ප්‍රේෂණ ව්‍යාපෘති සඳහා ශක්‍යතා වාර්තාව නිම කරන ලදී. මෙම සියලුම ව්‍යාපෘති හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතා වර්ධන ආයෝජන වැඩසටහනෙහි 2 වන ණය කොටස යටතේ ආසියානු සංවර්ධන බැංකුව මගින් සපයන මූල්‍යාධාර යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිතය.

## ශක්‍යතා සහ පූර්ව-ශක්‍යතා අධ්‍යයන

### ■ මොරගොල්ල ජල විදුලි යෝජනා ක්‍රමය

ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් යොදවා ජපානයේ Nippon Koei Consultants විසින් සිදුකරන ලද මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතියේ විස්තරාත්මක ඉංජිනේරුමය සැලසුම් අධ්‍යයනය 2014 ජනවාරි මස අවසන් විය.

### ■ බලශක්ති විවිධාංගීකරණය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය - IIA අදියර - ශ්‍රී ලංකාවට ද්‍රව ස්වාභාවික වායු (LNG) හඳුන්වා දීම පිළිබඳ ශක්‍යතා අධ්‍යයනය.

ශ්‍රී ලංකාවට ද්‍රව ස්වාභාවික වායු හඳුන්වා දීම ගැන ජපානයේ ඔරියන්ටල් උපදේශන සමාගම සිදු කළ ශක්‍යතා අධ්‍යයනය 2014 ජූනි මස අවසන් විය. මෙම අධ්‍යයනයට අරමුදල් සපයන ලද්දේ ජපාන අන්තර් ජාතික සහයෝගිතා නියෝජිත ආයතනය විසිනි.

### ■ සුළං බල ව්‍යාපෘතිය

ආසියානු සංවර්ධන බැංකුවේ සහාය ඇතිව සිදු කළ පුනර්ජනනීය බලශක්ති මහා සැලැස්මට අදාළ අධ්‍යයනයේ දී මන්නාරම සුළං බල විභව්‍යතාව මෙ.වෝ. 375 ක් ලෙස හඳුනා ගන්නා ලදී. මෙ.වෝ. 375 ක් සුළං බලයෙන් නිෂ්පාදනය කිරීම සඳහා වන ශක්‍යතා අධ්‍යයන වාර්තාව සම්පාදනය කිරීම සහ පාරිසරික බලපෑම ඇස්තමේන්තු කිරීම ඉටුවෙමින් තිබුණි. ලංකා විදුලිබල මණ්ඩලය සතු ප්‍රථම මෙ.වෝ. 100 සුළං බල උයන සංවර්ධනය වෙමින් පැවතුණි. මෙම ව්‍යාපෘතියට විදේශීය මූල්‍ය ආයතනවලින් අරමුදල් ලබා ගැනීම සැලසුම් කරනු ලැබේ.

## සම්ප්‍රේෂණ නිර්මාණ ඒකකය

වසර තුළ ඉටු කළ කටයුතු පහත සඳහන් පරිදි වේ.

- මහ කොළඹ සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ දී සිදුවන හානි අඩු කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, ජාතික සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ ජාලය සංවර්ධනය කිරීම සහ කාර්යක්ෂමතා වර්ධන ව්‍යාපෘතිය, හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතා වර්ධන ආයෝජන වැඩසටහන - ණය දීමනාවේ 1 වන කොටස, Agency Franciaise De Development විසින් මුදල් සපයන

# සම්ප්‍රේෂණ අංශය

සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය, පිවිතුරු බලශක්තිය සහ ප්‍රවේශ වර්ධන ව්‍යාපෘතිය - 2 වන කොටස, අතිරේක විෂය පථය, කිලිනොච්චි වව්නියා කොටුමා වර්ධන ව්‍යාපෘතිය, කැලණිය කොටුමා වර්ධන ව්‍යාපෘතිය සහ වාලච්චේන කිරිබත්කුඹුර කොටුමා වර්ධන ව්‍යාපෘතිය යන කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම සඳහා මිල ගණන් කැඳවීමේ ලේඛන සකස් කිරීම.

- පිවිතුරු බලශක්ති සහ ප්‍රවේශ වර්ධන ව්‍යාපෘතිය දෙවන කොටස, සම්ප්‍රේෂණ පද්ධති සවිමත් කිරීමේ සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය, නව ගාල්ල බලශක්ති සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය, සම්ප්‍රේෂණ පද්ධති ශක්තිකරණ කොටුමා උපපොළ ව්‍යාපෘතිය, සම්ප්‍රේෂණ පද්ධති ශක්තිකරණ සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය, පිවිතුරු බලශක්ති සහ ජාල කාර්යක්ෂමතා වර්ධන ව්‍යාපෘතිය පැකේජ් 1, 2 සහ 3, ඊසාන දිග බලශක්ති සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය, බියගම සහ රන්ටැඹේ තාරාපැවි ස්ථාපනය ආදී කර්තව්‍යයන් ආශ්‍රිත කටයුතු සැලසුම් සමාලෝචන සියුම් ලෙස පරීක්ෂාවට භාජන කිරීමට ඇතුළත් විය.

ඉහත සඳහන් ක්‍රියාකාරකම්වලට අමතර වශයෙන් මෙම වර්ෂය තුළ සම්ප්‍රේෂණ සැලසුම් ඒකකය ලංකා විදුලිබල මණ්ඩලය විසින් ප්‍රථමවරට හඳුන්වා දීමට අදහස් කරන කි.වො. 400 සම්ප්‍රේෂණ රැහැන සඳහා තාක්ෂණික පිරිවිතර සකස් කිරීම සහ මෙරට විවිධ ප්‍රදේශවල සිදු කළ පරීක්ෂණ පදනම් කොට ගෙන දූෂණ සිතියමක් සකස් කිරීම පිළිබඳ කටයුතුවල නිරත විය. අනාගත සම්ප්‍රේෂණ ව්‍යාපෘති පිරිවිතර සකස් කිරීමේ දී දූෂණ සිතියම උපකාරී වනු ඇත.

## ආරක්ෂණ සංවර්ධන ඒකකය

ලංකා විදුලිබල මණ්ඩලයේ සමස්ත බලශක්ති ජාලය සඳහා සම්බන්ධීකරණය කරන ලද විශ්වසනීය ආරක්ෂණ පද්ධතියක් වර්ධනය කිරීම ආරක්ෂණ සංවර්ධන ඒකකයේ ප්‍රධාන කර්තව්‍ය විය.

සම්ප්‍රේෂණ ජාලයේ පූර්ණ හෝ අර්ධ බිඳවැටීම් විශ්ලේෂණය කිරීම ද, පද්ධතියේ විශ්වසනීයත්වය වැඩි කිරීම සඳහා පිළියම් යෙදීමේ පිළිවෙත් හෝ වැළැක්වීමේ පිළිවෙත් ක්‍රියාත්මක කිරීම ද මෙම ඒකකයෙන් ඉටු වූ කාර්යයන් වේ.

විදුලි බලය බිඳවැටීම නිසා පූර්ණ වශයෙන් අඳුරෙහි නිමග්න වූ අවස්ථා වසර තුළ නොවීය. ඉතා විශාල අර්ධ බිඳවැටීම් දෙකක් 2014 මාර්තු 7 සහ 2014 මාර්තු 22 දින සිදු වූ අතර සුළු බිඳවැටීම් ස්වල්පයක් ද සිදු විය. බිඳවැටීම් විශ්ලේෂණය කොට පිළියම් යෝජනා කරන ලදී. පිළියම් සහ වැළැක්වීමේ පිළිවෙත් හඳුන්වා දීමෙන් පසු පද්ධති කාර්යසාධනයෙහි වැඩි දියුණුවක් නිරීක්ෂණය විය.

සම්ප්‍රේෂණය පුළුල් කිරීම සහ පුනරුත්ථාපන ව්‍යාපෘති සඳහා සහාය වීම සහ උපදේශන සේවා සැපයීම ආරක්ෂණ සංවර්ධන ඒකකයේ තවත් කාර්යයකි. නව ව්‍යාපෘති සහ පුනරුත්ථාපන ව්‍යාපෘතිවල ආරක්ෂණ විෂය පථය හඳුනා ගැනීම සහ කොන්ත්‍රාත්කරුවන් විසින් සපයන ලද ආරක්ෂක යෝජනා ක්‍රම / පරිස්ථිතිවල තාක්ෂණික පිරිවිතර සකස් කිරීම, ආරක්ෂණ පරිස්ථිති ගණන් බැලීම සහ හරි වැරදි බලා අනුමත කිරීම, මෙම වැඩවලට ඇතුළත් විය. මෙයට අමතරව සම්ප්‍රේෂණ සහ ජනන ව්‍යාපෘතිවල ප්‍රයෝජන ලබන්නන් ඒවා පිළිගැනීමට පෙර ඒවායේ ආරක්ෂණ යෝජනා ක්‍රම මෙහෙවරෙහි යෙදවීමට සම්බන්ධ විය යුතුය. එබඳු සේවාවන් මෙම වසර තුළ ඊසාන දිග බලශක්ති සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය, නොරොච්චොලෙයි ෂෂ වන සහ ෂෂෂ වන අදියර සම්ප්‍රේෂණ පද්ධති ශක්තිමත් කිරීම සහ කොටුමා උපපොළ ව්‍යාපෘතිය, ගාල්ල බලශක්ති සම්ප්‍රේෂණ සංවර්ධන නව ව්‍යාපෘතිය, හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතා වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සහ මහ කොළඹ සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ හානි අඩු කිරීමේ ව්‍යාපෘතිය යන වැඩසටහන්වලට ලබාදෙන ලදී.

බලශක්ති ජාලයෙහි කි.වො. 220 ආරක්ෂණ පද්ධතිය පුනරුත්ථාපනය ද, ආරක්ෂණ ඒකකය විසින් කළමනාකරණය කරන ලදී.

## පාරිසරික ඒකකය

ලංකා විදුලිබල මණ්ඩලය ඉටු කරන පාරිසරික කටයුතු වැඩි කොටසක් පරිසර ඒකකය කේන්ද්‍ර කොට ගෙන ඉටු විය. පාරිසරික ඒකකයේ ප්‍රධාන වගකීම් අතරට පහත සඳහන් දෑ ඇතුළත් විය. ලංකා විදුලිබල මණ්ඩලය ක්‍රියාත්මක කරන සංවර්ධන ව්‍යාපෘති සඳහා පාරිසරික අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලිය ගැන වගකීම දැරීම, ජාතික පාරිසරික පනත සහ (අදාළ නම්) අරමුදල් සපයන නියෝජිත ආයතනවල මාර්ගෝපදේශ අනුව පාරිසරික ආරක්ෂණ ලේඛන සකස් කිරීම, අදාළ පාරිසරික අනුමැතීන් ලබා ගැනීම සහ ලංකා විදුලිබල මණ්ඩලය සහ උනන්දුවන්නන් සඳහා පාරිසරික දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

පාරිසරික ඒකකය විසින් මෙම වසර තුළ ඉටු කරන ලද පාරිසරික බලපෑම් ඇගයීම / පාරිසරික බලපෑම් ඇස්තමේන්තුව පිළිබඳ ක්‍රියාවලිය ගැන දළ විස්තරයක් පහත දැක්වේ.

- යෝජිත කි.වො. 220 සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය (වව්නියාව හරහා අනුරාධපුර සිට මන්නාරම දක්වා - කි.මී. 130) සඳහා ද, යෝජිත (තුල්හිරිය සිට කෑගල්ල දක්වා - කි.මී. 21.5) කි.වෝ. 220 සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය සඳහා ද, යෝජිත (කිරිඳිවැල හරහා වේයන්ගොඩ සිට පාදුක්ක දක්වා - කි.මී. 42) කි.වො. 400 / කි.වො. 200 සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය සඳහා ද, යෝජිත (තුල්හිරිය සිට වේයන්ගොඩ දක්වා - කි.මී. 27.2) කි.වො. 132 සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය සඳහා ද පාරිසරික අනුමැතිය ලබා ගන්නා ලදී.

- යෝජිත (පොල්පිටිය සිට පන්නිපිටිය දක්වා - කි.මී. 75) කි.වො. 220 සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය සඳහා ද, යෝජිත (පොල්පිටිය සිට නව හබරණ දක්වා - කි.මී.

# සම්ප්‍රේෂණ අංශය

150) කි.වො. 132 සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය සඳහා ද, යෝජිත (පොල්පිටිය සිට කොත්මලේ දක්වා - කි.මී. 22.3) කි.වො. 220 සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය සඳහා ද, ජාතික පාරිසරික පනත යටතේ සකස් කරන ලද ආරම්භක පාරිසරික ඇස්තමේන්තු වාර්තාවල අවසන් කෙටුම්පත් මධ්‍යම පරිසර අධිකාරියට අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

- Agency Franciaise De Development මගින් අරමුදල් සපයන ලද සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතියෙහි විස්තරාත්මක සැලසුම මෙම ඒකකය සමග ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් සිදු කරනු ලැබිය.

## පද්ධති පාලන ශාඛාව

ගි.වො. පැය 659.0 ක පූර්ණ ජල විදුලිබල සංචිතයකින් යුක්තව 2014 වසර ආරම්භ විය. මෙය පූර්ණ ජල විදුලිබල සංචිතයෙන් 52.4% කි. 2013 වසර ආරම්භ වන විට ජල විදුලිබල සංචිතය පූර්ණ සංචිතයෙන් 84.3% ක් විය. ප්‍රථම මාස කීපය තුළ ජලය ගලා ඒම පෙර වසර හා සසඳන විට අඩු විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 2014 අප්‍රේල් 21 වන විට ජල විදුලි සංචිතය ගිග වොට් පැය 287.9 ක් විය. නිරිත දිග මෝසම් වැස්ස පෙර වසරෙහි මෙන් අඛණ්ඩව නොපැවති බැවින් 2014 අගෝස්තු 23 වන විට පැවති සංචිතය ගිග වොට් පැය 696.9 ක් පමණි. වසරෙහි අවසාන කාර්තුවේ දී ඊසාන දිග මෝසම් වැසි ආරම්භ වීමෙන් පසු ජල විදුලි ජලාශවලට ජලය ගලා ඒම වැඩි විය. 2014 දෙසැම්බර් 26 වන විට වාර්තා වූ උපරිම සංචිතය ගිග වොට් පැය 1,190.3 කි (එනම් පූර්ණ සංචිතයෙන් 94.58% කි). වර්ෂය අවසානයේ දී සංචිතය ගිග වොට් පැය 1,180.5 ක් විය.

වසර සඳහා ජනනය කරන ලද සම්පූර්ණ බලශක්තිය ගිග වොට් පැය 12,423 කි. මෙය 2013 සඳහා වාර්තා වූ සම්ප්‍රේෂණ බලශක්ති ජනනයට වඩා 4% ක වැඩි වීමකි.

ජනන මුසුව - 2014




2014 වසර තුළ උපරිම බලශක්ති ඉල්ලුම වාර්තා වී ඇත්තේ 2014 මැයි 19 දිනය. එදින වාර්තා වූ බලශක්ති ඉල්ලුම මෙ.වො. 2,151.7 කි.

දෛනික ජනන වක්‍රය 2014 මැයි 19




## පද්ධති පාලන මධ්‍යස්ථානය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය

2010 වර්ෂයේ දී සමාලෝචනයට භාජන වූ 2006 වර්ෂයේ සිදු කළ ශක්‍යතා අධ්‍යයනයක් පදනම් කරගෙන මෙම ව්‍යාපෘතිය යටතේ ජයවර්ධනපුර කෝට්ටේ නගරයෙහි නව ජාතික පද්ධති පාලන මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමට නියමිතය.

ආසන්න වශයෙන් කි.මී. 1,000 ක් දිග ඇති හඳුනාගත් වෝල්ට් 132 සහ කිලෝ වෝල්ට් 220 රැහැන් මත පවත්නා භූ තන්තු වෙනුවට දෘෂ්‍ය කෙඳි භූ තන්තු (Optical Fiber ground wire) ස්ථාපනය කරන ලදී. හඬ / දත්ත සන්නිවේදන පද්ධතිය ස්ථාපනය සඳහා කොන්ත්‍රාත්තුව 2013 දී ප්‍රදානය කර ඇත. උපකරණ සැලසුම් කිරීම සහ නිෂ්පාදනය වසර තුළ නිම වූ අතර, වසර අවසානයට පෙර උපකරණ විශාල ප්‍රමාණයක් ගෙනවිත් භාර දී තිබුණි. අවශ්‍ය දෘඩාංග සහ මෘදුකාංග පද්ධති සම්පාදනය කොට ජාතික පද්ධති පාලන මධ්‍යස්ථානය ස්ථාපනය සඳහා කොන්ත්‍රාත්තුව පිරිනමන ලදී. ව්‍යාපෘතියේ සම්පූර්ණ පිරිවැය ආසන්න වශයෙන් එක්සත් ජනපද ඩොලර් මිලියන 25 ක් වන අතර, මේ සඳහා අරමුදල් ආසියානු සංවර්ධන බැංකුවේ පිවිතුරු බලශක්ති සහ ප්‍රවේශ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ සපයනු ලැබේ.

## වත්කම් කළමනාකරණ ශාඛාව

සම්ප්‍රේෂණ ජාලයෙහි පිරියත සහ උපකරණවලින් උපරිම වාණිජ ප්‍රතිලාභ ලබා ගැනීම පිළිබඳ වගකීම සම්ප්‍රේෂණ අංශයේ වත්කම් කළමනාකරණ ශාඛාව උසුලයි. නඩත්තු ප්‍රතිපත්ති සහ ක්‍රියාදාම ස්ථාපනය කිරීම, පිරියත කාර්යසාධනය පසුවිපරම් කිරීම, මෙහෙයුම් ඵලදායීතාව සහතික කිරීම සඳහා නඩත්තු සැලසුම්කරණය සහ වත්කම්වල ආර්ථික ආයු කාලය උපරිම තත්ත්වයට පත්කිරීම එම ශාඛාවේ ප්‍රධාන කාර්යභාරයට ඇතුළත්ය. ශාඛාව ඉටු කළ තවත් වැදගත් වත්කම් කළමනාකරණ කාර්යයක් නම් වත්කම්වල ප්‍රයෝජනවත් කාලය අවසන් වූ පසු ඒවා ප්‍රතිස්ථාපනය සැලසුම් කිරීමයි.

# සම්ප්‍රේෂණ අංශය



කෙරවලපිටිය කොටුමා උපපොල - කි.වො. 220 වායු පරිවාරක වහරු (GIS)

කි.වො. 132 උඩිස් රැහැන් කි.මී. 2,206 ක් ද, භූගත කි.වො. 132 යටි බහන් කි.මී. 50 ක් ද, කි.වො. 220 උඩිස් සම්ප්‍රේෂණ රැහැන් කි.මී. 601 ක් ද, කි.වො. 220 භූගත යටි බහන් කි.මී. 2 ක් ද, අධි වෝල්ටීයතා සම්ප්‍රේෂණ ජාලයට ඇතුළත් විය. මේවාට අමතරව 2014 අවසාන වන විට කොටුමා උපපොල 66 ක් මෙහෙයුම් කටයුතුවල නිරතව සිටියේය.

## සම්ප්‍රේෂණ මෙහෙයුම් සහ නඩත්තු ශාඛාව

සම්ප්‍රේෂණ අංශයේ මෙහෙයුම් සහ නඩත්තු ශාඛාවේ ප්‍රධාන අරමුණ වන්නේ කොටුමා උපපොල මෙහෙයුම් කටයුතු කිරීම සහ රැහැන් සහ කොටුමා උපපොල උපකරණ කාර්යක්ෂම, විශ්වසනීය සහ ඵලදායී ලෙස පවත්වා ගැනීමයි.

## සම්ප්‍රේෂණ මෙහෙයුම් සහ නඩත්තුව - කොළඹ කලාපය

වසර තුළ ඉටු කළ ප්‍රධාන කාර්යයන් මෙසේය:

- ශ්‍රී ජයවර්ධනපුර කොටුමා උපපොලෙහි නව තාරාපැවි දෙකක් පරීක්ෂා කොට මෙහෙවරෙහි යෙදවීම.
- නව කි.වෝ. 132 සැරි සිඳු දෙකක් රත්මලාන කොටුමා පොලෙහි ස්ථාපනය කිරීම සහ කි.වෝ. 132 සැරි සිඳුවක් පන්නිපිටිය කොටුමා පොලෙහි ස්ථාපනය කිරීම.

## සම්ප්‍රේෂණ මෙහෙයුම් සහ නඩත්තුව - ගාල්ල කලාපය

වසර තුළ ඉටු කළ ප්‍රධාන කාර්යයන් මෙසේය:

- හම්බන්තොට කොටුමා පොලෙහි 16 එඒ තාරාපැවිය ප්‍රතිස්ථාපනය කොට ඒ වෙනුවට යෙදූ නව 31.5 MVA තාරාපැවිය ස්ථාපනයට සහ මෙහෙවරෙහි යෙදවීමට සහාය වීම සහ හම්බන්තොට කොටුමා උප පොලෙහි සමාන්තර පාලක පද්ධතියක් ඉදිකිරීම සම්පූර්ණ කිරීම.
- අම්බලන්ගොඩ කොටුමා උපපොල සහ මාතර කොටුමා පොලෙහි සිට පිළිවෙළින් මතුගම කොටුමා උපපොල සහ බෙලිඅත්ත කොටුමා පොලෙහි දුරස්ථ මෙහෙයුම් පහසුකම් ක්‍රියාත්මක කිරීම.

## සම්ප්‍රේෂණ මෙහෙයුම් සහ නඩත්තුව - අනුරාධපුර කලාපය

වසර තුළ ඉටු කළ ප්‍රධාන කාර්යයන් මෙසේය:

- පැරණි අනුරාධපුර කොටුමා උපපොලෙහි අංක 2 සහ 3 පෝෂකයන් (feeders) සඳහා නව කි.වෝ. 33 SF6 සැරිසිඳු ස්ථාපනය කිරීම.
- පුත්තලම කොටුමා පොලෙහි ධාරිත්‍රක බැංකු අංක 1 සඳහා නව ධාරිත්‍රක ස්ථාපනය කිරීම.

## සම්ප්‍රේෂණ මෙහෙයුම් සහ නඩත්තුව - නුවර කලාපය

වසර තුළ ඉටු කළ ප්‍රධාන කාර්යයන් මෙසේයථ

- කිරිබත්කුඹුර කොටුමා උපපොලෙහි සිට නාඋල සහ පල්ලේකැලේ කොටුමා උපපොලවල ද, අම්පාර කොටුමා උපපොල සිට වව්නතිවු කොටුමා උපපොලෙහි ද දුරස්ථ මෙහෙයුම් සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම.
- නුවර සහ අනුරාධපුර කලාපවල සැරිසිඳු ගමන සහ කාල නිශ්චය පරීක්ෂණ සාර්ථක ලෙස සැලසුම් කොට ක්‍රියාත්මක කරන ලදී.
- කොටුමා උපපොලවල තාප පිළිබිඹු මගින් හඳුනාගත් දෝෂ සහිත ස්ථාන පිළිසකර කිරීම. (උදා: අම්පාර 31.5 එඒ තාරාපැවියෙහි කි.වො. 33 බුෂ් සහ තුල්හිරිය කි.වෝ. 132 රැහැන් 2 (පහළ බස්නය).
- සියලුම තාරාපැවිවල තෙල්වල තෙතමන අන්තර්ගතය ගැන වාර්තා ලබා ගැනීම.

## සජීව රැහැන් නඩත්තු ඒකකය

සම්ප්‍රේෂණ මෙහෙයුම් සහ නඩත්තු ශාඛාවේ සජීව රැහැන් නඩත්තු ඒකකය කි.වෝ. 132 සහ කි.වෝ. 220 සම්ප්‍රේෂණ රැහැන්වල සියලු බිඳවැටීම් නිදොස් කිරීම සහ සජීව රැහැන් නඩත්තුව සිදු කළේය. ලංකා විදුලිබල මණ්ඩලය සම්ප්‍රේෂණ ජාලයට කි.වො. 132 සම්ප්‍රේෂණ රැහැන් කි.මී. 2,206 ක් ද, කි.වො. 220 සම්ප්‍රේෂණ රැහැන් කි.මී. 601 ක් ද අයත් ය. වර්ෂය තුළ සජීව රැහැන් නඩත්තු ඒකකය සම්ප්‍රේෂණ රැහැන් කුළුණු 4,772 ක් අතුරෙන් සම්ප්‍රේෂණ රැහැන් කුළුණු 3,087 ක් පරීක්ෂා කිරීම අවසන් කළේය.

# සම්ප්‍රේෂණ අංශය



කි.වෝ. 132 අවලම්භිත කුළුණුවල සජීවී රැහැන් නඩත්තුව
කි.වෝ. 220 අවලම්භිත කුළුණුවල සජීවී රැහැන් නඩත්තුව



කි.වෝ. 220 අවලම්භිත කුළුණුවල සජීවී රැහැන් නඩත්තුව
කි.වෝ. 132 අවලම්භිත කුළුණුවල සජීවී රැහැන් නඩත්තුව

## ආරක්ෂණ සහ මධ්‍යගත සේවා ඒකකය

සාමාන්‍ය පිළිවෙතක් සේ ඉටුවන ආරක්ෂක පිළයවන නඩත්තුව, පැරණි විද්‍යුත් යාන්ත්‍රික පිළියවන නව පිළියවන මගින් ප්‍රතිස්ථාපනය කිරීම, දෝෂ වාර්තාකරණය, ස්වයංචිකිත්සාව සහ සන්නිවේදන පහසුකම් සම්පාදනය, බිඳවැටීම්වල දී ධාරා තාරාපැවි පරීක්ෂා කිරීම සහ ඒවා ප්‍රතිස්ථාපනය කිරීම, පැරණි උපපොළ වර්ධනය කිරීම හා බැඳුන ව්‍යාපෘති වැඩ, ටැන් ඩෙල්ටා (Tan Delta) පරීක්ෂණ, දඟර ප්‍රතිරෝධ විශ්ලේෂණ පරීක්ෂණ, ද්‍රාවිත වායු විශ්ලේෂණ පරීක්ෂණ, උපුටු මාරුකුරුව පරීක්ෂා කොට නඩත්තු කිරීම, තාරාපැවිවල දෝෂ නිශ්චය කිරීම සහ විශේෂයෙන් තාරාපැවි ඇතුළු උපකරණ ආරක්ෂක පිළියවන මෙහෙයුම් නිසා ඒවා ඇනහිටින විට විස්තරාත්මක දෝෂ විශ්ලේෂණය සඳහා උපකරණ පරීක්ෂා කිරීම ආදිය මෙම ඒකකය විසින් වසර තුළ ඉටු කරන ලදී.

වසර තුළ ඉටු කළ ප්‍රධාන කර්තව්‍යයන් පහත දැක්වේ:

- පහත සඳහන් ස්ථානවල දුරස්ථ පිළියවන ප්‍රතිස්ථාපනය කරන ලදී.
  - ඇඹිලිපිටිය කෙළවරෙහි ඇඹිලිපිටිය - සමනලවැව සම්ප්‍රේෂණ රැහැන
  - සමනලවැව කෙළවරෙහි සමනලවැව - බලංගොඩ සම්ප්‍රේෂණ රැහැන
  - පන්නිපිටිය කෙළවරෙහි පන්නිපිටිය - රත්මලාන සම්ප්‍රේෂණ රැහැන
  - රන්ටැඹේ කෙළවරෙහි රන්ටැඹේ - බදුල්ල සම්ප්‍රේෂණ රැහැන
  - බෝවතැන්න කෙළවරෙහි බෝවතැන්න - උකුවෙල සම්ප්‍රේෂණ රැහැන
- සපුගස්කන්ද තාරාපැවි පිවිසුම් මාර්ග අංක 2 සහ 3 හි තාරාපැවි වෙනසියා පිළියවන ප්‍රතිස්ථාපනය.
- රත්මලාන, මාදම්පේ සහ බියගම කොටුමා උපපොළවල නව බැර හැරීමේ පිළියවන ස්ථාපනය.
- නව බැර හැරීමේ යෝජනා ක්‍රම යොදා ගැනීම.
- ශ්‍රී ජයවර්ධනපුර කොටුමා උපපොළෙහි නව තාරාපැවි අංක 1හි ආරක්ෂක යෝජනා ක්‍රමය මෙහෙවරෙහි යෙදවීම.
- හම්බන්තොට කොටුමාවෙහි නව තාරාපැවියෙහි ආරක්ෂක යෝජනා ක්‍රමය මෙහෙවරෙහි යෙදවීම.
- හලාවත නව උපපොළෙහි සහ දෙනියාය, කුලියාපිටිය, හම්බන්තොට සහ ශ්‍රී ජයවර්ධනපුර කොටුමා උපපොළවල තාරාපැවි පරීක්ෂා කිරීම.
- නෝරච්චෝලෙයි නව හලාවත රැහැනේ බේ පුවරු 1 සහ 2හි තනි කුළුණේ රැඳවූ ස්වයංක්‍රීය බැර කඩනය මෙමෙහෙවරෙහි යොදවා පරීක්ෂා කිරීම.

## බලශක්ති මිළදී ගැනුම් ශාඛාව

පද්ධති ඉල්ලුම සපුරාලීම සඳහා පුද්ගලික බලශක්ති නිෂ්පාදකයන්ගෙන් ප්‍රශස්ථ මිලකට විදුලිබලය මිලට ගැනීම බලශක්ති මිළදී ගැනුම් අංශයෙහි වගකීම විය.

වර්ෂය තුළ ස්වාධීන පෞද්ගලික බලශක්ති නිෂ්පාදකයන් හත් දෙනෙක් ලංකා විදුලිබල මණ්ඩලයට තාප බලය සැපයූහ. ඔවුන් සතුව පැවති පූර්ණ ධාරිතාව මෙ.වො. 771 කි. තව ද, මෙ.වො. 442 ක ධාරිතාවක් සහිත සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති 167 කින් ද බලශක්තිය මිලට ගන්නා ලදී.

මෙ.වො. 10ට අඩු ධාරිතාවෙන් යුත් සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති බලාගාරවලට පහත සඳහන් අය ක්‍රම දෙක යටතේ මුදල් ගෙවන ලදී.

- තාක්ෂණයට විශේෂිත වූ ස්ථර තුනකින් යුත් පිරිවැය පාදක කරගත් අය ක්‍රමය.
- වැළැක් වූ පිරිවැය පදනම් කරගත් අය ක්‍රමය.

## කුඩා ජල විදුලි බලාගාර සංවර්ධනය

වර්ෂය තුළ මෙ.වො. 23 ක සම්පූර්ණ ධාරිතාවක් සහිත කුඩා ජල විදුලිබල ව්‍යාපෘති 12 ක් ජාලයට එකතු විය. මේ අනුව ජාලය බලශක්තිය සපයන සම්පූර්ණ කුඩා ජල විදුලි බලාගාර සංඛ්‍යාව 142 දක්වා වැඩි වූ අතර එම බලාගාරවල පූර්ණ ධාරිතාව මෙ.වො. 293 කි. වසර තුළ ජනනය කළ සම්පූර්ණ බලශක්ති ප්‍රමාණය ගි.වො. පැය 890 කි. ලංකා විදුලිබල මණ්ඩලය මෙගා වො. 154 ක සමූහ ධාරිතාවක් ලබාගැනීම සඳහා බලශක්තිය මිලට ගැනීමේ ප්‍රමාණිත ගිවිසුම් 76 කට ලංකා විදුලිබල මණ්ඩලය අත්සන් තබා ඇත.

# සම්ප්‍රේෂණ අංශය

## ජෛව ස්කන්ධ බලශක්ති සංවර්ධනය

පවත්නා ජෛව ස්කන්ධ බලාගාර ප්‍රධාන වර්ග තුනකට අයත් විය. ඒවා වෘක්ෂලතා පාදක, නාගරික ද්‍රව්‍ය පාදක සහ කාර්මික අපද්‍රව්‍ය පාදක බලාගාර වේ. වසර තුළ කෘෂි සහ කර්මාන්ත අප ද්‍රව්‍ය පාදක බලාගාර එකක් ද, වෘක්ෂලතා පාදක බලාගාර එකක් ද, ජාලයට එකතු කරන ලදී. එම බලාගාර දෙකෙහි පූර්ණ ධාරිතාව මෙගා වොට් 7 ක් වූ අතර, පූර්ණ ජනනය ගිගා වොට් පැය 20 ක් විය. වසර අවසාන වන විට ලංකා විදුලිබල මණ්ඩලය මෙග වොට් 70 ක සමූහ ජනන ධාරිතාවකින් යුත් බලශක්තිය මිලට ගැනීමේ ප්‍රමාණිත ගිවිසුම් 14 කට අත්සන් තබා තිබුණි.



ජෛව ස්කන්ධ විදුලිබලි ව්‍යාපෘතියක්

## සුළං බලශක්ති සංවර්ධනය

වර්ෂය තුළ පූර්ණ ධාරිතාව මෙග වොට් 30 ක් වූ සුළං බලාගාර තුනක් ජාලයට එකතු විය. වසර අවසාන වන විට මෙග වොට් 114 ක සමූහ ධාරිතාවකින් යුත් සුළං බලාගාර 14 ක් ජාලයට එකතු වී තිබුණි. මෙග වොට් 11 ක පූර්ණ ධාරිතාවකින් යුත් තවත් බලාගාර දෙකක් සඳහා බලශක්තිය මිලට ගැනීමේ ප්‍රමාණිත ගිවිසුම්වලට අත්සන් තබන ලදී. වසර අවසාන වන විට මෙම බලාගාර ඉදිවෙමින් තිබුණි.




## බලශක්ති අලෙවිකරණ ශාඛාව

වර්ෂය තුළ බලශක්ති අලෙවිකරණ ශාඛාව ප්‍රධාන වශයෙන් සම්ප්‍රේෂණය සහ බෙදාහැරීමේ බලපත්‍රලාභීන් අතර විදුලිබල ගනුදෙනු මැනීම සහ ගිණුම්ගත කිරීම ආශ්‍රිත කටයුතුවල නිරත විය. බලපත්‍රලාභීන් වෙනුවෙන් අයකුම සකස් කිරීම සම්බන්ධයෙන් එම ශාඛාව වසර තුළ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසම සමග සමීපව කටයුතු කළේය.

අනුමත අයකුම ක්‍රමවේදය (2011 දී ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසම ඉදිරිපත් කළ නව තොග සැපයුම් අයකුමය) හඳුන්වා දීමත් සමග ලංකා විදුලිබල මණ්ඩලයේ සහ ලෙකෝ ආයතනයේ බෙදාහැරීමේ බලපත්‍රලාභීන් 4 දෙනා සඳහා තොග සැපයුම් ගනුදෙනු ගිණුම් වෙන වෙනම සකස් කිරීම බලශක්ති අලෙවිකරණ ශාඛාවට බාරදෙන ලදී. බලශක්ති ගනුදෙනු වාර්තා කිරීම සඳහා 0.2 පංතියේ නිරවද්‍යතාවයෙන් යුත් බලශක්ති මනු මිලට ගෙන සම්ප්‍රේෂණ බලපත්‍රලාභීන් සහ බෙදාහැරීමේ බලපත්‍රලාභීන් අතර මායිම්වල ස්ථාපනය කරන ලදී. අවශ්‍යතා පරිදි ඒවා ප්‍රකුම ලේඛනයට භාජන කොට බලශක්ති මනු කියවීම් මත තොග සැපයුම් ගනුදෙනු සටහන් සම්පාදනය කිරීමෙන් පසු එම සටහන් මාසිකව සෑම බෙදාහැරීමේ බලපත්‍රලාභියෙකුටම බෙදාහරින ලදී.

## සන්නිවේදන ශාඛාව

ජනන, සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ අංශවලට සහ ආශ්‍රිත ඒකකවලට කටහඬ සහ දත්ත සන්නිවේදන පහසුකම් ලබාදීම සන්නිවේදන ශාඛාවේ කාර්යභාරය විය. පද්ධති පාලන මධ්‍යස්ථානයට අධීක්ෂණ පාලන හා දත්ත උකහා ගැනීමේ පහසුකම් සැපයීම ද සන්නිවේදන ශාඛාව ඉටු කරයි.

බලශක්ති රැහැන් ද, බලශක්ති රැහැන් වාහක ද, කෙළවර උපකරණ ඇතුළු දෘෂ්‍ය තන්තු ජාල ද, බලශක්ති රැහැන් වාහක සහ PLTS දුරකථන පද්ධති ද, දුරකථන හුවමාරු සහ බලාගාර සහ කොටුමා උපපොළ ආශ්‍රිත පද්ධතිවලට ද අදාළ කටහඬ සහ දත්ත සන්නිවේදන ජාල පිළිබඳ වගකීම, සන්නිවේදන ශාඛාව උසුලයි.

## සන්නිවේදන සේවා ඒකකය

මෙම ඒකකය වසර තුළ පහත සඳහන් සේවාවන් ඉටු කළේය:

- නව දුරස්ථ පර්යන්ත ඒකක මොඩියුල කීපයක් ස්ථාපනය කිරීමෙන් පද්ධති පාලන මධ්‍යස්ථානයෙහි අභිරූපක නිරූපනය (mimic display) වැඩි දියුණු කිරීම.
- පද්ධති පාලන මධ්‍යස්ථානයෙහි අධීක්ෂණ පාලන සහ දත්ත ලබාගැනීමේ පද්ධතියට අයත් සේවා (server) පරිගණක ප්‍රතිස්ථාපනය.
- පද්ධති පාලන මධ්‍යස්ථාන නවීකරණ ව්‍යාපෘතියෙහි පාලන පහසුවට ඉඩ සැලසීමට සේවා ස්ථාන 7 ක පවත්නා දුරස්ථ පර්යන්ත සේවා 560 තත්ත්වයෙන් උසස් කිරීම.
- දත්ත ලබාගැනීම සහ නව පද්ධති පාලන මධ්‍යස්ථානයෙහි පාලන පහසුවට ඉඩ සැලසීම සඳහා රන්දෙනිගල සහ රන්ටැඹේ බලාගාරවල නව දුරස්ථ පර්යන්ත සේවා ස්ථාපනය කිරීම.

# සම්ප්‍රේෂණ අංශය

- පද්ධති පාලන නවීකරණ ව්‍යාපෘතියෙහි ප්‍රාථමික අධ්‍යයන සහ භූමි භාග සමීක්ෂණ සිදු කිරීම.

## සන්නිවේදන පද්ධති ඒකකය

වසර තුළ මෙම ඒකකය පහත සඳහන් කටයුතු ඉටු කළේය:

- පද්ධති පාලන මධ්‍යස්ථානයෙහි උපස්ථ සංඛ්‍යාත ගණකයක් (backup frequency counter) සැලසුම් කොට පිරිසකසා ස්ථාපනය කිරීම.
- උතුරු ජනනී බලාගාරයට කාරකාත්මක කටහඬ සන්නිවේදන පහසුකම් ලබාදීම.
- සමනලවැව, ලක්ෂපාන සහ බෝවතැන්න බලාගාරවල ද, හබරණ සහ පන්නිපිටිය කොටුමා උපපොලවල ද, SOPHO PABX සංනිවේදන ජාලය ස්ථාපනය කොට මෙහෙවරෙහි යෙදවීම.
- පල්ලේකැලේ සහ වව්නතිවු කොටුමා උපපොලවල දුරස්ථ මෙහෙයුම් සඳහා තන්තු දෘෂ්‍ය බහුපථකාරක (Fiber Optic Multiplexers) හරහා ස්ථානීය සන්නිවේදන ජාල (LAN) පහසුකම් ලබාදීම.
- තන්තු දෘෂ්‍ය බහුපථකාරක මගින්, කොත්මලේ, රන්ටැඹේ, ලක්ෂපාන, සමනලවැව සහ උකුවෙල බලාගාර දක්වා එෂඔක්ෂහ ජාලය පුළුල් කිරීම සඳහා දත්ත මාධ්‍ය ලබාදීම.

## සංඛ්‍යාත ධාරක ඒකකය (Digital Bearer Section)

වර්ෂය තුළ මෙම ඒකකය පහත සඳහන් කාර්යයන් ඉටු කළේය:

- නව UHF ජාලයක් ලබාදීම සහ නව ස්ථාපන ස්ථාන සඳහා භූමිභාග හඳුනා ගැනීමට නැගෙනහිර පළාතේ ක්ෂේත්‍ර පරීක්ෂණ පැවැත්වීම.
- වයඹ පළාතේ සන්නිවේදන පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා සහ හලාවත සහ පුත්තලම දක්වා ඉතා ඉහළ සංඛ්‍යාත (VHF) ආවරණය පුළුල් කිරීම සඳහා ඉතා ඉහළ සංඛ්‍යාත (VHF) පුනරාවර්තකයක් සහ සූක්ෂම තරංග ස්ථානයක් ස්ථාපනය කිරීම, උපකරණ කුටිය සැලසුම් කිරීම, පිරිසැකසුම සහ ස්ථාපනය සන්නිවේදන ශාඛාව විසින් ඉටු කරන ලදී.
- අධි ක්‍රියාකාරී ඇන්ටෙනා (high gain antennas) මගින් පවත්නා ඇන්ටනා ප්‍රතිස්ථාපනය කිරීමෙන් නමුණුකුල පුනරාවර්තකයෙහි ඵ්‍යහ ආවරණය වැඩි දියුණු කිරීම.
- අඛණ්ඩ බලශක්ති සැපයුමක් සහතික කිරීම සඳහා ඉපිලුම් ආරක්ෂක උපකරණ භූමිභාග කීපයක ස්ථාපනය කිරීම.
- ප්‍රදේශයේ ආවරණය වැඩි දියුණු කිරීම සඳහා මොණරාගල නව පහළ තරංග පථයක් සහිත පුනරාවර්තකයක් ස්ථාපනය සඳහා සුදුසු ස්ථානයක් හඳුනා ගැනීමට භූමිභාග සමීක්ෂණයක් සහ ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීම.

## ආයතනික සහ නියාමන සබඳතා ශාඛාව

අංශයෙහි පවත්නා මානව සම්පත් ප්‍රශස්ථ ලෙස භාවිතා කරමින් සම්ප්‍රේෂණ අංශය යෝග්‍ය පරිදි ක්‍රියා කිරීම සහතික කිරීමේ වගකීම වර්ෂය තුළ ආයතනික සහ නියාමන ශාඛාව සතු විය. සම්ප්‍රේෂණ අංශය සඳහා වාර්ෂික පිරිස් සැලැස්ම සහ ආයතනික සැලැස්ම සකස් කිරීම ආයතනික සහ නියාමන සබඳතා ශාඛාව විසින් ඉටු කරන ලදී.

විධායක සහ විධායක නොවන සේවක කොට්ඨාස දෙකෙහිම කාර්යසාධන ඇගයීම සහ සේවයෙහි උසස් කිරීම, පුහුණුව සහ කුසලතා වර්ධනය මෙම ශාඛාවෙහි ක්‍රියාදාමයට ඇතුළත්ය. තව ද, මෙම ශාඛාව විසින් පුහුණු ශාඛාවේ සහාය ඇතිව සේවකයන්ගේ වෘත්තීය දියුණුව වැඩි දියුණු කිරීම පිණිස දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් සංවිධානය කොට මෙහෙයවන ලදී.

## මානව සම්පත්

විධායක නිලධාරීන් 142 ක් ද, විධායක නොවන නිලධාරීන් 971 ක් ද ඇතුළත් වන සම්පූර්ණ වශයෙන් 1,113 දෙනෙකුගෙන් සමන්විත වූ කාර්යමණ්ඩලයක් සම්ප්‍රේෂණ අංශයේ සේවය කළේය. වර්ෂය තුළ බඳවා ගෙන අංශයට අනුගත කළ සේවක පිරිස 48 කි. අංශයෙන් විශ්‍රාම ලැබූ සේවක සංඛ්‍යාව 19 කි. 125 දෙනෙක් තම සේවයේ උසස් ශ්‍රේණිවලට උසස් කරනු ලැබීම හෝ ලංකා විදුලිබල මණ්ඩලයේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියට අනුව අදාළ වූ වැඩි වැටුප් පරිමාණයට පත්කිරීම සිදුවිය.

කුසලතා වැඩිදියුණු කිරීමේ අවශ්‍යතා අනුව අදාළ කාර්යමණ්ඩලයට දේශීය හෝ විදේශීය පුහුණුව ලබාදෙන ලදී. සැලසුම්කරණය, නිර්මාණකරණය, සන්නිවේදනය, උපපොල ස්වයංක්‍රීයකරණය, උපපොල සහ සම්ප්‍රේෂණ රැහැන් මෙහෙයුම සහ නඩත්තුව යන විෂයන් විදේශීය පුහුණුව විසින් ආවරණය කරන ලදී.

විදේශීය පුහුණු වැඩසටහන් / වැඩමුළුවලට සහභාගී වූ කාර්යමණ්ඩලයට තම අත්දැකීම් අන් අය සමග බෙදා ගැනීමට සැලැස් වූ සැසිවාර සෑම මසකම පවත්වනු ලැබීය.

ලංකා විදුලිබල මණ්ඩලය නිල වශයෙන් අනුග්‍රහය දැක්වූ සක්‍රීය සුබසාධන සමිතියක් මෙම අංශයෙහි විය. ණය ලබාදීම, ණය සහ ණය පහසුව සලස්වන සේවා මෙම සමිතිය මගින් සේවකයන්ට ලබාදී ඇත. කාර්යමණ්ඩලයේ විවිධ අංශ අතර සුහද සබඳතා ප්‍රවර්ධනය කරන ලදී.



# මෙහෙයුම්
## සමාලෝචනය




# බෙදාහැරීමේ අංශයන්

# බෙදාහැරීමේ අංශයන්

ලංකා විදුලිබල මණ්ඩලය ශ්‍රී ලංකාවේ 88% ක් ප්‍රදේශවල විදුලිබලය බෙදාහැරීම පිළිබඳ වගකීම දරන අතර, ඉතිරි කොටසෙහි විදුලිබලය බෙදාහැරීම ලංකා විදුලිබල මණ්ඩලයේ පරිපාලිත ආයතනයක් වන සීමාසහිත ලංකා විදුලිබල සමාගම සතුවේ.

ලංකා විදුලිබල මණ්ඩලයේ විදුලිබලය බෙදාහැරීමේ පද්ධතිය අංශ 4 ක් මගින් සිදුවේ. මෙලෙස බෙදාහැරීම් අංශ හතරක් ඇති කිරීමේ ප්‍රධාන අරමුණ වූයේ එකිනෙක අංශවල කාර්ය සාධනය අනෙක්වා සමග පොදුවේ සංසන්ධනය කිරීමටත්, එමගින් පාරිභෝගිකයන්ට වඩාත් කාර්යක්‍ෂම හා ගුණාත්මක විදුලි සැපයුමක් ලබාදීමටත්ය.

කිලෝවෝල්ට් 33 සහ කිලෝවෝල්ට් 11 මධ්‍යම වෝල්ටීයතා රැහැන් සහ වෝල්ට් 400 ට අඩු වෝල්ටීයතා රැහැන්වලින් බෙදාහැරීමේ ජාල පද්ධතිය සමන්විත වන අතර එය කොටුම උපපොල හරහා කිලෝවෝල්ට් 132 සහ කිලෝවෝල්ට් 220 සම්ප්‍රේෂණ ජාලයට සම්බන්ධවෙයි.

සෑම අංශයකම ප්‍රධානියා හැටියට සාමාන්‍යාධිකාරීවරයාට සෘජුවම වාර්තා කරන අතිරේක සාමාන්‍යාධිකාරීවරයකු සේවය කරයි. ඒ ඒ අංශයන් භාරයේ පවත්නා ප්‍රදේශ වෙන වෙනම පහත දැක්වේ.

බෙදාහැරීමේ අංශය 1 (DD1) : කොළඹ නගරය, වයඹ පළාත, උතුරු මැද පළාත සහ උතුරු පළාත.

බෙදාහැරීමේ අංශය 2 (DD2) : බස්නාහිර පළාත උතුර, මධ්‍යම පළාත සහ නැගෙනහිර පළාත.

බෙදාහැරීමේ අංශය 3 (DD3) : බස්නාහිර පළාත දකුණ II, ඌව සහ සබරගමුව පළාත.

බෙදාහැරීමේ අංශය 4 (DD4) : බස්නාහිර පළාත දකුණ I සහ දකුණු පළාත.

## අංශයේ මුඛ්‍ය පරමාර්ථ

1. අංශය තුළ ව්‍යවස්ථාපිත මට්ටම අනුව (statutory levels) අනුග්‍රාහකයන්ට විශ්වසනීය විදුලිබල සැපයුමක් ලබාදීම.
2. විදුලිබලය විකිණීම සහ සම්පූර්ණ වියදම උපයා ගතහැකි අයුරින් සැලසුම්ගත ආදායම ලබාගැනීම.
3. සියලු දෙනාටම විදුලිබලය සැපයීම.
4. සියලු පාර්ශ්වකරුවන්ගේ උපරිම තෘප්තිය සඳහා විදුලිය ආශ්‍රිත සියලු සේවා සැපයීම.
5. පද්ධති හානිය අවම කරන අතරම බෙදාහැරීමේ ජාල විශ්වසනීයත්වය සම්බන්ධයෙන් අන්තර්ජාතික මට්ටමට ළඟා වීම සඳහා විදුලිබලය බෙදාහැරීමේ පද්ධතිය සංවර්ධනය සහතික කිරීම.




බෙදාහැරීමේ අංශ

# බෙදාහැරීමේ අංශයන්

**2014 වර්ෂයේ සුවිශේෂ කාර්යසාධනයන්**

| විස්තරය | ඒකකය | බෙදාහැරීමේ අංශය 1 | බෙදාහැරීමේ අංශය 2 | බෙදාහැරීමේ අංශය 3 | බෙදාහැරීමේ අංශය 4 | මුළු ගණන |
|---|---|---|---|---|---|---|
| මිලට ගත් විදුලි ඒකක සංඛ්‍යාව | ගි.වො. පැය | 3,315.62 | 3,751.83 | 1,960.33 | 1,593.00 | 10,621.00 |
| අලෙවි කළ විදුලි ඒකක සංඛ්‍යාව | ගි.වො. පැය | 3,047.17 | 3,377.40 | 1,810.22 | 1,458.00 | 9,693.00 |
| අලෙවියෙන් ඉපැයූ ආදායම | රුපියල් මිලියන | 63,371.82 | 58,232.07 | 31,791.00 | 26,350.00 | 179,745.00 |
| අලෙවි කිරීමේ සාමාන්‍ය මිල | රුපියල් | 20.79 | 17.24 | 17.39 | 18.07 | 18.54 |
| බෙදාහැරීමේ හානිය | % | 8.1 | 10.0* | 7.7 | 8.5 | 8.7 |
| ලබාගත හැකි තත්ත්වය | මාස | 0.95 | 0.95 | 0.90 | 0.79 | 0.90 |
| තොග පාරිභෝගිකයන් සංඛ්‍යාව | සංඛ්‍යාව | 3,540 | 2,828 | 1,654 | 1,388 | 9,417 |
| සාමාන්‍ය පාරිභෝගිකයන් සංඛ්‍යාව | සංඛ්‍යාව | 1,500,913 | 1,870,001 | 1,104,507 | 932,692 | 5,408,113 |
| වර්ෂය තුළ ලබාදුන් නව සබඳතා සංඛ්‍යාව | සංඛ්‍යාව | 72,429 | 64,866 | 43,313 | 26,183 | 206,791 |

* සමහර පෝෂකයන් (feeders) සඳහා මායිම් මනු නොතිබුණ බැවින්

## මෙහෙයුම් ව්‍යුහය

කාර්යභාරය අනුව එක් බෙදාහැරීමේ අංශයක් ශාඛා කීපයකට බෙදා ඇත. එනම්, ව්‍යාපෘති සහ බර යන්ත්‍රෝපකරණ නඩත්තුව, සැලසුම්කරණය සහ සංවර්ධනය සහ වාණිජ යන ආයතනික ශාඛා යනුවෙනි. මෙයට අමතරව සෑම අංශයක්ම පළාත්වලට බෙදන ලදුව එක් ශාඛාවක් සහ පළාතක් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයෙකු යටතේ පවතී. එක් පළාතක් ප්‍රදේශවලට බෙදා සෑම ප්‍රදේශයක්ම ප්‍රාදේශීය විදුලිබල ඉංජිනේරුවරයෙකු යටතට පත්කර ඇත. සෑම ප්‍රදේශයක්ම තව දුරටත් පාරිභෝගික සේවා මධ්‍යස්ථානවලට බෙදා එම මධ්‍යස්ථාන විදුලි අධිකාරීන් යටතට පත්කර තිබේ.

## ආදායම් එකතු කිරීමේ මධ්‍යස්ථාන

වර්ෂය තුළ ලංකා විදුලිබල මණ්ඩලය සහ පහත දැක්වෙන නියෝජිත ආයතන එකතු කිරීමේ මධ්‍යස්ථාන මෙහෙය වූහ:

සැනෙකින් යාවත්කාලීනවන ගෙවීම් කවුළු (Online Real Time Payment Counters) ලංකා විදුලිබල මණ්ඩලයේ ගෙවීම් කවුළු, මහජන බැංකුවේ ශාඛා, කාගිල්ස් ෆුඩ්සිටි වෙළෙඳසැල්, eZ-Cash (Dialog), M-Cash (Mobitel)

අනෙකුත් ස්ථාන: තැපැල් කන්තෝරු සහ නියෝජිතවරු 23 ක්

**බෙදාහැරීමේ යටිතල ව්‍යුහය**

| විස්තරය | ඒකක | බෙදාහැරීමේ අංශය 1 | බෙදාහැරීමේ අංශය 2 | බෙදාහැරීමේ අංශය 3 | බෙදාහැරීමේ අංශය 4 | මුළු ගණන |
|---|---|---|---|---|---|---|
| කිලෝවෝල්ට් 33 බෙදාහැරීමේ රැහැන් | කි.මී. | 9,320 | 7,472 | 7,948 | 4,488 | 29,228 |
| කිලෝවෝල්ට් 11 බෙදාහැරීමේ රැහැන් | කි.මී. | 770 | 398 | 40 | 296 | 1,504 |
| කිලෝවෝල්ට් 11 භූගත බහන් | කි.මී. | 630 | 120 | 5 | 22 | 777 |
| කිලෝවෝල්ට් 33/11 ප්‍රාථමික උපපොළ | සංඛ්‍යාව | 37 | 42 | 11 | 33 | 123 |
| අඩු වෝල්ටීයතා බෙදාහැරීමේ රැහැන් | කි.මී. | 35,200 | 34,808 | 28,190 | 24,325 | 122,524 |
| අඩු වෝල්ටීයතා භූගත බහන් | කි.මී. | 580 | 66 | 6 | 3 | 655 |
| අඩු වෝල්ටීයතා බෙදාහැරීමේ උපපොළ | සංඛ්‍යාව | 8,600 | 7,364 | 5,215 | 4,406 | 25,585 |

**බෙදාහැරීමේ අංශ ව්‍යාප්ත වී ඇති ආකාරය**

| විස්තරය | බෙදාහැරීමේ අංශය 1 | බෙදාහැරීමේ අංශය 2 | බෙදාහැරීමේ අංශය 3 | බෙදාහැරීමේ අංශය 4 |
|---|---|---|---|---|
| ප්‍රදේශ සංඛ්‍යාව | 17 | 22 | 13 | 10 |
| පාරිභෝගික සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාව | 58 | 77 | 42 | 37 |
| එකතු කිරීමේ මධ්‍යස්ථාන සංඛ්‍යාව | 12 | 16 | 8 | 10 |
| පාලක මධ්‍යස්ථාන සංඛ්‍යාව | 4 | 3 | 2 | 2 |

# බෙදාහැරීමේ අංශයන්

## බෙදාහැරීමේ අංශවල මෙහෙයුම් දත්ත










### අංශවල පාරිභෝගික ගිණුම්




| | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|---|
| DD1 | 1,126,805 | 1,188,702 | 1,265,463 | 1,351,767 | 1,432,024 | 1,504,453 |
| DD2 | 1,368,479 | 1,420,930 | 1,488,745 | 1,563,349 | 1,807,970 | 1,872,836 |
| DD3 | 1,001,849 | 1,055,703 | 1,116,039 | 1,188,156 | 1,062,848 | 1,106,161 |
| DD4 | 783,034 | 815,087 | 847,199 | 876,588 | 907,917 | 934,080 |

## වර්ෂය තුළ විදුලිය සපයා ඇති මට්ටම්

| බෙදාහැරීමේ අංශය | පළාත | විදුලිය සපයා ඇති මට්ටම (%) 2013 | 2014 |
|---|---|---|---|
| බෙදාහැරීමේ අංශය 1 | උතුර | 82.0 | 92.0 |
| | වයඹ | 95.0 | 97.0 |
| | උතුරු මැද | 93.0 | 95.5 |
| | කොළඹ නගරය | 100.0 | 100.0 |
| බෙදාහැරීමේ අංශය 2 | බස්නාහිර උතුර | 100.0 | 100.0 |
| | මධ්‍යම | 94.0 | 99.0 |
| | නැගෙනහිර | 84.0 | 88.6 |
| බෙදාහැරීමේ අංශය 3 | බස්නාහිර - දකුණ II | 99.0 | 99.2 |
| | ඌව | 89.0 | 94.0 |
| | සබරගමුව | 94.3 | 99.4 |
| බෙදාහැරීමේ අංශය 4 | බස්නාහිර - දකුණ I | 99.6 | 99.6 |
| | දකුණ | 99.5 | 99.5 |

## ග්‍රාමීය ප්‍රදේශවලට විදුලිබලය සැපයීම

100% ක් ජනතාවට විදුලිය සැපයීමේ අරමුණ ඇතිව ලංකා රජය සහ ලංකා විදුලිබල මණ්ඩලය ග්‍රාමීය විදුලිබල සැපයීමේ

## අයකුම වර්ගය අනුව සම්පූර්ණ ගිණුම් සංඛ්‍යාව

| අයකුම වර්ගය | බෙදාහැරීමේ අංශය 1 | බෙදාහැරීමේ අංශය 2 | බෙදාහැරීමේ අංශය 3 | බෙදාහැරීමේ අංශය 4 | මුළු ගණන |
|---|---|---|---|---|---|
| ගෘහස්ත | 1,291,818 | 1,652,778 | 986,835 | 836,803 | 4,768,234 |
| ආගමික | 11,202 | 11,359 | 5,915 | 4,699 | 33,175 |
| කර්මාන්ත | 26,595 | 14,016 | 7,977 | 5,989 | 54,577 |
| හෝටල් | 123 | 181 | 51 | 107 | 462 |
| රාජ්‍ය | 119 | 110 | 51 | 1,406 | 1,686 |
| පොදු කාර්යය | 174,596 | 194,392 | 105,332 | 85,076 | 559,396 |
| මුළු ගණන | 1,504,453 | 1,872,836 | 1,106,161 | 934,080 | 5,417,530 |

# බෙදාහැරීමේ අංශයන්

| ඉදිකිරීම් වැඩ පිළිබඳ කාර්යසාධනය | | | | | | |
|---|---|---|---|---|---|---|
| බෙදාහැරීමේ අංශය | පළාත | අධි වෝල්ටීයතා කි.මී. | අඩු වෝල්ටීයතා කි.මී. | බෙදාහැරීමේ උපපොළ | අඩු වෝල්ටීයතා අනුවර්තනය කි.මී. | පිරිවැය |
| බෙදාහැරීමේ අංශය 1 | උතුර | 944 | 3,640 | 452 | | 2,627 |
| | වයඹ | 256 | 1,157 | 243 | 96 | 2,840 |
| | උතුරු මැද | 64 | 542 | 84 | 35 | 1,252 |
| | කොළඹ නගරය | 14 | 23 | 38 | 2 | 6,000 |
| බෙදාහැරීමේ අංශය 2 | බටහිර දකුණ | 14 | 71 | 59 | 203 | 158 |
| | මධ්‍යම | 28 | 45 | 9 | 35 | 188 |
| | නැගෙනහිර | 106 | 669 | 127 | 36 | 1,663 |
| බෙදාහැරීමේ අංශය 3 | බටහිර දකුණ II | 12 | 35 | 10 | 8 | 195 |
| | ඌව | 190 | 1,017 | 99 | 41 | 1,889 |
| | සබරගමුව | 138 | 846 | 108 | 189 | 1,770 |
| බෙදාහැරීමේ අංශය 4 | බටහිර දකුණ I | 13 | 63 | 56 | 7 | 311 |
| | දකුණ | 28 | 59 | 71 | 208 | 397 |

| ගැමි විදුලියන වැඩ පිළිබඳ කාර්ය සාධනය | | | | | |
|---|---|---|---|---|---|
| බෙදාහැරීමේ අංශය | පළාත | යෝජනා ක්‍රම | | ව්‍යාප්ති කටයුතු | |
| | | අවසන් කළ වැඩ සංඛ්‍යාව | පිරිවැය ශ්‍රී ලංකා රු.මි. | අවසන් කළ වැඩ සංඛ්‍යාව | පිරිවැය ශ්‍රී ලංකා රු.මි. |
| බෙදාහැරීමේ අංශය 1 | උතුර | 452 | 4,520 | 452 | 678 |
| | වයඹ | 142 | 1,581 | 1,260 | 640 |
| | උතුරු මැද | 57 | 463 | 1,069 | 647 |
| | කොළඹ නගරය | 100% විදුලිය සැපයීම අවසන්ය | | | |
| බෙදාහැරීමේ අංශය 2 | බටහිර දකුණ | - | - | 304 | 86.074 |
| | මධ්‍යම | 132 | 853.88 | 2,146 | 1,067 |
| | නැගෙනහිර | 43 | 727.19 | 369 | 535.529 |
| බෙදාහැරීමේ අංශය 3 | බටහිර දකුණ II | 2 | 10.29 | 61 | 36.15 |
| | ඌව | 91 | 1,123.10 | 484 | 651.10 |
| | සබරගමුව | 43 | 482.22 | 1,221 | 527.07 |
| බෙදාහැරීමේ අංශය 4 | බටහිර දකුණ I | - | - | 181 | 646.6 |
| | දකුණ | 1 | 6.2 | 265 | 56.72 |

යෝජනා ක්‍රමවලට අරමුදල් සපයයි.

## බෙදාහැරීමේ අංශයෙහි නිහිත (embedded) ජනක බලාගාර

කුඩා ජල විදුලි බලාගාර, සුළං බලාගාර, ජෛවස්කන්ධ බලාගාර සහ ව්‍යාෂලතා බලාගාර ඇතුළු මෙ.වො. 450 ක් පමණ නිහිත ජනක හැටියට බෙදාහැරීමේ අංශයෙහි වර්ෂය අවසාන වන විට මෙහෙවරෙහි යොදවා ඇත.

# බෙදාහැරීමේ අංශය 1

## මෙහෙයුම් ප්‍රදේශය

බෙදාහැරීමේ අංශය 1 හි මෙහෙයුම් ප්‍රදේශය පරිපාලන පළාත් 4 කින් සමන්විත ය. එනම්, වයඹ, උතුරු මැද, උතුර සහ කොළඹ නගර ප්‍රදේශයයි. ඒවා තවදුරටත් ප්‍රාදේශීය ඒකක 17 කට බෙදා ඇත.

උතුරු පළාත ප්‍රාදේශීය ඒකක 3 කට බෙදා ඇත. එනම්, යාපනය, කිලිනොච්චිය සහ වව්නියාවයි. උතුරු මැද පළාත ද ප්‍රාදේශීය ඒකක 3 කට බෙදා ඇත. එනම්, අනුරාධපුර, කැකිරාව සහ මින්නේරිය යි. වයඹ පළාත ප්‍රාදේශීය ඒකක 7 කට බෙදා ඇත. එනම්, හලාවත, කුරුණෑගල, කුලියාපිටිය, වාරියපොළ, වෙන්නප්පුව, පුත්තලම සහ නාරම්මල ය. කොළඹ නගරය, කොළඹ උතුර, කොළඹ දකුණ, කොළඹ බටහිර සහ කොළඹ නැගෙනහිර යන ප්‍රාදේශීය ඒකක 4 ට බෙදා ඇත.

## වසරේ වැදගත් සිදුවීම්

### පාරිභෝගිකයන්ට සැපයූ වැඩි දියුණු කළ සේවා

- ඇමතුම් මධ්‍යස්ථාන

  වයඹ පළාත, උතුරු මැද පළාත සහ උතුරු පළාතෙහි පාරිභෝගිකයන්ට වඩා හොඳ සේවයක් ලබාදීම සඳහා ඇමතුම් මධ්‍යස්ථාන විවෘත කරන ලදී.


වයඹ පළාත


උතුරු පළාත

- E - නගරය (E-city)

  පාරිභෝගිකයන්ට නූතන පහසුකම් සැපයීම සඳහා සියලුම පාරිභෝගික සම්බන්ධක (interfaces) වෙනස් කරන ලදී. අනුරාධපුර සහ මන්නාරම ප්‍රදේශවල පාරිභෝගිකයන්ට වඩා හොඳ සේවයක් ලබාදීම සඳහා E - නගර මධ්‍යස්ථාන (E-city) දෙකක් ස්ථාපනය කරන ලදී.

- දොරින් දොරට සේවය ලබාදීම

  පාරිභෝගිකයන්ට උපදුවයන්ගෙන් තොර සේවයක් ලබාදීම පිණිස කොළඹ සහ පදවිය නගරයේ ජංගම සේවා පද්ධතියක් ඇරඹින.

## වර්ෂය තුළ කාර්යය සාධනයන්

වයඹ පළාත විසින් 2012 දී අදාළ ක්‍රියාරම්භයෙන් පසුව 2014 මැයි මාසයේ දී නාරම්මල ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු කාර්යාලයට ISO 9001:2008 ගුණාත්මක කළමනාකාර පද්ධති සහතිකය ලැබුණි.



නොච්චියාගම කණ්ඩායම

ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය විසින් 2012/2014 කාලය සඳහා පැවැත් වූ ත්‍යාග තරඟයේ දී කුරුණෑගල පොතුහැර පාරිභෝගික සේවා මධ්‍යස්ථානය සහ හලාවත මාහෝ පාරිභෝගික සේවා මධ්‍යස්ථානය සේවා අංශයේ (කුඩා පරිමාණ) දෙවන ස්ථාන දිනාගත්තේය. 2012/2013 වකවානුව සඳහා වන ජාතික ඵලදායිතා ත්‍යාග තරඟයේ දී අනුරාධපුර නොච්චියාගම පාරිභෝගික සේවා මධ්‍යස්ථානය ඵලදායීතාව සඳහා විශේෂ ත්‍යාගයක් හිමිකර ගත්තේය.

# බෙදාහැරීමේ අංශය 2

## මෙහෙයුම් ප්‍රදේශය

බෙදාහැරීමේ අංශය 2 හි මෙහෙයුම් ප්‍රදේශය වූයේ බස්නාහිර පළාත උතුර, මධ්‍යම පළාත සහ නැගෙනහිර පළාතයි. මෙම මෙහෙයුම් ප්‍රදේශය පරිපාලන පළාත් වන මධ්‍යම පළාත සහ නැගෙනහිර පළාත ද, බස්නාහිර සහ සබරගමුව පළාත්වල කොටස් ද, ආවරණය කරයි.

නැගෙනහිර පළාත ප්‍රාදේශීය ඒකක 4කට බෙදා ඇත. එනම්, අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමලය සහ කල්මුනේ ය. කෑගල්ල, මාවනැල්ල, මහනුවර නගරය, පේරාදෙනිය, කුණ්ඩසාලේ, කටුගස්තොට, ගලගෙදර, මාතලේ, දඹුල්ල, නුවරඑළිය, ගිනිගත්හේන සහ නාවලපිටිය මධ්‍යම පළාතේ මෙහෙයුම් පථයට යටත් විය. බස්නාහිර පළාත උතුර ප්‍රාදේශීය ඒකක 6 කට බෙදා තිබුණි. එනම්, ගම්පහ, කැලණිය, මීගමුව, ජා ඇල, දිවුලපිටිය සහ වේයන්ගොඩයි.

මෙහෙයුම් සේවා පහසු කිරීම සඳහා බෙදාහැරීමේ අංශය 2 යටතේ ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු කාර්යාල 22 ක් ද, පාරිභෝගික සේවා මධ්‍යස්ථාන 76 ක් ද විය.

## ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ ඇමතුම් මධ්‍යස්ථානය

ප්‍රධාන කාර්යාලයේ ඇමතුම් මධ්‍යස්ථානයෙහි (1987) සියලුම පරිපාලන සහ මූල්‍ය කටයුතු බෙදාහැරීමේ අංශය 2 හි වාණිජ සහ ආයතනික ශාඛාව විසින් මෙහෙයවන ලදී. කාලීන නව්‍යතාවලින් යුත් සන්නිවේදන යටිතල පහසුකම් සහ පෞද්ගලික ස්වයංක්‍රීය ශාඛා හුවමාරුවකින් (PABX) යුක්තව මධ්‍යස්ථානය තත්ත්වයෙන් උසස් කරන ලදී. තව ද, පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා ඉටු කරන අන්තර් ක්‍රියාකාරීත්ව කටහඬ ප්‍රතිචාර පද්ධතියක් වර්ෂය තුළ දී ස්ථාපනය කරන ලදී. මෙය සියලු පළාත් ඇමතුම් මධ්‍යස්ථාන අන්තර් ක්‍රියාකාරී තත්ත්වයට පත්කරනු ඇත.

## බලශක්ති කළමනාකරණ ක්‍රියාකාරකම්

### දැනුවත් කිරීමේ වැඩසටහන් සහ බලශක්ති විගණනය

තොග වශයෙන් බලශක්තිය සපයන පාරිභෝගිකයන්ගේ පරිශ්‍රයන්හී පාරිභෝගික දැනුවත් කිරීමේ වැඩසටහන් සහ බලශක්ති විගණනයන් සිදුකරන ලදී.





### බලශක්ති සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්

නැගෙනහිර පළාතේ පාසල් සහ විශ්වවිද්‍යාලවල බලශක්ති සංරක්ෂණය ගැන දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.



## වසරේ වැදගත් සිදුවීම්

### විදුලිය සබඳතා ලබාදීම සඳහා කාර්යක්ෂම සේවයක්

වර්ෂය තුළ නැගෙනහිර පළාතේ එක් දිනයක් තුළ විදුලිය සබඳතාව ලබාදීම සහ දුරස්ථ ප්‍රදේශවල පාරිභෝගික පැමිණිලි ගැන ක්‍රියා කිරීම සඳහා ජංගම සේවා පැවැත්විණ.

වර්ෂය තුළ දිවුලපිටිය ප්‍රදේශයේ එක් දිනයක් තුළ විදුලිය සැපයීමේ සේවය ආරම්භ විය.

### ගිනිගත්හේන ප්‍රදේශයෙහි නෝර්ටන් බ්‍රිජ් පාරිභෝගික සේවා මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණය කිරීම

අවුරුදු 40 ක් පමණ පැරණි නෝර්ටන් බ්‍රිජ් පාරිභෝගික සේවා මධ්‍යස්ථානය බාහිර කොන්ත්‍රාත්කරුවන්ගේ සහාය නොමැතිව ලංකා විදුලිබල මණ්ඩල කාර්යමණ්ඩලය විසින් ප්‍රතිසංස්කරණය කරන ලදුව 2014 දී විවෘත කරන ලදී.

### E-නගරය (E-city)

වර්ෂය තුළ කෑගල්ල සහ වේයන්ගොඩ E-නගර (E-city) දෙකක් ස්ථාපනය කරන ලදී.

### නව ගෙවීම් කවුළු (POS)

ගම්පහ සහ මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවල නව ගෙවීම් කවුළු (POS) මධ්‍යස්ථාන දෙකක් 2014 දී විවෘත කරන ලදී.

# බෙදාහැරීමේ අංශය 3

## මෙහෙයුම් ප්‍රදේශය

සබරගමුව පළාත ද, ඌව පළාත ද, බස්නාහිර පළාත දකුණ II යනුවෙන් හැඳින්වෙන බස්නාහිර පළාතේ කොටසක් ද, ආවරණය කරන බෙදාහැරීමේ බලපත්‍රලාභීට හිමි සේවා ප්‍රදේශය බෙදාහැරීමේ අංශය 3 (DD3) යනුවෙන් හැඳින්වේ.

බස්නාහිර පළාත දකුණ II, ප්‍රාදේශීය ඒකක 5 කට බෙදා තිබුණි. ඒවා නම්, බණ්ඩාරගම, හෝමාගම, ශ්‍රී ජයවර්ධනපුර, අවිස්සාවේල්ල සහ හොරණයි. සබරගමුව පළාත ද ප්‍රාදේශීය ඒකක 5 කට බෙදා තිබුණි. ඒවා නම් රත්නපුර, කහවත්ත, රුවන්වැල්ල, ඇහැලියගොඩ සහ ඇඹිලිපිටියයි. එම කොට්ඨාසය රත්නපුර දිස්ත්‍රික්කය සම්පූර්ණ වශයෙන් ද, කෑගල්ල දිස්ත්‍රික්කයෙන් කොටසක් ආවරණය කළේය. බදුල්ල, දියතලාව, මොණරාගල ඇතුළු බදුල්ල සහ මොණරාගල පරිපාලන දිස්ත්‍රික්ක ඌව පළාතට අයිති විය.

මේ අනුව මෙහෙයුම් පහසුව ඇති කොට පාරිභෝගිකයන් සඳහා කාර්යක්ෂම ඵලදායී සේවයක් ඉටු කිරීම සඳහා මෙම අංශය යටතේ ප්‍රාදේශීය කාර්යාල 13 ක් ද, පාරිභෝගික සේවා මධ්‍යස්ථාන 42 ක් ද පිහිටුවා තිබේ.

තව ද, අංශයේ මෙහෙයුම් සිදුකිරීම සඳහා අවශ්‍ය ආධාරක සේවා ලබා දීමට වෙනම ශාඛා තුනක් ද පිහිටුවා තිබුණි. එනම්, ව්‍යාපෘති සහ බැර නඩත්තු ශාඛාව, සැලසුම් සහ සංවර්ධන ශාඛාව සහ වාණිජ සහ ආයතනික ශාඛාව වේ.

## විදුලමු ලංකා රත්නපුරය ව්‍යාපෘතිය

රත්නපුරය දිස්ත්‍රික්කය සපුරා 100% ක් පාරිභෝගිකයන්ට විදුලිය සැපයීම සාක්ෂාත් කර ගැනීම උදෙසා 2008 වසරේ දී මෙම ව්‍යාපෘතිය ආරම්භ විය. ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් කළමනාකරණය කරන ලද මෙම ව්‍යාපෘතියෙහි විෂය පථය පහත සඳහන් පරිදි විය.

1. කි.වෝ. 33 අධිසැර රැහැන් කි.මී. 71 ක් සහ වහරු අටළු අංගන 3 ක් ඉදිකිරීම.

2. අධිසැර රැහැන් කි.මී. 1,000 ක්, අඩු සැර රැහැන් කි.මී. 2,100 ක් සහ බෙදාහැරීමේ උප මධ්‍යස්ථාන 550 ක් ඉදිකිරීම.

## බෙදාහැරීමේ දී සිදුවන හානි අඩු කිරීම

බෙදාහැරීමේ අංශය 3 හි බෙදාහැරීමේ හානි 2013 වසරේ දී 9.8%ක් වුව ද, එය 8.4% දක්වා 2014 වසර අවසාන වන විට අඩු කළ හැකි විය. බෙදාහැරීමේ දී සිදුවන හානි අඩු කළ හැකි වූයේ ප්‍රබල පසුවිපරම් සහ ඉකුත් වසර කීපය තුළ ක්‍රියාත්මක කළ හානි අඩු කිරීමේ වැඩසටහන්වල ප්‍රතිඵල වශයෙනි.

බලශක්ති කළමනාකරණ ඒකකය වසර තුළ හානි අඩු කිරීම සඳහා තොග සැපයුම් උපපොළ පසුවිපරමට භාජන කළ අතර පුනරුත්ථාපන ක්‍රියාකාරකම් සිදු කළේය. බස්නාහිර පළාත දකුණ ෂෂ හි බලශක්ති කළමනාකරණ ඒකකය සොරකම් සහ නීති විරෝධී ලෙස බලශක්තිය ලබා ගැනීම් ගැන පරීක්ෂණ පැවැත්වූයේය. දෝෂ සහිත මනු හඳුනා ගැනීම සහ සොරකම් ගැන දැන ගැනීමට මනු පරීක්ෂණ කටයුතු සිදුවිය.

බෙදාහැරීමේ හානි අඩු කිරීම, ජාල යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සහ ක්ෂේත්‍ර සේවකයින්ගේ තාක්ෂණික කුසලතා වර්ධනය කිරීම සඳහා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බස්නාහිර පළාත දකුණ II) විසින් පත් කරන ලද ඉංජිනේරුවරුන් කණ්ඩායමක් විසින් ක්ෂේත්‍ර සේවකයන් සඳහා වැඩෙහි යෙදෙමින් පුහුණුව ලබන උපපොළ නඩත්තු වැඩසටහනක් සංවිධානය කරන ලදී. ආරම්භයේ දී ප්‍රදේශ ස්වල්පයක ආරම්භ කළ මෙම වැඩසටහන 2015 වසර අවසන් වන විට උපපොළ 180 ක් ඇතුළත් කර ගැනීමේ ඉලක්කය ඇතිව වේගයෙන් ව්‍යාප්ත කරන ලදී.



| අරමුදල් වර්ගය | වැඩ සංඛ්‍යාව | වැඩ අන්තර්ගතය | | | පිරිවැය රු. මි. |
|---|---|---|---|---|---|
| | | අධිසැර රැහැන් (කි.මී.) | අඩුසැර රැහැන් (කි.මී.) | තාරපැවි | |
| විදුලමු ලංකා රත්නපුර ව්‍යාපෘතිය | 14 | - | 5.5 | - | 5.1 |
| ඉරානය (ද්‍රව්‍ය පමණයි) | 1414 | 55.9 | 321.2 | 29 | 584.7 |
| මුළු ගණන | 428 | 55.9 | 326.7 | 29 | 589.8 |

# බෙදාහැරීමේ අංශය 4

## මෙහෙයුම් ප්‍රදේශය

බස්නාහිර පළාතෙන් කොටසක් (බස්නාහිර පළාත දකුණ I) ද, සම්පූර්ණ දකුණ පළාත ද, සබරගමුව සහ ඌව පළාත්වල කොටස් කීපයක් ද, බෙදාහැරීමේ අංශය 4 ට අයත් වේ. බස්නාහිර පළාත දකුණ I, ප්‍රාදේශීය ඒකක 3 කට බෙදා තිබුණි. එම කොටස් නම් රත්මලාන, කළුතර සහ දෙහිවලය. අම්බලන්ගොඩ, ගාල්ල හම්බන්තොට, මාතර, තංගල්ල, වැලිගම සහ බද්දේගම ප්‍රදේශ දකුණු පළාතට අයත් ප්‍රාදේශීය ඒකක විය. බෙදාහැරීමේ අංශය 4 හි ජාලය දෙහිවල සිට කතරගම දක්වා පැතිරී ඇත.

## දෙහිවල - ගල්කිස්ස විදුලිබල බෙදාහැරීමේ සංවර්ධන ව්‍යාපෘතිය

පහත දැක්වෙන ලක්‍ෂණවලින් යුත් ඉහත සඳහන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් ලබා ගැනීමට මෙම වසර තුළ ජපාන අන්තර්ජාතික සහයෝගීතා නියෝජිත ආයතනයට යෝජනාවක් ඉදිරිපත් කරන ලදී.

- සබඳතා ගොඩනැගීමේ මෙහෙවරක් අප්‍රේල් මාසයේ දී ඉටුවිය.
- කරුණු සෙවීමේ මෙහෙවරක් අගෝස්තු මාසයේ දී ඉටුවිය.
- අතිරේක සමීක්‍ෂණයක් සැප්තැම්බර් සහ ඔක්තෝබර් මාසවල දී සිදු කරන ලදී.
- ඇගයීමේ මෙහෙවරක් සැප්තැම්බර් මාසයේ දී ඉටුවිය.

## බලශක්ති කළමනාකරණ කටයුතු

- බොහෝ තොග සැපයුම් පාරිභෝගිකයන්ගේ ඉල්ලීම පරිදි දකුණු පළාතේ උපරිම ඉල්ලුම පවතින දිනය සෑම මසකම 20 වන දින සිට ඊළඟ මාසයේ 1 වන දින අතර ප්‍රත්‍යාරම්භනය ක්‍රමලේඛනගත කිරීම බෙදාහැරීමේ අංශය 4, අතිරේක සාමාන්‍යාධිකාරී සහ දකුණු පළාත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ මගපෙන්වීම සහ නියාමනය අනුව දකුණු පළාත් බලශක්ති කළමනාකරණ ඒකකය විසින් සිදු කරන ලදී.
- බලශක්තිය කාර්යක්‍ෂම ලෙස භාවිතා කිරීම සහ බලශක්ති විගණනය ගැන දැනුවත් කිරීමේ වැඩසටහනක් ගාල්ල ප්‍රදේශයේ පාරිභෝගිකයන් සඳහා මෙහෙයවන ලදී.
- හම්බන්තොට ප්‍රදේශයේ කාර්යමණ්ඩලය සහ සේවකයන් සඳහා තොග සැපයුම් මනු ස්ථාපනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් මෙහෙයවන ලදී.

## වැදගත් සිදුවීම්

- පාරිභෝගිකයන්ගෙන් ලැබිය යුතු ගාස්තු ගැන පාරිභෝගිකයන්ට රතු දැන්වීම් සහ සිහි කැඳවීම් යැවීමට SMS වැඩසටහනක් ආරම්භ කිරීම.
- පාරිභෝගිකයන්ට ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රදේශ කාර්යාලයට නොගොස් විදුලිබල සේවය ලබාගත හැකි වන පරිදි රත්මලාන ප්‍රදේශයේ නිවාසවලට ගොස් සේවය ලබා දෙන සේවයක් ඇරඹීම
- Google Earth මෘදුකාංග මත පදනම් වූ අඩු මිල ජංගම දුරකථන භාවිතා කොට දෙහිවල - රත්මලාන ප්‍රදේශයෙහි තාරාපැවි පවත්නා ස්ථාන හා මධ්‍යම වෝල්ටීයතා රැහැන් සිතියම්ගත කිරීම.
- විශේෂ සේවයක් තංගල්ල සහ අම්බලන්ගොඩ ප්‍රදේශවල පාරිභෝගිකයන්ට ලබාදීම සඳහා එම ප්‍රදේශවල E-නගර මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම.
- බද්දේගම ප්‍රදේශයේ (E-city) පාරිභෝගිකයන්ට ලබා දෙන සේවය වැඩි දියුණු කිරීම සඳහා බද්දේගම පිහිටි උප පාරිභෝගික සේවා මධ්‍යස්ථානය, පාරිභෝගික සේවා මධ්‍යස්ථානයක තත්ත්වයට උසස් කිරීම.
- දකුණු පළාතේ ඇමතුම් මධ්‍යස්ථානයෙහි බිඳවැටීම් පසුවිපරම් පද්ධතියක් හඳුන්වා දීම සහ ක්ෂේත්‍ර කාර්යමණ්ඩලයට අතේ ගෙන යා හැකි සන්නිවේදන උපකරණ ලබා දීමෙන් බිඳවැටීම් සේවයෙහි කාර්යක්‍ෂමතාව වැඩි දියුණු කිරීම.
- වංචා කිරීම්වලට ඇති අවදානම් අවම කරන අතරම මණ්ඩලයට මුදල් ලැබීම වැඩි කොට බැංකු අයිරාවන්ට ගෙවන පොලිය අඩු කළ හැකි වන පරිදි මහජන බැංකුවේ සහාය ඇතිව මාර්ගගත තථ්‍යකාල විදුලි බිල්පත් ගෙවීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.
- බස්නාහිර පළාත දකුණ I සහ දකුණු පළාතෙහි සියලු පාරිභෝගික සේවා මධ්‍යස්ථානයන්හී ගෙවීම් වවුචර්පත් මාර්ගගත පද්ධතියක් හඳුන්වා දීම.
- අභ්‍යන්තර මාර්ගස්ථ ගිණුමෙහි ශේෂය අඩු කිරීම සඳහා මාර්ගගත මාරු වව්චර් ක්‍රමය පහසු කිරීමේ පිළිවෙතක් හඳුන්වා දීම.
- මාතර සහ වැලිගම ප්‍රදේශවල රැහැන් දෝෂ පවතින අවස්ථාවල දී සතුටුදායක ලෙස මෙහෙයුම් සිදු කිරීම සඳහා පැන එන ඇඳහැලෙන වහරු (DDLO) පුළුසු ස්වයංක්‍රීය පිළිඇවුරුම් සමග සම්බන්ධීකරණය කිරීම සහ මධ්‍යම වෝල්ටීයතා ජාලයෙහි පැන එන ඇඳහැලෙන වහරු (DDLO) පුළුසු තෝරා ප්‍රතිස්ථාපනය සඳහා සම්මත ක්‍රියාදාමයක් සකස් කිරීම.

# බෙදාහැරීමේ අංශය 4



අම්බලන්ගොඩ E-නගරය විවෘත කිරීම

## බලශක්ති සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන

පාසල්වල පැවැත්වෙන බලශක්ති සංරක්ෂණ දැනුවත් කිරීමේ වැඩසටහන් ලංකා විදුලිබල මණ්ඩලය සහ පාරිභෝගිකයන් යන දෙකොට්ඨාසයටම ප්‍රයෝජනවත් වන බැවින් බෙදාහැරීමේ අංශය 4 හි බලශක්ති කළමනාකරණ ඒකකය බස්නාහිර පළාත් දකුණු 2 හි ප්‍රදේශ කාර්යාල විසින් තෝරා ගත් පාසල්වල දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කරන ලදී. මෙරට අනාගත නායකයන් වන පාසල් ළමුන් අතර පැවති මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් බෙහෙවින් ඵලදායී බව පෙනුණි.





බලශක්ති සැපයුම පිළිබඳ ගැටළු විසඳන අතරම තොග වශයෙන් විදුලිබලය පරිභෝජනය කරන්නන්ට විදුලිබලය කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස භාවිතා කිරීමට ඉඩ සැලසීම සඳහා බෙදාහරින ලද සැපයුමෙහි ගුණාත්මකභාවය පසුවිපරම් කිරීම සඳහා වර්ෂය තුළ බලශක්ති විගණනය සහ බලශක්ති ගුණාත්මකභාවය විශ්ලේෂණය ආරම්භ කරනු ලැබීය.

# කෙටි යෙදුම්

1. AGM - අතිරේක සාමාන්‍යාධිකාරී
2. DGM - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
3. CE - ප්‍රධාන ඉංජිනේරු
4. DD1 - බෙදාහැරීමේ අංශය 1
5. DD2 - බෙදාහැරීමේ අංශය 2
6. DD3 - බෙදාහැරීමේ අංශය 3
7. DD4 - බෙදාහැරීමේ අංශය 4
8. MV - මධ්‍යම වෝල්ටීයතාවය
9. LV - අඩු වෝල්ටීයතාවය
10. GSS - කොටුමා උපපොල
11. MLKR - ශ්‍රී ලංකා රුපියල් මිලියන
12. CSC - පාරිභෝගික සේවා මධ්‍යස්ථානය
13. RE - ග්‍රාමීය විදුලියනය
14. PSS - ප්‍රාථමික උපපොල
15. LSE - විදුලමු ශ්‍රී ලංකා - නැගෙනහිර
16. UU - ඌව උද්‍යානය
17. ADB - ආසියානු සංවර්ධන බැංකුව
18. NN - නැගෙනහිර නවෝදය
19. BSF - මණ්ඩලයේ විශේෂ අරමුදල
20. SC - තනි පරිපථ
21. DC - ද්වි පරිපථ
22. WPN - බස්නාහිර පළාත උතුර
23. CP - මධ්‍යම පළාත
24. EP - නැගෙනහිර පළාත
25. POS - ගෙවීම් කවුළුව
26. CT - විදුලි ධාරාපැවිය
27. PT - විභව්‍ය ධාරාපැවිය
28. DCB - විමධ්‍යගත අයවැය
29. PCB - පළාත් සභා අයවැය



# මෙහෙයුම්
## සමාලෝචනය



# ව්‍යාපෘති අංශය

# ව්‍යාපෘති අංශය

2014 වර්ෂය ව්‍යාපෘති අංශයට ඉතාමත්ම සාර්ථක ප්‍රතිඵල ලබාදුන් වැදගත් සිදුවීම් වලින් ගහන වර්ෂයක් විය. මෙම වර්ෂය තුළ පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතියෙහි දෙවන අදියර සහ දුම්මලසූරිය, බදුල්ල, මාහෝ, නාඋල, පල්ලේකැලේ, පොළොන්නරුව සහ වවුනතිවු කොටුමා උපපොල ඇතුළු එම උපපොල ආශ්‍රිත සම්ප්‍රේෂණ රැහැන් මෙහෙවරෙහි යොදවන ලදී. මෙම ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත දැක්වේ:

## මෙ.වො. 2 x 300 පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය - දෙවන අදියර

පුත්තලම මෙ.වො. 2 x 300 ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතියේ දෙවන අදියරෙහි ඉදිකිරීම් 2010 මැයි මාසයේ ආරම්භ විය. චීනයේ එක්සිම් (EXIM) බැංකුව විසින් සපයනු ලබන එක්සත් ජනපද ඩොලර් මිලියන 891 ක ණය මුදලක් මගින් ව්‍යාපෘතියට අරමුදල් සපයන ලදී. ඉදිකිරීම් වැඩ China Machinery Engineering Corporation ආයතනය විසින් ඉංජිනේරු මිලදී ගැනීම් සහ ඉදිකිරීමේ පදනම මත ඉටු කරන ලදී.

මෙ.වො. 300 වාෂ්ප තලබමන ජනක ඒකක දෙකක් (ඒකක අංක 2 සහ 3) ස්ථාපනය කිරීම, නොරොච්චෝලයෙහි කි.වො. 220 වායු පරිවෘත වහරු ප්‍රසාරණය, දුම්මලසූරිය කි.වො. 220 / 132, 2 x 240 MVA (මෙ.වෝ.ඇ.) කොටුමා උපපොල ඉදිකිරීම සහ නොරොච්චෝලේ සිට අනුරාධපුර දක්වා කි.මී. 105 ක් දිග කි.වො. 220 ද්වි පරිපථ සම්ප්‍රේෂණ රැහැනක් ඉදිකිරීම මෙම ව්‍යාපෘතියට අයත් කාර්ය පරිපථයට අයත් විය.


බලාගාරය සහ ගල් අඟුරු බෑමේ යන්ත්‍රෝපකරණ

අංක 2 ජනක ඒකකය සහ අංක 3 ජනක ඒකකය මෙහෙවරෙහි යෙදවීම පිළිවෙළින් 2014 මැයි සහ 2014 ඔක්තෝබර් මාසවල සිදුවිය. එක ඒකකයකින් වාර්ෂිකව ඒකක මිලියන 1,800 ක් ජනනය කිරීමට අපේක්ෂිතය. වසර අවසාන වන විට පුත්තලම ගල් අඟුරු බලාගාරය දිනකට ඒකක මිලියන 18 ක් ජනනය කළේය. එම ප්‍රමාණය මෙරට දෛනික විදුලි පරිභෝජනයෙන් 50%කි. ඒකක අංක 2 සහ 3 ජනාධිපතිතුමා විසින් 2014 සැප්තැම්බර් 16 දින විවෘත කරන ලදී.

දුම්මලසූරිය උපපොල ඉදිකිරීම සම්පූර්ණ කොට බලගැන්වීම 2014 මාර්තු මාසයේ දී සිදු විය. දෙවන අදියර යටතේ ජනනය කළ බලශක්තියෙන් කොටසක් කි.වො. 220 ද්වි පරිපථ සම්ප්‍රේෂණ රැහැන මගින් අනුරාධපුරයට සම්ප්‍රේෂණය කිරීමට සැලසුම් කරන ලදී. එමගින් උතුරු මැද සහ උතුරු පළාත් විදුලියනය සහ සම්පූර්ණ පද්ධතියෙහි සමස්ත විශ්වසනීයත්වය වැඩි කිරීම අපේක්ෂා කරන ලදී. සම්ප්‍රේෂණ ව්‍යාපෘති අංශයේ සහාය ඇතිව 2014 නොවැම්බර් 21 දින මෙම රැහැනේ කටයුතු සම්පූර්ණ විය.

## ඉහළ කොත්මලේ ජල විදුලි ව්‍යාපෘතිය

මෙ.වො. 150 ක ස්ථාපිත ධාරිතාවකින් ද, ගි.වො. පැය 450 ක වාර්ෂික ජනනයකින් ද යුත් ඉහළ කොත්මලේ ජල විදුලි ව්‍යාපෘතිය ගං දිය මාන මාදිලියේ විදුලිබල ව්‍යාපෘතියකි. ජපාන අන්තර්ජාතික සහයෝගිතා නියෝජිත ආයතනයෙන් මිලියන 37,817 ක ණය පහසුවක් මගින් ව්‍යාපෘතිය සඳහා අරමුදල් ලැබුණි. මෙම ව්‍යාපෘතියේ මෙ.වො. 150 පොළව යට බලාගාරය 2012 වසරේ දී සාර්ථක ලෙස මෙහෙවරෙහි යොදවන ලදී. සමාජ හා දේශපාලන හේතු නිසා ව්‍යාපෘතියට අයත් නැවත පදිංචි කිරීමේ කටයුතු නැවත සැලසුම් කිරීමට සිදුවිය. දෙවන අදියරෙහි 1 වන කොටස යටතේ ගෙවල් 78 ක්, බද්ධ නිවාස 3 ක්, වෙළෙඳ සැල් සහ ගරාජ් 24 ක්, නානායම් එකක්, හින්දු කෝවිල් 3ක් සහ පාසල් ගොඩනැගිලි 3 ක් ඉදිකර ඇත. ගංවතුර පුරෝකථන සහ අනතුරු ඇඟවීම් පද්ධතිය ඇතුළු ඉතිරි වැඩ කොටස කොන්ත්‍රාත්තුවේ 4 වන කොටස යටතේ නිම කරන ලදී. වසර අවසාන වන විට ව්‍යාපෘතියේ බලපෑමට පාත්‍ර වූ පවුල් නැවත පදිංචි කිරීම් අවසානයට ළඟා විය.

## මෙ.වො. 500 ත්‍රිකුණාමලය ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය.

ලංකා විදුලිබල මණ්ඩලය සහ ඉන්දියාවේ 'නැෂනල් තර්මල් පවර් කෝපරේෂන් ලිමිටඩ්' (NTPC) විසින් ත්‍රිකුණාමලයේ මෙ.වො. 500 ගල් අඟුරු බලාගාරයක් ගොඩනැගීම, අයිතිය ලබා ගැනීම සහ මෙහෙයවීමේ පදනම යටතේ ඉදිකොට මෙහෙයවීමට සීමාසහිත ත්‍රිකුණාමලය බලශක්ති සමාගම නමින් ඒකාබද්ධ ව්‍යාපාරික සමාගමක් සංස්ථාගත කරන ලදී. සීමාසහිත ත්‍රිකුණාමලය බලශක්ති සමාගම ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකා ආණ්ඩුව සහ ලංකා ගල් අඟුරු සමාගම එක්වීමෙන් සෑදුම් ලද ඒකාබද්ධ ව්‍යාපාරික සමාගම ව්‍යාපාරයට අදාළ සියලුම ප්‍රධාන ගිවිසුම්වලට එළඹී ඇත. ව්‍යාපෘතියේ ඉංජිනේරුවරයා හැටියට ඉන්දියාවේ සීමාසහිත ජාතික තාප බල සංස්ථාව හඳුනාගෙන ඇත. එක්සත් ජනපද ඩොලර් මිලියන 500 කට ආසන්න පිරිවැයකින් තනනු ලබන මෙම බලාගාරය සාම්පූර් හී ස්ථානගත වේ. ව්‍යාපෘතියෙහි පාරිසරික බලපෑම් ඇගයීම මධ්‍යම පරිසර අධිකාරියට ඉදිරිපත් කරන ලදුව, එම අධිකාරියෙන් ලද උපදෙස් අනුව තවදුරටත් අධ්‍යයනයන් සිදුකිරීමට අවශ්‍ය විය. වර්ෂය තුළ බලාගාරයේ මූලික සැලසුම් උපමානයන් සමාලෝචනයට භාජන විය.

සාම්පූර් හී පිහිටි බලාගාරයේ සිට වේයන්ගොඩට සහ ගල් අඟුරු බාන ජැටිය දක්වා සම්ප්‍රේෂණ රැහැන ඉදිකිරීම

# ව්‍යාපෘති අංශය

ව්‍යාපෘතියට ඇතුළත් විය. කප්පල්තුරෙයි සිට සාම්පූර් - හබරණ හරහා වේයන්ගොඩ දක්වා පැවති කි.වෝ. 220/400 සම්ප්‍රේෂණ පද්ධතිය ජපාන අන්තර්ජාතික සහයෝගිතා නියෝජිත ආයතනයේ සහාය ඇතිව සංවර්ධනය කරන ලදී. ගල් අඟුරු බාන ජැටිය ඉදිකිරීම සහ මෙහෙයවීම සඳහා වන ලංකා ගල් අඟුරු සමාගම සහ සීමාසහිත ශ්‍රී ලංකා ගේට්වේ ඉන්ඩස්ට්‍රීස් පුද්ගලික සමාගම අතර පර්යන්ත සේවා ගිවිසුමට 2013 සැප්තැම්බර් මාසයේ දී අත්සන් තබන ලදී.

## බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි ව්‍යාපෘතිය

බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි ව්‍යාපෘතිය යනු පවත්නා පොල්පිටිය බලාගාරයට පහළින් ලබාගත හැකි ජල විදුලි විභවයෙන් ප්‍රයෝජන ගැනීමේ අරමුණ ඇතිව කැලණි ගඟ මත ඉදිකරන ගං දිය මාන (run-of-river) මාදිලියේ බලාගාරයක් ඉදිකිරීමේ ව්‍යාපෘතියයි. මෙ.වො. 35 ක ස්ථාපිත ධාරිතාවක් ඇති මෙම ව්‍යාපෘතිය මගින් වාර්ෂිකව ගි.වො. පැය 126 ක විදුලිබලය ජනනය කරනු ඇතැයි අපේක්ෂිතය. ව්‍යාපෘතියෙහි ප්‍රධාන වැඩබිම පිහිටියේ කිතුල්ගල නගරය අසළය. එහි ප්‍රධාන සංඝටකයක් වනුයේ ප්‍රධාන බැම්ම, හැරවුම් බැම්ම, පෙරාර උමග, හැරවුම් උමග, මතුපිට බලාගාරය, වහරු අංගනය සහ සම්ප්‍රේෂණ රැහැනයි.

සැලසුම් කොට ඉදිකිරීමේ පදනම මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට තෝරාගත් කොන්ත්‍රාත්කරු වූයේ China National Electric Equipment Corporation (CNEEC) ආයතනයයි. ව්‍යාපෘතියේ සම්පූර්ණ පිරිවැය එක්සත් ජනපද ඩොලර් මිලියන 82 කි. අරමුදලෙහි ප්‍රධාන සංඝටකය චීනයේ Industrial & Commercial Bank of China බැංකුව විසින් සැපයූ අතර, ඉතිරි කොටස ශ්‍රී ලංකාවේ හැටන් නැෂනල් බැංකුව ලබා දුන්නේ ය. මෙම බැංකු දෙකම සමග මූල්‍ය ගිවිසුම්වලට 2013 දී අත්සන් තබා ඇත. ව්‍යාපෘතියේ මූලික ඉදිකිරීම් කටයුතු ආරම්භ වී ඇති අතර, මෙම ව්‍යාපෘතිය වසර හතරකින් නිම කිරීමට සැලසුම් කර ඇත.



ප්‍රධාන හැරවුම් උමග ඉදිකිරීම

ව්‍යාපෘතිය පිළිබඳ පාරිසරික ගැටළු නොමැති බව දැනටත් දැනුම් දී ඇත. මෙම ව්‍යාපෘතියට පිරිසිදු සංවර්ධන යාන්ත්‍රණ (Clean Development Mechanism) ලියාපදිංචිය ලැබී ඇත. වසර අවසන් වන විට ප්‍රධාන උමග සහ හැරවුම් උමග ඉදිකිරීම ඉටුවෙමින් පැවතුණි.

## උමාඔය ජල විදුලි ව්‍යාපෘතිය

උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශයේ සහාය ඇතිව වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම ව්‍යාපෘතිය මධ්‍යම කඳුකරයට ගිණිකොන දෙසින් පිහිටි එක් ප්‍රදේශයකින් තවත් ප්‍රදේශයකට ජලය ලබා දෙන, විදුලි බලය ජනනය කරන, වාරි පහසුකම් සලසන ව්‍යාපෘතියකි. යෝජනා ක්‍රමයෙහි ප්‍රධාන කොටස, ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ නිරිත දිග කොටසෙහි පිහිටා ඇත.

මෙම ව්‍යාපෘතිය මගින් වාර්ෂිකව දීර්ඝ කාලීන වශයෙන් වාරි කටයුතු සඳහා ජලය කියුබික් මීටර් මිලියන 145 ක් අන්‍ය ප්‍රදේශයකට යවන අතරම, මෙ.වො. 120 ක් ජනනය කරමින් වාර්ෂිකව ගි.වො. පැය 290 ක් නිපදවනු ඇත. බලාගාරය බදුල්ල කොටුමා උපපොළ මගින් ජාතික ජාලයට සම්බන්ධ වේ. වර්ෂය තුළ පෙරාර උමගෙහි වැඩ අවසන් විය. වසර අවසන් වන විට බලශක්ති සහ සබඳතා උමංවල වැඩ ඉටු වෙමින් පැවතුණි. ජනන සහ තලබමන උපකරණ මිලට ගැනීම සඳහා ඇණවුම් යවන ලදී.

## මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතිය



මොරගොල්ල ජලවිදුලි ව්‍යාපෘතියෙහි පිහිටීම

මහවැලි ගඟ ඉහත්තාවෙහි මොරගොල්ල ජල විදුලි බලාගාරය ස්ථාපනය කර ඇත. මහවැලි ගඟ සහ කොත්මලේ ඔය යාවන ස්ථානයේ සිට කි.මී. 3 ක් පමණ පහළින් ජලය ඇතුල් කරන බැම්ම පිහිටා ඇත. යෝජිත ජලවිදුලි බලාගාරය ගං දිය මාන වර්ගයේ බලාගාරයකි. එහි ස්ථාපිත ධාරිතාව මෙ.වො. 30 ක් වන අතර, වසරකට ගි.වො. පැය 103 ක් ජනනය කිරීමට සමත් ය. ජලය ඇතුල් කරන බැම්ම උසම ස්ථානයේ දී මීටර් 37 ක් උස වන අතර, එහි දිග මීටර් 236 කි. එහි වාන්මග දොරටුවලට ජලය 6,700 පැය ක ප්‍රමාණයක් නිදහස් කළ හැක. බලශක්ති උමග කි.මී. 3 ක් දිග වන අතර එහි විෂ්කම්භය මීටර් 4.7 කි.

# ව්‍යාපෘති අංශය

විස්තරාත්මක ඉංජිනේරුමය සැලැස්ම සහ මිල ගණන් දැක්වීමට අවශ්‍ය ලේඛන සැකසීම අවසන් කර ඇත. වර්ෂය අවසාන වන විට ඉදිකිරීමේ කටයුතු සඳහා ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ සහාය ලබා ගැනීමට උපදේශක සේවා ප්‍රතිසම්පාදන කටයුතු ඉටුවෙමින් පැවති අතර ඒ සඳහා වන යෝජනා ඉල්ලුම් පත්‍රය දැනටමත් උපදේශක සේවා සපයන ව්‍යාපාරික ආයතනවල කෙටි ලැයිස්තුවට අයත් ආයතනවලට සපයා ඇත.

## සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය

සම්ප්‍රේෂණ ව්‍යාපෘති ශාඛාවේ විෂය පථයට අයත් ව්‍යාපෘති කළමනාකරණ ඒකක වර්ෂය තුළ තමන්ට පවරන ලද වැඩ සතුටුදායක ලෙස ඉටු කරන කාර්ය බහුල තත්ත්වයක පැවතුණි.

## විශේෂ පැවරුම්

වර්ෂය තුළ නොරොච්චෝලෙයි - අනුරාධපුර කි.වො. 220 සම්ප්‍රේෂණ රැහැන ඉදිකිරීම ඉක්මන් කිරීමේ අවශ්‍යතාව පැනනැගුණි. එබැවින් සම්ප්‍රේෂණ ව්‍යාපෘති ශාඛාවේ ව්‍යාපෘති කළමනාකරුවන්ට සහ එම ව්‍යාපෘති කාර්ය මණ්ඩලයට තම සාමාන්‍ය රජකාරිවලට අමතර වශයෙන් නොරොච්චෝලෙයි - අනුරාධපුර කි.වො. 220 රැහැන සඳහා කුළුණු අත්තිවාරම් 13 ක් ඉදිකිරීමේ විශේෂ පැවරුම භාර ගැනීමට සිදුවිය. මෙම කාර්යය 2014 ජුලි මාසයේ ආරම්භ වී 2014 සැප්තැම්බර් මස සාර්ථක ලෙස නිම විය.

වසර තුළ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති ගැන කෙටි විස්තරයක් පහත සඳහන් සටහන්වල වෙන වෙනම දැක්වේ.

## පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් ජනනය කරන බලශක්ති අවශෝෂණය සඳහා කොටුමා උපපොළ සංවර්ධනය කිරීම

පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් ජනනය වන බලශක්තිය අවශෝෂණය කිරීම සඳහා පවත්නා කොටුමා උපපොළ අටක ධාරිතාව වැඩි කිරීම සහ කිලෝ වෝල්ට් 132/33 උපපොළක් අලුතෙන් ඉදිකිරීම සඳහා මෙම ව්‍යාපෘතිය සකස් කරන ලදී. ව්‍යාපෘතිය සඳහා අරමුදල් ආසියානු සංවර්ධන බැංකුවෙන් සහ ශ්‍රී ලංකා රජයෙන් ලැබුණි. බදුල්ල, බලංගොඩ, නුවරඑළිය, සීතාවක, උකුවෙල සහ රත්නපුර කොටුමා උපපොළ ඇතුළු විමලසුරේන්ද්‍ර සහ රන්ටැඹේ බලාගාර වෘද්ධිකරණය ද, මහියංගනයේ කොටුමා උපපොළක් ඇතුළු ඒ ආශ්‍රිත කී.මී. 21 ක් දිග සම්ප්‍රේෂණ රැහැන ඉදිකිරීම ද, ව්‍යාපෘති විෂය පථයට අයත් විය. බදුල්ල කොටුමා උපපොළෙහි වැඩ වසර තුළ නිම කළ අතර ඉතිරි වැඩ ඉකුත් වසර තුළ නිම විය.


බදුල්ල කොටුමා උපපොළ

## සම්ප්‍රේෂණ පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා වන සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය

ණය අංක 2518-SRI /2519-SRI(SF)-පිවිතුරු බලශක්ති සහ ප්‍රවේශ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2 වන කොටස යටතේ ආසියානු සංවර්ධන බැංකුව විසින් එක්සත් ජනපද ඩොලර් මිලියන 20.4 ක් මෙම ව්‍යාපෘතියට ලැබුණි. කිලෝ වෝල්ට් 132 සම්ප්‍රේෂණ රැහැන් කී.මී. 94 ක් ලෑම ව්‍යාපෘතියේ මුල් විෂය පථයට ඇතුළත් වූ අතර එම වැඩ කොටස 2013 අවසානයට ප්‍රථම අවසන් විය. ඉහත සඳහන් ණය මුදලෙහි ඉතිරිය උපයෝගී කරගනිමින් කි.මී. 42 ක් වන පුත්තලම - මාහෝ කිලෝ වෝල්ට් 132 සම්ප්‍රේෂණ රැහැන දෙවන පරිපථ ලෑම ඇතුළත් වැඩි විෂය පථයක් සහිත කොන්ත්‍රාත්තුවකට අත්සන් තබන ලදී. මෙම කාර්යය 2014 වසර අවසන් වන විට ඉටුවෙමින් පැවති අතර 2015 දී අවසන් කිරීමට නියමිතය.

## සම්ප්‍රේෂණ පද්ධති ශක්තිමත් කිරීම සඳහා වන කොටුමා උපපොළ ව්‍යාපෘතිය


පල්ලේකැලේ කොටුමා උපපොළ

ණය අංක 2518 - SRI - පිවිතුරු බලශක්ති සහ ප්‍රවේශ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ආසියානු සංවර්ධන බැංකුව විසින් එක්සත් ජනපද ඩොලර් මිලියන 34 ක් මෙම ව්‍යාපෘතිය සඳහා සපයනු ලැබේ. කුරුණෑගල පවත්නා කොටුමා උපපොළ වෘද්ධිකරණය ඉටුවෙමින් පැවති අතර එම කාර්යය 2015 මැයි මාසය වන විට නිම කරනු ඇතැයි අපේක්ෂිතය. හබරණ,

# ව්‍යාපෘති අංශය

පුත්තලම, පානදුර සහ මාතර පවත්නා කොටුමා උපපොල වර්ධනය ද, මාහෝ, නාඋල සහ පල්ලේකැලේ නව කොටුමා උපපොල ඉදිකිරීම් ද වසර අවසානයට පෙර නිම විය. හොරණ සහ වේයන්ගොඩ කොටුමා උපපොල වර්ධනය ඉටුවෙමින් පැවති අතර එම කටයුතු 2015 වසර තුළ නිම කිරීමට අපේක්ෂිතය.

## සම්ප්‍රේෂණ පද්ධති ශක්තිමත් කිරීම සඳහා වන නැගෙනහිර පළාත් ව්‍යාපෘතිය

ණය අංක 2519- SRI (SF) - පිවිතුරු බලශක්ති සහ ප්‍රවේශ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ එක්සත් ජනපද ඩොලර් මිලියන 18.2 ක් මෙම ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් සපයන ලදී. කි.මී. 100 ක් දිග - හබරණ වාලච්චේනයි - කිලෝ වෝල්ට් 132 සම්ප්‍රේෂණ රැහැන ඉදිකිරීම සහ වාලච්චේනයි සහ අම්පාර කොටුමා උපපොල වර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියේ මුල් විෂය පථයට අයත් විය. එම කටයුතු 2013 වර්ෂයේ දී අවසන් විය. එම ණය මුදලේ ඉතිරිය උපයෝගී කර ගනිමින් වාලච්චේනයි කොටුමා උපපොල තවදුරටත් වර්ධනය කිරීම සඳහා වැඩි කළ විෂය පථයේ කාර්යයන් උදෙසා 2014 ජූලි මාසයේ දී කොන්ත්‍රාත්තුවකට අත්සන් තබන ලදුව, එම කටයුතු 2015 දී අවසන් කිරීමට නියමිතය.

## ඊසාන දිග බලශක්ති සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය



මහියංගන සිට අම්පාර හරහා වව්නතිවු දක්වා සම්ප්‍රේෂණ රැහැන

ණය අංක 2733 යටතේ නැගෙනහිර සහ උතුරු මැද පළාත්වල විදුලිබල සම්පාදනය වැඩි දියුණු කිරීම සඳහා වන මෙම ව්‍යාපෘතියට ආසියානු සංවර්ධන බැංකුව එක්සත් ජනපද ඩොලර් මිලියන 55.2 ක් සපයා ඇත. පොළොන්නරුව, මොණරාගල සහ වව්නතිවු හී නව කොටුමා උපපොල තුනක් ඉදිකිරීම, පවත්නා අම්පාර කොටුමා උපපොල වෘද්ධිකරණය, මහියංගන සිට අම්පාර හරහා වව්නතිවු දක්වා සහ මැදගම සිට මොණරාගල දක්වා කිලෝ වෝල්ට් 132 සම්ප්‍රේෂණ රැහැන් ඉදිකිරීම සහ කොත්මලේ- නව අනුරාධපුර කිලෝ වෝල්ට් 220 රැහැනේ දෙවන පරිපථ රැහැන් ඇදීම මෙම ව්‍යාපෘතියේ විෂය පථයට අයත් විය. මොණරාගල කොටුමා උපපොලට සම්බන්ධ කටයුතු හැර අනෙක් සියලු වැඩ වසර තුළ දී අවසන් විය. 2015 දී නිම කළ යුතු පොළොන්නරුව සහ මොණරාගල කොටුමා උපපොල වර්ධනය කිරීම ඇතුළත් වැඩි කළ විෂය පථයකින් යුත් කාර්යයන් සඳහා ඉහත සඳහන් ණය මුදලෙහි ඉතිරිය උපයෝගී කරගත් කොන්ත්‍රාත්තුවකට අත්සන් තබන ලදී.




වව්නතිවු කොටුමා උපපොල

## නව ගාල්ල බලශක්ති සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය

නව ගාල්ල උපපොල සහ අම්බලන්ගොඩ - ගාල්ල කිලෝ වෝල්ට් 132 සම්ප්‍රේෂණ රැහැන ඉදිකිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එක්සත් ජනපද ඩොලර් මිලියන 21.6 ක් ලබා දුන්නේය. මෙම කටයුතු ඉටුවෙමින් පැවති අතර 2015 වසරේ දී නිම කිරීමට අපේක්ෂිතය.

## කැලණිය වව්නියා සම්ප්‍රේෂණ මාර්ගය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

පිවිතුරු බලශක්තිය සහ ප්‍රවේශය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ පොරොන්දු ණය මුදලෙන් භාවිතයට නොගත් මුදල කැලණිය කොටුමා උපපොල වර්ධනය සඳහා යෙදවීමට ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබා දී ඇත. මෙම වැඩ සඳහා ප්‍රතිසම්පාදන කටයුතු වසර තුළ අවසන් වූ අතර 2014 සැප්තැම්බර් මාසයේ දී අදාළ ගිවිසුමට අත්සන් තබන ලදී. 2016 වසරේ දී වැඩ නිම කිරීමට අපේක්ෂිතය.

කිලිනොච්චි කොටුමා උපපොල වර්ධනය සඳහා සහ වව්නියා කොටුමා උපපොලට අවශ්‍ය අමතර කොටස් මිලදී ගැනීමට වව්නියා කිලිනොච්චි සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය සඳහා වෙන්කළ මුදලෙන් ඉතිරිය යොදා ගැනීමට ජපාන අන්තර්ජාතික සහයෝගිතා නියෝජිත ආයතනය ඉඩ ලබා දී ඇත. මෙම කාර්යය සඳහා ප්‍රතිසම්පාදන කටයුතු වසර තුළ ඉටුවෙමින් පැවති අතර එම කාර්යය 2016 වසරේ දී නිම කිරීමට අපේක්ෂිතය.

## පිවිතුරු බලශක්ති සහ ජාල කාර්යක්ෂමතා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය - පළමු පැකේජය - මන්නාරම සම්ප්‍රේෂණ යටිතල ව්‍යාපෘතිය

කිලෝ වෝල්ට් 132/33 මන්නාරම කොටුමා උපපොල සහ එම උපපොල මන්නාරම - වව්නියා - නව අනුරාධපුර කිලෝ වෝල්ට් 220 රැහැන ඉදිකොට කිලෝ වෝල්ට් 132 සහිතව ක්‍රියාත්මක කරනු ලබන කි.මී. 70 හා කි.මී. 55 සම්ප්‍රේෂණ රැහැන මගින් ජාතික ජාලයට සම්බන්ධ කිරීම මෙම ව්‍යාපෘතියේ විෂය පථයට අයත් විය. කිලෝ වෝල්ට් 220 සම්ප්‍රේෂණ

# ව්‍යාපෘති අංශය

රැහැන මන්නාරම ප්‍රදේශයේ සුළං බල විභවය සම්පූර්ණයෙන් සංවර්ධනය කිරීමට ඉඩ සලසනු ඇත. සියලු ප්‍රතිසම්පාදන කටයුතු 2017 මුල් භාගයේ දී අවසන් කිරීමට අපේක්ෂිතය.

## පිවිතුරු බලශක්ති සහ ජාල කාර්යක්ෂමතා සංවර්ධන ව්‍යාපෘතිය - 2 වන පැකේජය - කිලෝ වෝල්ට් 132 සම්ප්‍රේෂණ යටිතල ව්‍යාපෘතිය

කෑගල්ලේ කිලෝ වෝල්ට් 132/33 කොටුමා උපපොල ඉදිකිරීම සහ එය කි.මී. 22ක් දිග කිලෝ වෝල්ට් 132 සම්ප්‍රේෂණ රැහැන මගින් සම්බන්ධ කිරීම මෙම ව්‍යාපෘතියේ විෂය පථයට ඇතුළත් විය. තව ද, පොල්පිටිය - නව පොල්පිටිය, අතුරුගිරිය - පාදුක්ක කිලෝ වෝල්ට් 132 සම්ප්‍රේෂණ රැහැන් ඉදිකිරීම, අතුරුගිරිය සිට කොළොන්නාව දක්වා කි.මී. 15 සම්පේෂණ රැහැන නැවත ඉදිකිරීම සහ පවත්නා උපපොල 7ක 160 MVAr ධාරක බැංකු ස්ථාපනය මෙම ව්‍යාපෘතියට ඇතුළත් විය. සියලු ප්‍රතිසම්පාදන කටයුතු 2017 මුල් භාගයේ දී අවසන් වනු ඇතැයි අපේක්ෂිතය.

## පිවිතුරු බලශක්තිය සහ ජාල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය - 3වන පැකේජය - කිලෝ වෝල්ට් 220 යටිතල ව්‍යාපෘතිය

පොල්පිටිය සහ පාදුක්ක කිලෝ වෝල්ට් 220/132/33 කොටුමා උපපොල ඉදිකිරීම සහ පොල්පිටිය - නව පොල්පිටිය - පාදුක්ක - පන්නිපිටිය කිලෝ වෝල්ට් 220 කි.මී. 70 සම්ප්‍රේෂණ රැහැන ඉදිකිරීම මෙම ව්‍යාපෘතියෙහි විෂය පථයට ඇතුළත් විය. බටහිර බැර මධ්‍යස්ථාන සහ ලක්ෂපාන සංකීර්ණය අතර විදුලිබල මාරුව සුමට ලෙස සිදු කිරීම නව සම්ප්‍රේෂණ පද්ධතිය නිසා පහසු වනු ඇත. ප්‍රතිසම්පාදන කටයුතු අවසන් අවස්ථාවට ලංවී තිබුණ අතර 2017 මුල් භාගයේ දී අවසන් කිරීමට අපේක්ෂිතය.

පැකේජ තුනකින් සමන්විත ව්‍යාපෘතියෙහි සියලු පැකේජ සඳහා ආසියානු සංවර්ධන බැංකුව අරමුදල් සැපයීම සහතික කර ඇත.

## මහ කොළඹ සම්ප්‍රේෂණය, බෙදාහැරීම සහ හානි අඩු කිරීමේ ව්‍යාපෘතිය

විශ්වසනීයත්වය වැඩි දියුණු කොට පද්ධති හානිය අඩු කිරීම සහ කොළඹ නගරයේ සිදුවන මහා පරිමාණ සංවර්ධන කටයුතු සඳහා වැඩි වෙමින් පවතින විදුලිබල ඉල්ලුමට සරිලන සැපයුමක් ලබාදීම අරමුණු කොට ගෙන මහ කොළඹ ප්‍රදේශයේ සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ ජාලය ශක්තිමත් කිරීමට මෙම ව්‍යාපෘතිය සැලසුම් කර තිබේ. කිලෝ වෝල්ට් 220 සහ කිලෝ වෝල්ට් 132 කොටුමා උපපොල 4 ක් ඉදිකිරීම, කොටුමා උපපොල 5 ක් වර්ධනය කිරීම, පොළව යට සම්ප්‍රේෂණ බහන් කි.මී. 37.7 ක් සහ පොළව යට බෙදාහැරීමේ බහන් කි.මී. 97 ක් එලීම සහ කි.වෝ. 11 බෙදාහැරීමේ පනේල 88 ක් ස්ථාපනය කිරීම ව්‍යාපෘතියේ විෂය පථයට අයත් විය. යෙන් බිලියන 15.9 ක ණයක් සපයමින් ජපාන අන්තර්ජාතික සහයෝගීතා නියෝජිත ආයතනය ව්‍යාපෘතියට අවශ්‍ය මූල්‍ය සහාය ලබා දුන්නේය. ඉදිකිරීම් 2015 අවසාන වන විට ආරම්භ කිරීමට සහ 2017 දී අවසන් කිරීමට සැලසුම් කර ඇත. ලංසු තබන්නන්ගේ පූර්ව සුදුසුකම් වසර තුළ සම්පාදනය කරන ලදී. උපදේශකයන් සමග ලංකා විදුලිබල මණ්ඩලයේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය බහන් මග ඇතුළු සියලු ස්ථාපනයන් සඳහා මූලික සැලසුම් සකස් කොට ඉඩම් වෙන් කිරීම සඳහා අනුමැතිය ලබාගෙන ඇත. අන්තර්ජාතික තරඟකාරී ලංසු තැබීම පිණිස ඉදිකිරීම් සඳහා වන ලංසු තැබීමේ ලේඛන දැනටමත් සම්පූර්ණ කර ඇත.

# මෙහෙයුම්
# සමාලෝචනය



වත්කම් කළමනාකරණ අංශය

# වත්කම් කළමනාකරණ අංශය

වත්කම් කළමනාකරණය, යටිතල ව්‍යුහය සංවර්ධනයෙහිම කොටසකි. මෙම අංශය, වර්ෂය තුළ ලංකා විදුලිබල මණ්ඩලයෙහි ආර්ථික වර්ධනය, සාමාජික ප්‍රගමනය සහ පාරිසරික සංවර්ධනය පිළිබඳ වැදගත් මෙහෙවරක් ඉටු කළේය.

වත්කම් කළමනාකරණ අංශය පහත සඳහන් ශාඛා / ඒකකවලින් සමන්විතයත

- වත්කම් කළමනාකරණ සහ ආයතනික ශාඛාව
- පුහුණු ශාඛාව
- ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (විදුලක්පාය)
- වැඩපොළ සහ උපකාරක සේවා ශාඛාව
- සිවිල් වැඩ සහ ගොඩනැගිලි ශාඛාව
- ආරක්ෂක සේවා ඒකකය

## වත්කම් කළමනාකරණ සහ ආයතනික ශාඛාව

ලංකා විදුලිබල මණ්ඩලයේ වත්කම් කළමනාකරණය ආශ්‍රිත කාර්යයන් වර්ෂය තුළ වත්කම් කළමනාකරණ සහ ආයතනික ශාඛාව විසින් මෙහෙවන ලදී. මෙහි වැදගත්ම කාර්යභාරය වනුයේ ලංකා විදුලිබල මණ්ඩලයට අයත් ඉඩම් සහ ගොඩනැගිලි කළමනාකරණය සහ පවත්නා සම්පත් සහ වත්කම් මණ්ඩලයේ ව්‍යවස්ථාගත ක්‍රියාකාරකම්වලට පරිබාහිරව, නිත්‍ය කටයුතුවලට බාධාවක් නොවන අයුරින්, අතිරේක ආදායමක් ලබා ගැනීම සඳහා භාවිතයට ගැනීමයි.

### වත්කම් කළමනාකරණ ඒකකයෙහි ප්‍රධාන කාර්යයන්

1 ඉඩම් සහ ගොඩනැගිලි පිළිබඳ වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාම සහ එය වාර්ෂිකව යාවත්කාලීන කිරීම.

2 ඉඩම් සහ ගොඩනැගිලිවල වටිනාකම යාවත්කාලීන කිරීම.

3 අත්පත් කරගත්, පැවරූ හෝ ලංකා විදුලිබල මණ්ඩලය විසින් එකහෙළා මිලට ගත් ඉඩම් සඳහා අයිතිය දක්වන ලේඛන ලබා ගැනීම.

4 හිමිකම් ඔප්පු හෝ මිනින්දෝරු ඔප්පු නැති ලංකා විදුලිබල මණ්ඩලය විසින් උපයෝජනය කරන ඉඩම් හඳුනාගෙන ඒ සඳහා මිනින්දෝරු ප්ලෑන් සකස් කිරීම.

5 අනවසර අත්පත් කරගැනීම් නිසා මායිම් පිළිබඳ ආරවුල් ඇති ලංකා විදුලිබල මණ්ඩලයේ ඉඩම්වල මායිම් නැවත ලකුණු කිරීම.

6 ලංකා විදුලිබල මණ්ඩලයේ වත්කම් (ඉඩම් සහ ගොඩනැගිලි) සඳහා දත්ත පදනමක් සහිත මහා සැලැස්මක් වර්ධනය කොට පවත්වා ගැනීම.

7 ලංකා විදුලිබල මණ්ඩලයට අයත් වාහන පිළිබඳ දත්ත පදනමක් පවත්වා ගැනීම.

8 පාවෙන යානා සහ බෝට්ටු සේවා භාවිතය වැනි විනෝද කටයුතු සහ සංචරන සේවා සඳහා ලංකා විදුලිබල මණ්ඩලය සතු ජල විදුලි ජලාශ කල්බදු ක්‍රමයට ලබාදීම.

9 මිල ගණන් කැඳවීම් කටයුතු සහ ඇගයීම් ගැන තාක්ෂණික සහාය ලබාදීම, (දැයට කිරුළ).

10 දැන්වීම් ප්‍රචාරය සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ පරිශ්‍ර සහ මායිම් තුළ අලුතෙන් හඳුනාගත් ඉඩ කල්බදු ක්‍රමයට ලබාදීම.

11 අනාගත පුළුල් කිරීම් සහ වෙනස් කිරීම් සඳහා ගොඩනැගිලි සාර්ව සංවර්ධනයට භාජන කිරීම.

12 සේවයට ගත නොහැකි තරාපැවි (Transformers) ට්‍රාන්ස්ෆෝමර් බැහැර කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කිරීම.

13 පොලිකාබනේට් බයි ෆීනයිල් (PCB) දූගනයට පාත්‍ර වූ උපකරණ බැහැර කිරීම සඳහා සහමූල්‍යනය (co-financing) පිළිබඳ තොරතුරු ලබාදීම.

### ආයතනික ඒකකයේ ප්‍රධාන කාර්යභාරය

1. වත්කම් කළමනාකරණ අංශයේ ආයතනික කාර්යභාරය, එනම්, කාර්යසාධන ඇගයීම්, උසස් කිරීම්, මාරු කිරීම් සහ වත්කම් කළමනාකරණ අංශයේ සේවකයන්ගේ පුහුණු අවශ්‍යතා සහ විනය පිළිබඳ කටයුතු.

2. වත්කම් කළමනාකරණ අංශයේ අනුප්‍රාප්ති සැලසුම සහ එම අංශයේ සේවකයන් පිළිබඳ ත්‍රෛමාසික ප්‍රගති වාර්තා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්) වෙත ඉදිරිපත් කිරීම.

3. ආයතනික සැලසුම්, ක්‍රියාකාරී සැලසුම්, වාර්ෂික වාර්තා, වාර්ෂික අයවැය සකස් කිරීම සහ මාසික ප්‍රගති වාර්තා සකස් කොට වත්කම් කළමනාකරණ අංශයේ අතිරේක සාමාන්‍යාධිකාරී වෙත ඉදිරිපත් කිරීම.

## පුහුණු ශාඛාව

නූතන ඒකාබද්ධ කර්මාන්ත අවශ්‍යතා අනුව, සේවය කිරීමට හැකිවන පරිදි අධ්‍යාපනය, පුහුණුව සහ කුසලතා වර්ධනය මගින් පරිමිත සේවක පිරිසක් බිහි කිරීමට වසර ගණනාවක් තිස්සේ පුහුණු ශාඛාව පියවර ගෙන ඇත

### ලංකා විදුලිබල මණ්ඩලයේ පුහුණු මධ්‍යස්ථානය - පිළියන්දල

### කාර්ය සාධනය

ඉංජිනේරුවරුන්, ගණකාධිකාරීන්, මධ්‍යම මට්ටමේ තාක්ෂණික සේවා නිලධාරීන්, ලිපිකරු හා සමාන්තර සේවකයන් ද, ක්ෂේත්‍ර සේවයෙහි නියුතු සේවකයන් ද, වර්ෂය තුළ පුහුණු කිරීමට ගත් පියවර පිළිබඳ විස්තර පහත දැක්වේ:

# වත්කම් කළමනාකරණ අංශය

| අනු අංකය | වැඩසටහන් | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 01. | වැඩමුළු, සම්මන්ත්‍රණ සහ ඉංජිනේරුවරුන් සඳහා පුහුණුව | 13 | 557 |
| 02. | ගණකාධිකාරිවරුන් සඳහා පුහුණුව | 01 | 73 |
| 03. | මධ්‍යම මට්ටමේ තාක්‍ෂණික සේවකයන් සඳහා පුහුණුව | 08 | 338 |
| 04. | ලිපිකරු හා සමාන්තර සේවා ඇතුළු ආරක්‍ෂක සේවා කාර්යමණ්ඩලය පුහුණු කිරීම | 29 | 1041 |
| 05. | ක්ෂේත්‍ර සේවයෙහි නියුතු සේවකයන් සඳහා පුහුණුව | 60 | 1618 |
| 06. | බාහිර ආයතනවල සේවකයන් සඳහා පුහුණුව | 07 | 77 |
| 07. | පද්ධති පුහුණු වැඩසටහන් | 03 | 175 |

### ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන් සඳහා බාහිර ආයතනවල ලබාදුන් දේශීය පුහුණුව

ඉංජිනේරුවරුන්, ගණකාධිකාරීන්, මධ්‍යම මට්ටමේ තාක්‍ෂණික නිලධාරීන් ද, ලිපිකරු හා සමාන්තර සේවා කාර්යමණ්ඩලය ද, ක්ෂේත්‍ර සේවා නිලධාරීන් ද ඇතුළුව සේවකයන් 144 දෙනෙකුට තම සේවයට අදාළ වූ පුහුණුව බාහිර තාක්‍ෂණ ආයතන මගින් මෙහෙයවන පුහුණු පාඨමාලා තුළින් ලබා ගැනීමට අවස්ථාව සලසන ලදී.

### යන්ත්‍රාගාර තුළ පුහුණුව

| පුහුණු කාණ්ඩය | ක්ෂේත්‍රය | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| උපාධි අපේක්‍ෂකයන් | විදුලි | 291 |
| | යාන්ත්‍රික | 14 |
| | රසායනික | 7 |
| | සිවිල් | 1 |
| ඩිප්ලෝමා විද්‍යාර්ථීන් | විදුලි | 127 |
| | ඉලෙක්ට්‍රෝනික | 4 |
| | යාන්ත්‍රික | 10 |
| | රසායනික | 1 |
| තාක්‍ෂණික විද්‍යාලවලින් පැමිණි ශිෂ්‍යයන් | තාක්‍ෂණික | 88 |
| | තාක්‍ෂණික නොවන | 29 |

උපාධි අපේක්‍ෂකයන්, ඩිප්ලෝමා විද්‍යාර්ථීන් සහ තාක්‍ෂණික විද්‍යාලවල තාක්‍ෂණික සහ තාක්‍ෂණික නොවන ශිෂ්‍යයන්ට යන්ත්‍රාගාර තුළ ලබාදුන් පුහුණුව පිළිබඳ විස්තර පහත දැක්වේ.

### ආධුනිකත්ව පුහුණු වැඩසටහන (NVQ 4)

විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශය, යොවුන් කටයුතු සහ නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය සහ ලංකා විදුලිබල මණ්ඩලය නිපුණතා හිමි සේවකයන් බඳවා ගැනීමට අවබෝධතා ගිවිසුමට අත්සන් තැබූහ. මේ අනුව ආධුනික විදුලි ශිල්පීන් සඳහා තුන් අවුරුදු පුහුණු වැඩසටහනක් සංවිධානය කිරීමට ද, ඔවුන්ගේ පුහුණුව ගැන අඛණ්ඩ ඇගයීමක් කිරීමට ද, පුහුණු කාලය තුළ ඔවුන්ට දීමනාවක් ගෙවීමට ද ලංකා විදුලිබල මණ්ඩලය එකඟ විය. විශේෂ එක් අවුරුදු විදුලි ශිල්පී පුහුණු පාඨමාලාව සාර්ථක ලෙස නිම කළ ශිෂ්‍යයන් 431 ක් පිළිබඳ විස්තර තාක්‍ෂණික අධ්‍යාපන සහ පුහුණු දෙපාර්තමේන්තුව විසින් සපයන ලදී.

### වෘත්තීය සෞඛ්‍යය සහ ආරක්‍ෂක ඒකකය

වෘත්තීය සෞඛ්‍යය සහ ආරක්‍ෂක ඒකකය බෙදාහැරීමේ සහ ජනන අංශවල සේවකයන් සඳහා මෙම අංශය විසින් වර්ෂය තුළ පහත සඳහන් වැඩසටහන් සහ වැඩමුළු පවත්වන ලදී.

| | වැඩසටහන් | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 01. | ප්‍රථමාධාර පිළිබඳ වැඩමුළුව | 32 | 925 |
| 02. | ගින්දරෙන් ආරක්ෂා වීම පිළිබඳ වැඩමුළුව (දින 1 යි) | 08 | 292 |
| 03. | ඉංජිනේරුවන් සඳහා වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව (දින 5යි) | 02 | 63 |
| 04. | මධ්‍යම මට්ටමේ තාක්ෂණික නිලධාරීන් සඳහා වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව (දින 6යි) | 01 | 45 |
| 05. | ආරක්ෂාව පිළිබඳ වැඩමුළුව (ජංගම) දින 1 යි | 43 | 2436 |
| 06. | රියදුරන් සඳහා වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව (දින 3යි) | 01 | 52 |

### විභාග ඒකකය

බඳවා ගැනීම් සහ තරගකාරී විභාග 21 ක් ද, උසස් වීම් සඳහා සුදුසුකම් ලබා ගැනීමේ විභාග 9 ක් ද, ලිපිකාර සහ ආශ්‍රිත සේවා සඳහා කාර්යක්‍ෂමතා කඩඉම් විභාග 5 ක් ද, මධ්‍යම මට්ටමේ තාක්‍ෂණික සේවකයන් සඳහා සේවාස්ථ විභාග 7 ක් ද, විභාග දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පරිපාලන සංවර්ධන ආයතනය, පිරිස් කළමනාකරණ ආයතනය ආදී ආයතනවල සහාය ඇතිව ප්‍රශස්ත පිරිවැය ගුණාත්මකතාව සහ රහස්‍ය භාවය සහතික වන අයුරින් විභාග ඒකකය විසින් වර්ෂය තුළ දී සංවිධානය කොට මෙහෙයවන ලදී.

# වත්කම් කළමනාකරණ අංශය

### කාසල්රී පුහුණු මධ්‍යස්ථානය

ජනන අංශයේ නුපුහුණු ක්ෂේත්‍ර සේවකයින් සඳහා ද, ආධුනික කණිෂ්ඨ තාක්‍ෂණික සහායකයන්ට ලබාදෙන උපනයන (induction) පුහුණුව (N6) සඳහා ද, කණිෂ්ඨ තාක්‍ෂණික සහායකයන් පුහුණු කිරීම (N5) සඳහාදි, ක්ෂේත්‍ර සේවා සේවකයන්ට මොඩියුලගත පුහුණුව ලබාදීම ද අරමුණු කරගත් ප්‍රථම පුහුණු මධ්‍යස්ථානය මෙය වේ. වසරක් තුළ මෙහෙයවන ලද පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තර පහත දැක්වේ:

| | වැඩසටහන් | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|
| 01. | උපනයන (Induction) පුහුණුව | 211 |
| 02. | කණිෂ්ඨ තාක්‍ෂණික සහායකයන් උසස් කිරීම සඳහා අවශ්‍ය වන පුහුණුව (N5) | 47 |
| 03. | තාක්‍ෂණික සහායකයන් උසස් කිරීම සඳහා පුහුණුව | 41 |
| 04. | මොඩියුලගත පුහුණුව | 389 |

### බාහිර පුහුණු ඒකකය

2013 වසර තුළ බාහිර පුහුණු ඒකකය විසින් විවිධ වර්ගවල සේවකයන්ට පහත සඳහන් පරිදි විවිධ පැවරුම් සඳහා විදේශගත වීමට පහසුකම් සලස්වන ලදී.

| වැඩසටහන | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|
| ප්‍රසම්පාදනය සඳහා වූ භාණ්ඩ නැව්ගත කිරීමට පෙර කළයුතු පරීක්ෂණ (pre shipment inspection & testing) | 205 |
| ශිෂ්‍යත්ව, පුහුණු සහ අධ්‍යයන චාරිකා | 201 |
| වැඩමුළු, සම්මන්ත්‍රණ, සමුළු සහ රැස්වීම් | 127 |
| ක්‍රීඩා කටයුතු | 26 |

### කථන කලා වැඩසටහන

විධායක නිලධාරීන්ගේ සංනිවේදන සහ නායකත්ව කුසලතා වැඩි දියුණු කිරීම සඳහා ඔවුන් වෙනුවෙන් කථන කලා වැඩසටහන් මාලාවක් සාමාන්‍යාධිකාරිගේ අනුමැතිය ඇතිව පුහුණු ශාඛාව විසින් සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකාවේ අත්දැකීම් සහිත පිළිගත් කථිකයන් විසින් මෙහෙයවන ලද මෙම එක් වැඩසටහනක් දින 10 ක් තුළ පැවති අතර, සතියකට එක් දිනක් මේ සඳහා යොදනු ලැබීය.

### පාරිසරික සංවර්ධනය

ඝන අපද්‍රව්‍ය කළමනාකරණයෙහි කොටසක් ලෙස පුහුණු මධ්‍යස්ථානයෙහි ලීටර් 5,000ක ධාරිතාවක් සහිත හරිත වායු ජීව වායු ඒකකයක් ස්ථාපනය කළ අතර එය වසර තුළ බාධාවකින් තොරව ක්‍රියා කර ඇත. එය ආපන ශාලාවෙන් බැහැර කරන පිසින ලද ආහාර සහ ජෛවීය එළවළු / පලතුරු අමුද්‍රව්‍ය හැටියට යොදාගනී. මේ අනුව ලැබෙන ජීව වායුව ආපන ශාලාවෙහි පිසීමට භාවිතා වේ. මෙම ඒකකයෙන් බැහැර කරන ද්‍රව්‍ය එම පරිශ්‍රයෙහිම වවන එළවළු සඳහා පොහොර වශයෙන් භාවිතා වේ.

### විදුලක්පාය ව්‍යාපෘති ඒකකය

නාරාහේන්පිට ලංකා විදුලිබල මණ්ඩලය සතු ඉඩමක ඉදිකිරීමට යෝජිත ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල (විදුලක්පාය) ආශ්‍රිත ඉදිකිරීම් කටයුතු සම්බන්ධීකරණය කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් ස්ථාපනය කරන ලදී. මහල් 11 කින් යුක්තව යෝජිත මෙම ගොඩනැගිල්ලෙහි බිම වර්ග මීටර 27,800 කි. ඒ සඳහා වැය වන මුදල රුපියල් බිලියන 2.6 කි. මේ සඳහා ලංකා විදුලිබල මණ්ඩලය අරමුදල් සපයයි.

### වසර අවසාන වන විට ප්‍රගතිය

1. 2014 මැයි මාසයේ දී ටැම් 400 ක් ඉදි කිරීම සහ ඒවා ගෙබිම සමග ලංකා විදුලිබල මණ්ඩලයට උපදේශකයන් විසින් බාර දීම.

2. අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයකට අනුව උපදේශක සේවා ගිවිසුම 2014 ජුලි 17 දින අවසන් කිරීම.

## වැඩපොළ සහ උපකාරක සේවා ශාඛාව

වැඩපොළ සහ උපකාරක සේවා ශාඛාවට විවිධ සේවා සැපයීම සඳහා මෙහෙයුම් ඒකක 4 ක් ඇත.

### ජනක යන්ත්‍ර ඒකකය

### වර්ෂයේ කාර්යසාධනය පිළිබඳ සාරාංශය

| සේවා වර්ගය | සේවා සංඛ්‍යාව | පිරිවැය (රු.මි.) |
|---|---|---|
| වාර්ෂික නඩත්තුව | 159 | 101.54 |
| පිළිසකර කිරීම / ප්‍රතිෂ්ඨාපනය | 72 | 24.23 |
| ජනක යන්ත්‍ර කුලියට දීම | | |
| • ලංකා විදුලිබල මණ්ඩලය | 54 | 37.12 |
| • පෞද්ගලික සහ රාජ්‍ය පාර්ශ්වයන් | 347 | 100.80 |
| ජනක යන්ත්‍ර ස්ථාපනය | 05 | 19.50 |
| වෙනත් වැඩ | 119 | 5.2 |

### වායු සමීකරණ සහ ශීතකරණ ඒකකය

දිවයින පුරා රෝහල්, වැදගත් පුද්ගලයන්ගේ කාර්යාල සහ ලංකා විදුලිබල මණ්ඩලයේ ස්ථානයන් ඇතුළු රාජ්‍ය අංශයට වායු සමීකරණ සහ ශීතකරණ ඒකකය විසින් පහත සඳහන් සේවාවන් වර්ෂය තුළ ඉටුකරන ලදී.

# වත්කම් කළමනාකරණ අංශය

1. අදාළ අනුග්‍රාහකයන්ගේ අවශ්‍යතා පරිදි නව වායු සමීකරණ සහ ශීතකරණ යන්ත්‍ර සැපයීම සහ ස්ථාපනය.

2. පවත්නා වායු සමීකරණ සහ ශීතකරණ යන්ත්‍ර නඩත්තුව, පිළිසකර කිරීම සහ වැඩි දියුණු කිරීම.

3. උපදේශක සේවා.

### වායු සමීකරණ සහ ශීතකරණ ඒකකය විසින් ඉටු කළ සේවා

| | වැඩ වර්ගය | වැඩ සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|
| | | ලංකා විදුලිබල මණ්ඩලය තුළ රජයේ වැඩ | ලංකා විදුලිබල මණ්ඩලය තුළ ලංවිමයේ වැඩ | කොන්ත්‍රාත්කරුවන් තුළ රජයේ වැඩ | කොන්ත්‍රාත්කරුවන් තුළ ලංකා විදුලිබල මණ්ඩලයේ වැඩ |
| 1 | වාර්ෂික නඩත්තුව | 51 | 93 | 3 | 66 |
| 2 | නව ස්ථාපනයන් | - | - | 2 | 37 |
| 3 | පිළිසකර කිරීම් | 11 | 15 | - | - |
| | මුළු ගණන | 62 | 108 | 5 | 103 |

## සෝපාන ඒකකය

### සේවා පහසුකම්

කොළඹ කොටුව ඩිපෝව, එක් ඉලෙක්ට්‍රෝනික වැඩපොළක් සහ එක් විද්‍යුත් වැඩපොළක් කොලොන්නාව කාර්යාලයෙහි පිහිටුවා ඇති අතර රෝහල් ඩිපෝව ජාතික රෝහල් පරිශ්‍රයේ සිට ක්‍රියාත්මක විය.

### වසර තුළ ඉටු කළ කටයුතු පහත දැක්වේ

1. **සේවා කිරීම ඇතුළු නඩත්තුව**

   පවත්නා සියලු ඔසවනයන් අතුරෙන් 86 ක් ලංකා විදුලිබල මණ්ඩලයේ අධීක්ෂණය යටතේ පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන් / දේශීය නියෝජිත ආයතන විසින් නඩත්තු කරන ලද අතර ඉතිරි 52 ලංකා විදුලිබල මණ්ඩලය විසින්ම නඩත්තු කරන ලදී. මාතර මහ රෝහලේ එක් සයන සෝපානයක් සහ සපුගස්කන්ද ඩීසල් බලාගාරයෙහි එක් සේවා සෝපානයක් පුනරුත්ථාපනය / පිළිසකර කිරීම සිදු කරන ලදුව නඩත්තුව සඳහා වර්ෂය තුළ ලංකා විදුලිබල මණ්ඩලය වෙත පවරා ගන්නා ලදී. පුත්තලමේ ලක්විජය ගල් අඟුරු බලාගාරයෙහි නැවතුම් සේවා (stop service) සහිත සෝපාන 7 න් 2 ක් සහ බණ්ඩාරනායක අනුස්මරණ අන්තර්ජාතික සම්මන්ත්‍රණ ශාලාවේ මගී සේවා හයිඩ්‍රෝලික් සෝපාන අතුරෙන් තුනක් නඩත්තු කිරීම මෙම වසර තුළ ශාඛාව විසින් පවරා ගන්නා ලදී.

2. **වර්ෂය තුළ ඉටු කළ ප්‍රධාන නඩත්තු / පිළිසකර කිරීම්**

   වර්ෂය තුළ අග්‍රාමාත්‍ය කාර්යාලයේ ප්‍රකර්ෂණ (traction) මෝටරය සහ මාතර මහ රෝහලේ ප්‍රකර්ෂණ ඒකකය සහ පාලකය පිළිසකර කිරීම සිදු කරන ලදී. කොළඹ ඇස් රෝහලේ සයන සෝපාන දෙකෙහි යල්පිනූ කම්බි කඹ අළුත් කඹ යොදා ප්‍රතිස්ථාපනය කරන ලදී. යාපනයේ ශික්ෂණ රෝහලේ දිරාගිය ලැන්ඩින් (landing) දොරවල් ප්‍රතිස්ථාපනය කරන ලදී. පුත්තලම ලක්විජය ගල් අඟුරු බලාගාරයෙහි ඇති බොයිලර් සෝපානයේ කඹ ප්‍රතිස්ථාපනය සහ ප්‍රකර්ෂණ ෂීව් (sheave) පිළිසකර කිරීම වසර අවසාන වන විට ඉටුවෙමින් තිබුණි.

3. **පුනරුත්ථාපන සහ නවීකරණ වැඩ**

   කොළඹ ද සොයිසා මාතෘ රෝහලේ පැරණි සයන සෝපානයෙහි පාලක සහ එසවුම් මග රැහැන් ඇදීම (controller and hoist way wiring) වර්ෂය තුළ සම්පූර්ණයෙන්ම පුනරුත්ථාපනය කොට ආරක්ෂිත හා හිරිහැරවලින් තොර සේවයකට ඉඩ සලසන ලදී. වර්ෂය අවසාන වන විට කරාපිටිය මහ රෝහලේ OTIS සයන සෝපානයක් ක්ෂුද්‍ර සකසන (micro processor) පාලකයන් ස්ථාපනය කිරීමෙන් මෙහෙයුම සහ නිතර සිදු වූ බැඳවැටීම් අඩුකර පුනරුත්ථාපනය කොට නවීකරණය කිරීම සිදු වෙමින් පැවතුණි. නූතන උපාංග භාවිත කරමින් මෙම ශාඛාව විසින් පිළිසකර කරන ලද අනෙක් සෝපාන දෙකත් හොඳින් ක්‍රියාත්මක බැවින් රජයේ මුද්‍රණාලයෙහි TITAN වර්ගයේ භාණ්ඩ සෝපානයක් පුනරුත්ථාපනය කිරීම ලංකා විදුලිබල මණ්ඩලයට පවරනු ලැබීය.

4. **නව ස්ථාපනයන්**

   රජයේ රෝහල් සහ මධ්‍යම පළාතේ නුවර පිහිටි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කාර්යාලයෙහි නව ස්ථාපනයන් සිදු කරන ලදී.

# වත්කම් කළමනාකරණ අංශය

5. **උපදේශක සේවා**

ආරක්ෂක අමාත්‍යාංශය, පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය සහ ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලවලට උපදේශක සේවා සපයන ලදී.



ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයෙහි පැවති දින 8 අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලාවට සහභාගී වූවෝ



ආධුනිකත්ව පුහුණු ආයතනයෙහි ශිෂ්‍යයන් පුහුණු කිරීම

## මධ්‍යම වැඩපොළ හා ගරාජය

වසර තුළ ඉටු කළ කටයුතු පහත සඳහන් පරිදි වේ.

1. සියලු මාදිලියේ මෝටර් රථවල එදිනෙදා පිළිසකර කිරීම් සහ සම්පූර්ණ ඇන්ජින් පිළිසකර කිරීම්, දොඹකරවල හයිඩ්‍රෝලික් පද්ධති පිළිසකර කිරීම් සහ වාහනවල ඉන්ධන භාවිතය ගැන පරීක්ෂණ පැවැත්වීම.
2. කොළඹ නගරයේ සහ ශ්‍රී ජයවර්ධනපුර ප්‍රාදේශිකයේ මෝටර් රථ සර්විස් කිරීම.
3. අනතුරුවලට පාත්‍ර වූ වාහන පිළිසකර කිරීම ගැන අදාළ නියෝජිත ආයතන සමග කටයුතු කිරීම.
4. වාහන සපුරා ටින්කර් කිරීම, පින්තාරු කිරීම සහ පුනරුත්ථාපනය.
5. D brackets, Aluminium T Clamps, Drum jacks වැනි විශේෂ යන්ත්‍ර, වානේ සැකිලි ආදිය පිරිසැකසුම.
6. විදුලියමය ස්ථාපනයන් හී විදුලි මෝටර් නැවත එතීම හා විදුලියමය නඩත්තු ගැන කටයුතු කිරීම.

## සිවිල් වැඩ සහ ගොඩනැගිලි ශාඛාව

දිවයින පුරා ඉදිකිරීම් සහ පිළිසකර වැඩ, සිවිල් වැඩ සහ ගොඩනැගිලි ශාඛාව ඉටු කරයි. වසර තුළ මෙම ශාඛාව ඉටු කළ වැඩ පහත දැක්වේ:

1. මහල් තුනකින් යුත් නැගෙනහිර පළාත් කාර්යාලය සැලසුම් කොට ඉදිකිරීම සහ ත්‍රිකුණාමලයේ නේවාසික ගොඩනැගිලි 7 ක් තැනීම.
2. නැගෙනහිර පළාත් කාර්යාලයට දැව භාණ්ඩ සැපයීම සහ ඒවා සවි කිරීම.
3. යාපනයේ මහල් පහකින් යුත් උතුරු පළාත් කාර්යාලය සැලසුම් කොට ඉදිකිරීම.
4. නුවර මහල් 4 කින් යුත් මධ්‍ය පළාත් කාර්යාලය විශාල කිරීම.
5. ගම්පහ මහල් 4 කින් යුත් ප්‍රධාන විදුලි ඉංජිනේරු කාර්යාලය ඉදිකිරීම.
6. දෙල්ගොඩ, වත්තල සහ වේයන්ගොඩ (පළමු අදියර) පාරිභෝගික සේවා මධ්‍යස්ථාන ඉදිකිරීම සහ දිවුලපිටියේ පාරිභෝගික සේවා මධ්‍යස්ථානය පිළිසකර කිරීම.
7. කොලොන්නාවේ පිහිටි කොළඹ නගරයේ ගබඩා ගොඩනැගිල්ල පිළිසකර කිරීම.
8. කිරිබත්ගොඩ පිහිටි බස්නාහිර පළාත් (උතුර) කාර්යාලයෙහි මහල් 4ක් අළුත්වැඩියා කිරීම.
9. කාසල්රී පුහුණු මධ්‍යස්ථානයෙහි වැසිකිලි සමූහ ගොඩනැගිලි දෙකක් ඉදිකිරීම.
10. කැළණිතිස්ස බලාගාරයෙහි පිහිටි සංනිවේදන පාලන මධ්‍යස්ථානයේ දිවා ආහාර කුටිය අළුත්වැඩියා කිරීම සහ අගු වහල පිළිසකර කිරීම.
11. කොලොන්නාවේ ගණකාධිකාරීගේ කාර්යාලය සහ කෙන්ට් පාරේ ආරක්ෂක සංවර්ධන ශාඛාව වැඩි දියුණු කිරීම සහ අළුත්වැඩියාව.
12. මඩකලපුවේ ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු කාර්යාලය සංචාරක බංගලාවකට පරිවර්තනය කිරීම, පිළියන්දල පුහුණු මධ්‍යස්ථානයේ පොකුණ අළුත්වැඩියා කිරීම, කිරිබත්ගොඩ පළාත් ගණකාධිකාරීගේ කාර්යාලය අළුත්වැඩියා කිරීම සහ කැළණිතිස්ස බලාගාරයෙහි සංනිවේදන පාලක මධ්‍යස්ථානයේ වැසි ජල පද්ධතිය පිළිසකර කිරීම සඳහා මිල ගණන් කැඳවීම.

# වත්කම් කළමනාකරණ අංශය

### ආරක්ෂක සේවා ඒකකය

බලාගාර, ජලාශ, කොටුමා උපපොල, ගබඩා, මුදල් කවුන්ටර් ලංකා විදුලිබල මණ්ඩල ප්‍රධාන කාර්යාලය සහ විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශ පරිශ්‍රය ඇතුළු ලංකා විදුලිබල මණ්ඩලයේ අන්තරාය පාත්‍රතාවක් ඇති ස්ථානවල දේපල සහ ජීවිතවල ආරක්ෂාව සඳහා වගකීම ආරක්ෂක ඒකකය සතු විය.

ප්‍රධාන අංශ වන ජනන අංශය, සම්ප්‍රේෂණ අංශය, බෙදාහැරීමේ අංශය, වත්කම් කළමනාකරණ අංශය සහ ව්‍යාපෘති අංශය යන ප්‍රධාන අංශවලට ආරක්ෂාව සැපයීම සඳහා ආරක්ෂක ඒකක යොදවන ලදී. ප්‍රධාන ආරක්ෂක ඒකක යටතේ උප ඒකක 98 ක් වර්ෂය තුළ ක්‍රියාත්මක විය. දිවයින පුරා පිහිටි මණ්ඩලයේ සමහර පරිශ්‍රවල සේවයට යොදවා ඇති පෞද්ගලික ආරක්ෂක සේවා අධීක්ෂණය හ පසුවිපරම ආරක්ෂක කොට්ඨාසයට පැවරී තිබුණි.

ආරක්ෂක සේවක පිරිසගේ කාර්යක්ෂමතාව, විනය, උත්ප්‍රේරණය සහ ඵලදායීතාව වැඩි කිරීම උදෙසා ඔවුන්ගේ දැනුම සහ කුසලතා වර්ධනය අරමුණු කරගත් පුහුණු වැඩසටහන්, වැඩමුළු සහ සම්මන්ත්‍රණ වර්ෂය තුළ මෙහෙවන ලදී.



# මෙහෙයුම්
## සමාලෝචනය



# ආයතනික ක්‍රමෝපාය අංශය

# ආයතනික ක්‍රමෝපාය අංශය

## ආයතනික ක්‍රමෝපාය සහ නියාමන කටයුතු ශාඛාව

ආයතන ක්‍රමෝපාය සහ නියාමන කටයුතු ශාඛාව වර්ෂය තුළ, ලංකා විදුලිබල මණ්ඩලයට නිකුත් කළ ජනන, සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ බලපත්‍ර ඇසුරෙන් පැනනගින සහ ඒ ආශ්‍රිත කරුණු ගැන ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිසමේ අදාළ අංශ සමග සම්බන්ධීකරණ කටයුතු ඉටු කළේය. නියාමන කටයුතුවලට අමතර වශයෙන් මණ්ඩලයේ ආයතනික ක්‍රමෝපාය සම්පාදනය සම්බන්ධීකරණය කිරීමේ වගකීම ද මෙම ශාඛාවට පැවරී තිබුණි.

ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිසමේ අනුමැතිය ඇතිව රජයේ 2015 අයවැය යෝජනාවලට අනුකූලව, 2014 සැප්තැම්බර් 16 දින සිට බලපැවැත්වෙන පරිදි ගෘහස්ත පාරිභෝගිකයන් සඳහා වන විදුලිබල අය ක්‍රමය සහ 2014 නොවැම්බර් 15 දින සිට බලපැවැත්වෙන පරිදි ගෘහස්ත නොවන පාරිභෝගිකයන් සඳහා වන විදුලිබල අය ක්‍රමය සංශෝධනය කරන ලදී. මෙයට අමතරව කර්මාන්ත සඳහා නව අය ක්‍රමයක් 2014 නොවැම්බර් 15 සිට බලපැවැත්වෙන පරිදි හඳුන්වා දෙන ලදී.

ඉහත සඳහන් අය ක්‍රමවේදය අනුව විශේෂිත අවශ්‍යතාවයක් ලෙස ද්වි-වාර්ෂික තොග සැපයුම් අය ක්‍රමය ඉදිරිපත් කිරීම සහ 2015 වසර සඳහා අවසර දී ඇති අය කිරීම් සිදු කරන ලදී.

ලංකා විදුලිබල මණ්ඩලයේ බෙදාහැරීමේ බලපත්‍රලාභීන් සඳහා වන සැපයුම් සේවා සංග්‍රහයන් සම්පාදනය නිම කිරීමට මෙම ශාඛාව ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිසම සමග සමීපව කටයුතු කළේය. තව ද මෙම ශාඛාව සියලු ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්, වාණිජ ඉංජිනේරුවරුන් සහ පළාත්වල සේවය කරන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් දෙකක් පවත්වන ලදී.

ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිසම සකස් කර ඇති "විදුලිබල පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම් සහ වගකීම් ප්‍රකාශය" නම් ලේඛනයෙහි කෙටුම්පත ගැන අදහස් දැක්වීම සූදානම් කිරීමට ශාඛාව විසින් සාකච්ඡා මණ්ඩපයක් හඳුන්වා දෙන ලදී. මෙම සාකච්ඡා මණ්ඩපයේ දී ලැබුණ ප්‍රතිචාර අනුව, ධනාත්මක අදහස් එකතුවක් ඉදිරිපත් කරන ලදී.

අය ක්‍රම කමිටුව සඳහා පත්කර ඇති උපදේශකයන්ගේ සහාය ඇතිව අධ්‍යාපනික සැසියක් පැවැත්වීමෙන් දෙවන වාරය සඳහා (2016 - 2020) බහු වාර්ෂික අයක්‍රම ඉදිරිපත් කිරීම් ක්‍රියාවලියක් ආරම්භ කරන ලදී. ඉන් අනතුරුව තවත් රැස්වීම් දෙකක් පැවැත්විණි. අයක්‍රම ඉදිරිපත් කිරීම සකස් කිරීම වර්ෂය තුළ ඉටුවෙමින් පැවතුණි.

ආයතනික ක්‍රමෝපායට අදාළව පහත සඳහන් ආයතනික ලේඛන මෙම ශාඛාව විසින් සම්පාදනය කරන ලදී.

- 2014 - 2018 සඳහා වන අනුමත ආයතනික සැලැස්ම පදනම් කොටගත් 2015 සඳහා ක්‍රියාකාරී සැලැස්ම.
- වාර්ෂික වාර්තාව - 2013
- සංඛ්‍යාලේඛන සාරාංශ සංග්‍රහය - 2013
- අලෙවි සහ ජනන දත්ත පොත - 2013
- 2014 කාර්යසාධනය සහ 2015 සඳහා වැඩසටහන්

## ව්‍යාපාර සහ මෙහෙයුම් ක්‍රමෝපාය ශාඛාව

වර්ෂය තුළ ව්‍යාපාර සහ මෙහෙයුම් ක්‍රමෝපාය ශාඛාවෙහි ප්‍රධාන කාර්යභාරය වූයේ ලංකා විදුලිබල මණ්ඩලයේ සංවිධාන කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සහ එය පසුවිපරම් කිරීම පහසු කිරීම යි. ලංකා විදුලිබල මණ්ඩලයේ ආයතනික පිළිබිඹුව සහ ආයතනික සංස්කෘතිය වැඩි දියුණු කිරීම සහ ලංකා විදුලිබල මණ්ඩලයේ විවිධ ශාඛාවල කාර්යයන් ප්‍රමිතිකරණයට භාජන කිරීම ද මෙම අංශයේ විෂය පථයට අයත් ය.

'තුලිත ලකුණු පත්‍රය' නමැති ක්‍රමෝපාය කළමනාකරණ මෙවලම සංස්ථානික මට්ටමේ දී උපයෝගී කර ගැනීමත් සමග ක්‍රමෝපාය කළමනාකාරණ කාර්යාලයේ කාර්යභාරය ව්‍යාපාර සහ මෙහෙයුම් ක්‍රමෝපාය ශාඛාවට භාරදෙන ලදී. මෙම ශාඛාව මාස තුනකට වරක් තුලිත ලකුණු පත්‍ර වාර්තා ඉහළ කළමනාකාරිත්වයට භාරදෙයි. මෙයට අමතරව, මුඛ්‍ය කාර්යසාධන දර්ශක ලකුණු පදනම් කොට වැදගත් යයි සිතන කරුණු මෙම ශාඛාව විසින් විශ්ලේෂණය කොට මෙහෙයුම් සමාලෝචන රැස්වීමේ දී ඉහළ කළමනාකාරිත්වයේ අවධානයට පාත්‍ර කරයි. අවධාරණය කරන ලද එබඳු එක් ගැටළුවක් වූයේ, සමබර ලකුණු පත්‍ර අනුව සැලකිය යුතු ලෙස වැඩි දියුණු කළ යුතු සේවක ආරක්ෂාව යි. මෙම කාරණය වෙත සංස්ථානික කළමනාකරණ කාණ්ඩයේ අවධානය යොමු කරන ලදුව ආයතනයේ ආරක්ෂක අවශ්‍යතා වැඩි දියුණු කිරීමට අත්‍යවශ්‍ය පියවර ගන්නා ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් වර්ෂය තුළ මෙහෙයුම් සෞඛ්‍යය සහ ආරක්ෂක ශාඛාව ස්ථාපනය කරන ලදී.

ලංකා විදුලිබල මණ්ඩලයේ පාරිභෝගිකයන් කේන්ද්‍ර කරගත් ආයතනික සංස්කෘතිය වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාව හඳුනාගන්නා ලදුව එහි ප්‍රතිඵලයක් වශයෙන් ලංකා විදුලිබල මණ්ඩලය ශ්‍රී ලංකාවේ ඉතාමත්ම පාරිභෝගික මිත්‍ර ආයතනය බවට පරිවර්තනය කිරීමට උපායමාර්ගයක් සම්පාදනය කරන ලදී. මෙම වර්ෂය "ප්‍රශස්ත පාරිභෝගික සේවා වසර" හැටියට නම් කරන ලදී. කාර්ය බලකායන් දෙකක් සංවිධානය කරන ලදී. එක් බලකායක් තොරතුරු තාක්ෂණ කාර්ය බලකාය හැටියට ද, අනික් බලකාය බෙදාහැරීමේ කාර්ය බලකාය හැටියට ද නම් කරනු ලැබීය. ඒවා විවිධ ශාඛා සමග විවිධ ක්‍රමෝපායන් යොදා ගනිමින් පාරිභෝගිකයන්ට වැඩි සේවයක් සැලසීමට කටයුතු කළහ. වැඩ කෙරෙහි දක්වන ආකල්පය වෙනස් කොට ව්‍යාපාරික කටයුතු කිරීමේ දී නවෝත්පාදනීය වන අයුරින් මූලික වෙනසක් ඇතිවන පරිදි බොහෝ සේවකයන් වෘත්තීය පුහුණුකරුවකු විසින් පුහුණු කරන ලදී.

අන්තර් පාඨශාලීය ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක් දිස්ත්‍රික්ක 10 ක සිංහලෙන් ද, දිස්ත්‍රික්ක 9ක දෙමළෙන් ද ලංකා ගුවන්විදුලි සංස්ථාවේ සහාය ඇතිව පවත්වන ලදී. තරගයෙහි අරමුණ

# ආයතනික ක්‍රමෝපාය අංශය

වූයේ පාසල් ශිෂ්‍යයන්ට ලංකා විදුලිබල මණ්ඩලය ගැන ද, මෙරට විදුලිබල භාවිතය සහ බලශක්ති අංශය ගැන ද, එදිනෙදා ජීවිතයේ දී වැදගත් වන ආරක්ෂිත විදුලිබල භාවිතය ගැන ද වැඩි දැනුමක් ලා ගැනීමට සැලැස්වීමයි. මෙම වැඩසටහන සිටි FM (City FM) නාලිකාව සහ තෙන්ඩ්‍රාල් (Thendral) නාලිකාව මගින් ද සති අන්තයේ දී ප්‍රචාරය කරන ලදී.

විෂය පිළිබඳ විශේෂ දැනුමක් ඇති උපදේශකයන් සමග සාකච්ඡා කිරීමෙන් පසුව විවිධ ගැටළුවලට විසඳුම් සොයා දැන ගැනීම සහ නිර්දේශ කිරීම සඳහා පහසුකම් සලසන්නෙකු සහ සම්බන්ධීකාරකයකු හැටියට ක්‍රියා කිරීමට මෙම ශාඛාවට බලය පවරන ලදී.

## ප්‍රචාරක ඒකකය

විද්‍යුත් මාධ්‍යයට සහ මුද්‍රණ මාධ්‍යයට නිකුත් කරන මාධ්‍ය නිවේදන සහ ලංකා විදුලිබල මණ්ඩලය සංවිධානය කරන සජීවී මාධ්‍ය වැඩසටහන් මෙම ඒකකය මගින් සම්බන්ධීකරණය කරන ලදී. ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන්ට තම සාහිත්‍යමය හැකියාවන් පෙන්වීමට අවස්ථාව සලසන ලංකා විදුලිබල මණ්ඩල නිල පුවත්පත වන "ලංවිම" ද්වි මාසික සඟරාව මෙම අංශය ප්‍රකාශයට පත් කළේය. මෙම අංශයේ අනෙක් කාර්යයන් වනුයේ මණ්ඩලීය පුවත්හසුන සහ වෙනත් මණ්ඩලයේ ප්‍රකාශන ප්‍රකාශයට පත් කිරීම සහ ලංකා විදුලිබල මණ්ඩලයේ විශේෂ උත්සව සම්බන්ධ මාධ්‍ය වැඩසටහන් සංවිධානය කිරීම යි. වර්ෂය තුළ මෙම අංශය විසින් ඉටු කරන ලද වෙනත් කාර්යයන් පහත දැක්වේ.

- ජාතික පුවත්පත් මගින් විවිධ දැන්වීම්, පුවත්පත් අතිරේක සහ පුවත්පත් නිවේදන ප්‍රකාශයට පත් කිරීම.
- ලංකා විදුලිබල මණ්ඩලයේ පුවත්පත් සාකච්ඡා සහ විවිධ මාධ්‍ය වැඩසටහන් සංවිධානය කිරීම.
- ජාතික මට්ටමේ ප්‍රදර්ශන සංවිධානය කිරීම.
- ලංකා විදුලිබල මණ්ඩලයේ විශේෂ උත්සව සම්බන්ධීකරණය කිරීම.
- දැයට කිරුළ ප්‍රදර්ශනය සංවිධානය කිරීම.

## ක්‍රියාකාරී ක්‍රමෝපාය සහ කාර්යක්‍රම ප්‍රවර්ධන ශාඛාව

2010 වර්ෂයේ දෙවන භාගයේ දී ආයතනික ක්‍රමෝපාය අංශය ස්ථාපනය කිරීමත් සමග ක්‍රියාකාරී ක්‍රමෝපාය සහ කාර්යක්‍රම ප්‍රවර්ධන ශාඛාව පිහිටු වීමට මණ්ඩලයේ අනුමැතිය ලැබුණි. මෙම ශාඛාවේ සංවිධාන ව්‍යුහයට මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් පසු 2012 අවසාන භාගයේ දී ශාඛාව නිල වශයෙන් ක්‍රියා කිරීම ආරම්භ කළේ ය.

ක්‍රියාකාරී ව්‍යුහ සංවර්ධනය සහ ප්‍රතිපත්ති සහ කාර්යක්‍රම ප්‍රවර්ධන කටයුතු කිරීම ශාඛාවේ ප්‍රධාන අරමුණු වේ. තව ද, සියලු පද්ධති සහ කාර්යක්‍රම ලේඛනගත කොට ඒවා අදාළ මෙහෙයුම් සහ ක්‍රියාකාරී අත්පොත්වල ඇතුළත් කිරීම සහතික කිරීම ද ශාඛාවේ වගකීමකි.

මේ අනුව ක්‍රියාකාරී ක්‍රමෝපාය සහ කාර්යක්‍රම ප්‍රවර්ධන ශාඛාව 2012 දී පටන් පහත සඳහන් කටයුතු ආරම්භ කර ඇත.

- අනාගත භාවිතය සඳහා අධ්‍යයනය කොට අවශ්‍ය තැන්හී සංශෝධනය කොට යාවත්කාලීන කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩල ක්‍රියාකාරී සහ මෙහෙයුම් අත්පොත් එකතු කිරීම.
- 2013 දී පත් කළ කමිටුවක් මගින් සම්පාදිත ප්‍රාදේශීය විදුලි ඉංජිනේරුවරුන් සඳහා වන සංශෝධිත මෙහෙයුම් අත්පොතෙහි පළමු කෙටුම්පත සම්පාදනය කිරීම.
- 2014 දී පත්කරන ලද විශ්‍රාමලත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සැදුම් ලද කමිටුවක් විසින් සකස් කරන ලද පළාත් භාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි කෙටුම්පත සමාලෝචනය කිරීම.
- චක්‍රලේඛ කළමනාකරණ පද්ධතිය භාවිතා කරමින් වෙබ් අඩවිය මගින් සොයා ගත හැකි වන පරිදි ලංකා විදුලිබල මණ්ඩලය අන්තර්ජාලයේ චක්‍රලේඛ දත්ත පදනමට ඇතුළත් කිරීම සඳහා චක්‍රලේඛ එකතු කොට සංඛ්‍යාකරණයට භාජන කිරීම. මෙම වැඩපිළිවෙල පද්ධතිය මගින් ප්‍රකාශයට පත්කළ චක්‍රලේඛ උපයෝගී කර ගනිමින් 2013 වර්ෂයේ දී සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කරන ලදී.
- 2013 දී ලංකා විදුලිබල මණ්ඩලයේ ව්‍යුහය අධ්‍යයනයට පාත්‍ර කිරීම ආරම්භ විය. ප්‍රථමයෙන් බෙදාහැරීමේ අංශ අධ්‍යයනයට භාජන කොට යෝජනා රැසක් කළමනාකාරිත්වයට ඉදිරිපත් කරන ලදී. වසර අවසාන වන විට සම්ප්‍රේෂණ අංශයේ සහ ජනන අංශයේ ව්‍යුහයන් අධ්‍යයනයට පාත්‍ර වෙමින් තිබුණි.
- පිරිස් අත්පොත්, එනම් නිවාඩු අත්පොත, විනය අත්පොත, ස්ථාන මාරුවීම් ප්‍රතිපත්ති පිළිබඳ අත්පොත සමාලෝචනය කිරීම.
- ආයතනික ක්‍රමෝපාය අංශයේ තනතුරුවලින් කොටසක් සහ (පළාත්) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සඳහා තනතුරු කාර්යය විස්තර සකස් කිරීම.

## පර්යේෂණ සහ සංවර්ධන ශාඛාව

2013 ජනවාරි මාසයේ දී පර්යේෂණ සහ සංවර්ධන ශාඛාව පිහිටුවන ලදී. එම ශාඛාව යටතේ ප්‍රධාන ඒකක තුනක් විය. එනම්, ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණ ඒකකය, පර්යේෂණ සහ සංවර්ධන ඒකකය සහ ආලෝකනය සඳහා වන කලාපීය මධ්‍යස්ථානය වේ.

## ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණ ඒකකය

ශ්‍රී ලංකා විදුලිබල පද්ධතියේ බැර පැතිකඩෙහි (Lord profile) ඉහළ මට්ටමේ කූටප්‍රාප්තියක් සන්ධ්‍යා භාගයෙහි දැකිය හැක. මෙය අඩු කිරීමට මෑත දී පියවර කීපයක් ගෙන ඇති අතර, ඉන් එකක් වනුයේ නව අයක්‍රම ව්‍යුහය හඳුන්වා දීමයි.

# ආයතනික ක්‍රමෝපාය අංශය

කෙසේ වුව ද, වාර්ෂික බැර සාධකය හෙවත් උපරිම ඉල්ලුම සහ සාමාන්‍ය ඉල්ලුම අතර අනුපාතය ක්‍රමයෙන් වැඩිවන නැඹුරුවක් තවදුරටත් පෙන්වයි. එබැවින් පද්ධති බැර පැතිකඩ අධ්‍යයනය කොට පද්ධති බැර වක්‍රය පැතලි කිරීමේ විකල්ප සෙවීම කාලීන අවශ්‍යතාවකි. මෙම ගැටළු ඇමතීමට ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණ ඒකකය 2013 දී පිහිටුවා ඇත.

ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණ ඒකකය වසර තුළ ඉටුකළ සේවාවන් කීපයක් පහත දැක්වේ:

- රාත්‍රී කාලයේ උපරිම ඉල්ලුමට දායකවන්නන් හඳුනා ගැනීම සඳහා සියලු තොග පාරිභෝගිකයන්ගේ බලශක්ති ඉල්ලුම ගැන අධ්‍යයනයක් සිදු කිරීම.
- බලශක්ති කාර්යක්ෂමතාවක් ඇති වීථි ආලෝකන පද්ධතියක් ගැන නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා වීථි ආලෝකන ක්‍රමෝපායක් ගැන සාකච්ඡා සංසදයක් පැවැත්වීම.
- තෝරාගත් කුකුල් ගොවිපල කීපයක අයක්‍රම වර්ගය නිර්ණය කිරීම සඳහා එම ගොවිපලවල බැර අධ්‍යයන මාලාවක් සිදුකොට, එම අධ්‍යයනයන්ගේ ප්‍රතිඵල බෙදාහැරීමේ සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කිරීම.
- ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදල් භාවිතා කොට, ලංකා බැංකුවේ ප්‍රධාන කාර්යාලය සහ රිජ්වේ ආර්යා රෝහල සඳහා ස්මාර්ට් (Smart) ගොඩනැගිලි නියමු ව්‍යාපෘතියක් ආරම්භ කිරීම.
- මාතලේ මහ රෝහල සහ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය සඳහා විස්තරාත්මක බලශක්ති විගණනයක් සහ බලශක්ති කාර්යක්ෂමතා වැඩසටහනක් ආරම්භ කිරීම.
- වයඹ පළාතේ ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන් සඳහා බලශක්ති කාර්යක්ෂමතාව ගැන සම්මන්ත්‍රණයක් පැවැත්වීම.
- නොරච්චෝලෙයි බලාගාරයෙහි මෙහෙයුම් සහ නඩත්තු ඉංජිනේරුවන් සඳහා බලශක්ති කාර්යක්ෂමතාව සහ බලාගාර පරිසරය ගැන සම්මන්ත්‍රණයක් පැවැත්වීම.

## පර්යේෂණ සහ සංවර්ධන ඒකකය

පර්යේෂණ සහ සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය කිරීමේ අදහස ඇතිව පර්යේෂණ මාතෘකා රාශියක් පිළිබඳ පර්යේෂණ, පර්යේෂණ සහ සංවර්ධන ඒකකය සම්බන්ධීකරණය කරයි. එබඳු එක් මාතෘකාවක් වනුයේ වෙරළාශ්‍රිත බෙදාහැරීමේ ප්‍රදේශවල සමුද්‍රීය පරිසර දූෂණය යි. යෝග්‍ය පරිවාරක තෝරා ගැනීම සඳහා සැලසුම් කිරීමේ උපමානයක් හැටියට දූෂණ සිතියමක් (pollution map) යොදාගත හැකි වන පරිදි තෝරාගත් වෙරළ ප්‍රදේශ පිළිබඳ පර්යේෂක කණ්ඩායමක් දූෂණ සිතියමක් සකස් කිරීමෙහි යෙදී සිටිති.

ගුණාත්මක භාවයෙන් යුත් විදුලිබල සැපයුමක් සහතික කොට අගනා වත්කම් විදුලි කෙටීමෙන් ආරක්ෂා කිරීම සඳහා පිළියම් සෙවීමට, පර්යේෂණ කළ යුතු එක් විෂයක් ලෙස විදුලිබල බෙදාහැරීමේ ජාලය කෙරෙහි විදුලි කෙටීම බලපාන ආකාරය තෝරා ගෙන ඇත. ජාතික ජාලයට සුළං බලය සැපයීම මෑත දී සිදුවිය. සුළං බලය ලබාදුන් කොටුමා උපපොලවල විදුලිබල ගුණාත්මකතාව අධ්‍යයනය කිරීම ද පර්යේෂක කණ්ඩායමක් විසින් පර්යේෂණ සහ සංවර්ධන ඒකකයේ ආධාරය ඇතිව අරඹා ඇත.

යෝග්‍ය මෙහෙයුම සහතික කිරීම සඳහා ජනනය සහ සම්ප්‍රේෂණ ක්‍රියාදාමය තුළ පවත්නා ප්‍රධාන මෙහෙයුම් උපකරණවලතත්ත්වය පසුවිපරම් කළ යුතු ය. ප්‍රධාන වත්කම්වල තත්ත්වය පසුවිපරම් කිරීමට යාන්ත්‍රණයක් සහ ක්‍රමවේද සංවර්ධනය කිරීමෙහි ලා ජනන අංශයේ පර්යේෂක කණ්ඩායමක් නිරත වී සිටිති. පර්යේෂණ සහ සංවර්ධන අංශයේ මගපෙන්වීම යටතේ කණ්ඩායම් කීපයක් පර්යේෂණයෙහි නිරත වී සිටින, හඳුනාගත් පර්යේෂණ මාතෘකා වනුයේ "මධ්‍ය වෝල්ටීයතා සහ අඩු වෝල්ටීය බෙදාහැරීමේ පද්ධතිවල ආරක්ෂණය පිළිබඳ අධ්‍යයනය" සහ "බෙදාහැරීමේ ජාලය සඳහා පූර්ණ සුදුසුකම් ඇති අධීක්ෂණ පාලන සහ දත්ත ලබාගැනීමේ ක්‍රමෝපාය පද්ධතියක් ක්‍රියාත්මක කිරීමේ අධ්‍යයනය" වේ.

## කලාපීය ආලෝකකරණ මධ්‍යස්ථානය

දකුණු ආසියාව පිවිතුරුව සහ කාර්යක්ෂමව ආලෝකකරණය කිරීමේ මූලික අරමුණ ඇතිව 2009 වර්ෂයේ දී අන්තර්ජාතික සංවර්ධනය සඳහා වන එක්සත් ජනපද නියෝජිත ආයතනය පිරිනැමූ ප්‍රදානයක් උපයෝගී කොටගෙන ආලෝකකරණ මධ්‍යස්ථානය පිහිටුවන ලදී. 2012 වර්ෂය අවසානය දක්වා මෙම මධ්‍යස්ථානය ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA) විසින් කළමනාකරණය කරන ලදී. 2013 ජනවාරි 01 දින කලාපීය ආලෝකකරණ මධ්‍යස්ථානය ලංකා විදුලිබල මණ්ඩලයට පවරන ලදුව එය පර්යේෂණ සහ සංවර්ධන ශාඛාව යටතට පත්කරන ලදී.

කලාපීය ආලෝකකරණ මධ්‍යස්ථානයේ අරමුණු මෙසේ ය:

- බලශක්තිය පිරිමසින, විශ්වාසදායී සහ පිවිතුරු ආලෝකකරණ තාක්ෂණයන් පිළිබඳ දැනුවත්කම සහ ඒවා මිලට ගැනීමේ හැකියාව වැඩි දියුණු කිරීම සහ එම තාක්ෂණයන් යොදා ගැනීමෙන් ආලෝකකරණය සඳහා පවතින විදුලිබල ඉල්ලුම අඩු කිරීම.
- කලාපයේ ආර්ථිකය වැඩි දියුණු කිරීම සඳහා විදුලිබල පිරිමැස්ම සහිත ආලෝකකරණ නිෂ්පාදන කලාපීය වශයෙන් නිෂ්පාදනය කිරීම උත්ප්‍රේරණය කිරීම සහ වරප්‍රසාද අහිමි බොහෝ පුරවැසියනට ආලෝකකරණය මිලට ගැනීම පහසු කිරීම.
- දකුණු ආසියාවේ චිරස්ථායී ආලෝකකරණය ඇති කිරීම සඳහා කලාපයේ අවශ්‍ය ශ්‍රම බලකාය පුහුණු කිරීම සහ ඔවුනට අවශ්‍ය අධ්‍යාපනය ලබා දීම.

# ආයතනික ක්‍රමෝපාය අංශය

## පුහුණුව සහ අධ්‍යාපනය

කලාපීය ආලෝකරණ මධ්‍යස්ථානය වර්ෂය තුළ පුහුණු වැඩසටහන් දෙකක් පැවැත්විය.




අප්‍රේල් මාසයේ දී එළිමහන් ආලෝකරණය ගැන දෙදින පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. එයට කර්මාන්තයෙහි නියුතු වූවන් 30 ක් පමණ සහභාගී විය. සාකච්ඡාවට භාජන වූ විෂයන් අතර වීථි ආලෝකරණය, එළිමහන් ආලෝකරණ සැලැස්ම සහ ආලෝකරණ ගුණාත්මකතාව විය.

ජුලි මාසයේ දී කලාපීය ආලෝකරණ මධ්‍යස්ථානය විසින් LED ආලෝකරණ තාක්‍ෂණය ගැන දෙදින පුහුණු වැඩසටහනක් කර්මාන්තයෙහි නියුතුවූවන් සඳහා පවත්වන ලදී. LED ආලෝකනයේ විවිධ පැතිකඩ සාකච්ඡාවට භාජන වූ අතර LED උපකරණ එකලස් කිරීම සහ පරීක්‍ෂාවට භාජන කිරීම ගැන සහභාගී වූවන්ට අත්දැකීම් සහිත පුහුණුවක් ලැබිණ. කර්මාන්තයෙහි නියුතු වූවන් 30 දෙනෙක් වැඩසටහනට සහභාගී විය. වැඩසටහන අවසානයේ දී සහභාගී වූවන්ට සහතික ප්‍රදානය කරනු ලැබීය.

## පර්යේෂණ සහ ආදර්ශ නිරූපනය

වර්ෂය තුළ කලාපීය ආලෝකරණ මධ්‍යස්ථානය ආලෝකරණය ආශ්‍රිත පර්යේෂණයන් හී නියුතු වෙමින් ආලෝකරණ ක්ෂේත්‍රයෙහි නවතම සංවර්ධනයන් ආදර්ශ මගින් නිරූපණය කරන ලදී. බලශක්ති ගුණාත්මකතාව CFL කෙරෙහි බලපාන ආකාරය ගැන වසර තුළ පර්යේෂණ පැවැත්විණ.

## නිෂ්පාදන පරීක්ෂණය

අවශ්‍ය උපකරණ පූර්ණ වශයෙන් පවත්නා දීප්තිමිතික රසායනාගාරයක් කලාපීය ආලෝකරණ මධ්‍යස්ථානයෙහි ඇත. මෙම රසායනාගාරයෙහි ප්‍රධාන උපකරණ හැටියට මීටර් 1 සහ මීටර් 2 විෂ්කම්භය සහිත අනුකලක ගෝල දෙකක් ද, ගොනියො මීටර (goniometer) එකක් ද ඇත. ශ්‍රී ලංකාවේ භාවිතයට ගෙන ඇති ප්‍රථම ගොනියො මීටරය මෙය වේ. ගොනියො මීටරයට දීප්තතාව පැතිරීමේ තීව්‍රතාවය මැනිය හැක. දිගටි රේඛීය ආලෝක ප්‍රභවයන්ගේ දීප්තිමාපක පරාමිති මැනීමට විශාලතම අනුකලක ගෝල උපකාරී වෙයි.

සම්ප්‍රදායික ආලෝකන නිෂ්පාදන සහ ඝන අවස්ථාගත ආලෝකරණ නිෂ්පාදනවල දීප්තිමාපක සහ විද්‍යුත් පරාමිති පරීක්ෂා කිරීම කලාපීය ආලෝකරණ මධ්‍යස්ථානය විසින් වර්ෂය තුළ ඉටු කරන ලදී. දැනට ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය විසින් සියළු ආනයනික CFL නිෂ්පාදනවල අවම කාර්යසාධන උපමාන පනවා ඇත. සියලු CFL නිෂ්පාදන SLS 1231 සහ SLS 1225 මගින් දක්වා ඇති අවශ්‍යතා සපුරාලිය යුතු ය. ආනයනිත CFL නියැදි මෙම SLS ප්‍රමිතිවලට අනුකූල වන්නේ ද යන වග පිරික්සීමේ කාර්යය කලාපීය ආලෝකරණ මධ්‍යස්ථානය වර්ෂය තුළ ඉටු කළේය. තව ද, LM 79 අනුව LED නිෂ්පාදන පරීක්ෂාව ද කලාපීය ආලෝකකරණ මධ්‍යස්ථානය ඉටු කළේය. මෙයට අමතරව IEC 17025 අනුව නිෂ්පාදන පරීක්‍ෂාව සඳහා ශ්‍රී ලංකා පිළිගැනීම් මණ්ඩලයෙහි (Sri Lanka Accreditation Board) පිළිගැනීම ලබාගැනීමට කටයුතු කිරීම ද ආරම්භ වී තිබුණි.



## නව්‍ය වර්ධන තත්ත්වයේ ආලෝකකරණ නිෂ්පාදන සහ තාක්ෂණයන් ප්‍රවර්ධනය කිරීම

කාර්යාල, ඇඟලුම් කම්හල්, කර්මාන්ත පහසුතා (facilities), රථගාල්, මාවත්, ගොඩනැගිලි මුහුණත ආදියෙහි අභ්‍යන්තර සහ බාහිර ආලෝකරණය නව්‍යතම තත්ත්වයන්ට ගැලපෙන පරිදි සැලසුම් කිරීමේ කාර්යයන් කලාපීය ආලෝකරණ මධ්‍යස්ථානය විසින් වර්ෂය තුළ ඉටු කරන ලදී. දිය යට ආලෝකරණය අවශ්‍ය ජල විදිනයක් (Water jets) සහිත කොළඹ නගරයේ වටරවුම් කීපයක් සඳහා ආලෝකරණ සැලසුම් සහ වීථි ආලෝකරණ සැලසුම් මෙම මධ්‍යස්ථානය මගින් සිදු කරන ලදී. ඇතැම් වටරවුම් වසර අවසාන වන විට ද ඉදිවෙමින් පැවතුණි.

දේශීය විකුණුම්කරුවන්ට තම නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩි දියුණු කර ගැනීම සඳහා පුනර් පිරිවැද්දුම (retrofitting) පිළිබඳ ආලෝකරණ සැලසුම් සහ බලශක්ති කාර්යක්ෂමතාව ගැන උපදේශන සේවා සැපයීමට කලාපීය ආලෝකරණ මධ්‍යස්ථානයට හැකි විය.

# ආයතනික ක්‍රමෝපාය අංශය

## තොරතුරු තාක්ෂණ ශාඛාව

විදුලිබල මණ්ඩලයේ විවිධ අංශ සඳහා තොරතුරු පද්ධති වර්ධනය කිරීම, තොරතුරු පද්ධති මෙහෙයුම් කළමනාකරණය කිරීම, විද්‍යුත් දත්ත පිරිසැකසුම සහ ජාල සේවා සැපයීම තොරතුරු තාක්ෂණ ශාඛාවේ සේවාවන් වේ. බිල්පත්‍ර සැකසීම, ගිණුම්කරණය, මුදල් එකතුව, ද්‍රව්‍ය කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, විදුලි බලය ඇනහිටීම කළමනාකරණය, විද්‍යුත් තැපැල සහ ලංකා විදුලිබල මණ්ඩල වෙබ් අඩවි පවත්වා ගැනීම සම්බන්ධයෙන් තොරතුරු තාක්ෂණ විසඳුම් සපයනු ලැබේ. 2014 වර්ෂයේ දී ලංකා විදුලිබල මණ්ඩලය ශ්‍රී ලංකාවේ වඩාත්ම පාරිභෝගික මිත්‍ර ආයතනය බවට පත් කිරීමේ අරමුණ ඇතිව හඳුන්වා දුන් ”පාරිභෝගික සේවා ප්‍රශස්ත සත්කාරයේ වසර” පාරිභෝගිකයා වෙත යොමු වූ නවතම මෙහෙයුමකි. මෙම නව මෙහෙයුම සම්බන්ධයෙන් තොරතුරු තාක්ෂණ ශාඛාවට වැදගත් කාර්යභාරයක් ඉටු කිරීමට සිදු විය.

වර්ෂය තුළ මෙම පද්ධතිය, නිවාඩු ඉල්ලුම, මානව සම්පත් කළමනාකරණ යෙදවුම්වල දී ඇගයුම් මොඩියුල භාවිතය, ගෙවීම් යාවත්කාලීන කිරීම, මාස්ටර් ඉන්වොයිස් හඳුන්වා දීම, පළාත්වල මූල්‍ය යෙදවුම් පුළුල් කිරීම, සංඛ්‍යාත වාර්තා කළමනාකරණ පද්ධති සහ නඩු කළමනාකරණ පද්ධතිය යන විෂයන් වෙත තව දුරටත් යොමු විය. ලංකා විදුලිබල මණ්ඩලය තුළ කාර්යමණ්ඩලයට තොරතුරු තාක්ෂණ පුහුණුව ලබා දීම ද මෙම ශාඛාවේ වැදගත් මෙහෙවරකි.

තොරතුරු හුවමාරුවට සහාය වීම සඳහා මෙම ශාඛාවේ විද්‍යුත් දත්ත පිරිසැකසුම සහ ජාල සේවා ප්‍රධාන වශයෙන් යටිතල පහසුකම් කෙරෙහි යොමු විය. සර්වර් (Server) යෙදවුම්, විද්‍යුත් තැපැල් යෙදවුම්, වෙබ් යෙදවුම්, කැප වූ (dedicated) සබඳතා නඩත්තුව සහ පද්ධතියෙහි දත්ත ගබඩා කිරීම චර්යානුගත පිළිවෙත් විය. ප්‍රධාන දත්ත මධ්‍යස්ථානයට අමතර වශයෙන් ආපදා ප්‍රතිසාධන (recovery) පොලක් (site) ස්ථාපනයට කටයුතු කරන ලදී. ජාලයන් විදුලි කෙටීමෙන් ආරක්ෂා කිරීම ශක්තිමත් කරමින් ප්‍රාදේශීය ප්‍රදේශ ජාල සඳහා තන්තු කේබල් යොදන ලදී. පද්ධතියෙහි දත්ත ආරක්ෂා කිරීම සඳහා ගබඩා ප්‍රදේශ ජාලය හඳුන්වා දෙන ලදී. ප්‍රධාන කාර්යාලය සහ පළාත් කාර්යාලවල දත්ත මධ්‍යස්ථානවල ආරක්‍ෂාව ශක්තිමත් කරන ලදී.

පාරිභෝගිකයන්ට ලංකා විදුලිබල මණ්ඩල කාර්යාලයට පැමිණීමෙන් තොරව, සේවා සබඳතා ඇස්තමේන්තු ලබාගැනීම සහ සේවා සබඳතා සඳහා ගෙවීම් එකතු කිරීමේ පහසුව සලස්වන දොරින් දොර සේවයක් තොරතුරු පද්ධති මෙහෙයුම් මගින් හඳුන්වා දෙන ලදී. මේ අනුව එක දිනක් ඇතුළත සේවා සබඳතාවක් ලබා ගැනීමේ හැකියාව නාගරික ප්‍රදේශ කිහිපයකට ලැබී ඇත. රත්මලාන කාර්යාලයෙහි වාහනයෙන් යන ගමන්ම ගෙවීම් කොට කුවිතාන්සි ලබා ගැනීමේ පහසුවක් සලසා ඇත. මෙම ගෙවීම් පාරිභෝගික ගිණුමට එදිනම බැර කරනු ලැබේ. මෙම පහසුව දැනට බස්නාහිර පළාත දකුණ 1 කාර්යාලයට පමණක් සීමා කර ඇත. වෙනත් කොට්ඨාසවලට ද පසුව එය පුළුල් කරනු ඇත. වර්ෂයේ තාක්ෂණික මෙහෙයුම් ගැටළු විසඳීම සහ අදාළව කාර්යමණ්ඩල පුහුණුව ද ශාඛාවේ වෙනත් කාර්යයන් විය.




- පිරිස් ශාඛාව
- නීති ඒකකය
- විශේෂ විමර්ශන ඒකකය
- අභ්‍යන්තර විගණන ශාඛාව

# පිරිස් ශාඛාව

තම සේවය ස්වාධිපත්‍යය, නිර්මාණශීලිත්වය සහ වගකීම සහිතව ඉටු කිරීමට අනුබල දෙමින් ලංකා විදුලිබල මණ්ඩලය මෙම වර්ෂය තුළ සියළුම සේවකයන්ට හිතකාමීව වැඩ කිරීමේ පරිසරයක් ලබා දුන්නේ ය. සතු වූ සීමිත සම්පත් සහ වැඩ කිරීමේ දී මුහුණ දීමට සිදු වූ බාධක මධ්‍යයේ තම සේවක පිරිස සාක්ෂාත් කරගත් කාර්යසාධනයන් ගැන මෙම ශාඛාව සතුටු වේ. ලංකා විදුලිබල මණ්ඩලයේ පිරිස් ශාඛාව පහත සඳහන් කාර්යයන් ඉටු කළ අතර, වෙනත් මානව සම්පත් කළමනාකරණ කාර්යයන් අදාළ අංශවල මානව සම්පත් ඒකක විසින් ඉටු කරන ලදී.

- ස්ථිර සේවක මණ්ඩලයට අයත් පුරප්පාඩු සඳහා නව සේවකයන් බඳවා ගැනීම.
- මානව සම්පත් ප්‍රතිපත්ති සම්පාදනය කිරීම.
- සභාපති තුමා සහ සාමාන්‍යාධිකාරීගේ විෂය පථයට අයත් ශාඛාවල මානව සම්පත් පරිපාලන කටයුතු කිරීම.
- තනතුරු සීමා කිරීම්වලට යටත් සේවකයන් තනතුරෙහි උසස් කිරීම හා සේවකයන් සම්බන්ධ විනය කටයුතු.

2014 වර්ෂය අවසාන වන විට ලංකා විදුලිබල මණ්ඩලයේ සේවය කළ සම්පූර්ණ සේවක සංඛ්‍යාව 16,123කි. 2014 වර්ෂය තුළ සේවයට බඳවාගත් සේවක පිරිස 710 ක් වන අතර, විශ්‍රාම ගැනීම, ඉල්ලා අස්වීම ආදිය නිසා සේවයෙන් ඉවත්ව ගිය සංඛ්‍යාව 913 කි. පාරිභෝගික සහ සේවක පිරිස අතර අනුපාතය 2013 අවසානයේ දී 319 ක් වූ අතර, එය 2014 දී 336 දක්වා වැඩි විය.

ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන්ගේ වයස් විශ්ලේෂණය




සේවකයන්ගේ වයස විශ්ලේෂණය කිරීමේ දී පෙනී යන්නේ ඉදිරි වර්ෂ 5 තුළ සේවකයන් 2,841 ක් පමණ විශ්‍රාම යා යුතු බව ය. එම සේවකයන් අතුරෙන් 17.6%ක් වයස අවුරුදු 55 ට වැඩි වන අතර, සේවකයන් 14.3% ක් වයස අවුරුදු 51 - 55 කාණ්ඩයට අයත් ය. ලංකා විදුලිබල මණ්ඩලය වයස්ගත වන සංවිධානයක් බව ද, අපේක්ෂිත නිපුණතා හිමි වෘත්තියමය සුදුසුකම් ඇති කාර්යමණ්ඩලයක අනාගත අවශ්‍යතාවය සපුරාලීමට ප්‍රවේසමෙන් සකස් කළ වෘත්තීයමය අනුප්‍රාප්තික සැලැස්මක් අවශ්‍ය බව ද, මෙයින් පැහැදිලි වේ.

දීර්ඝ කාලීන වශයෙන් මනා පළපුරුද්දක් ලද සැලකිය යුතු සේවක සංඛ්‍යාවක් සහිත කාර්ය මණ්ඩලයක් ඇති බව ද, 34% පමණ වන සේවක සංඛ්‍යාවකට අවුරුදු 20 ට වැඩි පළපුරුද්දක් ඇති බව ද, පහත දැක්වෙන සේවා විශ්ලේෂණ ප්‍රස්ථාරය දක්වයි.

ලංකා විදුලිබල මණ්ඩලය සේවකයන්ගේ සේවා විශ්ලේෂණය




සේවකයන් අතුරෙන් 8.4%ක් විධායක ශ්‍රේණියට අයත් වන අතර 54.4% ක් පුහුණු සහ අර්ධ වශයෙන් පුහුණු වර්ගවලට අයත් විය.

ලංකා විදුලිබල මණ්ඩල සේවක වර්ගීකරණය



# පිරිස් ශාඛාව

## පත්වීම්

වර්ෂය තුළ පහත සඳහන් වැදගත් පත්වීම් සිදු කරන ලදී.

සේවයෙන් විශ්‍රාම ලැබූ ජේ.එස්. විතානගේ මහතා වෙනුවට 2014 පෙබරවාරි 02 සිට බලපැවැත්වෙන පරිදි පී.එස්. රණසිංහ මහතා අතිරේක සාමාන්‍යාධිකාරී (වත්කම් කළමනාකරණ) ලෙස පත් කරන ලදී.

සේවයෙන් විශ්‍රාම ලැබූ ජේ.ඒ.එස්. පෙරේරා මහතා වෙනුවට 2014 අප්‍රේල් 03 සිට බලපැවැත්වෙන පරිදි ඩබ්.ආර්.ඒ. පෙරේරා මහතා අතිරේක සාමාන්‍යාධිකාරී (බෙදාහැරීමේ අංශය 2) ලෙස පත් කරන ලදී.

සේවයෙන් විශ්‍රාම ලැබූ ඩබ්.ආර්.ඒ. පෙරේරා මහතා වෙනුවට 2014 ජුනි 13 සිට බලපැවැත්වෙන පරිදි ඩී.සී.ජේ. සේරම් මහතා අතිරේක සාමාන්‍යාධිකාරී (බෙදාහැරීමේ අංශය 2) ලෙස පත් කරන ලදී.

සේවයෙන් විශ්‍රාම ලැබූ පී.එස්. රණසිංහ මහතා වෙනුවට 2014 ජුලි 09 දින සිට බලපැවැත්වෙන පරිදි සී.පී.ඩබ්. අකරවිට මහතා අතිරේක සාමාන්‍යාධිකාරී (වත්කම් කළමනාකරණ) ලෙස පත් කරන ලදී.

යූ.කේ.ඩබ්. සිල්වා මහතා අතිරේක සාමාන්‍යාධිකාරී (බෙදාහැරීමේ අංශය 1) විශ්‍රාම ගැනීම සහ වයි.එම්. සමරසිංහ මහත්මිය (අතිරේක සාමාන්‍යාධිකාරී (සම්ප්‍රේෂණ) බෙදාහැරීමේ අංශය 1 ට, අතිරේක සාමාන්‍යාධිකාරී (බෙදාහැරීමේ අංශය 01) ලෙස පත්වීම ලබා මාරුවීමෙන් පසු ජී.ඇස්.පී. මෙන්ඩිස් මහතා 2014 දෙසැම්බර් 20 සිට බලපැවැත්වෙන පරිදි අතිරේක සාමාන්‍යාධිකාරී (සම්ප්‍රේෂණ) ලෙස පත් කරන ලදී.

අතිරේක මුදල් කළමනාකරු (ආයතනික) ව සිටි ටී.කේ. ලියනගේ මහතා 2014 ජුනි 10 සිට බලපැවැත්වෙන පරිදි මුදල් කළමනාකරු ලෙස පත් කරන ලදී.

## මානව සම්පත් ප්‍රතිපත්ති

නව මානව සම්පත් ප්‍රතිපත්ති සම්පාදනය සහ පවත්නා මානව සම්පත් ප්‍රතිපත්ති සංශෝධනය මානව සම්පත් ප්‍රතිපත්ති කමිටුව මගින් අඛණ්ඩව සිදු කරනු ලැබේ. ලංකා විදුලිබල මණ්ඩලයේ සියළුම අංශවල මානව සම්පත් කළමනාකරණය භාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරු මානව සම්පත් ප්‍රතිපත්ති කමිටුවේ සාමාජිකයෝ වෙති.

ලංකා විදුලිබල මණ්ඩලයේ අරමුණු, සාක්ෂාත් කරගැනීම සඳහා සේවකයන් උත්ප්‍රේරණය කරන පරිසරයක් ගොඩනැගීම සඳහා 2014 වසර තුළ සේවක යහපත සැලසෙන යෝජනා ක්‍රම රැසක් ලංකා විදුලිබල මණ්ඩලය විසින් ක්‍රියාත්මක කර ඇත. මෙම යෝජනා ක්‍රම අතර ප්‍රසාද දීමනා ගෙවීම, ලබා නොගත් අසනීප / විවේක නිවාඩු සඳහා දිරි දීමනා ගෙවීම සහ විවිධ විශේෂ මූල්‍ය අත්තිකාරම් ගෙවීම වේ.

## ප්‍රසාද දීමනා ගෙවීම

ඉකුත් වසරවල ප්‍රසාද දීමනා ගෙවූ පදනම මත පිහිටා ලංකා විදුලිබල මණ්ඩල සේවකයන්ට 2014 වසර සඳහා ද ප්‍රසාද දීමනා ගෙවන ලදී. මේ සඳහා දරන්නට සිදු වූ වියදම රු. මිලියන 690 කි.

## ලබා නොගත් අසනීප / විවේක නිවාඩු සඳහා දිරි දීමනා ගෙවීම

සේවයට නොපැමිණීමේ නැඹුරුව අඩුකොට ඵලදායීතාව වැඩි කිරීමේ අරමුණ ඇතිව, ලංකා විදුලිබල මණ්ඩලයෙහි ලබා නොගත් අසනීප / විවේක නිවාඩු සඳහා දිරි දීමනා ගෙවීමේ යෝජනා ක්‍රමයක් 1984 සිටම ක්‍රියාත්මක විය. මෙම යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ 2014 වර්ෂයේ දී ද ලබාදෙන ලදී. මේ අනුව මෙම වර්ෂයේ දී කළ සම්පූර්ණ ගෙවීම රුපියල් මිලියන 554 කි.

## සිංහල / හින්දු අළුත් අවුරුද්ද සඳහා විශේෂ අත්තිකාරමක් ගෙවීම

සිංහල / හින්දු අළුත් අවුරුද්ද වෙනුවෙන් ලංකා විදුලිබල මණ්ඩල සේවකයන්ට 2014 වසරේ අප්‍රේල් මාසයේ දී විශේෂ අත්තිකාරමක් සහ වැටුප් අත්තිකාරමක් ගෙවන ලදී.

## රාමසාන් උත්සවය සඳහා විශේෂ අත්තිකාරමක් ගෙවීම

ලංකා විදුලිබල මණ්ඩලයේ මුස්ලිම් භක්තික සේවකයන්ට ඉකුත් වසරවල දී මෙන් 2014 වසරේ දී ද විශේෂ අත්තිකාරමක් සහ වැටුප් අත්තිකාරමක් ගෙවන ලදී.

## සුබ සාධන ඒකකය

සේවකයන්ගේ සුබ සාධනය ගැන කටයුතු කිරීම සඳහා සුබ සාධන ඒකකය පිහිටුවන ලදී.

උඩරට ප්‍රදේශයේ හැටන් සහ බණ්ඩාරවෙල වැනි ස්ථානවල ද, ආගමික / පුරාවිද්‍යාත්මක වැදගත්කමක් ඇති අනුරාධපුර, මින්නේරිය, නුවර, කතරගම සහ යාපනය වැනි ස්ථානවල ද සංචාරක බංගලා ජාලයක් ලංකා විදුලිබල මණ්ඩලය පවත්වාගෙන යයි. මෙම සේවය නිවාඩු කාලය ගත කිරීම සඳහා සේවකයන්ට ප්‍රයෝජන ගත හැකි ප්‍රමුඛතම ප්‍රතිලාභයක් වේ. නවාතැන් ගන්නා පිරිසට ඉතා හොඳ සේවයක් ලැබෙන පරිදි මෙම බංගලාවල පහසුකම් අඛණ්ඩව දියුණු කරනු ලැබේ.

ක්‍රීඩා සමාජයේ ක්‍රියාකාරකම් සඳහා වාර්ෂිකව ප්‍රදානයක් සිදු කරමින් ලංකා විදුලිබල මණ්ඩලය තම සේවකයන්ට ක්‍රීඩා සහ විනෝද කටයුතුවලට සහභාගී වීමට අනුබල දෙයි.

ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන් සහභාගී වූ ක්‍රීඩා උත්සවයක් 2014 ඔක්තෝබර් 17 දින සාර්ථක ලෙස පවත්වන ලදී. තරඟ බොහොමයක් පවත්වන ලද්දේ කලාපීය

# පිරිස් ශාඛාව

මධ්‍යස්ථානවලය. පා පන්දු, වොලිබෝල්, එල්ලේ සහ මේස පන්දු තරග පිළිවෙළින් යාපනය, අනුරාධපුරය, බුත්තල සහ මහනුවර පවත්වන ලදී. අවසන් ධාවන සහ ක්ෂේත්‍ර තරග කොළඹ සුගතදාස ක්‍රීඩාංගනයේ දී පවත්වන ලදී. යාපනයේ පැවති පා පන්දු තරගය සියලු සහභාගීකරුවන්ට සහ යාපනයේ වැසියන්ට උද්‍යෝගීමත් තරගයක් වූ බව සතුටින් සඳහන් කළ යුතුව ඇත. තරගයේ එක් අවස්ථාවක් මේ සමග පලවන චිත්‍රයෙහි දැක්වේ.



ලංකා විදුලිබල මණ්ඩල බෞද්ධ සංගමය සහ ලංකා විදුලිබල මණ්ඩල ක්‍රිස්තියානි සංගමය වැනි සමාජ මගින් සංවිධානය කරනු ලබන වෙසක් උත්සවය, පොසොන් උත්සවය සහ නත්තල් උත්සවය වැනි උත්සව සඳහා වාර්ෂික ප්‍රදානයන් කරමින් සේවකයන්ගේ ආගමික කටයුතුවලට ලංකා විදුලිබල මණ්ඩලය අනුබල දෙයි. ඊට අමතරව අගෝස්තු මාසයේ දී මහනුවර දළදා මාළිගාවේ දී ද, දෙසැම්බර් මාසයේ මාඋස්සාකැලේ සමන් දේවාලයේ ද, ජූනි මාසයේ මිහින්තලේ ද, අගෝස්තු මාසයේ කතරගම කිරිවෙහෙරේ ද ලංකා විදුලිබල මණ්ඩලය වාර්ෂික උත්සව සංවිධානය කරයි.

ඩී.ජේ. විමලසුරේන්ද්‍ර මහතාගේ 140 වන උපන් දිනය සැමරීමේ ක්‍රියාකාරකම්වල කොටසක් වශයෙන් 2014 සැප්තැම්බර් 17 දින සුබ සාධන ඒකකය විසින් විමලසුරේන්ද්‍ර දිනය සමරණ ලදී. තව ද, 2014 නොවැම්බර් 01 දින ලංකා විදුලිබල මණ්ඩල දිනය සමරන උත්සවය ද පවත්වන ලදී.

දුරස්ථ ස්ථානවල පිහිටා ඇති ජනන අංශයේ සියලු බලාගාර ආශ්‍රිතව පැවැත්වෙන මොන්ටිසෝරි පාසල් සඳහා සේවකයන් වෙනුවෙන් සලසන සේවයක් වශයෙන් ලංකා විදුලිබල මණ්ඩලය අරමුදල් සපයයි.

## ආයතනික සමාජ වගකීම්වලට අදාළ කටයුතු

සේවකයන්ගේ යහපත උදෙසා වඩා හොඳ සේවා පරිසරයක් ඇති කිරීමටත්, කණ්ඩායම් හැඟීම වර්ධනය කිරීමටත්, සේවකයන්ගේ නිපුණතා දියුණු කිරීමටත්, ක්‍රීඩා උත්සව, කලා උළෙල ආදිය වර්ෂය තුළ සංවිධානය කරන ලදී. තව ද, ලේ දන්දීමේ ව්‍යාපාර, ආගමික සහ සංස්කෘතික ක්‍රියාකාරකම් වැනි සමාජ වටිනාකමක් ඇති කටයුතු ද වර්ෂය තුළ පැවැත්විණි.



ලේ දන්දීමේ වැඩසටහන



නැගෙනහිර පළාතේ බෞද්ධ සංගමය විසින් වෙසක් පොහොය දින ගිරිහඬු සෑය ආලෝකමත් කිරීම

# නීති ඒකකය

වර්ෂය තුළ ලංකා විදුලිබල මණ්ඩලයේ සියළු නෛතික කටයුතු සහ නඩුමගට පිවිසීමේ කටයුතු නීති ඒකකය මගින් ඉටු කරන ලදී. එම ඒකකයේ ප්‍රධානියා ප්‍රධාන නීති නිලධාරී වන අතර, ඔහුගේ සහාය පිණිස නීති නිලධාරීන් 5 දෙනෙක් ද, තවත් කාර්ය මණ්ඩලයක් ද ඇත. ලංකා විදුලිබල මණ්ඩලය විසින් පවරන ලද නඩු සහ ලංකා විදුලිබල මණ්ඩලයට එරෙහිව අනෙක් අය පවරන නඩු සම්බන්ධයෙන් පැනනගින කරුණු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම නීති ඒකකයේ වගකීමයි.

පළමු වර්ගයේ කටයුතු;

- මනු දෝෂ / අපචේශනය ආදියට සම්බන්ධ විදුලි බිල්පත් සංශෝධනය කිරීම් / විසන්ධනයන්ට අනතුරුව හිඟ මුදල් අයකර ගැනීම.
- ගිවිසුම් / කොන්ත්‍රාත්තු කඩ කිරීමෙන් මතුවන ගැටළු.
- ලංකා විදුලිබල මණ්ඩලයේ දේපල / වාහනවලට සිදුවන හානි සඳහා වන්දි අයකර ගැනීම.
- ලංකා විදුලිබල මණ්ඩල නිවාස අත්පත් කර ගැනීම්වලින් නිදහස් කර ගැනීම / ඉඩම් කටයුතු.

දෙවන වර්ගයේ කටයුතු;

- විසන්ධි කිරීම් සහ බිල්පත් සංශෝධනයට විරුද්ධව ගන්නා ක්‍රියාමාර්ග
- තෙවන පාර්ශ්වයකට අයත් දේපල මත විදුලි රැහැන් ඇදීමට එරෙහිව නිරෝධාඥාවන් / තහනම් නියෝග / එවන් දේපල, ඉඩම්, ගස් / වෘක්ෂලතා ආදියට සිදුවන හානි සඳහා වන්දි ඉල්ලීම.
- ටෙන්ඩර් / කොන්ත්‍රාත් වැඩවලට අදාළ පොරොන්දු කඩ කිරීම්, ක්‍රියාදාම උල්ලංඝනයන් සහ වන්දි ඉල්ලීම්.
- සේවය අත්හිටු වීම, සේවක - සේව්‍ය ගැටළු ආදිය. මූලික අයිතිවාසිකම් ඉල්ලුම් පත්‍ර, කම්කරු උසාවි / කාර්මික උසාවි / කම්කරු දෙපාර්තමේන්තු කටයුතු.

ලංකා විදුලිබල මණ්ඩලය බාහිර පාර්ශ්වයන් සමග එළඹෙන මූල්‍ය ගිවිසුම්, වාණිජ ගිවිසුම් සහ බලශක්තිය මිලට ගැනීමේ ගිවිසුම් ඇතුළු සියළු ගිවිසුම් / කොන්ත්‍රාත්තුවල නෛතික තත්ත්වය සහතික කිරීම සඳහා නෛතික අංශය විසින් පරීක්ෂාවෙන් කියවා බැලීම අවශ්‍ය විය.

- නොතාරිස් වැඩ
- කල්බදු ගිවිසුම්
- ලංකා විදුලිබල මණ්ඩලය බාහිර පාර්ශ්වයන්ගෙන් දේපල මිලට ගැනීමේ අවස්ථාවලදී අත්සන් කරන පැවරුම් ඔප්පුග
- නෛතික මතය - ලංකා විදුලිබල මණ්ඩලයට අදාළ සියළු කරුණු සම්බන්ධයෙන් නෛතික මතය ඉදිරිපත් කිරීම.
- ආරවුල් බේරුම් කිරීම - 1995 අංක 11 දරන ආරවුල් බේරුම් කිරීමේ පනත අනුව ආරවුල් බේරුම් කිරීම සඳහා යොමු කරනු ලබන ලංකා විදුලිබල මණ්ඩලය සහ බාහිර පාර්ශ්වයන් අතර ආරවුල්. 2014 වර්ෂයේ දී ආරවුල් බේරුම් කිරීම් 5 ක් සම්බන්ධයෙන් නීති අංශය කටයුතු කර ඇත.
- ඉඩම් පිළිබඳ කරුණු - ලංකා විදුලිබල මණ්ඩලයේ දේපල නියමානුකූල කිරීම සඳහා විවිධ ආකාරයෙන් වත්කම් කළමනාකරණ ශාඛාවට උපදෙස් දීම / සහාය වීම සිදුවේ.

# විශේෂ විමර්ශන ශාඛාව

අනවසරයෙන් විදුලිය ලබාගැනීම සහ මනු අපචේශනය ගැන විමර්ශන ඉක්මන් කිරීම සඳහා 1995 දී විමර්ශන කළමනාකරු යටතේ විශේෂ විමර්ශන ශාඛාවක් ස්ථාපනය කරන ලදී. මෙම විමර්ශනය සඳහා පළාත්වල කඩාපනින විමර්ශන කාණ්ඩ 18 ක් යොදවා ඇත.

විශේෂ විමර්ශන ශාඛාව වර්ෂය තුළ ලැබූ ප්‍රගතිය පහත දැක්වේ;

| විමර්ශන වර්ගය | විමර්ශන සංඛ්‍යාව | උසාවි දඩය (රුපියල් මිලියන) | ලංකා විදුලිබල මණ්ඩලයට සිදු වූ පාඩුව (රුපියල් මිලියන) | මුළු ගණන |
|---|---|---|---|---|
| මනු අපචේශනය | 2077 | 14.72 | 177.76 | 192.48 |
| කොකු ගසා විදුලිය ගැනීම | 1122 | 6.98 | 13.31 | 20.29 |
| මුළු ගණන | 3199 | 21.70 | 191.07 | 212.77 |

මෙම විමර්ශනවලට අමතරව, විවිධ අයගෙන් අක්‍රමිකතා පිළිබඳව විශේෂ විමර්ශන ශාඛාවට ලැබුණු පැමිණිලි ගැන විමර්ශන රැසක් සිදුකරන ලදී. ඒ අනුව අදාළ නිලධාරීන් සහ සේවකයන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කර ඇත.

# අභ්‍යන්තර විගණන ශාඛාව

## කාර්යසාධනය

අභ්‍යන්තර විගණන ශාඛාව ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපතිට සෘජුවම වාර්තා කරන ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ අධීක්ෂණය යටතේ පවතී. ලංකා විදුලිබල මණ්ඩලයට සහ ලංකා විදුලිබල මණ්ඩල කළමනාකාරිත්වයට ආයතනික පාලන වගකීම් ඉටු කිරීමෙහි ලා සහාය වීම සහ ලංකා විදුලිබල මණ්ඩලයේ ව්‍යාපාරික කටයුතු සහ මෙහෙයුම් ක්‍රියාදාමයන් ඵලදායී සහ කාර්යක්ෂම ලෙස වැඩි දියුණු කොට ප්‍රවර්ධනය කිරීම අභ්‍යන්තර විගණක ශාඛාවේ අරමුණ යි.

නියැදි සහ තර්කාන්විත ක්‍රියාදාම උපයෝගී කොට ගෙන, පවත්නා ප්‍රතිපත්ති සහ ක්‍රියාදාම සමග අභ්‍යන්තර පාලන පද්ධති අනුකූල වන ආකාරය සහ ඵලදායී වන ආකාරය සත්‍යායනය කරමින් අනුකූල නොවන අවස්ථාවන්හී සුවිශේෂ වන කරුණු අභ්‍යන්තර විගණක ශාඛාව වෙසෙසා දක්වයි. මෙම ශාඛාවෙහි

විධායක නිලධාරීන් 25 දෙනෙක් ද, විධායක නොවන නිලධාරීන් 20 දෙනෙක් ද, වෙනත් නිලධාරීන් 9 දෙනෙක් ද සේවය කරති.

සියළුම ශාඛා සහ ඒකක ගැන විගණනය සිදු කරනු ලබන අතර, එම විගණනයන් පවත්වන වාර ගණන අවදානමෙහි තීව්‍රතාවය සහ කාර්ය මණ්ඩලයේ ප්‍රමාණවත් බව මත රඳා පවතී. 2014 වර්ෂයේ දී මෙම ශාඛාව විසින් පහත සඳහන් විගණන කාර්යයන් ඉටු කරන ලදී;

| | |
|---|---|
| සිරිත්හුරු විගණනයන් | 21 |
| ආදායම් විගණනයන් | 11 |
| පද්ධති විගණනයන් | 32 |
| විශේෂ විමර්ශන | 29 |
| මුළු ගණන | 93 |

## විගණන කමිටුව

### සංයුතිය

මූල්‍ය සහ විගණනය හා අදාළ ක්ෂේත්‍ර ගැන මනා දැනුමක් සහ පුළුල් අත්දැකීමක් ඇති ස්වාධීන අධ්‍යක්ෂ මණ්ඩලීය සාමාජිකයන් 4 දෙනෙකුගෙන් විගණක කමිටුව සෑදී ඇත. 2014 වර්ෂයේ දී පහත සඳහන් අධ්‍යක්ෂවරුන් මෙම කමිටුවෙහි සේවය කර ඇත.

ඩබ්.ඩී. ජයසිංහ මහතා (සභාපති)
එස්. විරිතමුල්ල මහතා (සාමාජික)
ආර්.ඒ.ඒ.කේ. රණවක මහතා (සාමාජික)
එම්.ටී.අයි.වී. අමරසේකර මිය (සාමාජික)

කමිටුවේ කැඳවුම් කරු වූයේ අභ්‍යන්තර විගණක අංශයේ ප්‍රධානියා ය.

2014 වසරේ දී කමිටුව විධිමත් රැස්වීම් 9 ක් පවත්වා ඇත. මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරී වන සාමාන්‍යාධිකාරී ද, මූල්‍ය කළමනාකරු ද, විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිත මහතෙක් ද, රැස්වීම්වලට ආරාධනය මත සහභාගී විය.

### කමිටුවේ කාර්යභාරය

මණ්ඩලයේ සියළුම අංශවල මෙහෙයුම් සහ මූල්‍ය කටයුතු පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තා සහ බාහිර විගණක වාර්තා විගණක කමිටුව විසින් සමාලෝචනය කිරීම සහ සාකච්ඡාවට භාජන කිරීම සිදුවිය. විගණන කමිටු තම පෘථුල අත්දැකීම් සහ විශේෂඥතාව පදනම් කර ගනිමින් මෙම වාර්තා සමාලෝචනය කොට, පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ශක්තිමත් කිරීමට අවශ්‍ය විට, අවශ්‍ය පරිදි ක්‍රියාත්මක කළ හැකි අතිරේක පාලන විධි සහ අවදානම් තත්ත්වයන් අවම කිරීමේ උපායමාර්ග නිර්දේශ කළේය. එමගින් මණ්ඩලයට අනාගතයේ දී වංචා, වැරදි සහ ඒවායේ බලපෑමට ද මෙහෙයුම් සහ මූල්‍ය අවදානම සහිත දෑවලට ද මුහුණ දීමට ඇති ඉඩ අවම කරන ලදී. විගණනයන් සැලසුම් කිරීම, ඒවායේ විෂය පථය සහ ගුණාත්මකතාව ගැන විශේෂ අවධානයකින් යුක්තව අභ්‍යන්තර විගණක කාර්යයන් කමිටුව විසින් සමාලෝචනය කරන ලදී.

වර්ෂය තුළ අභ්‍යන්තර විගණන වාර්තා සහ විගණකාධිපතිගේ වාර්තා සමාලෝචනය කොට, ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් වඩාත් තීව්‍ර කිරීමට මාර්ගෝපදේශ සහ විධානයන් විගණන කමිටුව විසින් සපයන ලදී.



# මූලාශ්‍ර තොරතුරු



# මූල්‍ය අංශය

# මූල්‍ය අංශය

ලංකා විදුලිබල මණ්ඩලයේ සමස්ත මෙහෙයුම සම්බන්ධ වැදගත් මෙහෙවරක් මූල්‍ය අංශය වසර තුළ ඉටු කළ අතර, එහි මූල්‍ය මෙහෙයුම් ඵලදායීව සහ කාර්යක්ෂමව මෙහෙයවීමේ වගකීම මූල්‍ය අංශය උසුලයි.

මූල්‍ය කටයුතු ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා යෝග්‍ය මූල්‍ය සැලසුම්කරණය සහ අයවැය පාලනය, මූල්‍ය මෙහෙයුම් සමීපව පසුවිපරම් කිරීම සහ අධීක්ෂණය සහ මූල්‍ය ආයතන සමග අදහස් හුවමාරුව මූල්‍ය අංශය විසින් ඉටු කළ යුතු විය.

2014 වසරේ දී මූල්‍ය අංශය සුසංවිධිත කොට එහි කාර්යක්‍ෂමතාව සහ ඵලදායීතාව දියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග රාශියක් අනුග මනය කරන ලදී.

වර්ෂය තුළ ආදායම් එකතුව වැඩි දියුණු වීම තවදුරටත් පැවතුණි. අන්තර්ජාල / කෙටි පණිවුඩ මත (SMS) ගෙවීම් ක්‍රමය හඳුන්වා දීමෙන් පාරිභෝගිකයන්ගේ විදුලි බිල්පත් තත්‍ය කාල මාදිලිය අනුව ගෙවීම යාවත්කාලීන කිරීම සඳහා මහජන බැංකුව සමග කටයුතු ශක්තිමත් කරන ලදී. එමගින් ගෙවීම් කවුළු වෙත නොගොස් බිල්පත් ගෙවීමේ පහසුව පාරිභෝගිකයන්ට ලැබිණ. නව එකතු කිරීමේ නියෝජිතයන්, එනම් ඩයලොග් (eZcash) සහ මොබිටෙල් (Mcash) පත් කිරීමෙන් වර්ෂය තුළ විදුලි බිල්පත් ගෙවීමේ ක්‍රම තවදුරටත් වැඩි දියුණු කරන ලදී.

ගණකාධිකාරීන් සඳහා මෙරට මෙන්ම පිටරට ද පුහුණු වැඩසටහන් සහ වැඩමුළු රැසක් පවත්වන ලදී. අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති ගැන පුහුණුව සඳහා ගණකාධිකාරීවරුන් කණ්ඩායමක් සිංගප්පූරුවට යවන ලදී. පාරිභෝගිකයන් සමග කටයුතු කිරීමේ දී සපයන සේවාවේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා ආයතනික සහ ක්‍රමෝපාය අංශය මගින් සියලුම ගණකාධිකාරීවරුන් සඳහා විශේෂ එක් දින වැඩසටහනක් පවත්වන ලදී.

## ලංකා විදුලිබල මණ්ඩල අර්ථසාධක අරමුදල

1958 අංක 15 දරන අර්ථසාධක අරමුදල් පනත යටතේ ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක අරමුදල පෞද්ගලික අර්ථසාධක අරමුදලක් ලෙස පැවැත්වේ. එය 7 දෙනෙකුගෙන් සමන්විත කළමනාකරණ කමිටුවක් මගින් කළමනාකරණය කරනු ලැබේ. එම කමිටුවේ සභාපති හැටියට ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපතිතුමා නිල බලයෙන් පත්වන අතර, නියෝජ්‍ය සභාපති නිල බලයෙන් ලංකා විදුලිබල මණ්ඩල සාමාන්‍යාධිකාරී වේ. අනෙක් නිල බලයෙන් පත්වන කමිටු සාමාජිකයන් නම් ලංකා විදුලිබල මණ්ඩල මූල්‍ය කළමනාකරු සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්) වෙති. අනෙක් සාමාජිකයන් තිදෙනා මණ්ඩලය මගින් නම් කරනු ලැබේ. මණ්ඩලය මගින් පත් කරනු ලබන අරමුදලේ ලේකම් / ගණකාධිකාරී එහි භාණ්ඩාගාරික ධූරය දරන අතර ඔහු අරමුදලේ එදිනෙදා පරිපාලනය පිළිබඳ වගකීම දරයි.

2014 වර්ෂය තුළ අරමුදල සඳහා ලැබුණ සම්පූර්ණ දායක මුදල රුපියල් මිලියන 2,008 ක් වන අතර, එයින් රුපියල් මිලියන 803 ක් මණ්ඩලයේ සේවකයන්ගෙන් ලැබුණ දායක මුදල් වේ.

2014 දෙසැම්බර් 31 වන විට එකතු වී තිබුණ සම්පූර්ණ අරමුදල, රුපියල් මිලියන 39,872 කි. එය ඉකුත් වසරට වඩා 6.05% ක වැඩි වීමකි. භාණ්ඩාගාර බිල්පත් සහ තිළිනපත්වල ද, රාජ්‍ය බැංකුවල ස්ථිර තැන්පතුවල ද, මුදල් ආයෝජනය කිරීමෙන් සහ සේවකයන්ට ණය ලබා දීමෙන් අරමුදලේ ප්‍රධාන ආදායම ලබාගෙන ඇත. අරමුදල වර්ෂය තුළ ආයෝජන මගින් උපයාගත් මුදල රුපියල් මිලියන 4,125 කි. වසර අවසානයේ දී ලාභාංශ වශයෙන් 10.62% ක් ප්‍රකාශයට පත්කරනු ලැබීය. සාමාජිකයන්ට වසර තුළ ලබාදුන් ණය මුදල රුපියල් මිලියන 1,770 කි. සේවයෙන් විශ්‍රාම ගත් සේවකයින්ට වසර තුළ අරමුදලෙන් ආපසු ලබා දුන් මුදල රුපියල් මිලියන 2,929 කි.

වර්ෂය අවසාන වන විට අරමුදලට දායකව සිටි සාමාජික සංඛ්‍යාව 16,101 කි. එම සංඛ්‍යාවෙන් 788 ක් නව සාමාජිකයෝ වූහ. වසර තුළ සේවයෙන් විශ්‍රාම ගත සංඛ්‍යාව 651 කි.

2014 වර්ෂය තුළ දී අරමුදල විසින් උපයාගත් මුදල සඳහා ආදායම් බදු වශයෙන් ගෙවූ මුදල රුපියල් මිලියන 185 කි.

## විශ්‍රාම වැටුප් අරමුදල

මණ්ඩලයට වසර 20 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් සේවය කර ඇති විශ්‍රාමික සේවකයන් මෙම අරමුදලෙහි ප්‍රතිලාභීහු වෙති. සේවය කර ඇති අවුරුදු ගණනට සරිලන ලෙස, අවසානවරට ගත් වැටුපෙන් 30% සිට 34% ක් ඔවුනට විශ්‍රාම වැටුපක් ලෙස ගෙවන අතර, මෙම ගෙවීම අදාළ සේවකයාගේ මරණය දක්වා ගෙවනු ලැබේ.

මෙම අරමුදලට 2014 වසරේ දී එකතු වූ විශ්‍රාමික සේවක පිරිස 465 ක් වූ අතර, වසර තුළ මියගිය සේවකයන් 191 දෙනෙක් ලැයිස්තුවෙන් ඉවත් විය. වසර අවසානයේ දී අරමුදලේ ප්‍රතිලාභීන් සංඛ්‍යාව 6,487 ක් විය.

2014 දෙසැම්බර් 31 දින වන විට අරමුදලේ ශුද්ධ වත්කම් ප්‍රමාණය රුපියල් මිලියන 15,882 ක් විය. අරමුදල ආයෝජනය කිරීමෙන් ලද ආදායම රුපියල් මිලියන 1,415 කි.

# මූල්‍ය සමාලෝචනය

## මූල්‍ය කාර්යසාධනය

මැඩපැවැත්විය නොහැකි පාරිසරික හේතු නිසා 2014 වර්ෂය මූල්‍ය වශයෙන් සාර්ථක වූ වර්ෂයක් නොවීය. ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය කාර්යසාධනය සහ සජීවී බව බලශක්ති ජනන මුසුව මත රඳා පවතින අතර, බලශක්ති ජනන මුසුව පුරෝකථනය කිරීම බෙහෙවින්ම අපහසු වූ දේශගුණික තත්ත්වය මත රඳාපවතී. වර්ෂයේ ප්‍රථම භාගයේ පැවති අඩු ජල විදුලි ජනන තත්ත්වය මත වර්ෂය අවසානයේ දී පැවති ලංකා විදුලිබල මණ්ඩල පිරිවැටුම් ව්‍යුහයෙහි විශාල කොටසක සෘජු ජනන පිරිවැටුම 74% ක් විය. වසර සඳහා බද්ද අඩු කිරීමෙන් පසු පාඩුව රුපියල් මිලියන 14,605 ක් විය. 2013 වසරේ ප්‍රතිප්‍රකාශිත බද්ද අඩු කිරීමෙන් පසු ලාභය රුපියල් මිලියන 20,900 ක් විය. මේ අනුව 2014 වසරේ දී මූල්‍ය කාර්යසාධනය 170% කින් පහත වැටී ඇති බව පෙනී යයි.

ජාතික ප්‍රමුඛතා සමග තම උපායමාර්ගික සැලසුම් සම්බන්ධ කළ ලංකා විදුලිබල මණ්ඩලය, තෙල් තාප බලශක්ති ප්‍රභවයන්ගෙන් බැහැර වී වර්ෂය තුළ ලක්විජය ගල් අඟුරු බලාගාරයේ දෙවන අදියර ක්‍රියාත්මක කරමින් ජාතික විදුලිබල සැපයුමට මෙ.වො. 600 ක් එකතු කළේය. ගල් අඟුරු බලශක්ති ජනනයෙන් ලද ධනාත්මක බලපෑම සමග වඩා හොඳ ජල විදුලි ජනනයත් එකතු වීමෙන් වර්ෂයේ අපර භාගයේ දී මූල්‍ය කාර්යසාධනය වඩා යහපත් විය. ඒ අනුව රුපියල් බිලියන 34 ක් වනු ඇතැයි ගණන් බලා තිබුණ අලාභය රුපියල් බිලියන 15 ක් විය.

වාර්ෂික ජල විදුලි ජනනය, 2013 වසරේ දී 50%ක් වූ අතර, 2014 වසරේ ද එය 30% ක් විය. තාප බල සංඝටකය (ස්වාධීන බලශක්ති නිෂ්පාදකයන් සහ ලංකා විදුලිබල මණ්ඩලය) 35% ක් වූ අතර, ගල් අඟුරු තාප බල සංඝටකය සම්පූර්ණ ජනනයෙන් 26% ක් විය. සම්ප්‍රදායික නොවන බලශක්ති ප්‍රභවයන්ගෙන් ඉතිරි බලශක්ති ප්‍රමාණය ලැබුණි.

අඩු පිරිවැය සහිත ලක්විජය ගල් අඟුරු බලාගාරය මගින් ලැබුණ පිරිවැය සහනය පාරිභෝගිකයන්ට ද ලබා දීම සඳහා 2014 සැප්තැම්බර් 16 සිට අයකුම සහනයක් දේශීය පාරිභෝගිකයන්ට ලැබුණ අතර 2014 නොවැම්බර් 15 සිට තොග පාරිභෝගිකයන්ට ද සහනයක් ලැබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් එක් විදුලි ඒකකයක සාමාන්‍ය විකුණුම් මිල මසකට රු. 19.00 සිට 15.60 දක්වා අඩු කිරීමෙන් සියලු වර්ගවල පාරිභෝගිකයන්ට සැලකිය යුතු සහනයක් ලැබුණි. තව ද, 2014 සැප්තැම්බර් 16 සිට ඩීසල් ලීටරයක මිල රු. 121/- සිට රු. 118/- දක්වා අඩු කරන ලද බැවින් 2014 වසර සඳහා ඇස්තමේන්තුගත පිරිවැටුම් ඉතිරිය රුපියල් බිලියන 1 ක් විය.

2014 දී වාර්ෂික ජනනය 4%ක වර්ධනයක් පෙන්නුම් කළේය. එම වසරේ ජනනය ගිගවොට් පැය 12,423ක් වූ අතර, පෙර වසරේ (2013) ජනනය ගිගවොට් පැය 11,962 ක් විය. 2013 වර්ෂයේ ගිගවොට් පැය 10,621 ක්ව පැවති ඒකක අලෙවිය 2014 දී ගිගවොට් පැය 11,063 ක් වීමෙන් 4% ක වර්ධනයක් පෙන්නුම් කළේය. මෙයට අදාළ අලෙවියෙහි අගය රුපියල්වලින් වාර්තා වන්නේ 2014 සඳහා රුපියල් මිලියන 202,645 ක් සහ 2013 වර්ෂය සඳහා රුපියල් මිලියන 194,147 ක් වශයෙනි. මේ අනුව 2014 වර්ෂය සඳහා 4% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

2014 වසරේ දී විදුලි ඒකකයක් (කිලෝවොට් පැය එකක්) සඳහා විකුණුම් මිල රු. 18.50 ක් වූ අතර, එක් ඒකකයක පිරිවැය විලම්භිත බදු සහ ක්ෂය වීම ඇතුළුව රු. 20.00 ක් විය. එබැවින් එක් ඒකකයක් සඳහා පාඩුව රු. 1.50 ක් විය.

ධනාත්මක සාධකයක් වනුයේ ස්වාධීන බලශක්ති නිෂ්පාදකයන් සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු මුදල පිළිවෙළින් රුපියල් බිලියන 18 ක් සහ රුපියල් බිලියන 2 ක් දක්වා අඩුකර ගැනීමට හැකි වීමයි. එය වසරේ අපර භාගයේ දී ඇති වූ දේශගුණික හිතකර භාවය සහ ලක්විජය ගල් අඟුරු බලාගාරය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කළ හැකි වීමෙන් ලැබුණ මූල්‍යමය වාසියකි.

ප්‍රදායක නියෝජිත ආයතන විසින් අරමුදල් සපයන ලද ප්‍රධාන ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු අතුරු ණය වශයෙන් පෙන්නුම් කර ඇති දීර්ඝ කාලීන ව්‍යාපෘති ණය ශේෂයන් වසර තුළ රුපියල් බිලියන 159 දක්වා අඩු කරන ලදී. ඒ සඳහා රුපියල් බිලියන 162 ක් ප්‍රාග්ධන කොටස් බවට සැප්තැම්බර් මාසයේ දී හරවන ලදී. එමගින් මූල්‍යමය බැර අඩු විය. තව ද, ලංකා විදුලිබල මණ්ඩලයේ සවිමත් වත්කම් පදනම, මෙරට සශ්‍රීක ආර්ථික තත්ත්වය සමග වර්ධනය වීමට අවශ්‍ය මූල්‍යාධාරය ලබා දුන්නේය. එහි අගය ආසන්න වශයෙන් රුපියල් බිලියන 770 කි.

### සමූහ ගිණුම්

ලංකා විදුලිබල මණ්ඩල ගිණුම්වලට අමතර වශයෙන් ලංකා විදුලිබල මණ්ඩලයේ පරිපාලිත ආයතන වන සීමාසහිත ලංකා විදුලිබල සමාගම (පුද්.), සීමාසහිත එල්.ටී.එල්. හෝල්ඩිංස් (පුද්.), සීමාසහිත ලංකා ගල් අඟුරු සමාගම සහ සීමාසහිත ශ්‍රී ලංකා බලශක්ති (පුද්.) සමාගම යන සමාගම්වල ගිණුම් ද ඇතුළත් කොට ලංකා විදුලිබල මණ්ඩල සමූහ ගිණුම් සම්පාදනය කරනු ලැබේ.

# මූල්‍ය සමාලෝචනය

## මූල්‍ය කාර්යසාධනය පිළිබඳ වැදගත් කරුණු

| ලාභ සහ අලාභ | 2014 රු. මිලියන | 2013 (ප්‍රති ප්‍රකාශිත) රු. මිලියන | 2012 රු. මිලියන | 2011 රු. මිලියන | 2010 රු. මිලියන |
|---|---|---|---|---|---|
| පිරිවැටුම | 202,645 | 194,147 | 163,513 | 132,460 | 121,862 |
| සෘජු පිරිවැය | (210,850) | (165,508) | (222,419) | (151,448) | (116,168) |
| දළ ලාභය / (අලාභය) | (8,205) | 28,638 | (58,906) | (18,988) | 5,694 |
| පරිපාලන වියදම් | (3,115) | (2,556) | (2,997) | (1,636) | (1,851) |
| වෙනත් ආදායම් | 5,524 | 5,107 | 6,354 | 3,810 | 3,062 |
| මෙහෙයුම් ලාභය / (අලාභය) | (5,796) | 31,190 | (55,549) | (16,814) | 6,905 |
| මූල්‍ය පිරිවැය (ශුද්ධ) | (6,650) | (8,924) | (5,898) | (3,371) | (2,047) |
| ලාභය / (අලාභය) බද්දට පෙර | (12,446) | 22,266 | (61,447) | (20,185) | 4,858 |
| ආදායම සහ විලම්භිත බදු වියදම් | 1,023 | (1,325) | (16,198) | | |
| වර්ෂය සඳහා ලාභය / (අලාභය) | (11,423) | 20,939 | (77,496) | | |
| වෙනත් විස්තීර්ණ ආදායම් | (3,182) | (39) | (124) | | |
| වර්ෂය සඳහා සම්පූර්ණ විස්තරාත්මක ආදායම් | (14,605) | 20,900 | (77,589) | | |

| ශේෂ පත්‍රය | 2014 රු. මිලියන | 2013 (ප්‍රති ප්‍රකාශිත) රු. මිලියන | 2012 රු. මිලියන | 2011 රු. මිලියන | 2010 රු. මිලියන |
|---|---|---|---|---|---|
| සම්පූර්ණ වත්කම් | 769,660 | 749,438 | 727,728 | 661,333 | 605,422 |
| ප්‍රාග්ධන සහ සංචිත | 380,022 | 226,728 | 197,300 | 257,464 | 282,631 |
| ජංගම නොවන බැරකම් | 307,328 | 430,008 | 393,072 | 281,835 | 229,128 |
| ජංගම බැරකම් | 82,309 | 92,698 | 137,356 | 122,034 | 93,663 |
| මුදල් | (2,249) | (1,431) | (17,812) | (1,178) | (3,102) |
| විකුණුම් (ගිගවොට් පැය) | 11,063 | 10,621 | 10,474 | 10,023 | 9,268 |
| ජනනය (ගිගවොට් පැය) | 12,423 | 11,962 | 11,801 | 11,528 | 10,714 |

# අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂවරු 2014 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා වන තම වාර්තාව සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරති.

## ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ව්‍යාපාර සමාලෝචන

මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ විදුලිබල ජනනය, ප්‍රසම්පාදනය, සම්ප්‍රේෂණය, එලදායී බෙදාහැරීම සහ විකිණීමයි.

## මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය තුළ පිරිවැටුම 4.38%කින් වැඩි වී ඇති බව වාර්තා විය. මෙම වසර අවසාන වන විට රුපියල් මිලියන 14,605 ක ශුද්ධ අලාභයක් වාර්තා වී ඇත.

## ආයෝජනය

සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ කොටස් 55.2%ක් ද, සීමාසහිත එල්.ටී.එල්. හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගමේ කොටස් 63%ක් ද, සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ කොටස් 60%ක් ද, සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගමේ කොටස් 100%ක් ද යනාදි වශයෙන් ලංකා විදුලිබල මණ්ඩලයේ ආයෝජනයන් පවතී. තව ද, ලංකා විදුලිබල මණ්ඩලය සහ ඉන්දියාවේ NTPC සමාග මේ ඒකාබද්ධ ව්‍යාපාරයක් වන සීමාසහිත ට්‍රින්කොමලී පවර් කොම්පැණි සමාගමෙහි ද, කොටස් 50%ක් ලංකා විදුලිබල මණ්ඩලය සතු ය.

මූල්‍ය වර්ෂ 2013/2014 සඳහා සීමාසහිත එල්.ටී.එල්. හෝල්ඩිංස් (පුද්ගලික) සමාගම ලාභාංශ රුපියල් මිලියන 500 ක් ප්‍රකාශයට පත්කර ඇත. එම මුදලෙන් රුපියල් මිලියන 315 ක් ලංකා විදුලිබල මණ්ඩලයට ලැබී ඇත. තව ද, සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම 2013 වර්ෂය සඳහා ලාභාංශ රුපියල් මිලියන 59 ක් ලාභාංශ ප්‍රකාශයට පත්කර ඇති අතර එම මුදලෙන් ලංකා විදුලිබල මණ්ඩලයට රුපියල් මිලියන 31 ක් 2014 සඳහා ලාභාංශ වශයෙන් ලබා ඇත.

## ස්වයං රක්ෂණ සංචිතය

ලංකා විදුලිබල මණ්ඩලය තම ස්ථාවර වත්කම් සඳහා තමන්ගේම රක්ෂණයක් පවත්වා ගනී. මේ සඳහා වර්ෂය අවසානයේ දී ප්‍රති ඇගයුම් කළ දළ ස්ථාවර අගයෙන් 0.1%ක් අනුයෝජනය කරනු ලැබේ. මෙම රක්ෂණයෙහි ශේෂ පත්‍ර දිනට සම්පූර්ණ සමුච්චිත අරමුදල රුපියල් මිලියන 9,753 ක් විය.

## දේපල පිරියත සහ උපකරණවලට එකතු කිරීම්

වර්ෂය තුළ ප්‍රාග්ධන වත්කම්වලට රුපියල් මිලියන 45,516 ක අගයක් ඇති දේපල පිරියත සහ උපකරණ එකතු කර ඇත. ඉකුත් වසරෙහි එකතු වූ සමානුරූපී අගය රුපියල මිලියන 33,009 කි. ප්‍රධාන වශයෙන් මෙම එකතු කිරීම් සිදු වූයේ සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ අංශවල වත්කම් ආශ්‍රිතවය.

## ණය

වර්ෂය අවසාන වන විට මණ්ඩලයේ පොලී සහිත ණය ගැනීම සහ ණය දීම රුපියල් මිලියන 221,735 ක් වූ අතර, ඉකුත් වසරේ සමානුරූපී ප්‍රමාණය රුපියල් මිලියන 355,043 ක් විය.

## මණ්ඩලයේ සාමාජිකයෝ

සමාලෝචන වර්ෂය තුළ ඩබ්.බී. ගනේගල මහතා සභාපති ධූරය දැරුවේය. ඔහු ලංකා විදුලිබල මණ්ඩලයේ පරිපාලිත ආයතන වන සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම, සීමාසහිත එල්.ටී.එල්. හෝල්ඩිංස් (පුද්ගලික) සමාගම, සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම සහ සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම යන සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු වශයෙන් ද සේවය කළේය. තව ද ඔහු ලංකා විදුලිබල මණ්ඩලය සමග ඒකාබද්ධ ව්‍යාපාරයක් වන ට්‍රින්කොමලී පවර් සමාගමෙහි ද අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු විය.

වසර තුළ 2014 මාර්තු 19 දක්වා ටී.එම්. හේරත් මහතා උප සභාපති ලෙස කටයුතු කළ අතර, ඔහුගේ අනුප්‍රාප්තිකයා ලෙස 2014 මාර්තු 24 දින පත්වීම ලැබූ කේ.කේ.සී.කේ. පෙරේරා මහතා වසර අවසාන වන තුරු සේවය කළේය.

කේ.අයි.සී.පී කුලරත්න මහතා 2013 මාර්තු 01 දින සිට මණ්ඩලයේ ක්‍රියාකාරී අධ්‍යක්ෂ ලෙස පත්වීම ලැබූ අතර ඔහු වසර අවසානය දක්වා සේවය කළේය. 2014 ජුනි 22 දක්වා ඩබ්.ඩී. ජයසිංහ මහතා අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු හැටියට සේවය කළේය. විරිතමුල්ල මහතා සහ ටී.ඩී.ඇස්.පී. පෙරේරා මහතා අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් හැටියට පිළිවෙළින් 2013 මාර්තු 01 සහ 2014 ජුලි 09 පත්වීම් ලැබූහ. එම දෙදෙනාම වසර අවසානය දක්වා සේවය කළහ.

පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම් ආර්.ඒ.ඒ.කේ. රණවක මහතා අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු හැටියට 2013 මාර්තු 06 දින පත්වීම ලැබ වසර අවසානය දක්වා එම තනතුරෙහි සේවය කළේය.

එම්.අයි.ටී.වී. අමරසේකර මෙනවිය මහාභාණ්ඩාගාරය නියෝජනය කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු හැටියට 2013 මැයි 10 දින පත්වීම ලැබ මෙම වසර අවසානය දක්වා එම තනතුර දැරුවේය.

# ඒකාබද්ධ ආදායම් ප්‍රකාශනය

2014 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා

(සියළුම මූල්‍ය ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින්)

| අඛණ්ඩ මෙහෙයුම් | සටහන | සමූහය 2014 | සමූහය 2013 ප්‍රතිප්‍රකාශිත | මණ්ඩලය 2014 | මණ්ඩලය 2013 ප්‍රතිප්‍රකාශිත |
|---|---|---|---|---|---|
| ආදායම | 3 | 219,054,966 | 198,767,716 | 202,644,828 | 194,146,823 |
| විකුණුම් පිරිවැය | | (220,417,618) | (167,440,089) | (210,849,743) | (165,508,775) |
| දළ ලාභය / (අලාභ) | | (1,362,652) | 31,327,627 | (8,204,915) | 28,638,048 |
| වෙනත් මෙහෙයුම් ආදායම් සහ ලාභ | 4 | 7,783,460 | 6,876,585 | 5,524,438 | 5,106,532 |
| බෙදාහැරීමේ පිරිවැය | | (52,569) | (60,362) | - | - |
| වෙනත් වියදම් | | (1,296,267) | (153,681) | - | - |
| පරිපාලන වියදම් | | (5,560,605) | (4,428,154) | (3,115,573) | (2,555,589) |
| මෙහෙයුම් ලාභ / (අලාභ) | | (488,633) | 33,562,015 | (5,796,050) | 31,188,991 |
| මූල්‍ය ආදායම් | 5.1 | 2,300,164 | 2,396,715 | 650,605 | 1,676,958 |
| මූල්‍ය පිරිවැය | 5.2 | (8,019,365) | (10,829,231) | (7,300,454) | (10,601,406) |
| මූල්‍ය පිරිවැය - ශුද්ධ | | (5,719,201) | (8,432,516) | (6,649,849) | (8,924,448) |
| ඒකාබද්ධ ව්‍යාපාරයෙන් අලාභ කොටස | 11 | (15,333) | (8,975) | - | - |
| බදු ගෙවීමට පෙර ලාභ/ (අලාභ) | 6 | (6,223,167) | 25,120,524 | (12,445,899) | 22,264,543 |
| ආදායම් බදු වියදම | 7.1 | (1,317,990) | (590,409) | 27,469 | - |
| විලම්බිත බදු ගාස්තු/ (ප්‍රත්‍යාවර්තන) | 7.2 | 895,984 | (1,207,593) | 995,517 | (1,325,265) |
| අඛණ්ඩ මෙහෙයුම් මගින් වර්ෂය සඳහා ලාභ / (අලාභ) | | (6,645,173) | 23,322,522 | (11,422,913) | 20,939,278 |
| සුළු කොටස් හිමි අයිතිය | | (2,509,773) | (1,932,701) | - | - |
| වර්ෂය සඳහා ලාභය / (අලාභ) | | (9,154,946) | 21,389,821 | (11,422,913) | 20,939,278 |

මෙම මූල්‍ය ප්‍රකාශනයේ පිටු අංක 93 සිට 149 දක්වා ඇති සටහන්, මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසක් වේ

# ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

2014 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා

(සියළුම මූල්‍ය ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින්)

| | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|
| | 2014 | 2013 ප්‍රතිප්‍රකාශිත | 2014 | 2013 ප්‍රතිප්‍රකාශිත |
| අඛණ්ඩ මෙහෙයුම්වලින් වර්ෂය සඳහා අලාභය | (6,645,173) | 23,322,522 | (11,422,913) | 20,939,278 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | | | |
| පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ බැඳීම් කෙරෙහි ආයුගණක අලාභය | (3,263,468) | (52,961) | (3,182,402) | (39,085) |
| විදේශ පරිපාලිත මෙහෙයුම් පරිවර්තන මත විනිමය වෙනස්වීම් | (27,447) | 81,941 | - | - |
| විකුණුම සඳහා ඇති මූල්‍ය වත්කම් මත සාධාරණ අගයෙහි ලාභය | 6,380,056 | 655,473 | - | - |
| විදේශ මුදල් ණය හුවමාරු පරිවර්තන මත විනිමය ශුද්ධ ලාභ/ (අලාභ) | 13,844 | 18,243 | - | - |
| ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගනය | 279,899 | - | - | - |
| අයුගණක ලාභය / (අලාභය) මත විලම්බිත බදු වල බලපෑම | (2,566) | - | - | - |
| බදු පසු වර්ෂය සඳහා මුළු විස්තීර්ණ අදායම් | (3,264,855) | 24,025,218 | (14,605,315) | 20,900,193 |

ආරෝපනීය සාධකඃ

| | | |
|---|---|---|
| පරිපාලන හිමි අයිතිය | (8,717,338) | 21,731,700 |
| සුළු කොටස් හිමි අයිතිය | 5,452,483 | 2,293,518 |
| | (3,264,855) | 24,025,218 |

මෙම මූල්‍ය ප්‍රකාශනයේ පිටු අංක 93 සිට 149 දක්වා ඇති සටහන්, මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසක් වේ

# මූල්‍ය තත්ව ප්‍රකාශනය

2014 දෙසැම්බර් 31 දිනට

(සියළුම මූල්‍ය ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින්)

| | සටහන | සමූහය | | | මණ්ඩලය | | |
|---|---|---|---|---|---|---|---|
| | | 2014 | 2013 ප්‍රතිප්‍රකාශිත | 2012 ප්‍රතිප්‍රකාශිත | 2014 | 2013 ප්‍රතිප්‍රකාශිත | 2012 ප්‍රතිප්‍රකාශිත |
| **වත්කම්** | | | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | | | |
| දේපල පිරියත සහ උපකරණ | 8 | 706,125,409 | 669,354,179 | 635,269,272 | 686,470,754 | 649,814,833 | 621,088,458 |
| කල්බදු ඉඩම් සඳහා ගෙවූ වාරිකය | | 6,984 | 7,373 | 5,903 | - | - | - |
| අස්පෘශ්‍ය වත්කම් | 9 | 16,520 | 19,256 | 22,025 | - | - | - |
| පරිපාලිත සමාගම්වල ආයෝජන | 10 | - | - | - | 784,813 | 784,813 | 761,902 |
| බද්ධ ව්‍යාපාරවල ආයෝජන | 11 | 59,814 | 75,145 | 84,121 | 150,000 | 150,000 | 150,000 |
| ලැබිය යුතු මූල්‍ය කල්බදු | 12 | 4,144,203 | - | - | - | - | - |
| වෙනත් ජංගම නොවන මූල්‍ය වත්කම් | 13 | 11,329,793 | 4,737,475 | 5,672,324 | 107,000 | - | - |
| රක්ෂණ සංචිතවල ආයෝජන | 14 | 5,653,841 | 5,250,300 | 4,433,045 | 5,653,841 | 5,250,300 | 4,433,045 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | 727,336,564 | 679,443,728 | 645,486,690 | 693,166,408 | 655,999,946 | 626,433,405 |
| විකිණීම සඳහා ඇති ජංගම නොවන වත්කම් | 15 | 1,955 | - | - | 1,955 | - | - |
| **ජංගම වත්කම්** | | | | | | | |
| දේපල පිරියත සහ උපකරණ (හෙළදනවි සමාගම) | 8.8 | 808,337 | - | - | - | - | - |
| භාණ්ඩ තොග | 16 | 39,349,291 | 39,267,846 | 32,528,016 | 34,561,437 | 36,544,650 | 29,949,063 |
| වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු මුදල් | 17 | 37,848,423 | 50,350,141 | 67,624,127 | 33,348,983 | 44,832,213 | 61,929,143 |
| සම්බන්ධිත පාර්ශව වලින් ලැබිය යුතු මුදල් | 18 | - | - | - | 1,619,422 | 4,981,501 | 1,810,852 |
| ලැබිය යුතු මූල්‍ය කල්බදු | 12 | 355,086 | - | - | - | - | - |
| වෙනත් ජංගම මූල්‍ය වත්කම් | 13 | 21,965,435 | 17,888,255 | 13,876,552 | 5,418,489 | 5,034,000 | 5,035,090 |
| ආපසු ලැබිය යුතු බදු | | 23,307 | 77,976 | 261,569 | - | - | - |
| මුදල් සහ බැංකු ශේෂ | 28 | 4,416,678 | 7,127,745 | 5,689,709 | 1,543,366 | 2,042,958 | 2,570,748 |
| **මුළු ජංගම වත්කම්** | | 104,766,557 | 114,711,963 | 119,979,973 | 76,491,697 | 93,435,322 | 101,294,896 |
| **මුළු වත්කම්** | | 832,105,076 | 794,155,691 | 765,466,663 | 769,660,060 | 749,435,268 | 727,728,301 |
| **ස්කන්ධය සහ වගකීම්** | | | | | | | |
| **ප්‍රාග්ධනය සහ ස්කන්ධය** | | | | | | | |
| දායක ප්‍රාග්ධනය | 19 | 289,046,982 | 121,707,829 | 110,862,044 | 289,046,982 | 121,707,829 | 110,862,044 |
| සංචිත | 20 | 38,640,569 | 33,102,172 | 30,806,054 | 27,434,332 | 25,998,798 | 24,460,247 |
| රඳවාගත් ලාභ / (අලාභ) | | 75,546,305 | 89,400,470 | 72,498,276 | 63,540,825 | 79,022,147 | 61,977,397 |
| **මූල සංවිධානයේ ධාරකයෝ** | | 403,233,856 | 244,210,471 | 214,166,374 | 380,022,139 | 226,728,774 | 197,299,688 |
| සුළු කොටස් හිමියන්ගේ අයිතිය | | 23,215,974 | 16,931,505 | 15,763,495 | - | - | - |
| **මුළු ස්කන්ධය** | | 426,449,830 | 261,141,976 | 229,929,869 | 380,022,139 | 226,728,774 | 197,299,688 |
| **ජංගම නොවන වත්කම් සහ විලම්බිත ආදායම්** | | | | | | | |
| පොලිය සහිත ණය සහ ණය ගැනීම් | 21 | 207,996,255 | 335,527,613 | 302,880,474 | 202,819,528 | 334,524,915 | 304,514,772 |
| පාරිභෝගික තැන්පතු | 22 | 10,458,306 | 9,721,662 | 8,899,445 | 10,458,306 | 9,721,662 | 8,899,445 |
| ප්‍රතිපාදන හා අනෙකුත් විලම්භිත වගකීම් | 23 | 7,341,042 | 3,845,468 | 4,123,115 | 6,571,579 | 3,236,183 | 3,592,799 |
| විලම්බිත ආදායම | 24 | 69,808,549 | 63,598,001 | 58,285,116 | 66,292,438 | 60,343,185 | 55,208,276 |
| විලම්බිත බදු | 25 | 21,618,360 | 22,497,833 | 21,290,241 | 21,186,971 | 22,182,488 | 20,857,224 |
| **මුළු ජංගම නොවන වගකීම් හා විලම්බිත ආදායම** | | 317,222,512 | 435,190,577 | 395,478,391 | 307,328,822 | 430,008,433 | 393,072,516 |
| **ජංගම වගකීම්** | | | | | | | |
| වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු මුදල් | 26 | 62,511,390 | 77,822,614 | 91,663,496 | 60,134,201 | 66,162,449 | 86,959,044 |
| ගෙවිය යුතු ලාභාංශ | | 628,949 | 491,648 | 19,322 | - | - | - |
| සම්බන්ධිත පාර්ශ්වවලට ගෙවිය යුතු මුදල් | 27 | - | - | - | 2,990,922 | 5,698,376 | 4,311,817 |
| පොලී සහිත ණය සහ ණය ගැනීම් | 21 | 23,312,581 | 18,397,805 | 41,574,861 | 18,915,024 | 20,518,283 | 41,185,236 |
| ගෙවිය යුතු ආදායම් බදු | | 1,979,814 | 1,111,071 | 6,800,724 | 268,952 | 318,953 | 4,900,000 |
| **මුළු ජංගම වගකීම්** | | 88,432,734 | 97,823,138 | 140,058,403 | 82,309,099 | 92,698,061 | 137,356,097 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | | 832,105,076 | 794,155,691 | 765,466,663 | 769,660,060 | 749,435,268 | 727,728,301 |

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරිත්වය වගකීම දරයි. මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලද්දෙ;

සභාපති

සාමාන්‍යාධිකාරී

මූල්‍ය කළමනාකරු

මෙම මූල්‍ය ප්‍රකාශනයේ පිටු අංක 93 සිට 149 දක්වා ඇති සටහන්, මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසක් වේ

2016-01-13

කොළඹ

# සමූහය - ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

2014 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා

| | දායක ප්‍රාග්ධනය | ප්‍රාග්ධන සංචිත | අපේක්ෂිත පිරිවැය සඳහා ගැලපීම | ප්‍රත්‍යාගණන සංචිත |
|---|---|---|---|---|
| **2013.01.01. දිනට ශේෂය** | 109,567,865 | 17,796,535 | 4,529,883 | 587,475 |
| කාලපරිච්ඡේදය තුල පෙර වර්ෂ ගැලපීම් | 1,294,179 | (122,933) | - | - |
| **2013.01.01. දිනට ශේෂය (ප්‍රතිප්‍රකාශිත)** | 110,862,044 | 17,673,602 | 4,529,883 | 587,475 |
| වර්ෂය සඳහා ලාභය / (අලාභය) | - | - | - | - |
| ස්වරක්ෂණ සංචිතයට / සංචිතයෙන් මාරු කිරීම | - | - | - | - |
| රක්ෂණ Escrow අරමුදල මත පොලී ආදායම | - | - | - | - |
| අපේක්ෂිත ලාභාංශ බදු | - | - | - | - |
| රාජ් ලංකා පවර් සමාගම කොටස් නිකුතුව | - | - | - | - |
| තාප අනුපාතික සංචිතය | - | - | - | - |
| ආයෝජන සංචිතය | - | - | - | - |
| ස්ථාවර වත්කම් ප්‍රතිස්ථාපන සංචිතය | - | - | - | - |
| පොදුකාර්ය සංචිතය | - | - | - | - |
| ශ්‍රී ජයවර්ධනපුර සංකීර්ණය | 20,000 | - | - | - |
| උතුරු වසන්තය | 1,345,441 | - | - | - |
| කඩිනම් ග්‍රාමීය විදුලියෝජනා ක්‍රම ව්‍යාපෘතිය | 50,000 | - | - | - |
| ග්‍රාමීය විදුලිබල ව්‍යාපෘතිය 08 (ඉරානය) | 485,231 | - | - | - |
| ග්‍රාමීය විදුලිබල ව්‍යාපෘතිය 04 (පුළුල් කිරීම) | 2,455,813 | - | - | - |
| වවුනියා කිලිනොච්චි සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය | 348,510 | - | - | - |
| බටහිර රත් අරුණ ව්‍යාපෘතිය | 20,000 | - | - | - |
| නැගෙනහිර නවෝදය ව්‍යාපෘතිය | 1,369,230 | - | - | - |
| රුහුණු උදානය ව්‍යාපෘතිය | 146,321 | - | - | - |
| ඌව උදානය ව්‍යාපෘතිය | 2,299,935 | - | - | - |
| යාපනය පුනරුත්ථාපන විදුලිබල සම්පාදන ව්‍යාපෘතිය | 493,890 | - | - | - |
| කඳුරට උදානය | 100,000 | - | - | - |
| වයඹ පුබුදුව | 200,000 | - | - | - |
| වැලිඔය විදුලියෝජන ක්‍රමය | 50,000 | - | - | - |
| EDE ව්‍යාපෘතිය | 535 | - | - | - |
| සබරගමුව | 285,000 | - | - | - |
| තිරසාරවිදුලිබල අංශයේ ආධාරක ව්‍යාපෘතිය | 520,719 | - | - | - |
| ත්‍රිකුණාමලය ඒකාබද්ධ ව්‍යාපෘතිය | 162,991 | - | - | - |
| කිලිනොච්චි චුන්නාකම් සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය | 491,760 | - | - | - |
| ADB අරමුදල- Clean Energy (Access Improvement Project) | 409 | - | - | - |
| වෙනත් විස්තරාත්මක ආදායම් | - | - | - | - |
| නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම මත ආයුගණක ලාභය හෝ අලාභය | - | - | - | - |
| ප්‍රකාශිත / අප්‍රකාශිත කොටස් වල සාධාරණ අගයෙහි ලාභාංශ | - | - | - | - |
| විදේශීය සහාය මෙහෙයුම පරිවර්තනය මත විනිමය වෙනස | - | 42,175 | - | - |
| විදේශීය මුදල් ණය විනිමය පරිවර්තනයේ දී ශුද්ධ ලාභය / අලාභය | - | 9,390 | - | - |
| අවසාන ලාභාංශ - සාමාන්‍ය කොටස් -2012 /13 (LTL) | - | - | - | - |
| ලාභාංශ ගෙවීම (ලෙකෝ) | - | - | - | - |
| **2013 දෙසැම්බර් 31ට ශේෂය (ප්‍රතිප්‍රකාශිත)** | 121,707,829 | 17,725,167 | 4,529,883 | 587,475 |

(සියළුම මුල්‍ය ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින්)

| පොදු කාර්ය සංචිත | ක්ෂය සංචිත | වත්කම් ප්‍රතිස්ථාපන සංචිත | ආයෝජන සංචිත | ස්වයං රක්ෂණ සංචිත | අලෙවිය සඳහා පවත්නා සංචිත | රඳවාගත් ඉපයීම් | සුළු කොටස් හිමියන්ගේ අයිතිය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| 42,670 | 23,000 | 213,700 | 66,849 | 8,101,951 | 897,871 | 68,467,833 | 15,949,348 | 226,244,983 |
| (69,685) | - | - | - | (1,261,263) | - | 4,030,442 | (185,854) | 3,684,886 |
| (27,015) | 23,000 | 213,700 | 66,849 | 6,840,688 | 897,871 | 72,498,275 | 15,763,494 | 229,929,868 |
| - | - | - | - | - | - | 21,389,821 | 1,932,701 | 23,322,522 |
| - | - | - | - | 809,110 | - | (809,110) | - | - |
| - | - | - | - | 729,441 | - | - | - | 729,441 |
| - | - | - | - | - | - | (3,046,335) | - | (3,046,335) |
| - | - | - | - | - | - | - | 254,517 | 254,517 |
| - | - | - | - | - | - | - | - | - |
| - | - | - | 360,189 | - | - | (571,729) | 211,540 | - |
| - | - | 8,434 | - | - | - | (13,387) | 4,953 | - |
| - | - | - | - | - | - | - | - | - |
| - | - | - | - | - | - | - | - | 20,000 |
| - | - | - | - | - | - | - | - | 1,345,441 |
| - | - | - | - | - | - | - | - | 50,000 |
| - | - | - | - | - | - | - | - | 485,231 |
| - | - | - | - | - | - | - | - | 2,455,813 |
| - | - | - | - | - | - | - | - | 348,510 |
| - | - | - | - | - | - | - | - | 20,000 |
| - | - | - | - | - | - | - | - | 1,369,230 |
| - | - | - | - | - | - | - | - | 146,321 |
| - | - | - | - | - | - | - | - | 2,299,935 |
| - | - | - | - | - | - | - | - | 493,890 |
| - | - | - | - | - | - | - | - | 100,000 |
| - | - | - | - | - | - | - | - | 200,000 |
| - | - | - | - | - | - | - | - | 50,000 |
| - | - | - | - | - | - | - | - | 535 |
| - | - | - | - | - | - | - | - | 285,000 |
| - | - | - | - | - | - | - | - | 520,719 |
| - | - | - | - | - | - | - | - | 162,991 |
| - | - | - | - | - | - | - | - | 491,760 |
| - | - | - | - | - | - | - | - | 409 |
| - | - | - | - | - | - | - | - | - |
| - | - | - | - | - | - | (47,065) | (5,896) | (52,961) |
| - | - | - | - | - | 337,378 | - | 318,094 | 655,473 |
| - | - | - | - | - | - | - | 39,765 | 81,941 |
| - | - | - | - | - | - | - | 8,853 | 18,243 |
| - | - | - | - | - | - | - | (1,517,481) | (1,517,481) |
| - | - | - | - | - | - | - | (79,036) | (79,036) |
| (27,015) | 23,000 | 222,134 | 427,038 | 8,379,239 | 1,235,250 | 89,400,470 | 16,931,505 | 261,141,976 |

# සමූහය - ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

2014 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා

| | දායක ප්‍රාග්ධනය | ප්‍රාග්ධන සංචිත | අපේක්ෂිත පිරිවැය සඳහා ගැලපීම | ප්‍රත්‍යාගණන සංචිත |
|---|---|---|---|---|
| **කාලපරිච්ඡේදය තුළ පෙර වර්ෂ ගැලපීම්** | | | | |
| **2014 ජනවාරි 01 දිනට ප්‍රතිප්‍රකාශිත ශේෂය** | 121,707,829 | 17,725,167 | 4,529,883 | 587,475 |
| වර්ෂය සඳහා ලාභය/ (අලාභය) | - | - | - | - |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ මත අයුගණක ලාභය / (අලාභය) | - | - | - | - |
| ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය | - | - | - | 154,504 |
| විකුණුම් සඳහා ඇති මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභය / (අලාභය) | - | - | - | - |
| ප්‍රකාශිත / අප්‍රකාශිත කොටස් වල සාධාරණය අගයේ ලාභය | - | - | - | - |
| විදේශ සහය මෙහෙයුම් පරිවර්තනය මත විනිමය වෙනස්කම් | - | (14,127) | - | - |
| විනිමය සංචිත | | 7,126 | - | - |
| **මුළු විස්තීරණ අදායම** | 121,707,829 | 17,718,165 | 4,529,883 | 741,979 |
| රක්ෂණ සංචිත අරමුදලෙන් ලද පොළී අදායම | - | - | - | - |
| ස්වයං රක්ෂිත සංචිතයට මාරුකිරීම් | - | - | - | - |
| RHCP ව්‍යපෘතිය සඳහා ADB අරමුදලෙන් ලැබීම් | - | 45,697 | - | - |
| බටහිර රන් අරුණ ව්‍යාපෘතිය | 790 | - | - | - |
| RE 4 දිගුව | 365,473 | - | - | - |
| RE 8 දිගුව | 725,000 | - | - | - |
| වවුනියා කිලිනොච්චි සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය | 181,705 | - | - | - |
| කිලිනොච්චි චුන්නාකම් සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය | 134,348 | - | - | - |
| නැගෙනහිර නවෝදය ව්‍යාපෘතිය | 2,437,178 | - | - | - |
| SPSP | 414,020 | - | - | - |
| මහකොළඹ ව්‍යාපෘතිය - දිගුව | 21 | - | - | - |
| උතුරු වසන්තය | 1,179,240 | - | - | - |
| ඌව උදානය ව්‍යාපෘතිය | 53,656 | - | - | - |
| යාපනය පුනරුත්ථාපන විදුලිබල සම්පාදන ව්‍යාපෘතිය | 140,697 | - | - | - |
| E D ව්‍යාපෘතිය | 14 | - | - | - |
| ත්‍රිකුණාමලය ඒකාබද්ධ | 24 | - | - | - |
| ප්‍රකාශිත ප්‍රාග්ධනයට පරිවර්තනය කල ව්‍යපෘති ණය | 161,706,953 | - | - | - |
| **හබරණ වේයන්ගොඩ විදුලි ව්‍යාපෘතිය** | 33 | - | - | - |
| විදේශ විනිමය සංචිතයෙන් රඳවාගත් ලභාවලට මාරුකිරීම | - | (60,310) | - | - |
| පරිපාලිත සමාගම් කොටස් නිකුතුව | - | - | - | - |
| තාප අනුපාතික සංචිතය | - | 73,732 | - | - |
| තාප අනුපාතික සංචිතය | - | (73,732) | - | - |
| ආයෝජන සංචිතය | - | - | - | - |
| ස්ථාවර වත්කම් ප්‍රතිස්තාපන සංචිතය | - | - | - | - |
| සුලු කොටස්හිමියන්ගේ අයිතිය අත්පත්කරගැනීම | - | - | - | - |
| අවසාන ලාභාංශ - සාමාන්‍ය කොටස් - 2013/14 | - | - | - | - |
| ලාභාංශ ගෙවීම (ලෙකෝ) | - | - | - | - |
| **2014 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 289,046,982 | 17,703,552 | 4,529,883 | 741,979 |

මෙම මූල්‍ය ප්‍රකාශනයේ පිටු අංක 93 සිට 149 දක්වා ඇති සටහන්, මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසක් වේ

(සියළුම මුල්‍ය ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින්)

| පොදු කාර්ය සංචිත | ක්ෂය සංචිත | වත්කම් ප්‍රතිස්ථාපන සංචිත | ආයෝජන සංචිත | ස්වයං රක්ෂණ සංචිත | අලෙවිය සඳහා පවත්නා සංචිත | රඳවාගත් ඉපයීම් | සුළු කොටස් හිමියන්ගේ අයිතිය | එකතුව |
|---:|---:|---:|---:|---:|---:|---:|---:|---:|
| | | | | | | (132) | (87) | (219) |
| (27,015) | 23,000 | 222,134 | 427,038 | 8,379,239 | 1,235,250 | 89,400,338 | 16,931,418 | 261,141,758 |
| - | - | - | - | - | - | (9,154,946) | 2,509,773 | (6,645,173) |
| - | - | - | - | - | - | (3,228,027) | (38,006) | (3,266,034) |
| - | - | - | - | - | - | - | 125,395 | 279,899 |
| - | - | - | - | - | 3,467,638 | - | 2,814,315 | 6,281,953 |
| - | - | - | - | - | 50,494 | - | 47,609 | 98,103 |
| - | - | - | - | - | - | - | (13,320) | (27,447) |
| - | - | - | - | - | - | - | 6,719 | 13,844 |
| (27,015) | 23,000 | 222,134 | 427,038 | 8,379,239 | 4,753,382 | 77,017,365 | 22,383,902 | 257,876,904 |
| - | - | - | - | 513,832 | - | - | - | 513,832 |
| - | - | - | - | 876,005 | - | (876,005) | - | - |
| - | - | - | - | - | - | - | - | 45,697 |
| - | - | - | - | - | - | - | - | 790 |
| - | - | - | - | - | - | - | - | 365,473 |
| - | - | - | - | - | - | - | - | 725,000 |
| - | - | - | - | - | - | - | | 181,705 |
| - | - | - | - | - | - | - | - | 134,348 |
| - | - | - | - | - | - | - | - | 2,437,178 |
| - | - | - | - | - | - | - | - | 414,020 |
| - | - | - | - | - | - | - | - | 21 |
| - | - | - | - | - | - | - | - | 1,179,240 |
| - | - | - | - | - | - | - | - | 53,656 |
| - | - | - | - | - | - | - | - | 140,697 |
| - | - | - | - | - | - | - | - | 14 |
| - | - | - | - | - | - | - | - | 24 |
| - | - | - | - | - | - | - | - | 161,706,953 |
| - | - | - | - | - | - | - | - | 33 |
| - | - | - | - | - | - | 109,258 | (48,947) | 1 |
| - | - | - | - | - | - | - | 1,002,447 | 1,002,447 |
| - | - | - | - | - | - | - | 43,303 | 117,035 |
| - | - | - | - | - | - | 117,036 | (17,087) | 26,216 |
| - | - | - | 487,699 | - | - | (774,125) | 286,426 | - |
| - | - | 9,841 | - | - | - | (15,621) | 5,780 | - |
| - | - | - | - | - | - | - | 95,934 | 95,934 |
| - | - | - | - | - | - | - | (508,659) | (508,659) |
| - | - | - | - | - | - | (31,604) | (27,125) | (58,729) |
| (27,015) | 23,000 | 231,975 | 914,737 | 9,769,076 | 4,753,382 | 75,546,305 | 23,215,974 | 426,449,830 |

# මණ්ඩලය - ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

**2014 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා**

| | දායක ප්‍රාග්ධනය | ප්‍රාග්ධන සංචිතය |
|---|---|---|
| **2013.01.01. දිනට ශේෂය** | 109,567,865 | 17,447,062 |
| පෙර වර්ෂ අදාළව කාලපරිච්ඡේදය තුල ගැලපීම් | 1,294,179 | - |
| **2013 ජනවාරි 01 දිනට ප්‍රතිප්‍රකාශිත ශේෂය** | 110,862,044 | 17,447,062 |
| වර්ෂය සඳහා ලාභය/ (අලාභය) | - | - |
| රක්ෂණ සංචිතයට / සංචිතයෙන් මාරු කිරීම | - | - |
| රක්ෂණ Escrow අරමුදල මත ආදායම් පොලිය | - | - |
| අපේක්ෂිත ලාභාංශ ලෙස ගෙවන බදු | - | - |
| ශ්‍රී ජයවර්ධනපුර සංකීර්ණය | 20,000 | - |
| උතුරු වසන්තය | 1,345,441 | - |
| කඩිනම් ග්‍රාමීය විදුලියෝජනා ක්‍රම ව්‍යාපෘතිය | 50,000 | - |
| ග්‍රාමීය විදුලිබල ව්‍යාපෘතිය 08 (ඉරානය) | 485,231 | - |
| රජරට නවෝදය ව්‍යාපෘතිය | 2,455,813 | - |
| වවුනියා - කිලිනොච්චි සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය | 348,510 | - |
| බටහිර රන් අරුණ ව්‍යාපෘතිය | 20,000 | - |
| නැගෙනහිර නවෝදය ව්‍යාපෘතිය | 1,369,230 | - |
| රුහුණු උදානය ව්‍යාපෘතිය | 146,321 | - |
| ඌව උදානය ව්‍යාපෘතිය | 2,299,935 | - |
| යාපනය පුනරුත්ථාපන විදුලිබල සම්පාදන ව්‍යාපෘතිය | 493,890 | - |
| කඳුරට උදානය | 100,000 | - |
| වයඹ පුබුදුව | 200,000 | - |
| වැලිඔය විදුලියෝජන ක්‍රමය | 50,000 | - |
| EDE ව්‍යාපෘතිය | 535 | - |
| සබරගමුව | 285,000 | - |
| තිරසාරවිදුලිබල අංශයේ ආධාරක ව්‍යාපෘතිය | 520,719 | - |
| ත්‍රිකුණාමලය ඒකාබද්ධ | 162,991 | - |
| කිලිනොච්චි චුන්නාකම් සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය | 491,760 | - |
| ADB අරමුදල | 409 | - |
| **2013 දෙසැම්බර් 31 දිනට ප්‍රතිප්‍රකාශිත ශේෂය** | 121,707,829 | 17,447,062 |
| **2014 ජනවාරි 01 දිනට ප්‍රතිප්‍රකාශිත ශේෂය** | 121,707,829 | 17,447,062 |
| වර්ෂය සඳහා ලාභය/පාඩුව | - | - |
| රක්ෂණ Escrow අරමුදල මත පොලී ආදායම | - | - |
| ස්වයං රක්ෂිත සංචිතයට මාරුකිරීම් | - | - |
| RHCP ව්‍යාපෘතිය සඳහා ADB අරමුදලෙන් ලැබීම් | - | 45,697 |
| බටහිර රන් අරුණ ව්‍යාපෘතිය | 790 | - |
| RE 4 දිගුව | 365,473 | - |
| RE 8 දිගුව | 725,000 | - |
| වවුනියා කිලිනොච්චි සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය | 181,705 | - |
| කඳුරට උදානය | - | - |
| KCTP ව්‍යාපෘතිය | 134,348 | - |
| නැගෙනහිර නවෝදය ව්‍යාපෘතිය | 2,437,178 | - |
| SPSP | 414,020 | - |
| මහකොළඹ ව්‍යාපෘතිය - දිගුව | 21 | - |
| උතුරු වසන්තය ව්‍යාපෘතිය | 1,179,240 | - |
| ඌව උදානය ව්‍යාපෘතිය | 53,657 | - |
| යාපනය පුනරුත්ථාපන විදුලිබල සම්පාදන ව්‍යාපෘතිය | 140,697 | - |
| E D ව්‍යාපෘතිය | 14 | - |
| ත්‍රිකුණාමලය ඒකාබද්ධ ව්‍යාපෘතිය | 24 | - |
| ස්කන්ධයට පරිවර්තනය කල ණය | 161,706,953 | - |
| හබරණ වේයන්ගොඩ විදුලියෝජනා ක්‍රමය | 33 | - |
| **2014 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 289,046,982 | 17,492,759 |

මෙම මූල්‍ය ප්‍රකාශනයේ පිටු අංක 93 සිට 149 දක්වා ඇති සටහන්, මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසක් වේ

(සියළුම මූල්‍ය ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින්)

| ප්‍රාග්ධනය නිදහස් කිරීමේ සංචිත අරමුදල | ක්ෂය සංචිතය | ස්ව රක්ෂණ සංචිතය | රඳවාගත් ඉපයීම් | එකතුව |
|---|---|---|---|---|
| 165,446 | 23,000 | 8,086,000 | 57,940,887 | 193,230,261 |
| - | - | (1,261,263) | 4,036,511 | 4,069,427 |
| 165,446 | 23,000 | 6,824,737 | 61,977,398 | 197,299,688 |
| - | - | - | 20,900,194 | 20,900,194 |
| - | - | 809,110 | (809,110) | - |
| - | - | 729,441 | - | 729,441 |
| - | - | - | (3,046,335) | (3,046,335) |
| - | - | - | - | 20,000 |
| - | - | - | - | 1,345,441 |
| - | - | - | - | 50,000 |
| - | - | - | - | 485,231 |
| - | - | - | - | 2,455,813 |
| - | - | - | - | 348,510 |
| - | - | - | - | 20,000 |
| - | - | - | - | 1,369,230 |
| - | - | - | - | 146,321 |
| - | - | - | - | 2,299,935 |
| - | - | - | - | 493,890 |
| - | - | - | - | 100,000 |
| - | - | - | - | 200,000 |
| - | - | - | - | 50,000 |
| - | - | - | - | 535 |
| - | - | - | - | 285,000 |
| - | - | - | - | 520,719 |
| - | - | - | - | 162,991 |
| - | - | - | - | 491,760 |
| - | - | - | - | 409 |
| 165,446 | 23,000 | 8,363,288 | 79,022,147 | 226,728,773 |
| 165,446 | 23,000 | 8,363,288 | 79,022,147 | 226,728,773 |
| - | - | - | (14,605,317) | (14,605,317) |
| - | - | 513,832 | - | 513,832 |
| - | - | 876,005 | (876,005) | - |
| - | - | - | - | 45,697 |
| - | - | - | - | 790 |
| - | - | - | - | 365,474 |
| - | - | - | - | 725,000 |
| - | - | - | - | 181,705 |
| - | - | - | - | - |
| - | - | - | - | 134,348 |
| - | - | - | - | 2,437,178 |
| - | - | - | - | 414,020 |
| - | - | - | - | 21 |
| - | - | - | - | 1,179,240 |
| - | - | - | - | 53,656 |
| - | - | - | - | 140,697 |
| - | - | - | - | 14 |
| - | - | - | - | 24 |
| - | - | - | - | 161,706,953 |
| - | - | - | - | 33 |
| 165,446 | 23,000 | 9,753,126 | 63,540,825 | 380,022,139 |

# ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2014 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා

(සියළුම මූල්‍ය ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින්)

| | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|
| | 2014 | 2013 | 2014 | 2013 |
| **මෙහෙයුම් කටයුතුවල යෙදවූ / කටයුතුවලින් මුදල් ප්‍රවාහය** | | | | |
| බද්දට පෙර ලාභය / (අලාභය) | (6,223,167) | 25,120,524 | (12,445,899) | 22,264,543 |
| **ගැලපීම්** | | | | |
| ක්ෂය - වර්ෂය සඳහා අයවීම | 21,701,693 | 21,769,587 | 21,361,151 | 20,491,076 |
| පාරිභෝගික දායකත්වය - වර්ෂය තුළ ක්‍රමක්ෂය කළ ප්‍රමාණය | (2,793,293) | (2,255,662) | (2,506,972) | (2,265,266) |
| රජයේ ප්‍රදාන - වර්ෂය තුළ ක්‍රමක්ෂය කළ ප්‍රමාණය | (12,517) | (12,391) | (12,391) | (12,391) |
| ආයෝජන වලින් ආදායම | (645,036) | (575,828) | (346,400) | (1,353,948) |
| දේපල, පිරියත සහ උපකරණ විකිණීමෙන් (ලාභය / අලාභය) | (163,404) | (123,210) | (106,708) | (105,936) |
| මූල්‍ය පිරිවැය | 8,019,365 | 13,157,111 | 6,012,065 | 11,138,754 |
| යල් පැනගිය හා භාවිතා කළ නොහැකි තොග සඳහා ප්‍රතිපාදන | 352,857 | 64,347 | 352,857 | 33,275 |
| මිල විචලනය සඳහා ප්‍රතිපාදන | 942,104 | 2,102,594 | 942,104 | 871,002 |
| වෙළෙඳ ණයකරුවන් හානිකරනය වීම සඳහා ප්‍රතිපාදන | - | 148,082 | - | - |
| වෙනත් ණයකරුවන් හානිකරනය වීම සඳහා ප්‍රතිපාදන | 8,887 | 38,083 | 8,887 | 163,812 |
| බොල්ණය කපාහැරීම | 156,041 | - | 156,041 | - |
| තොග වෙනස ගිණුම - (Stores Discrepancies Account) | 2,994 | 816 | 2,994 | 816 |
| බද්ද ව්‍යාපාරවල කොටස් අලාබයන් | 15,333 | - | - | - |
| අස්පෘශ්‍ය වත්කම් වල ක්‍රමක්ෂය | 2,735 | - | - | - |
| ආයෝජන වලින් ලැබුණු ආදායම | (1,655,057) | (1,820,887) | (304,205) | (267,467) |
| ගැලපීම් - බැහැර කිරීම් / වැඩිදියුණු කිරීම් | - | 109 | - | 109 |
| ප්‍රතිපාදන ප්‍රතිවර්තනය | - | (63) | - | (63) |
| නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම | 863,235 | 801,033 | 716,948 | 713,422 |
| විශ්‍රාම වැටුප් අරමුදලේ පිරිවැය | (120,799) | (706,345) | (120,799) | (664,143) |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභ / (අලාභ)** | 20,451,975 | 57,707,900 | 13,709,672 | 51,007,596 |
| භාණ්ඩ තොග (වැඩිවීම) / අඩුවීම | (1,379,399) | (8,773,992) | 1,980,220 | (7,557,103) |
| වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ (වැඩිවීම) / අඩුවීම | 12,260,063 | 12,331,324 | 14,680,380 | 7,750,366 |
| වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ (වැඩිවීම) / අඩුවීම | (15,358,164) | (16,630,455) | (8,735,701) | (24,069,584) |
| **මෙහෙයුම් වලින් ජනිත මුදල්** | 15,974,475 | 44,634,777 | 21,634,571 | 27,131,275 |
| ගෙවූ මූල්‍ය පිරිවැය | (7,948,477) | (8,824,249) | (5,941,324) | (9,282,761) |
| විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් | (512,895) | (425,150) | (443,153) | (402,778) |
| ගෙවූ ආදායම් බදු | (446,455) | (6,388,351) | (50,000) | (4,237,410) |
| **මෙහෙයුම් කටයුතු වල (යෙදවූ) / කටයුතු වලින් (ජනනය වූ) ශුද්ධ මුදල්** | 7,066,648 | 28,997,027 | 15,200,094 | 13,208,326 |
| **ආයෝජන කටයුතු වල (යෙදවූ) / කටයුතු වලින් (ජනනය) මුදල් ප්‍රවාහ** | | | | |
| දේපල, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම සහ කෙරිගෙන යන ප්‍රාග්ධන වැඩ | (62,927,235) | (72,955,665) | (59,714,218) | (65,451,558) |
| අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම | - | 2,768 | - | - |
| ඒකාබද්ධ ව්‍යාපාරවල ආයෝජන | - | 8,973 | - | - |
| රක්ෂණ සංචිත අරමුදලෙහි ආයෝජනය | (403,541) | (817,254) | (403,541) | (817,255) |
| රක්ෂණ සංචිත අරමුදලෙන් ලද පොලිය | 513,832 | 729,441 | 513,832 | 729,441 |
| ජංගම නොවන මූල්‍ය වත්කම්වල ආයෝජනය | 931,269 | 1,619,705 | - | - |
| ජංගම මූල්‍ය වත්කම්වල ආයෝජනය | (3,992,680) | (4,020,712) | - | - |
| ආයෝජන අත්පත් කර ගැනීම | - | - | - | (22,910) |
| ලාභාංශ ලැබීම | 645,036 | - | 346,400 | 1,353,948 |
| ලද පොලී | 1,655,057 | 2,406,798 | 304,205 | 267,467 |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද මුදල | 254,150 | 291,585 | 197,454 | 55,833 |
| ගෙවූ ලාභාංශ | (430,088) | (1,124,190) | - | - |
| **ආයෝජන කටයුතුවලින් ජනනය වූ / (කටයුතුවල යෙදවීමෙන්) ශුද්ධ මුදල් ප්‍රවාහය** | (63,754,200) | (73,858,551) | (58,755,868) | (63,885,034) |
| **මුදල් යෙදවීමේ කටයුතුවලින් ජනනය වූ / (කටයුතුවල යෙදවීමෙන්) මූල්‍ය ප්‍රවාහය** | | | | |
| දායක ප්‍රාග්ධනයෙන් ලත් මුදල | 5,632,200 | 10,845,785 | 5,632,200 | 10,845,784 |
| පාරිභෝගික දායකත්වය | 9,010,327 | 7,857,347 | 8,468,616 | 8,011,379 |
| වරණීය කොටස් නිදහස් කිරීම | 51,726 | - | - | - |
| පාරිභෝගික තැන්පතු - ආපසු ගෙවීම් | (193,717) | (243,215) | (193,720) | (243,217) |
| පාරිභෝගික තැන්පතු - ලැබීම | 930,361 | 1,065,433 | 930,361 | 1,065,433 |
| කල්බදු ණයකරුවන් / (කල්බදු ගෙවීම්) ශුද්ධ සංචලනය | (133,115) | (123,500) | (132,186) | (120,724) |
| පොලී සහිත ණය සහ ණය ගැනීම් වලින් ලත් මුදල් | 55,309,973 | 85,305,461 | 46,289,209 | 85,487,618 |
| පොලී සහිත ණය සහ ණය ගැනීම් ආපසු ගෙවීම | (19,013,789) | (38,355,312) | (18,256,325) | (37,988,348) |
| ලැබියුතු මූල්‍ය කල්බදු | (355,086) | - | - | - |
| නිවිදු කොටස් නිකුතුව | - | 254,517 | - | - |
| බදු ආපසු ලැබීම් | 20,669 | - | - | - |
| කල්බදු ඉඩම් මත ගෙවූ අතිරික්ත මුදල් | 389 | (1,470) | - | - |
| **මූල්‍ය (කටයුතු වල යෙදවීමෙන්) / කටයුතුවලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | 51,259,938 | 66,605,046 | 42,738,155 | 67,057,925 |
| **මුදල් සහ මුදල් වලට සමාන දෑ වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම)** | (5,427,614) | 21,743,522 | (817,619) | 16,381,217 |
| **වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් වලට සමාන දෑ** | 3,563,839 | (18,179,683) | (1,431,444) | (17,812,661) |
| **වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් වලට සමාන දෑ** | (1,863,775) | 3,563,839 | (2,249,063) | (1,431,444) |

මෙම මූල්‍ය ප්‍රකාශනයේ පිටු අංක 93 සිට 149 දක්වා ඇති සටහන්, මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසක් වේ

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 1.0 සංයුක්ත තොරතුරු

### 1.1 පොදු

1969 අංක 17 දරන පනත යටතේ, ලංකා විදුලිබල මණ්ඩලය සංස්ථාගත කර ඇත. මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය, අංක 50, සර් චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත, කොළඹ 2 යන ස්ථානයේ පිහිටා ඇත.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

#### මණ්ඩලය

වර්ෂය තුළ මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ, විදුලි උත්පාදනය, ප්‍රසම්පාදනය, සම්ප්‍රේෂණය,එලදායි බෙදාහැරීම සහ විදුලි බලය විකිණීම යි.

මණ්ඩලයේ පරිපාලිත සමාගම්වල ප්‍රධාන ක්‍රියාකාරකම් පහත දැක්වෙන පරිදි වේ.

#### සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම

වර්ෂය තුළ දී සමාගමේ ප්‍රධාන කාර්යයන් වූයේ, ලංකා විදුලිබල මණ්ඩලයෙන් විදුලිය මිලදී ගැනීම සහ ගාල්ල, කළුතර, මොරටුව, කැළණිය, නුගේගොඩ, කෝට්ටේ සහ මීගමුව යන ස්ථානයන්හි පිහිටි සමාගමේ ශාඛා හරහා ගෘහස්ථ සහ කාර්මික පාරිභෝගිකයනට සිල්ලරට බෙදා හැරීමයි.

#### සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම

වර්ෂය තුළ සමාගමේ ප්‍රධාන කාර්යයන් වූයේ ට්‍රාන්ස්ෆෝමර්ස් නිෂ්පාදනය කිරීම හා අපනයනය කිරීම සහ ආයතනික ව්‍යාපාර උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම වශයෙන් සමූහ සමාගම්වල ආයෝජන කාර්යයන්හි නිරතවීමයි.

#### සීමාසහිත ලංකා කෝල් (පුද්ගලික) සමාගම

පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි ලක්විජය ගල් අඟුරු බලාගාරයේ විදුලිබල උත්පාදනය සඳහා, ගෙන්දගම් ප්‍රමාණය අඩු, උසස් ප්‍රමිතියෙන් යුත් ගල් අඟුරු සැපයීමයි.

#### සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම

සමාගමේ ප්‍රධාන කාර්යයන් වනුයේ, සම්ප්‍රේෂණ මාර්ග සහ ජාලක උප පොළවල් ඉදිකිරීමේ ව්‍යාපාර කටයුතුවල නිරතවීම, පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ඉදිකිරීම, නඩත්තු කිරීම හා මෙහෙයවීම සහ විදුලි බල බලශක්ති උත්පාදනය සඳහා අවශ්‍ය කටයුතු කිරීම හා පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සඳහා අවශ්‍ය කටයුතුවල නිරත වීම යි.

#### බද්ධ ව්‍යාපාරය

#### සීමාසහිත ත්‍රිකුණාමල විදුලිබල සමාගම

විදුලිබල ජනනය හා ලංකා විදුලිබල මණ්ඩලයේ ජාතික ජාලයට විදුලිබලය විකිණීම සමාගමේ ප්‍රධාන කාර්යයවේ.

### 1.3 නිකුතුව සඳහා බලය පවරනු ලැබූ දිනය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා, ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට 2015 පෙබරවාරි 11 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනාවකට අනුකූලව අනුමැතිය ලබා දී ඇත.

## 2.0 පොදු ප්‍රතිපත්ති

### 2.1 පිළියෙල කිරීමේ පදනම

සමාගම් සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (Chartered Accountants of Sri Lanka) විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතී - ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලින් සමන්විත (මින් ඉදිරියට ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර.) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සකස් කරනු ලැබ ඇත.

මූල්‍ය ප්‍රකාශන, ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ උපචිත පදනම මත පිළියෙල කර ඇත.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතී / ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව SLFRS / LKAS මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, ඇතැම් අර්බුදකාරී (critical) ගිණුම් ඇස්තමේන්තු යොදා ගැනීමට සිදුවේ. ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කිරීමේ ක්‍රියාවලියේ දී, කළමනාකරණයට එහි විනිශ්චය (judgment) පාවිච්චි කිරීමට ද සිදුවනු ඇත. උසස් තත්ත්වයේ විනිශ්චයක් හෝ සංකීර්ණතාවයක් ඇතුළත්වන ක්ෂේත්‍රයන් නැතහොත් මූල්‍ය ප්‍රකාශන සඳහා උපකල්පන හා ඇස්තමේන්තු වැදගත් වන ක්ෂේත්‍රයන් මඟින් අනාවරණය කරනු ලැබේ.

#### 2.1.1 අනුකූලතා ප්‍රකාශනය

සමාගම් සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කරනු ලැබ ඇත (SLFRS).

#### 2.1.2 ඒකාබද්ධ කිරීමේ පදනම

ලංකා විදුලිබල මණ්ඩලයේ සහ එහි පරිපාලිත සමාගම් වන සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම(LTL), සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම (LECO), සීමාසහිත ලංකා කෝල් (පුද්ගලික) සමාගම (LCC), සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම සහ සීමාසහිත එල් ටී එල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගමේ හා සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ පරිපාලිතයන්ගේ ඒකාබද්ධ ගිණුම්වලින් සමූහ ගිණුම් සමන්විත වේ.

සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගමේ පරිපාලිත සමාගම් ලෙස, එල්ටීඑල් ට්‍රාන්ස්ෆෝමර්ස් (පුද්ගලික) සමාගම, එල්ටීඑල් ගැලවනයිසර්ස් (පුද්ගලික) සමාගම,සීමාසහිත ලක්දනව් (පුද්ගලික) සමාගම,සීමාසහිත නිව්දු(පුද්ගලික) සමාගම, සීමාසහිත එල්ටීඑල් එනර්ජි (පුද්ගලික) සමාගම, සීමාසහිත නිව්දු අසුපිනිඇල්ල (පුද්ගලික) සමාගම,සීමාසහිත ලංකා ඉන්ඩස්ට්‍රියල් ප්‍රඩක්ට්ස් ඉංජිනියරින් (පුද්ගලික) සමාගම, සීමාසහිත පවන් දනව් (පුද්ගලික) සමාගම සහ සීමාසහිත ඉන්ෆ්‍රා එන්ජියරින් (පුද්ගලික) සමාගම යන ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති සහ නිත්‍ය පදිංචි ලෙස ලියාපදිංචි වී ඇති සීමිත වගකීම්

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

සමාගම් වේ. මෙම සමාගම්වල ලියාපදිංචි කාර්යාල, කොළඹ 2, පාර්ක් වීදියේ අංක 67 යන ස්ථානයේ පිහිටා ඇත.

සීමාසහිත ලක්දනව් සමාගමේ පූර්ණ හිමිකම් සහිත පරිපාලිත සමාගමක් වන සීමාසහිත බ්‍රයිට් ඉන්ටර්නැෂනල් පවර් (පුද්ගලික) සමාගමේ ලියාපදිංචි කාර්යාලය, අංක 8, පයනියර් ස්ට්‍රීට්, සිංගප්පූරුව 628420 යන ස්ථානයේ පිහිටා ඇත. සීමාසහිත ලක්දනව් සමාගමේ අර්ධ හිමිකම් සහිත සමාගමක් වන සීමාසහිත රාජ් ලංකා පවර් සමාගමේ ලියාපදිංචි කාර්යාලය, බංගලාදේශයේ, අංක:350, නල්ජානි (වයර්ලස් ගේට්), චන්දන, ගාසිපර්-1702, යන ස්ථානයේ පිහිටා ඇත.

සීමාසහිත හෙළදනව් යනු සීමාසහිත ලක්දනව් සහ සීමාසහිත හේමාස් පවර් (පෞද්ගලික) සමාගම අතර පවත්නා බද්ධ ව්‍යාපාරයකි. මෙම සමාගමේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 1, බ්‍රිස්ට්ල් වීදියේ අංක 36 යන ස්ථානයේ පිහිටා ඇති අතර ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය හේලා ස්ටේට්, පුත්තලම යන ස්ථානයේ පිහිටා ඇත.

සීමාසහිත ලක්දනව් බංග්ලා විදුලිබල සමාගම සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගමට අර්ධ වශයෙන් හිමි පරිපාලිතයක් වන අතර එහි ලියාපදිංචි කාර්යාලය අංක 67. සහරා සෙන්ටර්, 9 මහල, 37/A කශ්‍රීයල් VIP මාර්ගය, ඩකා 1000 බංග්ලාදේශය හි ඇත.

සීමාසහිත ලක්දනව් සහ සීමාසහිත ලංකා ඉන්ඩස්ට්‍රියල් ප්‍රඩක්ට්ස් (පුද්ගලික) සමාගමේ ප්‍රධාන ව්‍යාපාර ස්ථානයන් ලිංඩල් කාර්මික වත්ත, සපුගස්කන්ද යන ස්ථානයේ පිහිටා ඇත. සීමාසහිත එල්ටීඑල් එනර්ජි (පුද්ගලික) සමාගම සහ සීමාසහිත නිව්ඳු (පුද්ගලික) සමාගම පිළිවලින් බෙලිහුල්ඔය, බලංගොඩ යන ලිපිනයන්හි ද සීමාසහිත නිව්ඳු අසුපිනිඇල්ල (පුද්ගලික) සමාගම අරනායක යන ලිපිනයේ ද සීමාසහිත පවන් දනව් (පුද්ගලික) සමාගම ඉලන්තඩිය, නොරොච්චෝලේ යන ලිපිනයන්හි පිහිටා ඇත.

සීමාසහිත එල්ටීඑල් එනර්ජි (පුද්ගලික) සමාගමේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 2, පාර්ක් වීදියේ අංක 67 යන ස්ථානයේ සහ ප්‍රධාන ව්‍යාපාර ස්ථානය කොළඹ 07 රොස්මීඩ් පෙදෙසේ අංක 08 ස්ථානයේද පිහිටා ඇත.

සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ (LECO) පරිපාලිත සමාගම් වනුයේ, සීමාසහිත ලෙකෝ ව්‍යාපෘති (පුද්ගලික) සමාගම සහ සීමාසහිත ඇන්ටිලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගම යි. මෙම සමාගම්වල ලියාපදිංචි කාර්‍යාලය, අංක 411, ඊ. එච්. කුරේ ගොඩනැගිල්ලි, ගාලු පාර, කොළඹ 3 යන ලිපිනයේ පිහිටා ඇත.

සීමාසහිත ලංකා කෝල් (පුද්ගලික) සමාගමේ ලියාපදිංචි කාර්‍යාලය අංක 51/3, දුටුගැමුණු වීදිය, දෙහිවල යන ලිපිනයේ පිහිටා ඇත.

සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජිස් (පුද්ගලික) සමාගමේ ලියාපදිංචි කාර්‍යාලය, අංක 50, සර් චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත, කොළඹ 2 යන ලිපිනයේ පිහිටා ඇත. එහි ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය 11 වන මහල, සෙත්සිරිපාය අදියර II, බත්තරමුල්ල ලිපිනයේ පිහිටා ඇත.

සීමාසහිත ත්‍රිකුණාමලය විදුලිබල සමාගම, ලංකා විදුලිබල මණ්ඩලය සහ ඉන්දියාවේ සීමාසහි NTPC සමාගම අතර බද්ධ ව්‍යාපාරයකි. ලියාපදිංචි කාර්යාලය, කිරුළපන, හයිලෙවල් පාරේ අංක 240 දරන ස්ථානයේ පිහිටි ගොඩනැගිල්ලේ තෙවන මහලේ පිහිටා ඇත.

ලංකා විදුලිබල මණ්ඩලය, සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම, සීමාසහිත ලංකා කෝල් (පුද්ගලික) සමාගම සහ සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජිස් (පුද්ගලික) සමාගම යන සමාගම් සඳහා දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන පොදු ගිණුම් වර්ෂයක් ඇති අතර සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම සහ සීමාසහිත ත්‍රිකුණාමලය විදුලිබල සමාගම යන සමාගම්වල මූල්‍ය වර්ෂය මාර්තු 31 දිනෙන් අවසන් වේ. කෙසේ වෙතත්, සමූහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට හැකි වන සේ, එම සමාගම්වල විගණකවරුන් විසින් සහතික කර ඇති මූල්‍ය ප්‍රකාශයන් තනි මූල්‍ය ප්‍රකාශයක් ලෙස සකසා ඇත.

මණ්ඩලයේ සහ එහි පරිපාලිත සමාගම්වල මුළු ලාභ / අලාභ ඒකාබද්ධ ආදායම් ප්‍රකාශනයේ ඇතුළත් කර ඇත. බාහිර කොටස් කරුවන්ට අදාළ බදු අය කිරීමෙන් පසු හිමි ලාභ හෝ අලාභ අනුපාතයන්, ලංකා විදුලිබල මණ්ඩලයේ සම කොටස් හිමියන්ට ආරෝපණීය ලාභ හෝ අලාභ ගණනය කිරීමේ දී පාලනයට යටත් නොවන හිමිකම් යන ශීර්ෂය යටතේ ගලපා ඇත.

ලංකා විදුලිබල මණ්ඩලයේ සහ එහි පරිපාලිත සමාගම්වල සියලු වත්කම් හා වගකීම් ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට ඇතුළත් කර ඇත. පරිපාලිත සමාග ම්වල බාහිර කොටස් හිමියන්ට අදාල ශුද්ධ වත්කම් ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පාලනයට යටත් නොවන ගේ ශීර්ෂය යටතේ ගලපා ඇත. අන්තර් සමූහ ශේෂයන් හා ගනුදෙනු සහ අන්තර් සමූහ ගනුදෙනුවලින් උද්ගත වන උපලබ්ධි නොවූ ලාභ/අලාභ සහ ලාභාංශ, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඉවත් කරනු ලැබේ.

පාලනය ගිලිහියාමෙන් තොරව පරිපාලිතයේ අයිතියෙහි සිදුවන වෙනස්වීමකදී එය ස්කන්ධ සම්බන්ධ ගනුදෙනුවක් ලෙස ගිණුම් ගත කරනු ලබයි. පරිපාලිත සමාගමක් පාලනය, සමූහයෙන් ගිලිහී ගියහොත්, එය

- පරිපාලිත සමාගම්හි වත්කම්, (කීර්ති නාමයත් ඇතුළත්ව) සහ වගකීම් නැවත හඳුනාගැනීම.
- සුළු කොටස් හිමියන්ගේ ධාරණ අගය නැවත හඳුනා ගැනීම.
- වාර්තාගත ස්කන්ධයේ සමුච්චිත පරිවර්තන වෙනස නැවත හඳුනා ගැනීම.

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

- ලැබුණු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගය හඳුනා ගැනීම.
- රඳවාගත් ආයෝජනයන්හි සාධාරණ අගය හඳුනා ගැනීම.
- ලාභ/ අලාභයන්හි අතිරික්ත/ ඌනතා හඳුනාගැනීම.
- විස්තීරණ ආදයම් ප්‍රකාශයේ ලාභ/අලාභ හෝ රඳවාගත් ඉපයීම් යටතේ හඳුනා ගනු ලැබූ පරිපාලිත සමාගමේ කොටස් අදාළ පරිදි නැවත වර්ගීකරණය කිරීම.

සමූහයේ හා එහි පරිපාලිතයන්හි 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවලින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සමන්විත වේ. සමූහය විවෘත වීමේදී පාලනය ඉටුකර ගැනීම හෙවත් ආයෝජක සමඟ එහි සහභාගීත්වයෙන් විචල්‍ය ලාභ සඳහා හිමිකම් ඇත. ආයෝජක කෙරෙහි එහි ශක්තිය තුළින් එම ලාභ සඳහා හැකියාව ඇත. විශේෂයෙන් පහත කරුණු තිබෙන විට පමණක් ආයෝජක පාලනය කරයි.

- ආයෝජක කෙරෙහි බලය (එනම් ආයෝජකගේ අදාළ කාර්යයන් මෙහෙයවීම සඳහා ප්‍රවර්තන හැකියාව ලබාදෙන පවත්නා හිමිකම්)
- ආයෝජක සමඟ එහි සහභාගීත්වය සඳහා විචල්‍ය ලාභ වලට පාත්‍ර කිරීම හෝ හිමිකම්.
- එහි ලාභවලට බලපෑම සඳහා ආයෝජක කෙරෙහි ශක්තිය සඳහා හැකියාව.

සාමාන්‍යයෙන් පාලනයේදී වැඩි දෙනෙකුගේ ඡන්දය දීමේ හිමිකම පුනරාරම්භයක් වේ. මෙම යළි ඇරඹුමට සහාය සඳහා හා ඡන්දය දීමක් හෝ ආයෝජකගේ සමාන හිමිකම් වැඩි ප්‍රමාණයක් සමූහයට නොවන විට සමූහය එහි ශක්තිය ආයෝජක කෙරෙහි තිබේද යන්න තක්සේරු කිරීමේදී සමූහය සියලු අදාළ කරුණු හා සැලකිල්ලට ගත යුතු කරුණු සලකා බලනු ලැබේ. පහත කරුණු ඇතුළත්ව

- ආයෝජකගේ වෙනත් ඡන්ද හිමිකරුවන් සමඟ ගිවිසුම්ගත වැඩපිළිවෙල
- වෙනත් ගිවිසුම්ගත වැඩපිළිවෙලකින් පැන නගින හිමිකම්
- සමූහයේ ඡන්දය දීමේ හිමිකම් හා විභව්‍ය ඡන්දය දීමේ හිමිකම

සමූහය එහි පාලනය තිබේද නැද්ද යන්න යළි තක්සේරු කරන අතර අදාළ කරුණු සැලකිල්ලට ගත යුතු කරුණු වලින් දැක්වෙන්නේ පාලන මූලිකාංග තුනෙන් එකක් හෝ වැඩි ගණනක් සඳහා වෙනස්වීම් තිබෙන බවයි. පරිපාලිතය කෙරෙහි සමූහයේ පාලනය ලබාගන්නා විට පරිපාලිතයන් ඒකාබද්ධ කිරීම් ආරම්භ කරන අතර පරිපාලිතය කෙරෙහි සමූහයේ පාලනය නැතිවන විට එය අවසන් වේ. පරිපාලිතයක වර්ෂය තුළ අත්පත් කරගත් හෝ අපහරණය කළ වත්කම්, බැරකම්, ආදායම් සහ වියදම් සමූහය පාලනය ලබා ගන්නා දින සිට ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරන අතර එය පරිපාලිතය පිළිබඳ සමූහයේ පාලනය අවසන් වන දින දක්වා වේ.

ලාභය හෝ පාඩුව සහ වෙනත් විස්තීර්ණ ආදායමේ (OCI) එක් එක් සංරචක සමූහයේ මව් සමාගමේ සම කොටස් හිමිකරුවන් හා සුළු කොටස් හිමිකරුවන් සඳහා ආරෝපණය කෙරේ. එහිදී සුළු කොටස් හිමිකරුවන්ගේ ඌනතා ශේෂයක් තිබුණද එසේ සිදු කෙරේ. ඒකාබද්ධ කිරීමේදී සම්පූර්ණයෙන් සමූහය අත්හැරේ නම් සාමාජිකයන් අතර ගනුදෙනුවලට අදාළව වත්කම් හා බැරකම් ස්කන්ධය, ආදායම, වියදම සහ මුදල් ප්‍රවාහ පිළිබඳ අවශ්‍ය ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවල සිදු කෙරේ. පාලනය අහිමිවීමක් නොමැතිව පරිපාලිතයක හිමිකම් අයිතියක වෙනස්වීමක් හිමිකම් ගනුදෙනුවක් ලෙස ගිණුම්ගත කෙරේ.

පරිපාලිතයක් පිළිබඳ පාලනය සමූහයට අහිමි වේ නම් එහිදී අදාළ වත්කම් (කීර්තිනාමය ඇතුළත්ව) සුළු කොටස් හිමිකරුවන්ගේ අයිතීන් සහ හිමිකම් පිළිබඳ වෙනත් සංරචක හඳුනාගන්නා අතර ලැබීමක් හෝ අලාභයක් ඕනෑම ප්‍රතිඵලයක් ලාභයෙහි හෝ පාඩුවෙහි හඳුනා ගනී. ඕනෑම රඳවා ගත් ආයෝජනයක් සාධාරණ අගයට හඳුනා ගනී.

### 2.1.3 අඛණ්ඩ පැවැත්ම

#### අඛණ්ඩ පැවැත්ම - සීමාසහිත හෙළදනව් සමාගම

අඛණ්ඩ පැවැත්මක් ලෙස සමූහයේ නොකඩවා පවත්වා ගෙන යාමේ හැකියාව පිළිබඳ තක්සේරුවක් අධ්‍යක්ෂවරුන් විසින් සිදුකරන ලද අතර පහත සඳහන් කරුණු හැර ඇවර කිරීමකට හෝ ව්‍යාපාර අවසන් කිරීමට හෝ ඔවුන් අදහස් නොකරයි.

සීමාසහිත හෙළදනව් සමාගම හා ලංකා විදුලිබල මණ්ඩලය අතර අත්සන් කරන ලද 2009 මැයි 09 දිනැති විදුලිබලය මිලදී ගැනීමේ ගිවිසුම 2014 දෙසැම්බර් 08 දින ඉකුත් වී තිබුණි. ආයතනය සම්බන්ධයෙන් බලනකල, ගිවිසුම් කල් ඉකුත් වීම යටතේ අඛණ්ඩ පැවැත්මක් තිබෙන ලෙස නොකඩවා පවත්වාගෙන යාම සඳහා ආයතනයේ හැකියාව පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් ඇත.

එබැවින් සීමාසහිත හෙළදනව් සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්ම උපකල්පනය අදාළ නොවේ.

## 2.2 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

### 2.2.1 බද්ධව පාලනය කෙරෙන ආයතනය

#### ලංකා විදුලිබල මණ්ඩලය

ලංකා විදුලිබල මණ්ඩලය සහ ඉන්දියාවේ NTPC (පුද්ගලික) සමාගම අතර බද්ධව පාලනය වන ඒකකයක් (entity) වන සීමාසහිත ත්‍රිකුණාමල විදුලිබල සමාගමේ ගිණුම් ප්‍රකාශන, ස්කන්ධ ක්‍රමය (Equity Method) අනුව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇත.

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

### සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම

සීමාසහිත හේමාස් පවර් සමාගම සහ සීමාසහිත ලක්දනව් සමාගම ආයතන දෙක අතර බද්ධව පාලනය වන, සීමාසහිත හෙළදනව් සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2014 ඔක්තෝබර් 31 දක්වා සමූහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇති අතර 2011 ජනවාරි 11 සිට බල පැවැත්වෙන ශ්‍රී ලං මූ වා ප්‍ර 11 ට අනුකූලව සමානුපාතික ඒකාබද්ධ කිරීම් ක්‍රමයෙන් ස්කන්ධ ක්‍රමයට එහි ගිණුම්කරණ ප්‍රතිපත්තියද වෙනස් කර ඇත.

## 2.2.2 විදේශ මුදල් පරිවර්තනය

### ආ). ව්‍යවහාරික හා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී යොදා ගන්නා මුදල්.

ආයතනය ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරයේ මුදල් භාවිතයෙන් මූල්‍ය ප්‍රකාශනවල අතුළත් කර ඇති අයිතම මනිනු ලැබේ. (ව්‍යවහාරික මුදල්) ආයතනයේ, ව්‍යවහාරික හා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ මුදල් ඒකක ලෙස සලකනු ලබන, "ශ්‍රී ලංකා රුපියල්" භාවිතයෙන් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලැබේ.

### ආ). ගනුදෙනු සහ ශේෂයන්

ගනුදෙනුව සිදුවන දිනයේ පවත්නා විනිමය අනුපාතිකයන් යොදා ගනිමින්, මණ්ඩලය විසින් විදේශ මුදල් ගනුදෙනු ආරම්භක අවස්ථාවේදී ව්‍යවහාරික මුදල් ලෙස වාර්තා කරයි. එවැනි ගනුදෙනු නිරාකරණය කිරීමේ හා විදේශ ව්‍යවහාර මුදල්වල නම් කරනු ලැබූ මූල්‍ය වත්කම් හා වගකීම්වල වර්ෂාවසාන විනිමය අනුපාතයන් අනුව පරිවර්තනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවන විදේශ විනිමය වාසි සහ අවාසි, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයන්හි හඳුනාගනු ලැබේ.

1969 අංකː 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 42 වන වගන්තියේ 06 වන උප වගන්තිය අනුව, විදේශීය ව්‍යවහාර මුදලින් ලබා ගන්නා ලද ණයවලට අදාළ ප්‍රාග්ධනය සහ පොලිය ශ්‍රී ලංකා රජය මගින් දරන බැවින්, ඒ සම්බන්ධයෙන් විනිමය උච්චාවචනයන්ගෙන් හටගන්නා කිසිදු ලාභයක් හෝ පාඩුවක් සැලකිල්ලට ගනු නොලැබේ. ආපසු ගෙවිය යුතු නොපිය වූ ණය, ලංකා විදුලිබල මණ්ඩලය විසින් ලබා ගන්නා අවස්ථාවේ පැවති එකඟ වූ විනිමය අනුපාතය අනුව අගයනු ලැබේ.

### ඇ) විදේශ ව්‍යවහාර මුදල් මෙහෙයුම

විදේශ මෙහෙයුම් වන එතෙර පරිපාලිත සමාගම් වල මූල්‍ය තත්ත්ව ප්‍රකාශයන් හා විස්තීර්ණ ආදායම් ප්‍රකාශයන්, පහත දැක්වෙන පරිදි, සමූහයේ ඉදිරිපත් වීමේ මුදල් ඒකක බවට පරිවර්තනය කළ යුතුය.

- ශේෂ පත්‍ර දිනයේදී නියම කරන ලද විනිමය අනුපාතය අනුව, වත්කම් හා වගකීම් පරිවර්තනය කරනු ලැබේ.

- සාධාරණ අගයට මිනුම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් ඒකකයන්හි මුදල් නොවන අයිතමයන්, සාධාරණ අගය හඳුනා ගත් දිනයට පවතින විනිමය අනුපාත භාවිත කරමින් පරිවර්තනය කරනු ලබයි.

- මෙම සාමාන්‍ය අනුපාතය ගනුදෙනු දිනයේදී පැවති සාමාන්‍ය අනුපාතයට ආසන්න සාධාරණ අනුපාතයන් නොවන්නේ නම් මිස, ගනුදෙනු දිනයේදී නියම කරන ලද විනිමය අනුපාතය අනුව ආදායම් හා වියදම් පරිවර්තනය කරන අවස්ථාවේදී, අදාළ කාලය සඳහා පැවති සාමාන්‍ය විනිමය අනුපාතය අනුව ආදායම් හා වියදම් පරිවර්තනය කරනු ලැබේ.

- ඒකාබද්ධ කිරීම සඳහා කෙරෙන ගනුදෙනුවලදී හට ගන්නා හුවමාරු වෙනස්කම් අනෙකුත් විස්තීර්ණ ආදායමේදී හඳුනාගනු ලැබේ.

## 2.2.3 බදු අයකිරීම

### (අ) ප්‍රවර්තන බදු

අදාළ කාලය සඳහා බදු වියදම්, ප්‍රවර්තන හා විලම්බිත බදුවලින් සමන්විත වේ. ප්‍රවර්තන හා පසු ගිය කාලයන් සඳහා ප්‍රවර්තන ආදායම් බදු වත්කම් හා වගකීම්, ආපසු අයකර ගැනීමට අපේක්ෂිත ප්‍රමාණය හෝ දේශීය ආදායම් කොමසාරිස් - ජනරාල් වෙත ගෙවන ලද ප්‍රමාණය අනුව ගණන් බලනු ලැබේ. සමාගම ක්‍රියාත්මක වන හෝ බදු පැනවිය හැකි ආදායම් උපදවන රටේ, පනවා ඇති හෝ වාර්තා කරන දිනයේ නිත්‍ය ලෙස පනවනු ලබන නීති, වටිනාකම් ගණනය කිරීම සඳහා භාවිතා කරන ලද බදු අනුපාතයන් හා බදු නීති වෙයි.

විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ බදු හඳුනා ගැනෙයි. වෙනත් විස්තීර්ණ ආදායම් ලෙස හඳුනා ගන්නා ආදායම් හෝ වියදම් අයිතමයකට ආරෝපණීය වන වෙනසක් හැර වෙනත් විස්තීර්ණ ආදායම් ද සෘජු ලෙසම වෙනත් විස්තීර්ණ ආදායම්වල හඳුනා ගනී. වර්තමාන ආදායම් බදු වලට අදාළව හිමිකම් ලෙස සෘජුවම හඳුනාගනු ලැබූ අයිතමයන් හිමිකම් ලෙස හඳුනා ගත යුතු අතර එය ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු නොලැබේ.

මූල්‍ය ප්‍රකාශනයන්හි වාර්තා කර ඇති පරිදි ආදායම් බදු සඳහා වන විධිවිධානයන් ආදායම් හා වියදම් මූලිකාංග මත පදනම් වන අතර 2006 අංක 10 දරන පනත හා එහි සංශෝධනයන්ට අනුව ආදායම් බදු ගණනය කරනු ලැබේ.

### ලංකා විදුලිබල මණ්ඩලය

2006 අංක 10 දරන දේශීය ආදායම් පනත හා එම පනතට කෙරෙන්නා වූ සංශෝධනයන් අනුව, 2011 අප්‍රේල් මස 01 වන දිනෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ සිට පස් වසරක කාලයක් සඳහා සියළුම ආදායම් මූලාශ්‍රයන්ගෙන් ලැබෙන ආදායම් සම්බන්ධයෙන් වන බද්දෙන්, ලංකා විදුලිබල මණ්ඩලය නිදහස කරනු ලැබේ. මේ අනුව, 2015/16 ආදායම් වර්ෂයෙන් බදු විරාමය අවසන් වන අතර ලාභයෙන් 28% ක් ආදායම් බද්දට යටත්වේ.

### (ආ). විලම්බිත බදුකරණය

බැරකම් ක්‍රමය භාවිතා කරමින් වත්කම් හා වගකීම්වල බදු පදනම් අතර ඇති වන සියලු තාවකාලික වෙනස්කම් සහ මූල්‍ය ප්‍රකාශනයන්හි ඒවායේ ධාරණ වටිනාකම් මත විලම්බිත ආදායම් බදු ප්‍රතිපාදන සලසා ඇත. ව්‍යාපාර

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

සංයෝජනයක් නොවන ගනුදෙනුවක වත්කමක් හෝ වගකීමක් මුල් හඳුනා ගැනීමේදී විලම්බිත ආදායම් බදු වගකීම් හටගන්නා අවස්ථාවක ද ව්‍යාපාර සංයෝජනයක් නොවන ගනුදෙනුවක් සිදුවන අවස්ථාවකදී ද ගිණුම්කරණ ලාභය හෝ පාඩුව බල නොපාන ගනුදෙනුවක් සිදුවන අවස්ථාවක ද හැර බදු අය කළ හැකි සියලු තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත ආදායම් බදු බැරකම් හඳුනාගනු ලබයි.

විලම්බිත ආදායම් බදු වත්කම් පිළිගනු ලබන්නේ අඩු කළ හැකි සියලු කාල වෙනස්කම් හා හිලවු නොකර ඉදිරියට ගෙන ගිය බදු අලාභ හා අඩු කළ හැකි කාල වෙනස්කම් වලට එරෙහිව බදු අයකළ හැකි ලාභ තිබෙන පමණට හිලවු නොකළ ඉදිරියට ගෙන ගිය බදු අලාභ භාවිතා කළ හැකි වන පමණටය. ගනුදෙනුවක් සිදුවන අවස්ථාවේදී හෝ ව්‍යාපාරික සම්බන්ධතාවයක් නොමැති ගනු දෙනුවකදී පිළිගැනෙන වත්කම් හෝ බැරකම්වලදී විලිම්බිත බදු වත්කම් සම්බන්ධ ලාභ හෝ අලාභ බල නොපාන පරිදි ගනු දෙනුව සිදුවන කාලයේ දී සහ ව්‍යාපාරික සම්බන්ධතාවයක් නොමැති ගනුදෙනුවකදී වත්කම් හා බැරකම් ලෙස මූලිකව නොසලකා විලම්බිත බදු බැරකම් හැරෙන්නට සියලුම තාවකාලික බදු වෙනස්කම් පදනම් කර ගෙන විලම්බිත බදු බැරකම් හඳුනාගනු ලබයි. විලම්බිත බදු වත්කම්වල ධාරණ අගයයන් එක් එක් වාර්තා කරන දිනයේදී සමාලෝචනය කරන විලම්බිත බදු සියල්ල හෝ ඉන් කොටසක් උපයෝගී කර ගැනීමට සෑහෙන තරම් බදු අයකර ගත හැකි නොවන පමණට අඩු කරනු ලබයි.

පරිපාලිත සමාගම් වල, ආශ්‍රිත සමාගම් වල සහ බද්ධ ව්‍යාපාර වල ආයෝජන තුලින් ඇතිවන තාවකාලික වෙනස්කම් පිළිබඳව සලකා බැලීමේදී ප්‍රතිවර්තන කල නියම කිරීම් හැර අනෙකුත් තාවකාලික වෙනස්කම් පාලනය කල හැකි අතර එම තාවකාලික වෙනස්වීම් අනගාතයේදී ප්‍රතිවර්තනය කල නොහැක.

සෑම වාර්තා කරන දිනයකදීම හඳුනානොගත් විලම්බිත බදු වත්කම් නැවත තක්සේරු කරන අතර බදු අය කළ හැකි අනාගත ලාභ වලින් විලම්බිත බදු වත්කම් අයකර ගැනීමට හැකි පමණට පත්ව ඇති බවට හඳුනා ගැනෙයි.

පරිපාලිත සමාගම්වල, ආශ්‍රිත සමාගම්වල හා බද්ධ ව්‍යාපාර වල ආයෝජනයන්හි ඇති වන අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් පිළිබඳ සලකා බැලීමේදී, අනාගතයේදී ප්‍රතිවර්තනය කල හැකි තාවකාලික වෙනස්කම්හි වටිනාකම් දක්වා තාවකාලික වෙනස්කම් උපයෝජනය කළහැකි වන ප්‍රමාණය හා අනාගත බදු වලට යටත් ලාභ දක්වා විලම්බීත බදු වත්කම් හඳුනාගත හැකිය.

විලම්බිත බදු වත්කම් හා බැරකම් මනිනු ලබන්නේ, බදු වත්කම් උපලබ්ධි වන හෝ බදු බැරකම් නිරවුල් කරනු ලබන අවස්ථාවන්හිදී හෝ වාර්තා කරන දිනට ක්‍රියාත්මක වන හෝ පසු කාලීනව පනවනු ලබන බදු අනුපාතිකයන් (සහ බදු නීති) අනුව වේ. ස්කන්ධ ප්‍රාග්ධන විෂයයන් හා සම්බන්ධිත විලම්බිත ආදායම් බදු වෙනත් විස්තීර්ණ ආදායමට හෝ ඍජුවම ස්කන්ධ ප්‍රාග්ධනයට හඳුනා ගනී. විලම්බිත බදු වත්කම් හා වගකීම් හිලව් කෙරෙනුයේ, විලම්බීත බදු වත්කම් හා වගකීම් හිලව් කිරීමට නීතිමය වශයෙන් බලාත්මක වූ අයිතියක් ඇත්තේ නම් හා විලම්බිත බදු එකම බදු අය කළ හැකි ආයතනයක් සම්බන්ධයෙන් වන විට හා සමාන බදු අධිකාරියක් ඇති විටය.

## 2.2.4 ණය ගැනීම් පිරිවැය

අරමුදල් ණයට ගැනීම සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලයට දැරීමට සිදුවන පොලී සහ අනෙකුත් වියදම්වලින් ණය ගැනීම් පිරිවැය සමන්විතවේ. අපේක්ෂිත භාවිතය හෝ විකිණීම සඳහා සූදානම් කිරීම පිණිස අත්‍යවශ්‍යයෙන්ම සැලකිය යුතු කාලයක් ගනු ලබන යෝග්‍යතා වත්කම්, පවරාගැනීම්, ඉදිකිරීම් හෝ නිෂ්පාදනයට ඍජුවම ආරෝපනය කළ හැක පොදු හා විශේෂිත ණය ගැනීමේ පිරිවැය, මෙම වත්කම් අපේක්ෂිත භාවිතය හෝ විකිණීම සඳහා සාර්ථක ලෙස සූදානම් කෙරෙන තෙක් මෙම වත්කම්වල පිරිවැයට එකතු කරනු ලැබේ. අනෙකුත් සියලුම ණය ගැනීමෙ වියදම්, වියදම් දරණ කාලය තුළ වියදම් කරනු ලැබේ.

## 2.2.5 භාණ්ඩ තොග

භාණ්ඩ තොග අගය කරනු ලැබ ඇත්තේ, යල්පැන ගිය හා සෙමෙන් අලෙවි වන භාණ්ඩ සඳහා නිසි දීමනාවන් වෙන් කිරීමෙන් පසු පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයටයි. ශුද්ධ උපලබ්ධි අගය යනු ඇස්තමේන්තු ගත නිමකිරීමේ පිරිවැය සහ විකුණුම් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තු ගත පිරිවැය අඩු කොට ව්‍යාපාර කටයුතු කෙරෙන සාමාන්‍ය කාල සීමාව තුළ භාණ්ඩ විකිණිය හැකි මිලයි. බඩු තොග ඒවා දැනට ඇති ස්ථානයට ගෙන ඒම සහ වර්තමාන තත්ත්වයට පත්කිරීමට දරන ලද වියදම් පහත සඳහන් ලෙස ගණනය කෙරේ.

| සීමාසහිත ලංකා විදුලි(පුද්ගලික) සමාගම | |
|---|---|
| මෙහෙයුම් හා නඩත්තු භාණ්ඩ | හරිත සාමාන්‍ය පදනමින් තත්‍ය පිරිවැය |
| මාර්ගස්ථ භාණ්ඩ සහ වෙනත් පිරිවැය | තත්‍ය පිරිවැය |
| **සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම** | |
| අමු ද්‍රව්‍ය අගැයීම | තත්‍ය පිරිවැයට ප්‍රථමයෙන් ලැබ ප්‍රථමයෙන් නිකුත් කළ පදනමින් |
| නිමි භාණ්ඩ සහ කෙරෙමින් පවතින වැඩ | ඍජු ද්‍රව්‍ය පිරිවැය, ඍජු ශ්‍රම පිරිවැය සහ නිසි ස්ථාවර නිෂ්පාදන පොදු කාර්යය පිරිවැය සමානුපාතය |
| පරිභෝජන ද්‍රව්‍ය සහ අමතර කොටස් | තත්‍ය පිරිවැයට ප්‍රථමයෙන් ලැබ ප්‍රථමයෙන් නිකුත් කළ පදනමින් |
| මාර්ගස්ථ භාණ්ඩ | තත්‍ය පිරිවැයට |

### ලංකා විදුලිබල මණ්ඩලය

වැඩි වශයෙන් ප්‍රයෝජනයට ගන්නා සහ වාර්ෂික මිල ලේඛනයේ ලැයිස්තු ගත කෙරෙන බෙදාහැරීම් අංශවල භාණ්ඩ තොග සම්මත මිලට අගය කෙරෙන අතර අනෙකුත් අංශයන්හි (උත්පාදන අංශය සහ සම්ප්‍රේෂණ අංශය ) පරිභෝජන භාණ්ඩ හා අමතර කොටස් වැනි වෙනත් භාණ්ඩ ප්‍රථම ලැබීම ප්‍රථම නිකුත්කිරීම (FIFO) ක්‍රමයට අගය කෙරේ.

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

කෙසේ වෙතත්, සම්මත මිලට අගය කරනු ලැබූ භාණ්ඩ තොගවල උපලබ්ධි නොවූ ලාභය මගින් මිල දක්වා පිරිවැය පහත හෙළීමට අවශ්‍ය ප්‍රතිපාදන ලංකා විදුලිබල මණ්ඩලය මගින් සලසනු ලැබීය.

### 2.2.6 මුදල් සහ මුදල්වලට සමාන වෙනත් දේ

අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු සහ ඉක්මණින් හා පහසුවෙන් නිශ්චිත මුදල් ප්‍රමාණයක් බවට පරිවර්තනය කළ හැකි හා අගය වෙනස්වීම පිළිබඳව අල්ප අවදානමට ලක්වන ඉහළ ද්‍රවශීලතාවයෙන් යුත් කෙටි කාලීන ආයෝජනයන්, මුදල් සහ මුදල්වලට සමාන වෙනත් දේ යනුවෙන් නිර්වචනය කරනු ලබයි. සමූහයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යයන් සඳහා මුදල් හා මුදල්වලට සමාන දේ යන්නට, අතැති මුදල් හා බැංකු අයිරා අඩු කළ පසු බැංකු තැන්පතු අන්තර්ගතවේ. කෙටි කාලීන වශයෙන් පරිණත බවට පත්වන ආයෝජනයන්, එනම්, පවරාගත් දින සිට මාස තුනකින් හෝ ඊට අඩු කාලයකින් පරිණත වන කෙටි කාලීන ආයෝජන ද ඇතුලත් වේ.

### 2.2.7 දේපල, පිරියත සහ උපකරණ

#### (අ) පිරිවැය සහ අගැයීමඃ

දේපල, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් දක්වා ඇත්තේ, සමුච්චිත ක්ෂය කිරීම් සහ හානි අලාභ කිසිවක් විනි නම් සමුච්චිත හානි අඩු කොට පිරිවැයටය. දේපල, පිරියත හා උපකරණයන්හි උපාංග, කොටස් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය, හඳුනාගැනීමේ නිර්ණායකයන් යෝග්‍ය වන්නේ නම්, දිගු කාලීන ඉදිකිරීමේ ව්‍යාපෘති සඳහා ණය ගැනීමේ පිරිවැය එවැනි පිරිවැයට ඇතුළත් වේ. දේපල, පිරියත හා උපකරණයන්හි වැදගත් කොටස් වරින් වර ප්‍රතිස්ථාපනය කිරීමට අවශ්‍යවූ විට, ප්‍රතිස්ථාපිත කොටස්වල ශුද්ධ පොත් අගය, සමූහය විසින් හඳුනා නොගන්නා අතර අලුතින් සවි කළ කොටස සහ ඒ ආශ්‍රිත කාර්යක්ෂම පැවැත්ම සහ ක්ෂයවීම පමණක් හඳුනා ගනී. ඒ හා සමානවම, ප්‍රධාන පරීක්ෂණයක් සිදු කළ විට, හඳුනා ගැනීමේ නිර්ණායකයන් තෘප්තිමත් කරන්නේ නම්, එහි පිරිවැය, පිරියත හා උපකරණයන්හි ධාරණ වටිනාකමේ ප්‍රතිස්ථාපනයක් ලෙස හඳුනා ගැනෙයි.

දේපල, පිරියත හා උපකණයන්හි අයිතමයන් පසුව ප්‍රත්‍යාගණනයට ලක් කරන්නේ නම්, එවැනි වත්කම්වල සම්පූර්ණ පංතියම ප්‍රත්‍යාගණනය කරනු ලැබේ. ආදායම් ප්‍රකාශයෙහි මෙම ඉහළයාම පිළිගන්නා විට අදායම් ප්‍රකාශයෙහි කලින් පිළිගත් එම වත්කමෙහිම ප්‍රත්‍යාගණනය අඩුවීමක් ප්‍රතිවර්තනය වන ප්‍රමාණයට හැර,වත්කම් ප්‍රත්‍යාග ණන සංචිතයෙහි අනෙකුත් විස්තීර්ණ ආදායමේ සහ සමුච්චිත සම කොටස්වල යම් ප්‍රත්‍යාගණන අතිරික්තයක් හඳුනා ගනු ලැබෙයි. ප්‍රත්‍යාගණන ඌනතාවයක් ආදායම් ප්‍රකාශනයේ හිලව් වන යම් දුරකට හැර හඳුනා ගැනෙන අතර එම වත්කමේ පවත්නා අතිරික්තය වත්කම් ප්‍රත්‍යාග ණන සංචිතයේ හඳුනා ගැනේ.

වත්කමේ දළ ධාරණ වටිනාකමට එරෙහිව ප්‍රත්‍යාගණන දිනට වන සමුච්චිත ක්ෂයකිරීම් අත් හැර දමන අතර ශුද්ධ වටිනාකම, වත්කමේ ප්‍රත්‍යාගණන වටිනාකමට අනුව නැවත නිශ්චය කෙරේ. යම් විශේෂ වත්කමකට සම්බන්ධිත යම් ප්‍රත්‍යාගණන සංචිතයක් ඉවත් කිරීමට විකුණනු ලබන විට එය රඳවාගත් ඉපයීම්වලට මාරු කරනු ලැබේ.

#### (ආ) දැනට සිදු කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන කාර්යයන්

සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් පිරිවැය මත ප්‍රකාශ කෙරේ. මේවා ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් වන අතර දිගු කාලීන ප්‍රාග්ධන ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතුවලට සෘජුව ඇතුළත් කෙරේ. ව්‍යාපෘතිය සම්පූර්ණ කරන තුරු හා ඒ හා ආශ්‍රිත වත්කම් පරිහරණය සඳහා ලබා ගත හැකිවන තුරු ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් දැනට සිදු කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන කාර්යයන් ලෙස සලකා ගිණුම් තබනු ලැබේ.

#### (ඇ) හඳුනා ගත් වත්කම් පොත්වලින් ඉවත් කිරීම.

දේපල, පිරියත සහ උපකරණවල අයිතමයක ධාරණ අගය අපහරණයේදී හෝ එය අපේක්ෂිත අනාගත ආර්ථික වාසි නොලැබෙන විට හඳුනා නොගනියි. දේපල, පිරියත හා උපකරණ අයිතමයක් පොත් පත් වලින් ඉවත් කිරීමෙන් ඇති වන වාසියක් හෝ පාඩුවක් අයිතමය හඳුනා නොගැනෙනන්නාවූ (ඉවත්කිරීමේ) වර්ෂයේ ලාභ හෝ පාඩු ප්‍රකාශනයට ඇතුළත් කෙරේ.

දේපල, පිරියත හා උපකරණ විෂයයක ධාරණ අගය ආදේශක පිරිවැයෙහි හඳුනාගන්නා විට, ආදේශ කරන කොටස්වල පවත්නා ධාරණ අගය හඳුනා ගනී. ප්‍රධාන පරීක්ෂණ පිරිවැය ප්‍රාග්ධනිත කෙරේ. එම එක් එක් ප්‍රාග්ධනිත කිරීමේදී, පෙර පරීක්ෂණ පිරිවැයෙහි ධාරණ අගය පොත්වලින් ඉවත් කෙරේ.

එවැනි වත්කම් "විකිණීම සඳහා ඇති වත්කම්" ලෙස හඳුනා ගන්නා අතර, ඒවා අධ්‍යක්ෂ මණ්ඩල තීරණයේ සිට මාස 06 ක් ඇතුළත අපහරණය කළ යුතුය. එසේ අපහරණය නොකළහොත් ඒවා දේපල, පිරියත හා උපකරණ (දේ.පි.උ) යටතේ ක්ෂය සඳහා අවසන් කාලපරිච්ඡේදයට ක්ෂය ගැලපීම සමඟ නැවත වර්ගීකරණය කළ යුතුය.

#### (ඈ) යථා තත්ත්වයට පත් කිරීමේ පිරිවැය

දේපල, පිරියත හෝ උපකරණ අළුත්වැඩියා කිරීම හෝ නඩත්තු කිරීම සඳහා දරන වියදම්, මුලින් තක්සේරු කරන ලද කාර්ය සාධන මට්ටමින් අනාගත ආර්ථික වාසි මුලින් පැවති තත්ත්වයට ගෙන ඒමට හෝ පවත්වා ගෙන යාම සඳහා දරන ලද වියදම්, ගාස්තුවක් ලෙස හඳුනාගනු ලැබේ.

#### (ඉ) ක්ෂය කිරීම්

සින්නක්කර ඉඩමක් හැර වෙනත් වත්කමක් ප්‍රයෝජනය සඳහා යොදාගත හැකිව ඇති විට වත්කමක ඵලදායි ජීවිත කාලය තුළ සරල මාර්ග ක්‍රමය යොදාගනිමින් ක්ෂයවීම ගණනය කරනු ලැබේ. බදු ඉඩමක පිහිටි ගොඩනැගිල්ලක ක්ෂය ගණනය කරන්නේ, වත්කමේ ඇස්තමේන්තු ගත ඵලදායී ජීවිත කාලයත්, කල්බදු වාරිකයත් යන දෙකෙන් අඩු අගයටය.

වත්කම්වල ඵලදායී ජීවිත කාලය පහත සඳහන් ලෙස ඇස්තමේන්තු කරනු ලැබේ.

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

| | |
|---|---|
| **ලංකා විදුලිබල මණ්ඩලය** | |
| සිත්නක්කර ගොඩනැගිලි සහ බදු ඉඩම් හා ගොඩනැගිලි | අවු: 40 |
| සිවිල් වැඩ: | |
| වාන්මඟවල් හා වේලි | අවු: 100 |
| වානේ ජලනල හා රැඳවුම් ජලය | අවු: 40 |
| උප පොළ හා වහරු අංගනය | අවු: 35 |
| උත්පාදන යන්ත්‍ර: පිරියත ඇතුළුව විදුලි බලාගාර (ජල) | අවු: 35 |
| පිරියත ඇතුළු විදුලි බලාගාර (තාප) | අවු: 25 |
| පිරියත ඇතුළු විදුලි බලාගාර (ඩීසල්) | අවු: 15 |
| පිරියත ඇතුළු විදුලි බලාගාර (ගෑස් ටර්බයින්) | අවු: 12 |
| පිරියත ඇතුළු විදුලි බලාගාර (ගල් අඟුරු) | අවු: 30 |
| පිරියත ඇතුළු විදුලි බලාගාර (සුළං) | අවු: 15 |
| සම්ප්‍රේෂණ මාර්ග කිවො 220, කිවො 132, කිවො 66 | අවු: 35 |
| **බෙදාහැරීමේ මාර්ග** | |
| අධි සැර යටිබහන් - 33 | අවු: 50 |
| අධි සැර යටිබහන් - 132 | අවු: 50 |
| අධි සැර යටිබහන් - 11 | අවු: 40 |
| අධි සැර උඩිස් | අවු: 35 |
| අඩු සැර යටිබහන් - | අවු: 40 |
| අඩුසැර උඩිස් | අවු: 35 |
| අඩුසැර පෝෂක කුළුණ | අවු: 35 |
| පාරිභෝගික උපපොළ | අවු: 35 |
| අධිසැර Switchgear | අවු: 35 |
| ප්‍රාථමික හා ජාලක උපපොළ | අවු: 35 |
| සේවා නඩත්තු | අවු: 35 |
| SCADA (මධ්‍යම පහසුකම්) හා සංනිවේදන උපකරණ | අවු: 15 |
| මෝටර් වාහන | අවු: 07 |
| මෝටර් බෝට්ටු | අවු: 07 |
| යන්ත්‍ර හා මෙවලම් | අවු: 05 |
| කාර්යාලීය උපකරණ | අවු: 05 |
| ලී බඩු සහ සවිකිරීම් | අවු: 05 |
| **සී/ස එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්) සමාගම** | |
| ගොඩනැගිලි | අවු: 25-50 ට වැඩි |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | අවු: 8-15 ට වැඩි |
| බලාගාර | අවු: 10-15 ට වැඩි |
| කර්මාන්තශාලා උපකරණ | අවු: 10 ට වැඩි |
| විද්‍යුත් පණිවිඩ හුවමාරු උපකරණ | අවු: 10 ට වැඩි |
| ගිනි නිවීමේ උපකරණ | අවු: 10 ට වැඩි |
| කාර්යාලීය උපකරණ | අවු: 03-10 ට වැඩි |
| ලී බඩු හා සවිකිරීම් | අවු: 03-10 ට වැඩි |
| මෝටර් වාහන | අවු: 04 ට වැඩි |
| උණුසුම් කිරීමේ උපකරණ | අවු: 06 ට වැඩි |
| මෙහෙයුම් හා නඩත්තු අමතර කොටස් | තථ්‍යභාවිතය |
| **සී/ස ලංකා විදුලි (පුද්) සමාගම** | |
| ගොඩනැගිලි | අවු: 40 වැඩි |
| බදු ඉඩම් | කල්බදු කාලසීමාව තුළ |
| යටිතල පහසුකම් සැපයීම | |
| උප පොළවල්, උඩිස් රැහැන් සහ පලාත් පාලන ආයතන හා ලංකාවිදුලිබල මණ්ඩලය වෙතින් පවරා ගත් සේවා රැහැන්, | අවු: 10 |
| ලංකා විදුලි (පුද්ගලික) සමාගම මගින් ඉදි කළ | |
| උප පොළවල්, උඩිස් රැහැන් සහ සේවා රැහැන් | අවු: 20-25 |
| මෝටර් වාහන | අවු: 05-07 |
| පරිගණක | අවු: 03-05 |
| කාර්යාලීය උපකරණ | අවු: 03-07 |
| පිරියත සහ යන්ත්‍ර | අවු: 03-04 |
| **සී/ස ලංකා කෝල් (පුද්) සමාගම** | |
| ලී බඩු හා සවිකිරීම් | අවු: 05 |
| උපකරණ | අවු: 04 |
| මෝටර් වාහන | අවු: 04 |
| පරිගණක | අවු: 04 |
| **සී/ස ත්‍රිකුණාමලය විදුලිබල සමාගම** | |
| ලී බඩු සහ සවිකිරීම් | අවු: 05 |
| උපකරණ | අවු: 05 |
| ලැප්ටොප් /පරිගණක | අවු: 03 |

පිරිවැය රු.15,000.00 වන තෙක් වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇත.

### 2.2.8 කල් බදු

#### (අ) මූල්‍ය කල්බදු:

මූල්‍ය කල්බදු යනු,කල් බද්ද ආරම්භ වන අවස්ථාවේදී, කල්බදු වත්කම් සම්බන්ධයෙන් අදාළ වන සෑම ප්‍රතිලාභයක් හා අවදානමක් මණ්ඩලය වෙත මාරුකරන ලද වත්කම්ය. කල්බදු වත්කමේ සාධාරණ වටිනාකමත්, අවම කල්බදු වාරිකවල වර්තමාන අගයත් යන දෙකෙන් වඩා අඩු අගය ප්‍රාග්ධනිත කරනු ලැබේ. වගකීමෙහි පවත්නා ශේෂය මත නොවෙනස් වන පොලී අනුපාතිකයක් සාක්ෂාත් කර ගැනීම් වස් කල්බදු ගෙවීම් මූල්‍ය කල්බදු අයකිරීම් හා කල්බදු වගකීම්වල අඩුවීම අතර විභජනය කෙරේ. මූල්‍ය ගාස්තු අයකරනු ලබන අතර එය අදායම් ප්‍රකාශයෙහි පිළිබිඹු කෙරේ. වත්කමෙහි අයිතිය පිළිබඳව සාධාරණ නිශ්චිතතාවක් නැත්නම් කල්බදු කාලසීමාව අවසානයේදී මණ්ඩලය විසින් වත්කමෙහි අයිතිය පවරා ගනු ලබයි නම්,ප්‍රාග්ධනිත කරන ලද කල්බදු වත්කමෙහි ඇස්තමේන්තු ගත ඵලදායි ආයුකාලය හා කල්බදු කාල පරිච්ඡේදය යන දෙකෙන් කෙටි කාල පරිච්ඡේදයට ක්ෂය කරනු ලැබේ. ක්ෂයකළ හැකි කල්බදු වත්කම්වල ක්ෂය ප්‍රතිපත්තිය, අයිතිය අනුව ක්ෂය කළ හැකි වත්කම් ක්ෂය කරන ආකාරය දැක්වෙන 2.2.7 (ඉ) ඡේදය අනුව වේ.

IFRIC 4 - "කල්බද්දකින් සමන්විත සැකැස්මක් තීරණය කිරීම" යන විෂය සීමාව තුළට සීමාසහිත රාජ් ලංකා විදුලි බල සමාගම හා බංග්ලාදේශ් විදුලිබල සංවර්ධන මණ්ඩලය අතර සැලැස්ම පිළිබඳ විෂය අර්ථයට වැටෙන බවට සමූහය සැලකිල්ල යොමු කරන අතර පහත සඳහන් නිර්නායකයන් තෘප්තිමත් වීම හේතුවෙන් "ශ්‍රී ලං ගි ප්‍ර 17 - කල්බදු" යටතේ කල්බද්දක් ලෙස ගිණුම්ගත කිරීමට ඇත.

- බංග්ලාදේශයේ රාජ්ෂාහී පිහිටි සමූහයේ විශේෂිත විදුලිබල පිරියතෙහි සුවිශේෂ උපයෝජනය පිළිබඳව විදුලිබල මිලදී ගැනුම් ගිවිසුම යටතේ සැකැස්ම පිළිබඳ සම්පූර්ණත්වය රඳා පවතී.

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

- විදුලිබල පිරියතෙහි සමස්ත නිමැවුම පාලනයේදී බංග්ලාදේශ් විදුලිබල සංවර්ධන මණ්ඩලයට විදුලිබල පිරියත මෙහෙයුම් සඳහා හිමිකම හෝ එය තීරණය කරන ආකාරයට විදුලිබල පිරියත මෙහෙයවීම සඳහා වෙනත් පාර්ශව මෙහෙයවීමටද හිමිකම ඇත.

- සමාගමේ විදුලිබල පිරියත විසින් උත්පාදනය කරන විදුලිබල නිමැවුමක් ලබාගැනීමට බංග්ලාදේශ් විදුලිබල සංවර්ධන මණ්ඩලයට හැර වෙනත් පාර්ශවයකට හැකියාවක් නැත. බංග්ලාදේශ් විදුලිබල සංවර්ධන මණ්ඩලය විසින් එක් ඒකකයකට ගෙවන ලද ධාරිතා ගාස්තු නිමැවුම මත පදනම් නොවේ.

සමාගම එහි වාණිජ්‍ය මෙහෙයුම් දිනයේ සිට යොදාගත් හෙයින් අතීතානුයෝගී බලපෑම සමඟ IFRIC 4 විධිවිධාන අදාළ වේ.

(ආ) මෙහෙයුම් කල්බදු :

මෙහෙයුම් කල්බදු ගෙවීම්, කල්බදු කාලය තුළ සරල රේඛීය පදනමින්, ආදායම් ප්‍රකාශයෙහි මෙහෙයුම් වියදමක් ලෙස හඳුනා ගැනේ.

(ඇ) සමූහ කල්බදු - එල්ටීඑල්

එල්.ටී.එල්.හි ජල, සුළං, හා තාප බලාගාර වල වත්කම්වල හිමිකමට අදාල සියලුම අවදානම් හා ප්‍රතිලාභ සමූහය විසින් හුවමාරු නොකරන අතර එය මෙහෙයුම් කල්බදු ලෙස වර්ග කරයි. කල්බදු වත්කම් තුලින් ජනිතවන උපයෝජිත ප්‍රතිලාභ අඩුවන කාල රටාවට අනුකූලව කාලච්ඡේදයට අදාල සියලුම බලාගාරයන්හි බදු ආදායම බලශක්ති නිමැවුම මත ආදායම් ප්‍රකාශය තුල හඳුනා ගනී. කල්බදු ආදායම් උපයාගැනීමේදී දරණ ලද ක්ෂය ඇතුලත් පිරිවැය වියදමක් ලෙස හඳුනා ගනී. ක්ෂය කල හැකි කල්බදු වත්කම් සඳහා වන ක්ෂය ප්‍රතිපත්තිය සමූහයේ සමාන වත්කම් සඳහා වන ක්ෂය ප්‍රතිපත්තියට අනුකූලවේ.

2.2.9 අස්පෘශ්‍ය වත්කම් :

වෙන් වෙන්ව අත් කර ගනු ලැබූ අස්පෘශ්‍ය වත්කම් මුලින්ම හඳුනා ගනු ලබන අවස්ථාවේදී පිරිවැය මත මැන දක්වයි. ව්‍යාපාර සංයෝජනයක අත්කර ගනු ලබන අස්පෘශ්‍ය වත්කමක පිරිවැය වනුයේ, එය අත්පත් කර ගනු ලබන දිනයේදී එහි පවත්නා සාධාරණ වටිනාකමයි. අස්පෘශ්‍ය වත්කම් මූලික හඳුනා ගැනීමෙන් පසු, යම් සමුච්චිත ක්‍රමක්ෂයක් හෝ හානිකරණයක් වෙතොත් එය අඩු කළ පසු පිරිවැය ඉදිරියට ගෙන යනු ලබයි. ප්‍රාග්ධනිත සංවර්ධන පිරිවැය හැර, අභ්‍යන්තරව ජනනය කරනු ලබන අස්පෘශ්‍ය වත්කම් ප්‍රාග්ධනිත නොකරනු ලබන අතර වියදම් සිදුවූ වර්ෂයේ ආදායම් ප්‍රකාශනයෙහි වියදම් පිළිබිඹු කෙරේ. අස්පෘශ්‍ය වත්කමක ඵලදායි ආයු කාලය පරිමිත හෝ අසීමිත (indefinite) ලෙස තක්සේරු කරනු ලැබේ.

පරිමිත ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම්, ඒවායේ ඵලදායි ආර්ථික ආයුකාලය තුළ ක්‍රමක්ෂයට පත් කරනු ලබන අතර අස්පෘශ්‍ය වත්කම් හානියට පත්වනු ඇති බවට පෙන්නුම් කෙරෙන විට හානිවූ ලෙස තක්සේරු කරනු ලැබේ. පරිමිත ඵලදායි ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කමක ක්‍රමක්ෂය කාල පරිච්ඡේදය හා ක්‍රමක්ෂය කිරීමේ ක්‍රමය, අවම වශයෙන්, වාර්තා කරනු ලබන සෑම කාල පරිච්ඡේදයකම අවසානයේදී සමාලෝචනය කරනු ලැබේ. අපේක්ෂිත ඵලදායි ආයුකාලය හෝ වත්කමේ අපේක්ෂිත අනාගත ආර්ථික වාසි, පරිභෝජනය කිරීමේ අපේක්ෂිත රටාවන්ගෙන් ඇතිවන වෙනස්කම්, ක්‍රමක්ෂය සිදුවන කාලපරිච්ඡේදය හෝ ක්‍රමය, යෝග්‍ය වෙනස්කම් කරමින් සිදු කරනු ලබන අතර ගිණුම්කරණ ඇස්තමේන්තුවලට කෙරෙන වෙනස්කම් ලෙස සළකනු ලැබේ. පරිමිත ජීව කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම්වල ක්‍රමක්ෂය වියදම, අස්පෘශ්‍ය වත්කම්වල කාර්යය සමග සංගත වන වියදම් ප්‍රභේදයෙහි, ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

අසීමිත ඵලදායි ජීවිත කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය නොකරන නමුත්, වෙන වෙනම හෝ මුදල් උපදවන ඒකක මට්ටමින් හෝ හානිකරණය සඳහා වාර්ෂිකව පරීක්ෂා කරනු ලැබේ. අසීමිත ජීවිත කාලය උපකාරී ලෙස අඛණ්ඩව පවතී දැයි තීරණය කර බැලීමට, අසීමිත ජීවිත කාලය තක්සේරු කිරීම වාර්ෂිකව සමාලෝචනය කෙරෙයි. එසේ නොවන්නේ නම් අසීමිත සිට පරිමිත අවස්ථාව දක්වා ඵලදායි ජීව කාලයේ වෙනස්වීම අනාගතය සඳහා බලපවත්නා පරිදි සිදුකෙරේ.

අස්පෘශ්‍ය වත්කමක් හඳුනා ගැනීමෙන් හට ගන්නා ලාභය හෝ පාඩු, බැහැර කිරීමෙන් ලැබෙන ශුද්ධ මුදල සහ වත්කම්වල ධාරණ වටිනාකමත් අතර වෙනසින් ගණනය කෙරේ.වත්කම් පොත්පත් වලින් ඉවත් කරන විට එම ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගැනේ.

පරිගණක මෘදුකාංග

පරිගණක මෘදුකාංග ඒවා අත්පත් කල දිනය හෝ සංවර්ධනය කල දින සිට අවුරුදු 4ක් තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ.

2.2.10 මූල්‍ය උපකරණ - මූලික හඳුනාගැනීම හා පසුකාලින මිනුම්කරණය

2.2.10.1 මූල්‍යමය වත්කම්

අ) මූලික හඳුනාගැනීම හා මිණුම්කරණය

ශ්‍රී ලං ගි ප්‍ර 39 යේ විෂය පථය අනුව මූල්‍යමය වත්කම් ලාභ හෝ අලාභ, ණය හා අයවිය යුතු මුදල්, කල්පිරීම් තෙක් රඳවාගෙන තිබෙන ආයෝජන හා අලෙවිකළ හැකි මූල්‍ය වත්කම් තුළින් සාධාරණ අගය මත උචිත පරිදි වර්ගීකරණය කරනු ලබන අතර, මූලික හඳුනාගැනීමේදී එහි මූල්‍ය වත්කම්වල වර්ගීකරණය තීරණය කරනු ලැබේ. ලාභ හෝ අලාභ මගින් සාධරණ අගය මත සටහන් වන මූල්‍ය වත්කම් හැර සියලුම මූල්‍යමය වත්කම් මුලදී හඳුනාගනු ලබන්නේ ගනුදෙනුවට අදාළ පිරිවැය එකතුකළ සාධාරණ අගය මතය. මූල්‍ය වත්කම්වලට මුදල්, කෙටිකාලීන තැන්පතු, වෙළඳ හා වෙනත් අයවිය යුතු මුදල්, ණය හා වෙනත් අයවිය යුතු මුදල් හා මිලප්‍රකාශිත හා අප්‍රකාශිත මූල්‍ය උපකරණ අයත්වේ.

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

### ආ) පසුකාලීන මිනුම්කරණය.

මූල්‍යමය වත්කම්වල පසුකාලීන මිනුම්කරණය රඳා පවතිනුයේ පහත දැක්වෙන ඒවායේ වර්ගීකරණය අනුවය.

### ලාභ හා අලාභ මගින් සාධාරණ අගය මතවූ මූල්‍ය වත්කම්.

ලාභ හා අලාභ මගින් සාධාරණ අගය මතවූ මූල්‍ය වත්කම්වලට, වෙළඳාම් කිරීම් පිණිස රඳවාගත් මූල්‍යමය වත්කම් හා ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගය මත මූලිකව හඳුනාගැනීමෙන් පසු නම් කළ මූල්‍ය වත්කම් ඇතුළත්ය. සමීප කාලීනව අලෙවි කිරීමේ හෝ නැවත මිලදී ගැනීමේ කාර්යයන් සඳහා ඒවා අත්පත් කරගෙන තිබේනම්, අදාළ මූල්‍ය වත්කම් වෙළඳාම් කිරීම් පිණිස රඳවාගත් ඒවා ලෙස වර්ග කරනු ලැබේ. ලාභ හා අලාභ මගින් සාධාරණ අගය මතවූ මූල්‍ය වත්කම්, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනවල සඳහන් වනුයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය යටතේ හඳුනාගනු ලබන සාධාරණ අගයේ වෙනස්වීම් සහිතව සාධාරණ අගය මතය. ගෙවීම් ලබාගැනීමට සමූහයට තිබෙන අයිතිය ස්ථිරවූ පසු ලාභ හා අලාභ මගින් සාධාරණ අගය මතවූ මූල්‍ය වත්කම්වල ලාභාංශ ආදායම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ.

### ණය හා අයවිය යුතු මුදල්.

ණය හා අයවිය යුතු මුදල් යනු සක්‍රීය වෙළඳපලක ප්‍රකාශිත නොවන ස්ථිර හෝ තීරණය කරන ලද ගෙවීම් සහිත නිර්ව්‍යුත්පන්න මූල්‍ය වත්කම්ය. මූලික මිම්මෙන් පසු එවන් මූල්‍ය වත්කම් පසුකාලීනව ක්‍රමක්ෂය කළ පිරිවැය මත හානිකරණය අඩුකර සඵල පොලී අනුපාතය (EIR) අනුව මනිනු ලැබේ. ක්‍රමක්ෂය කළ පිරිවැය ගණනය කරනු ලබන්නේ අත්පත්කර ගැනීමට අදාල කිසියම් වට්ටමක් හෝ ආධික්‍යයක් හා සඵල පොලී අනුපාතයේ අන්තර්ගත කොටසක් වන ගාස්තු හා පිරිවැය සැලකිල්ලට ගනිමින්ය. සඵල පොලී අනුපාත ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය ආදායම් යටතේ ඇතුළත්ය. හානිකරණය තුළින් ඇතිවන පාඩු ආදායම් ප්‍රකාශනයේ හඳුනාගැනේ.

### අලෙවිකළ හැකි මූල්‍ය ආයෝජන.

ස්කන්ධ හා ණය සුරැකුම්පත් අලෙවිකළ හැකි මූල්‍ය ආයෝජනවලට ඇතුළත්ය. අලෙවිකළ හැකි වශයෙන් වර්ගකර තිබෙන්නේ වෙළඳාම් කිරීම පිණිස රඳවාගෙන නොමැති හෝ ලාභ හෝ අලාභ මගින් සාධරණ අගයක් මත නම් නොකළ ඒවාය. මෙම ප්‍රවර්ගයේ ණය සුරැකුම්පත් යනු අසීමිත කාලසීමාවකට රඳවා තබාගැනීමට අපේක්ෂිත හා ද්‍රවශීලත්වයේ අවශ්‍යතාවලට ප්‍රතිචාරයක් වශයෙන් හෝ වෙළඳපල තත්ත්වයන්ට ප්‍රතිචාර වශයෙන් අලෙවි කිරීමට ඉඩ ඇති ඒවාය.

මූලික මිනුම්කරණයෙන් පසු, අලෙවිකළ හැකි මූල්‍ය ආයෝජන පසුකාලීනව මිනුම්කරණය කරනු ලබන්නේ උපලබ්ධි නොවූ ලාභ/අලාභ සමග සාධාරණ අගයට වන අතර එය පොත්වලින් ඉවත් කරන තෙක් වෙනත් විස්තීර්ණ ආදායමක් ලෙස විකිණීම සඳහා පවත්නා සංචිතයේ තබා ගනියි. මෙසේ කරනුයේ හඳුනාගත් ආයෝජනය පොත්පත් වලින් ඉවත් කරන තෙක් වන අතර, ඒ වන විට සමුච්චිත ලාභය හෝ පාඩුව වෙනත් මෙහෙයුම් ආදායම් වල හඳුනාගෙන හෝ හානිකරණය කිරීමට නිශ්චය කර තිබෙනු ඇත. මේ වන විට සමුච්චිත පාඩුව මූල්‍ය පිරිවැය අනුව ආදායම් ප්‍රකාශයේ නැවත වර්ගකර සඳහන්ව සහ අලෙවිකල හැකි සංචිතයෙන් ඉවත් කරනු ඇත. අලෙවි කල හැකි ණය සුරැකුම්පත් වල පොලී ආදායම ගණනය කරනු ලබන්නේ සඵල පොලී අනුපාත ක්‍රමය යෙදාගෙන වන අතර, ලාභයේදී හෝ පාඩුවේදී හඳුනාගනු ලැබේ.

නුදුරු අනාගතයේදී ඒවා අලෙවිකිරීම ඒ වනවිටත් උචිතදැයි නිශ්චය කිරීම පිණිස අලෙවිකළ හැකි සිය මූල්‍ය වත්කම් සමූහය විසින් අගයුම් කරනු ලැබේ. සමූහයට මෙම මූල්‍ය වත්කම් විකිණීමට නොහැකි වනුයේ, අක්‍රීය වෙළඳපල හා එසේ කිරීම සඳහා වන කළමනාකරණයේ අදහස සැලකිය හැකි ලෙස වෙනස් විය හැකි නිසාය. එවිට ඇතැම් අවස්ථාවන්හිදී සමූහය මෙම වත්කම් නැවත වර්ගීකරණය කිරීමට ඉඩ ඇත. මූල්‍ය වත්කම්, ණය හා අයවිය යුතු මුදල් යන නිර්වචනයට ගැලපෙන විට සහ නුදුරු අනාගතය හෝ කල්පිරීම් තෙක් මෙම වත්කම් රඳවා ගැනීමට සමූහයට අභිප්‍රාය හා හැකියාව ඇත්නම් ණය හා අයවිය යුතු මුදල් නැවත වර්ග කිරීමට අනුමැතිය තිබේ. ඒ අනුව මූල්‍ය වත්කම රඳවා ගැනීමට ආයතනයට අභිප්‍රාය හා හැකියාව තිබේ නම් පමණක් කල්පිරීම දක්වා රඳවා ගැනීමේ වර්ගයට නැවත වර්ග කිරීම අනුමත කළ හැක.

අලෙවිකළ හැකි වර්ගයක් වෙතින් නැවත වර්ගකරන ලද මූල්‍ය වත්කමක් සම්බන්ධයෙන් පූර්ව ලාභයක් හෝ පාඩුවක් ඇත්නම් එය ස්කන්ධය තුල හඳුනා ගන්නා ලද අතර සඵල පොලී අනුපාතය යොදාගෙන ආයෝජනයේ ඉතිරි අයුකාලය ඔස්සේ එය ලාභයට හෝ පාඩුවට ක්‍රමක්ෂය කරනු ලැබේ. ක්‍රමක්ෂය කල නව පිරිවැය හා අපේක්ෂිත මුදල් ප්‍රවාහය අතර කිසියම් වෙනසක් තිබේ නම් සඵල පොලී අනුපාතය යොදාගෙන වත්කමේ ඉතිරි අයුකාලය ඔස්සේ එයද ක්‍රමක්ෂය කරනු ලැබේ. වත්කම පසු කලක හානිකරණය කිරීමට නියමිත නම්, එවිට ස්කන්ධයේ සටහන්වී තිබෙන ගණන ආදායම් ප්‍රකාශනයට නැවත වර්ග කරනු ඇත.

### කල්පිරීම තෙක් රඳවා ඇති ආයෝජන

කල්පිරීම් තෙක් ඒවා රඳවා ගැනීම පිණිස සමූහයට නියත අභිප්‍රාය හා හැකියාව ඇත්නම් ස්ථිර හෝ නිශ්චය කළ හැකි ගෙවීම් හා ස්ථිර කල්පිරීම් සහිත නිර්ව්‍යුත්පන්න මූල්‍ය වත්කම් කල්පිරීම තෙක් රඳවා ගැනීම් වශයෙන් වර්ගකරනු ලැබේ. මූලික මිණුම් කිරීමෙන් පසු කල්පිරීම් තෙක් රඳවා ගන්නා ආයෝජනයන් ක්‍රමක්ෂය කල පිරිවැය මත හානිකරණය අඩුකර සඵල පොලී අනුපාතය අනුව මිණුම් කරනු ලැබේ. ක්‍රමක්ෂය කළ පිරිවැය ගණනය කරනු ලබන්නේ අත්පත් කර ගැනීමට අදාළ කිසියම් වට්ටමක් හෝ ආධික්‍යයක් හා සඵල පොලී අනුපාතයේ අත්‍යවශ්‍ය කොටසක් වන ගාස්තු හා පිරිවැය සැලකිල්ලට ගනිමින්ය. සඵල පොලී අනුපාත ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය ආදායම් යටතේ ඇතුළත්ය. හානිකරණය තුළින් ඇතිවන පාඩු ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය පිරිවැය යටතේ හඳුනා ගැනේ.

### ඇ) හඳුනාගත් වත්කම් පොත්පත් වලින් ඉවත් කිරීම

හඳුනාගත් මූල්‍ය වත්කමක් (හෝ අදාළ පරිදි මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසක්) පොත්පත් වලින් ඉවත්කිරීම සිදුවනුයේ පහත අවස්ථාවලදීය:

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

i) වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබාගැනීමේ අයිතිය ඉකුත්වීම

ii) වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබාගැනීමේ සිය අයිතිය පැවරීම හෝ ලැබී තිබෙන මුදල් ප්‍රවාහයන් සැලකිය යුතු ප්‍රමාදයකින් තොරව "පරික්‍රමණ" (pass-through) වැඩ පිලිවෙලක් යටතේ තෙවන පාර්ශ්වයකට සම්පූර්ණයෙන්ම ගෙවීමට බැඳියාවක් භාරගෙන තිබීම; සහ පහත දෙකෙන් එකක්:

(අ) සමූහය විසින් වත්කමේ සියලුම අවදානම් හා ප්‍රතිලාභ සාරානුකූලව මාරුකිරීම, හෝ

(ආ) සමූහය විසින් වත්කමේ සියලුම අවදානම් හා ප්‍රතිලාභ සාරානුකූලව. මාරුකර නොමැතිව හෝ එවා සාරානුකූලව රඳවාගෙන නොමැතිව වත්කම් පාලනය මාරුකිරීම

වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබාගැනීමේ සිය අයිතිය පවරා ඇත්නම් හෝ "පරික්‍රමණ" (pass-through) වැඩපිළිවෙලකට එළඹී ඇත්නම්, සහ සමූහය විසින් වත්කමේ සියලුම අවදානම් හා ප්‍රතිලාභ සාරානුකූලව මාරුකර හෝ රඳවා ගෙන නොමැතිනම්, වත්කම හඳුනා ගනු ලබන්නේ ඒ ගැන සමාගමේ තිබෙන අඛණ්ඩ සහභාගීත්වයේ විස්තාරය අනුවය. එවන් අවස්ථාවකදී සමූහය විසින් ආශ්‍රිත බැඳියාවක්ද හඳුනා ගනී. මාරුකරන ලද වත්කම් හා ආශ්‍රිත බැඳියාව මනිනු ලබන්නේ, සමූහය විසින් රඳවාගෙන තිබෙන අයිතිවාසිකම් හා බැඳියාවන් පිළිබිඹු වන ආකාරයටය.

මාරුකරන ලද වත්කම සම්බන්ධයෙන්වූ ඇප සහතිකයක ස්වරූපය ගන්නාවූ අඛණ්ඩ සහභාගීත්වය මනිනු ලබන්නේ වත්කමේ මුල් ධාරණ අගයත් සමූහයට ගෙවීමට නියමිත වියහැකි උපරිම මුදලත් යන දෙකෙන් අඩු අගයටය.

### 2.2.10.1.1 මූල්‍ය වත්කම් හානිකරණය

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිකරණය වී තිබෙන බවට කිසියම් වාස්තවික සාක්ෂියක් තිබේදැයි වාර්තා කරන සෑම දිනකටම සමූහය විසින් තක්සේරු කරනු ලබයි.මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිකරණය වී තිබෙන බවට සලකනු ලබන්නේ, වත්කමේ මූලික හඳුනාගැනීමෙන් පසු හටගත් සිදුවීම් එකක හෝ වැඩි ගණනක ප්‍රතිඵලයක් වශයෙන් (දරා තිබෙන පාඩු සිද්ධියක්) වන අතර, එම පාඩු සිද්ධිය මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වත්කම් සමූහයේ ඇස්තෙම්න්තු කළ අනාගත මුදල් ප්‍රවාහවලට විශ්වාසවන්තව ඇස්තමේන්තු කළ හැකි බලපෑමක් කළවිටය. ණයකරුවා හෝ ණයකරුවන් සමූහයක් සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා, පොලී හෝ ප්‍රාග්ධන ගෙවීම් වලදී පැහැර හැරීම් හෝ සුළු සුළු වැරදි සැලකිය යුතු පරිදි අත්විඳීන බවට වූ ඇඟවීම්, ඔවුන් බුන්වත්භාවය හෝ වෙනත් මූල්‍යමය ප්‍රතිසංවිධානයකට එළඹීමේ සම්භාවිතාවය සහ ඇස්තමේන්තු ගත අනාගත මූල්‍ය ප්‍රවාහවල මැනිය හැකි අඩුවීමක් තිබෙන බව නිරීක්ෂිත දත්ත වලින් පෙන්වීමද, (එනම් හිඟවීම්වල වෙනස් වීම් හෝ ආර්ථික තත්ත්වයන්ගේ වෙනස් වීම් අතපසුවීම් සමග සහ සම්බන්ධතාවයක් ඇතිබව) හානිකරණ සාක්ෂිවලට අයත් විය හැක.

### ක්‍රමක්ෂය කළ පිරිවැය මතවූ මූල්‍ය වත්කම්

ක්‍රමක්ෂය කළ පිරිවැය මත ඉදිරියට ගෙන යන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් තනි වශයෙන් ගත්කල වැදගත් වන මූල්‍ය වත්කම් තනි වශයෙන්ද තනි වශයෙන් ගත්කල වැදගත් නොවන මූල්‍ය වත්කම් සාමූහිකවද හානිකරණය වීමේ වාස්තවික සාක්ෂි තිබේදැයි සමූහය විසින් මුලින්ම තක්සේරු කරනු ලැබේ. තනි වශයෙන් තක්සේරු කරන ලද මූල්‍ය වත්කමක් සම්බන්ධයෙන් වැදගත් වුවද නොවුවද හානිකරණයවීමේ වාස්තවික සාක්ෂි නොතිබෙන බව සමූහය විසින් නිශ්චය කරනු ලබන්නේ නම්, එම වත්කම සමාන ණය අවදානම් ගතිලක්ෂණ සහිත සමූහයකට ඇතුළත් වන අතර, හානිකරණය සඳහා සාමූහිකව තක්සේරුවට ලක්වේ. හානිකරණය ගැන තනි වශයෙන් තක්සේරුවට භාජනය වන වත්කම්වල හානිකරණ අලාභයක් හඳුනා ගෙන තිබේ නම් හෝ හඳුනා ගැනීම දිගටම පවතී නම් ඒවා සාමූහික හානිකරණ තක්සේරුවකට ඇතුළත් නොකෙරේ.

හානිකරණ අලාභයක් සිදුවූ බවට වාස්තවික සාක්ෂි තිබේ නම්, අලාභය ගණනය කරනු ලබන්නේ වත්කමේ ධාරණ මුදල හා ඇස්තෙම්න්තු ගත අනාගත මුදල් ප්‍රවාහයන් වල වත්මන් අගය (තවමත් දරා නොමැති අනාගතයේදී අපේක්ෂිත ණය පාඩු හැර) අතරවූ වෙනස වශයෙනි.ඇස්තමේන්තු ගත අනාගත මුදල් ප්‍රවාහයන්හි වත්මන් අගය මූල්‍ය වත්කමේ මුල් සඵල පොලී අනුපාතය මත වට්ටම් කෙරේ. ණයකට විචල්‍ය පොලී අනුපාතයක් තිබේ නම්, කිසියම් හානිකරණ අලාභයක් මැනීම පිණිස යොදාගනු ලබන්නේ ප්‍රවර්තන සඵල පොලී අනුපාතයයි.

දීමනා ගිණුමක් යොදා ගැනීම නිසා වත්කමේ ධාරණ මුදල් ප්‍රමාණය අඩුවන අතර, ආදායම් ප්‍රකාශනයේ පාඩුවූ මුදල හඳුනා ගැනේ. අඩුවූ ධාරණ මුදලට අදාළවූ පොලී ආදායම උපචිත කිරීම දිගටම කෙරෙන අතර, හානිකරණ අලාභයක් මැනීම සඳහා අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීමට යොදා ගන්නා පොලී අනුපාතය යොදා ගනිමින් උපචිත කෙරේ. පොලී ආදායම මූල්‍ය ආදායමේ කොටසක් වශයෙන් ආදායම් ප්‍රකාශනයේ සටහන් කරනු ලැබේ. අනාගතයේදී ආපසු ලබාගැනීමේ අවස්ථාවක තාත්වික පිරික්සුමක් නොමැති විට හා සියලු සමපාර්ශ්වීයයන් ලබාගෙන ඇත්නම් හෝ සමූහය වෙත මාරුකර ඇත්නම්, ආශ්‍රිත දීමනා ද සහිත ණය මුදල් කපා හරිනු ලැබේ. හානිකරණ අලාභ හඳුනා ගැනීමෙන් පසු, පසුකාලීන වර්ෂයකදී සිද්ධියක් ඇතිවීම නිසා ඇස්තමේන්තුගත හානිකරණ අලාභය වැඩිවේ නම් හෝ අඩුවේ නම්, දීමනා ගිණුමට ගැලපීම් කර පෙර හඳුනා ගත් හානිකරණ අලාභය වැඩි කිරීම හෝ අඩුකිරීම කරනු ලැබේ. අනාගත කපා හැරීමක් පසුව ආපසු ලැබේ නම් ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය පිරිවැයට බැර කෙරේ.

### අලෙවි කිරීමට තිබෙන මූල්‍ය ආයෝජන

අලෙවි කිරීමට තිබෙන මූල්‍ය ආයෝජන සම්බන්ධයෙන් ආයෝජනයක් හෝ ආයෝජන සමූහයක් හානිකරණය වී තිබෙන බවට කිසියම් වාස්තවික සාක්ෂි තිබේදැයි එක් එක්වාර්තා කරන දිනයට සමූහය විසින් තක්සේරු කරනු ලබයි. ස්කන්ධ ආයෝජන, විකිණීම සඳහා පවත්නා මූල්‍ය වත්කම් ලෙස වර්ගකරන විට එම ආයෝජනයේ සාධාරණ අගයේ සැලකිය යුතු හා දීර්ඝ කාලීන අඩුවීමක් ඇති බවට

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

වාස්තවික සාක්ෂි තිබිය යුතු අතර එය එහි පිරිවැයට වඩා අඩු වෙයි. "වැදගත්කම" යන්න අගැයනුයේ ආයෝජනයේ මුල් පිරිවැය පදනම්ව වන අතර, "දීර්ඝ කාලය" ලෙස සැලකිල්ලට ගනුයේ, මුල් පිරිවැයට වඩා අඩු සාධාරණ අගයක් ඇති කාලයයි. හානිකර ණය ගැන සාක්ෂි තිබෙන විට සමුච්චිත අලාභය ගණනය කරනු ලබන්නේ අත්පත් කරගැනීමේ පිරිවැයත් වර්තමාන සාධාරණ අගයත් අතර වෙනසින් ආදායම් ප්‍රකාශනය තුළ කලින් හඳුනා ගන්නා ලද ආයෝජන වල යම්හානිකරණ පාඩු අඩුකිරීමෙනි. මෙය අනෙකුත් විස්තීර්ණ ආදායම් වලින් ඉවත් කර ආදායම් ප්‍රකාශනයට හඳුනා ගැනේ. ස්කන්ධ ආයෝජනවලට අදාළ හානිකරණ පාඩු ආදායම් ප්‍රකාශනය හරහා ප්‍රතිවර්තනය කිරීමක් සිදුනොවේ. හානිකරණය වීමෙන් පසු ඒවායේ සාධාරණ අගය වැඩිවීම් වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ ඍජුව හඳුනා ගැනේ.

### 2.2.10.2 මූල්‍ය වගකීම්

#### අ) මූලික හඳුනා ගැනීම හා මිනුම්කරණය.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 39 යේවිෂය ක්ෂේත්‍රය ඇතුළත මූල්‍ය වගකීම් වර්ග කරනු ලබන්නේ ලාභ හා අලාභ, ණය ලබාගැනීම්, වෙනත් මූල්‍ය වගකීම් හෝ උචිත පරිදි සඵල ඉදිරිරැකුමක, ඉදිරි රැකුම් උපකරණ ලෙසනම් කළ ව්‍යුත්පන්න ලෙසටය. සමූහය විසින් සිය මූල්‍ය වගකීම් වර්ග කිරීම නිශ්චය කරනු ලබන්නේ මූලික හඳුනා ගැනීමේදීය. සියලුම මූල්‍ය වගකීම් මූලික වශයෙන් හඳුනාගනු ලබන්නේ සාධාරණ අගය මත වන අතර, ණය ලබා ගැනීම් හා වෙනත් මූල්‍ය බැඳීම් ඉදිරියට ගෙන යනුයේ ක්‍රමක්ෂය කළ පිරිවැය මතය. මෙයට ඍජු ආරෝපණීය ගනුදෙනු පිරිවැය ඇතුළත්ය. සමූහයේ මූල්‍ය බැඳීම්වලට වෙළඳ හා වෙනත් ගෙවිය යුතු මුදල්, බැංකු අයිරා, ණය ලබාගැනීම් හා වෙනත් මූල්‍ය බැඳීම් අයත්ය.

#### ආ) පසුකාලීන මිනුම්කරණය

මූල්‍ය බැඳීම් මිනුම්කරණය රැඳී තිබෙනුයේ පහත දැක්වෙන වර්ග කිරීම් මතය.

#### ණය ලබාගැනීම්

මූලික හඳුනා ගැනීමෙන් පසු සඵල පොලී අනුපාත ක්‍රමය යොදා ගෙන පොලිය සහිත ණය ලබාගැනීම් පසුකාලීනව මනිනු ලබන්නේ ක්‍රමක්ෂය කළ මිල මතය. ආදායම් ප්‍රකාශනයේ ලාභ හඳුනා ගනු ලබන්නේ සඵල පොලී අනුපාත ක්‍රමය මතවූ ක්‍රමක්ෂය ක්‍රියාවලිය ඔස්සේද බැඳීම් හඳුනා ගන්නා විටය. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ අත්පත් කර ගැනීමේසහ ගාස්තු හෝ පිරිවැය ට අදාළ සඵල පොලී අනුපාත ක්‍රමයේ වැදගත් කොටසක් වන කිසියම් වට්ටම් හෝ අධිමිල සැලකිල්ලට භාජනය කරමිනි. සඵල පොලී අනුපාත ක්‍රමක්ෂය, ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය පිරිවැය යටතේ ඇතුළත්ය.

#### හඳුනා ගත් මූල්‍ය වගකීම් පොත් පත් වලින් ඉවත්කිරීම

අවසාන බැඳීමක හඳුනාගැනීම ඉවත්කරනු ලබන්නේ අදාල බැඳීම යටතේවූ වගකීම ඉටුවූ විට හෝ අවලංගු වූ විට හෝ එහි කල් ඉකුත්වූ විටය. පවත්නා මූල්‍ය බැඳීමක් සාරානුකූලව වෙනස් නියමයන් මත එම ණය දෙන්නාගෙන්ම ප්‍රතිස්ථාපනය වුවහොත් හෝ පවත්නා බැඳීම සාරානුකූලව වෙනස් වුවහොත්, එවැනි හුවමාරුවක් හෝ වෙනස් වීමක් මුල් බැඳීමේ හඳුනා ගැනීම ඉවත්කරනු ලැබීමක් හා නව හඳුනා ගැනීමක් වශයෙන් සලකනු ලබන අතර, ඉදිරියට ගෙනයනු ලබන ඒ ඒ ගණන්වල වෙනස ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ.

### 2.2.10.3 මූල්‍ය උපකරණ හිලව් කිරීම

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කර ශුද්ධ මුදල, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ වාර්තා කරනුයේ, හඳුනාගත් ගණන් හිලව් කිරීමට දැනට බලාත්මක කළ හැකි නීතිමය අයිතියක් තිබෙන විට හා ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම් උපලබ්ධි කොට සමගාමීව බැඳියාවන් පියවීමට අභිප්‍රායක් තිබෙන විට හෝ පමණි.

### 2.2.10.4 මූල්‍ය උපකරණවල සාධාරණ අගයි

වාර්තා කරනු ලබන සෑම දිනකටම සක්‍රිය වෙළඳපලේ වෙළඳාම් වන මූල්‍ය උපකරණවල සාධාරණ අගය නිශ්චය කරනු ලබන්නේ ගනුදෙනු පිරිවැය වෙනුවෙන් කිසිම අඩුකිරීමක් නොකර, ප්‍රකාශිත වෙළඳපල මිල ගණන්වලට හෝ ගනුදෙනුකරුවන්ගේ මිල කථනය පදනම්වය (දිගු කාලීන ඒවා සඳහා ලංසු ඉදිරිපත් කිරීම හා කෙටි කාලීන ඒවා සඳහා මිලක් ඉල්ලා සිටීම). සක්‍රිය වෙළඳපලක ගනුදෙනු නොවන මූල්‍ය උපකරණ සම්බන්ධයෙන් සාධාරණ අගය නිශ්චය කරනු ලබන්නේ උචිත තක්සේරු ශිල්පක්‍රම යොදා ගනිමිනි. එවැනි ශිල්පක්‍රමවලට මෑත කාලීන අතේ දුරින් සිදුවන වෙළඳපල ගනුදෙනු, සාරානුකූලව එයම වන වෙනත් උපකරණයක පවත්නා සාධාරණ අගය සහ වට්ටම් කළ මුදල් ප්‍රවාහ විග්‍රහයක් හෝ වෙනත් තක්සේරු ආකෘති අඩංගු විය හැක.

### 2.2.10.5 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

වත්කමක් හානිකරණයවී තිබෙන බවට කිසියම් ඇඟවීමක් තිබේදැයි, වාර්තා කරන සෑම දිනකටම සමූහය විසින් තක්සේරු කරනු ලබයි. එවැනි කිසියම් ඇඟවීමක් තිබේ නම් හෝ වත්කමක් සම්බන්ධයෙන් වාර්ෂික හානිකරණය පරීක්ෂණයක් පැවැත්වීම අවශ්‍ය වූවිට, සමූහය විසින් වත්කමේ නැවත අයකරගත හැකි මුදල ඇස්තමේන්තු කරනු ලබයි. වත්කමක නැවත අයකරගත හැකි මුදල වනුයේ, වත්කමේ හෝ මුදල් ජනන ඒකකයේ සාධාරණ අගයෙන් අලෙවි කිරීමේ පිරිවැය අඩුකර ලැබෙන අගයත් ප්‍රයෝජ්‍ය අගයත් යන දෙකින් වඩා වැඩි අගයටය. වෙනත් වත්කම් හෝ වත්කම් සමූහ වලින් බොහෝ දුරට ස්වාධීනව එම වත්කම මුදල් ගලා ඒම් ජනනය වන්නේ නම් මිස එය අදාළ වනුයේ තනි වත්කමක් සඳහාය. වත්කමක ධාරණ අගය එහි නැවත අයකරගත හැකි අගය අභිබවා යන්නේ නම්, එම වත්කම හානිකරණය වූවක් ලෙස සලකා එහි නැවත අයකර ගතහැකි අගය දක්වා අඩුකරනු ලැබේ. ප්‍රයෝජ්‍ය අගය තක්සේරු කිරීමේදී, මුදලේ කාලීන අගයේ වත්මන් වෙළඳපල තක්සේරුව සහ වත්කමට සුවිශේෂී අවදානම් පිළිඹිබු වන, බදු ගෙවීමට පෙර වට්ටම් අනුපාතයක් උපයෝගී කරගෙන, ඇස්තමේන්තු කල අනාගත මුදල් ප්‍රවාහයන් ඒවායේ වර්තමාන අගය දක්වා වට්ටම් කරනු ලැබේ.

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

පෙර ප්‍රත්‍යාගණනයකර, වෙනත් විස්තීර්ණ ආදායම් වලට ඇතුළත්ව ඇති ප්‍රත්‍යාගණන අතිරික්තයක් ඇති වත්කම් හැර, අඛණ්ඩ මෙහෙයුම්වල හානිකරණ අලාභ ආදායම් ප්‍රකාශයේ වියදම් වර්ගීකරණ යටතේ හඳුනා ගනී. මෙම අවස්ථාවේදී කිසියම් පූර්ව ප්‍රත්‍යාගණනයක ගණන දක්වා වෙනත් විස්තීර්ණ ආදායම්වලට හානිකරණය හඳුනාගනු ලැබේ.

වත්කම් සම්බන්ධයෙන් පෙර හඳුනා ගනු ලැබූ හානිකරණ අලාභ තවදුරටත් නොතිබෙන බවට හෝ අඩුවී තිබෙන බවට කිසියම් ඇඟවීමක් තිබේදැයි වාර්තා කරන සෑම දිනකම තක්සේරුවක් කරනු ලබයි. එවැනි ඇඟවීමක් තිබේ නම් සමූහය විසින් නැවත අයකර ගත යුතු මුදලේ ඇස්තමේන්තුවක් සකස් කරනු ලබයි. මෙයට පෙර හඳුනා ගෙන තිබූ හානිකරණ පාඩුවක් ප්‍රතිවර්තනය කරනුයේ නැවත අයකරගත හැකි අගය නිශ්චය කිරීමට යොදාගත් ඇස්තමේන්තුවල වෙනසක් තිබුනහොත් පමණි. පෙර වර්ෂවලදී වත්කම සම්බන්ධයෙන් හානිකරණ පාඩුවක් හඳුනා ගෙන නොතිබුනි නම්, ක්ෂය අඩු වත්කමේ ධාරණ අගය එහි ආපසු අයකර ගැනීමේ අගය ඉක්මවා නොයන තෙක් ප්‍රතිවර්තනය සීමාවේ. වත්කම් ප්‍රතිවර්තිත ගණනක් වශයෙන් ඉදිරියට ගෙන ගියහොත් ප්‍රතිවර්තනය ප්‍රත්‍යාගණන වැඩිවීමක් ලෙස සලකනු ලැබේ. ඒ හැර එවැනි ප්‍රතිවර්තන ආදායම් ප්‍රකාශයේ හඳුනා ගනු ලැබේ.

### 2.2.11 ප්‍රතිපාදන

අතීත සිද්ධියක් හේතුකොට ගෙන සමූහයට ප්‍රවර්තන බැඳීමක් තිබෙන විට (නීතිමය හෝ සම්ප්‍රයුක්ත) බැඳියාවන් ඉටුකිරීම පිණිස ආර්ථික ප්‍රතිලාභ සහිත සම්පත් පිටතට ගලායෑමේ සම්භාවිතාවයක් පවතීනම් සහ බැඳියාවට අදාළ මුදල් ගැන විශ්වාසය තැබිය හැකි ඇස්තමේන්තුවක් සකස් කළ හැකිනම් ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ. උදාහරණයක් වශයෙන් රක්ෂණ ගිවිසුමකට අදාළව වැනි, ප්‍රතිපාදනයේ මුළු මුදලම හෝ ඉන් කොටසක් ප්‍රතිපූරණය වීම සමූහය විසින් අපේක්ෂා කරනු ලැබුවහොත් ප්‍රතිපූරණය වෙනමවූ වත්කමක් ලෙස හඳුනාගනු ලැබේ. එසේ කරනුයේ ප්‍රතිපූරණය ලැබීම ඇත්ත වශයෙන්ම නියත නම් පමණි. කිසියම් ප්‍රතිපාදනයකට අදාළ වූ වියදම්, ආදායම් ප්‍රකාශනයට ඉදිරිපත් කරනු ලබන්නේ කිසියම් ප්‍රතිපූරණයකින් තොරවය. මුදලේ කාලීන අගයේ බලපෑම ප්‍රමාණවත් නම්,මුදලේ කාලීන අගයේ බලපෑම සහ උචිත පරිදි බැඳියාවට විශේෂිතවූ අවදානම පිළිබිඹු වන අයුරින් බදු ගෙවීමට පෙර අනුපාතයක් මත අනාගතයේදී අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් වට්ටම් කර ප්‍රතිපාදන නිශ්චය කරනු ලැබේ. වට්ටම් කිරීම උපයෝගී කර ගැනීමේදී කාලයාගේ ඇවෑමෙන් ප්‍රතිපාදනයේ වන වැඩිවීම් මූල්‍ය පිරිවැය වශයෙන් හඳුනා ගනු ලැබේ.

### 2.2.12 විශ්‍රාම ප්‍රතිලාභ බැඳියාවන්

#### අ) අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය

අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්මෙන් විග්‍රහ වනුයේ සාමාන්‍යයෙන් සේවා කාලය හා පාරිශ්‍රමිකය වැනි සාධක එකක් හෝ කීපයක් මුල් කරගත්, විශ්‍රාම යනවිට සේවකයෙකුට ලැබෙන ප්‍රතිලාභීය මුදලකි. අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්මට 1983 අංක 12 දරන පනත යටතේ සලසා තිබෙන පාරිතෝෂිකය ඇතුළත්ය.

පාරිතෝෂිකය සඳහා ප්‍රතිඥාදී ඇති විශ්‍රාම ප්‍රතිලාභ වල වත්මන් අගය සමූහය විසින් මනිනු ලබන අතර, එය ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය (PUC) මත පාදකවූ ආයුගණක තක්සේරු ක්‍රමවේදය භාවිතා කර ගනිමින් අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්මකි. ආයුගණක ලාභ හා අලාභ ඒවා සිදුවන කාලසීමාවට අදාළව ආදායම් ප්‍රකාශනයේ සම්පූර්ණයෙන්ම හඳුනාගනු ලැබේ. පාරිතෝෂික බැඳියාව සඳහා මුදල් බාහිරව ලබා ගනු නොලැබේ. මෙම අයිතමය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ අර්ථ දැක්වූ අනෙකුත් විලම්භිත වගකීම් යටතේ වර්ග කරනු ලැබේ.

#### ආ) අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාම වැටුප් බැඳියාව.

අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්මෙන් විග්‍රහ වනුයේ සාමාන්‍යයෙන් සේවා කාලය හා පාරිශ්‍රමිකය වැනි සාධක එකක් හෝ කීපයක් මුල් කරගත් විශ්‍රාම යනවිට සේවකයෙකුට ලැබෙන විශ්‍රාම ප්‍රතිලාභීය මුදලකි.

අර්ථ දැක්වූ විශ්‍රාම ප්‍රතිලාභ බැඳියාව සම්බන්ධයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වන ලද බැරකම වාර්තාකරණ කාල පරිච්ඡේදය අවසානයේදී අර්ථ දැක්වූ ප්‍රතිලාභ බැඳියාවේ වර්තමානයේ අගයෙන් සැලසුම්කළ වත්කම්වල සාධාරණ අගය අඩු කරයි. මෙහිදී හඳුනා නොගන්නා ලද අතීත සේවක පිරිවැයටද ගැලපුම් කරයි. අර්ථ දැක්වූ ප්‍රතිලාභ බැඳියාව ස්වාධීන ආයුගණකයින් විසින් වාර්ෂිකව ගණනය කරනු ලබන්නේ ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය භාවිතා කර ගනිමිනි. අර්ථ දැක්වූ ප්‍රතිලාභ බැඳියාවේ වත්මන් අගය නිශ්චය කරනු ලබන්නේ, ශ්‍රී ලංකාවේ උසස් තත්වයේ බලවත් සංයුක්ත පිලිනපත් වෙළඳපලක් නොමැති නිසා රජයේ පිලිනපත්වල පොලී අනුපාත යොදා ගනිමින් අනාගතයේදී අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් වට්ටම් කරමිනි. රජයේ පිලිනපත් නාමනය කෙරෙනුයේ ප්‍රතිලාභ ගෙවනු ලබන මුදල් වර්ගයෙන් වන අතර, අදාළ විශ්‍රාම වැටුප්වල නියමයන්ට සමීපව කල්පිරිය යුතුවේ.

සේවා පළපුරුද්ද ගැලපුම් හා ආයුගණක උපකල්පිත වල වෙනස්වීම් තුලින් පැනනගින ආයුගණක ලාභ හා පාඩු ඒවා පැනනගින කාලසීමාව තුළ දී වෙනත් විස්තීර්ණ ආදායම්වල ස්කන්ධයට හර හෝ බැර කරනු ලැබේ.

නියමකළ කාලසීමාවක් තුළ (පැවරීමේ කාලසීමාව) සේවයේ රැඳී සිටින සේවකයින්ට විශ්‍රාම වැටුප් සැලැස්මට කරන වෙනස්වීම් කොන්දේසි ගතනම් මිස, අතීත සේවා පිරිවැය විස්තීර්ණ ආදායම් ප්‍රකාශවල වහාම හඳුනාගනු ලැබේ. මේ අවස්ථාවේදී අතීත සේවා පිරිවැය පැවරීමේ කාලසීමාව මුළුල්ලේ සරල රේඛිය ක්‍රමය මත ක්‍රමක්ෂය කරනු ලැබේ.

#### ඇ) අර්ථ දැක්වූ දායකත්ව සැලසුම් - සේවක අර්ථ සාධක අරමුදල හා සේවා නියුක්ත භාර අරමුදල

අදාල නීති හා රෙගුලාසි වලට අනුකූලව සේවක අර්ථ සාධක අරමුදලේ දායකත්වය හා සේවා නියුක්තියන්ගේ භාර අරමුදෙල් දායකත්වය සේවකයින්ට හිමිය. ලංකා විදුලිබල මණ්ඩල අර්ථ සාධක අරමුදලට සේවකයින්ගේ දළ වැටුප්වලින් 15% ක දායකත්වයක් සපයන ලංකා විදුලිබල මණ්ඩලය හැර, සේවකයින්ගේ දළ වැටුප් වලින් අනුපිලිවෙලින් 12% හා 3% බැගින් සමූහය විසින් සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්ත භාරකාර අරමුදලට දායකවනු ලැබේ.

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

### 2.2.13 ස්වයං රක්ෂණ සංචිතය

සෑම වසරකම වසර අවසානයේදී ලංවිම විසින් ප්‍රත්‍යාගණිත ස්ථාවර වත්කම්වල දළ අගයෙන් 0.1% ක් ස්වයං රක්ෂණ සංචිතයකට මාරුකරනු ලබයි. දේපල හා යන්ත්‍රෝපකරණවල පාඩු හා හානි මෙම රක්ෂණ සංචිතෙයන් අය කරනු ලැබේ. මෙම කාර්යය සඳහා අරමුදල් බැංකුවක ආයෝජනය කර තිබෙන වෙනම ගිණුමකින් සපිරේ.

### 2.2.14 විලම්බිත ආදායම්

#### අ) පාරිභෝගික දායකත්වය - මණ්ඩලය

ලංවිම පාරිභෝගික දායක මුදල් විලම්බිත කොට ආදායම් ප්‍රකාශනයට ක්‍රමක්ෂය කරනු ලබන අතර, අදාළ වත්කම් ක්ෂය කිරීමේ කාලය වනුයේ වසර 35 කට අධික කාලයකි.

#### සීමාසහිත ලංකා විදුලි (පුද්) සමාගම.

නව සේවා සම්බන්ධතා සවිකිරීම පිණිසවූ වත්කම්වල පිරිවැය ඉසිලීම සඳහා පාරිභෝගිකයින් විසින් ගෙවා ඇති දායක මුදල් විලම්බිත බැඳියාවන් ලෙස හඳුනා ගැනේ. නව සේවා සම්බන්ධතා වත්කම් 20 වසරක කාලයක් මුලුල්ලේ ක්ෂය කරනු ලැබේ. අනුරූප පාරිභෝගික දායක මුදල් එවැනි 20 වසරක කාලසීමාවක් මුළුල්ලේ 2008 දෙසැම්බර් මස 31 දින දක්වා ආදායම් ප්‍රකාශයට ක්‍රමක්ෂය කරනු ලැබේ. 2009 ජනවාරි මස 01 දින සිට පාරිභෝගික දායක මුදල් 08 වසරක කාලයක් මුළුල්ලේ ක්‍රමක්ෂය කරනු ලබන අතර, 2008 දෙසැම්බර් මස 31 දිනට පෙර ලැබුණු පාරිභෝගික දායක මුදල් 20 වසරක කාලයක් මුළුල්ලේ ක්‍රමක්ෂය කරනු ලැබේ.

#### ආ) රජයේ ආධාර මුදල්

පිරියත හා යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම පිණිස ලැබී ඇති රජයේ ආධාර විලම්බිත ආදායම් ලෙස සලකනු ලැබේ. සීතාවක කර්මාන්ත උද්‍යානයේ ස්ථාපිත කර තිබෙන ජාල උපපොළ හා සම්ප්‍රේෂණ මාර්ග සඳහා කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයෙන් ලද අගය 21.2 සටහනෙහි නියෝජනය කරනු ලබන අතර, එය ආදායම් ප්‍රවේශය මතපදනම්ව 35 වසරක කාලයක් මුළුල්ලේ ක්‍රමක්ෂය කරනු ලැබීමට නියමිතය.

### 2.2.15 ආදායම් හඳුනා ගැනීම.

සමූහයට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ සම්භාවිතාවයේ ප්‍රමාණය මත හා ආදායම් සහ දරා තිබෙන ආශ්‍රිත වියදම් හෝ දැරීමට නියමිත වියදම් විශ්වාසනීය පරිදි මැනිය හැකි තාක් ආදායම් හඳුනා ගනු ලැබේ. ලැබී තිබෙන හෝ ලැබීමට නියමිත, ශුද්ධවෙළඳ වට්ටම් හා විකිණුම් බදු රහිතවූ, ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගය මත ආදායම මැනීම කරනු ලැබේ. ලිත් වර්ෂය අවසානයේදී සීමාසහිත ලක්දනව් හා සීමාසහිත හෙලදනව් සමාගම්වල ආදායම් අවම සහතික කළ බලශක්ති ප්‍රමාණය (Minimum Guaranteed Energy Amount) සඳහා ධාරිතා ගාස්තු වෙනුවෙන් ගලපනු ලැබේ. ආදායම් හඳුනා ගැනීමේ කාර්යයන් සඳහා පහත දැක්වෙන විශේෂිත උපමානයන් භාවිතා කරනු ලැබේ.

#### අ) සේවා පිරිනැමීම

අයිතිය සමග සාමාන්‍යයෙන් සම්බන්ධිත මට්ටම දක්වා අඛණ්ඩ කළමනාකරණ සහභාගීත්වය හෝ විකුණන ලද භාණ්ඩ මත සඵල පාලනයක් සමාගම විසින් රඳවා නොගෙන තිබියදී භාණ්ඩවල අයිතියට අදාල සැලකිය යුතු අවදානම් හා ප්‍රතිලාභ ගැනුම්කරු වෙත සම්ප්‍රේෂණයවූ පසු භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම් හඳුනා ගනු ලැබේ.

#### ආ) භාණ්ඩ විකිණීම

අයිතිය සමග සාමාන්‍යයෙන් සම්බන්ධිත මට්ටම දක්වා අඛණ්ඩ කළමනාකරණ සහභාගීත්වයක් හෝ විකුණන ලද භාණ්ඩ මත සඵල පාලනයක් සමාගම විසින් රඳවා නොගෙන තිබියදී භාණ්ඩවල අයිතියට අදාළ සැලකිය යුතු අවදානම් හා ප්‍රතිලාභ ගැනුම්කරු වෙත සම්ප්‍රේෂණය වූ පසු භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම් හඳුනා ගනු ලැබේ.

#### ඇ) පොලිය

එක්රැස් කිරීමේ හැකියාව සැක සහිත නැත්නම්, පොලිය උපචිත වන විට පොලී ආදායම් හඳුනා ගනු ලැබේ.

#### ඈ) ලාභාංශ

ගෙවීම් ලබාගැනීමට කොටස්කරුවන්ට තිබෙන අයිතිය ස්ථාපිත වූ පසු ලාභාංශ ආදායම් හඳුනා ගනු ලැබේ.

#### ඉ) වෙනත්

වෙනත් ආදායම් හඳුනා ගනු ලබන්නේ උපචිත පදනමක් මතය. දේපල, පිරියත උපකරණ හා ආයෝජන ඇතුලු ජංගම නොවන වෙනත් වත්කම් බැහැර කිරීම් වලට අදාළ ආදායම් ස්වභාවයක ශුද්ධ ලාභ හා පාඩු ආදායම් ප්‍රකාශනයේ ගිණුම් බැර කරනුයේ ධාරණ අගය හා අදාළ විකුණුම් වියදම් අපහරණ මුදලින් අඩු කළ පසුවය. ප්‍රත්‍යාගණනය කරන ලද දේපල පිරියත හා උපකරණ බැහැර කිරීමේදී, එකී වත්කමට අදාළව ප්‍රත්‍යාගණන සංචිතයේ ශේෂව තිබෙන ගණන ඍජුවම සමුච්චිත ලාභයට මාරුකරනු ලැබේ. ප්‍රධාන ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් වලට අනුශාංගික ක්‍රියාකාරකම් තුළින් පැන නගින ලාභ හා අලාභය සහ එයට සමාන ගනුදෙනු සමූහයකින් පැන නගින වැදගත් නොවන ඒවා එකතුකර, වාර්තා කර ශුද්ධ පදනමක් මත ඉදිරිපත් කරනු ලැබේ.

### 2.3 වැදගත් ගිණුම්කරණ උපකල්පන, තීරණ හා ඇස්තෙමේන්තු.

සමූහයේ ගිණුම් ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේදී මූල්‍ය ප්‍රකාශන වලට ප්‍රමාණාත්මක බලපෑමක් ඇති කරනු ලබන වටිනාකම් ගැලපීම් කිරීම සඳහා ඇස්තමේන්තු වලට අමතරව කළමනාකරණ විනිශ්චයන් ද අවශ්‍ය වේ. තවදුරටත් අනාගතය සම්බන්ධ ප්‍රධාන උපකල්පන හා අවිනිශ්චිතතාවයන් පිලිබඳ ඇස්තමේන්තු කිරීමේ ප්‍රධාන ප්‍රභවයන් ශේෂ පත්‍ර දිනයේදී කළමනාකරණය සලකා බැලේ. එහිදී වත්කම් හා බැරකම් වල ධාරණ අගයන්ට ප්‍රමාණාත්මක ගැලපීම් යොදාගන්නා නිසා, සැලකිය යුතු අවදානම් ඊළඟ වර්ෂය තුළ ඇතිවිය හැකි අතර, ඒවා පසුව සාකච්ඡා කෙරේ. වත්කම් හා බැරකම් වලට අදාළ ධාරණ අගයන් මූල්‍ය ප්‍රකාශන වල අදාළ සටහන් වල දැක්වේ. එම නිසා, ප්‍රධාන අයිතම පහත සාකච්ඡා කෙරේ.

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

### කල්බදු

වත්කම් හෝ වත්කම් වල භාවිතය හෝ වත්කම් භාවිතයට ඇති අයිතිය පැවරීම මත කල්බද්ද කුමක්ද යන්න කල්බදු ගිවිසුම ආරම්භයේදී තීරණය කෙරේ. ඒ අනුව වත්කම් වල අයිතියේ සියලුම අවදානම් හා ප්‍රතිලාභ සියල්ලම සාරානුකූලව සමූහය විසින් මාරු නොකරන තාප බලාගාර යන්ත්‍රෝපකරණ වර්ග කරනු ලබන්නේ මෙහෙයුම් කල්බදු වශයෙනි. කල්බද්දක් මූල්‍ය කල්බද්දක්ද නැතහොත් මෙහෙයුම් කල්බද්දක්ද යන්න වර්ග කිරීමට නියමු වන තනි හෝ සංයුක්ත නිර්ණායක නිශ්චය කිරීමේදී සමූහය විසින් ප්‍රමාණාත්මක විනිශ්චයන් ගන්නා ලදී.

### මූල්‍ය උපකරණවල සාධාරණ අගය

මූල්‍ය තත්ත්වය පිලිබඳ ප්‍රකාශනවල වාර්තා වී තිබෙන මූල්‍ය වත්කම්වල හා මූල්‍ය බැරකම්වල සාධාරණ අගය සක්‍රිය වෙළඳපල තුළින් ලබාගත නොහැකිවූ විට, වට්ටම්කළ මුදල් ප්‍රවාහ ක්‍රමයද ඇතුලු තක්සේරු ශිල්පක්‍රම භාවිතා කරමින් ඒවායේ සාධාරණ අගය නිශ්චය කරනු ලැබේ. නිරීක්ෂණය කළ හැකි වෙළඳපල වලින් හැකි අවස්ථාවලදී මෙම ක්‍රම සඳහා ආදාන ලබාගන්නා අතර, මෙසේ කළ නොහැකි අවස්ථාවලදී සාධාරණ අගය ස්ථාපනය කිරීමෙහිලා විචාර බුද්ධි මට්ටමක් අවශ්‍ය වේ. විනිශ්චයන් සිදුකිරීමේදී ද්‍රවශීලතාවය, අවදානම හා චංචල භාවය වැනි ආදාන ගැන සලකා බැලේ. මෙම සාධකවලට අදාල උපකල්පන ගැන වෙනස්වීම් මූල්‍ය උපකරණවල වාර්තාකළ සාධාරණ අගයන්ට බලපෑමක් කළ හැක.

### මූල්‍ය නොවන වත්කම්වලට හානිවීමෙන්වන පාඩු සමාලෝචනය

වත්කම් හානිකරණය වී ඇත්දැයි සමූහය විසින් නිශ්චය කරනු ලබන්නේ සිදුවූ හානි පිළිබඳව සමාලෝචනයක් පැවැත්වීමෙනි. මේ සඳහා මුදල් ජනනය කරන ඒකකවල "ප්‍රයෝජ්‍ය අගය" ඇස්තමේන්තු කිරීම අවශ්‍ය වේ. "ප්‍රයෝජ්‍ය අගය" ඇස්තමේන්තු කිරීම පිණිස මුදල් ජනනය කරන ඒකක වල අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහ ගැන ඇස්තමේන්තු කිරීමද, අදාල මුදල් ප්‍රවාහවල වත්මන් අගය ගණනය කිරීම පිණිස යෝග්‍ය වට්ටම් අනුපාතයක් තෝරා ගැනීමද පාලන අධිකාරිය විසින් කරනු ලැබීම අවශ්‍ය වේ. මෙම තක්සේරුව හේතු කොට ගෙන, අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහ සහ වට්ටම් අනුපාත පිලිබඳව සමූහය විසින් ඇස්තමේන්තු කරනු ලැබීම අවශ්‍ය බැවින් ඒවා අවිනිශ්චිත ස්වභාවයෙන් යුක්තය.

### වෙළඳ හා වෙනත් අයවිය යුතු මුදල් හානිකරණයෙන් සිදුවන පාඩු

වාස්තවික සාක්ෂි ඇති පාඩු උපදවන සිද්ධීන් නිසා වෙන්කිරීමක් සිදු කිරීම අවශ්‍යදැයි තීරණය කිරීමට, සමාන අවදානම් සහිත වත්කම් කාණ්ඩය තුළ තනි තනිව අගය කර ඇති සහ හානිකරණය නොවන බවට සොයා ගෙන ඇති වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ සාමුහිකව අගය කරන ලදී. නමුත් මෙහි බලපෑමක් තවමත් දක්නට නොමැත. ලැබිය යුතු මුදල් පිලිබඳ වගකීම් සමූහයේ (portfolio) දත්ත වල (හිඟ මුදල්වල මට්ටම්, ණය මුදල් උපයෝගී කරගැනීම් යනාදිය) සහ අවදානම් ඒකරාශී වීම සහ ආර්ථික දත්ත වල (විරැකියා මට්ටම්, දේපල මිල දර්ශක, රට තුළ අවදානම සහ විවිධ තනි කණ්ඩායම් වල ක්‍රියාකාරීත්වය යනාදිය ඇතුලු) බලපෑම් ගැන තිරණ සාමූහික තක්සේරුව සැලකිල්ලට ගනු ලැබේ.

### අයබදු

ආදායම් බදු හා වැට් ඇතුලු වෙනත් බදු ගෙවනු ලැබීමට සමූහය යටත්ය. බදු පැනවීමේ කාර්යය සඳහා මූල්‍ය ප්‍රකාශනවල සහ බදුගෙවිය යුතු ලාභ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මූල්‍ය වර්තාකරණ ප්‍රමිති වලට අනුගත වීම පිණිස පිලිපැදිය යුතු බදු උපදෙස් මාලාව ලැබෙන තෙක් ප්‍රවර්තන, විලම්බිත හා වෙනත් බදු වෙනුවෙන් සම්පූර්ණ ප්‍රතිපාදන නිශ්චය කිරීම සඳහා සැලකිය යුතු විචාර බුද්ධියක් අවශ්‍ය විය. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලැබූ අවස්ථාවේදී බදු නීති උපයෝගී කරගැනීම අර්ථනිරූපනය කිරීම සම්බන්ධයෙන් අවිනිශ්චිතතා තිබුණි. ප්‍රවර්තන, විලම්බිත හා වෙනත් බදු වෙනුවෙන් අතිරේක බදු ගෙවීමට නියමිතද යන්න පදනම්ව සමූහය විසින් වත්කම් හා බැරකම් හඳුනා ගන්නා ලදී. මේ සම්බන්ධයෙන් අවසාන බදු ප්‍රතිඵලය මුලදී වාර්තා කරන ලද ගණන් වලට වෙනස්වන විට, එවැනි වෙනස්වීම් හේතු කොට ගෙන තීරණය ගන්නා ලද කාලසීමාවේ ආදායම්, විලම්බිත හා වෙනත් බදුවලට බලපෑමක් ඇතිවේ.

### දේපල, පිරියත හා උපකරණවල ඵලදායි ආයුකාලය

වාර්තා කරන සෑම දිනයකදීම සමූහය විසින් වත්කම් වල අවශේෂ අගයයන්, ඵලදායි ආයුකාල හා ක්ෂය කිරීමේ ක්‍රම සමාලෝචනය කරනු ලබයි. මෙම අගයන්, අනුපාතයන් හා ක්‍රම නිර්ණය කිරීමේදී පාලන අධිකාරිය විසින් ඔවුන්ගේ විනිශ්චයන් යොදාගනු ලැබේ.

### නිර්ණය කළ ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂිකය

අර්ථ විග්‍රහකළ ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික පිරිවැය නිශ්චය කරනු ලබන්නේ ආයුගණක තක්සේරු ශිල්පක්‍රම භාවිතා කරමිනි. ආයුගණක තක්සේරු ශිල්පක්‍රම වලට වට්ටම් අනුපාත, වත්කම් වල අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාත සහ අනාගත වැටුප් වැඩිවීම් ගැන උපකල්පන වලට එළඹීම ඇතුළත්ය. මෙම සැලසුම්වල දීර්ඝ කාලීන ස්වභාවය නිසා එවැනි ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිතතාවයන්ට යටත්ය.

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

2014 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා (සියළුම මූල්‍ය ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින්)

| | | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|
| | | 2014 | 2013 | 2014 | 2013 |
| 3. | ආදායම | | | | |
| | විකුණුම් | 219,054,966 | 198,767,716 | 202,644,828 | 194,146,823 |
| | | 219,054,966 | 198,767,716 | 202,644,828 | 194,146,823 |

| | | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|
| | | 2014 | 2013 | 2014 | 2013 |
| 4. | වෙනත් මෙහෙයුම් ආදායම් /ලාභය | | | | |
| | විදේශීය ආයෝජනවලින් ආදායම | 28,496 | 308,740 | - | - |
| | විදුලිබල පරිභෝජනය මත දඩ මුදල් | 15,218 | 27,178 | 15,218 | 27,177 |
| | පාරිභෝගික අයකිරීම් | 283,143 | 259,520 | - | - |
| | දේපල පිරියත සහ උපකරණ අපහරණ ලාභ / (අලාභ) | 212,364 | 193,467 | 155,668 | 156,893 |
| | පාරිභෝගික දායකත්වය මත විලම්බිත ආදායම | 2,793,294 | 2,532,070 | 2,506,972 | 2,265,265 |
| | රජයේ ප්‍රදාන මත විලම්බිත ආදායම | 12,391 | 12,391 | 12,391 | 12,391 |
| | විවිධ ආදායම් | 2,134,052 | 1,782,196 | 996,099 | 883,882 |
| | රජයේ දෙපාර්තමේන්තු ආදායම් | 311,601 | 372,619 | 311,475 | 372,619 |
| | ඇවර හානි ගිණුම | 62,988 | 117,725 | 62,988 | 117,725 |
| | අළු විකිණීම | 128,924 | 24,263 | 128,924 | 24,263 |
| | ටෙන්ඩර් ගාස්තු / ආපසු නොගෙවන තැන්පතු / ඇප ගිණුම අහිමි කිරීම | 11,167 | 12,143 | 11,167 | 12,143 |
| | පිරිවැය ආපසු ලබා ගැනීමේ කාර්යයන් මත ආදායම | 522,298 | 499,204 | 522,298 | 499,204 |
| | සේවා රැහැන් අයදුම් ගාස්තු ගිණුම | 68,112 | 70,258 | 68,112 | 70,158 |
| | විදුලි බිල් මත අධිභාර | 733,126 | 664,811 | 733,126 | 664,812 |
| | කේවල් කර මිලදී ගැනීම් මත ලාභය | 76,824 | - | - | - |
| | අත්පත් කරගැනීම මත වූ සාධාරණ අගයේ ලාභය | 389,462 | - | - | - |
| | | 7,783,460 | 6,876,585 | 5,524,438 | 5,106,532 |

| | | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|
| | | 2014 | 2013 | 2014 | 2013 |
| 5.1 | මූල්‍ය ආදායම | | | | |
| | වෙනත් තැන්පතු මත පොලිය | 782,592 | 865,181 | - | - |
| | භාණ්ඩාගාරය මගින් ලබාගත් පරිපාලන ණය මත පොලිය | 39,900 | 61,225 | - | - |
| | ණය ගැනුම් මත පොලිය | 342,830 | 438,276 | - | - |
| | රාජ්‍ය සුරැකුම්පත් මත පොලිය | 96,150 | 116,136 | - | - |
| | ලාභාංශ ආදායම | 645,036 | 575,828 | 346,400 | 1,353,948 |
| | ආයෝජනවලින් පොලී ආදායම | 58,991 | 63,661 | 3,975 | 62,859 |
| | කාර්යමණ්ඩල ණයවලින් පොලිය | 256,100 | 220,865 | 221,665 | 204,608 |
| | සමෘද්ධි ණය පොලී ගිණුම | 78,565 | 55,543 | 78,565 | 55,543 |
| | | 2,300,164 | 2,396,715 | 650,605 | 1,676,958 |

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

2014 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා (සියළුම මූල්‍ය ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින්)

| | | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|
| | | 2014 | 2013 | 2014 | 2013 |
| 5.2 | මූල්‍ය පිරිවැය | | | | |
| | අයිරාවන් මත පොලී වියදම | 111,272 | 228,845 | 35,193 | 228,323 |
| | ණය ගැනීම් මත පොලී වියදම | 6,548,775 | 8,429,111 | 5,906,131 | 8,202,153 |
| | ව්‍යාපෘති ණය මත පොලී වියදම | - | 25,176 | - | 25,176 |
| | කල්බදු පොලී | 70,888 | 50,051 | 70,741 | 49,788 |
| | බැංකු ගාස්තු | 41 | 82 | - | - |
| | IPP ගෙවීම් සඳහා ප්‍රමාද ගාස්තු මත පොළිය | 966,958 | 2,054,949 | 966,958 | 2,054,949 |
| | CPC ගෙවීම් සඳහා ප්‍රමාද ගාස්තු මත පොළිය | 321,431 | 41,017 | 321,431 | 41,017 |
| | | 8,019,365 | 10,829,231 | 7,300,454 | 10,601,406 |

| | | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|
| | | 2014 | 2013 | 2014 | 2013 |
| 6. | බද්දට පෙර ලාභය / (අලාභය) | | | | |
| | ගාස්තු අයකිරීම / (බැර කිරීම) ට පසු ප්‍රකාශිත | | | | |
| | විගණකගේ පාරිශ්‍රමිකය - ප්‍රවර්තන වසරේ ගාස්තු | 5,726 | 11,687 | 3,414 | 6,588 |
| | අධ්‍යක්ෂකගේ පාරිශ්‍රමික | 4,754 | 6,833 | 4,550 | 5,046 |
| | ක්ෂය | 21,701,695 | 21,769,587 | 21,361,151 | 20,491,076 |
| | කාර්යමණ්ඩල පිරිවැයට | | | | |
| | - නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය - පාරිතෝෂික | 1,449,463 | 799,574 | 1,424,961 | 713,422 |
| | - නිශ්චිත දායක සැලසුම් පිරිවැය - සේ.අ.අ., සේ.නි.භා.අ. | 1,520,247 | 1,550,074 | 1,493,766 | 1,368,196 |
| | - වෙනත් කාර්යමණ්ඩල පිරිවැය | 16,139,295 | 13,982,196 | 15,865,006 | 13,789,432 |
| | දේපල, පිරියත සහ උපකරණ අපහරණය මත ලාභය / (අලාභය) | 163,404 | 123,210 | 106,708 | 107,396 |
| | පරිගණක මෘදුකාංග ක්‍රමක්ෂය වීම | 9,227 | 2,769 | - | - |
| | මහජන සබඳතා සහ දැන්වීම් ප්‍රචාරය | 223,271 | 168,673 | 213,079 | 150,780 |
| | පාරිභෝගික දායකත්වය | (2,506,972) | (2,532,070) | (2,506,972) | (2,265,266) |
| | රජයේ ප්‍රදාන | (12,391) | (12,391) | (12,391) | (12,391) |
| | වෙනත් ණයගැතියන් සඳහා වෙන්කිරීම් | 8,887 | 39,218 | 8,887 | 39,218 |

| | | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|
| | | 2014 | 2013 | 2014 | 2013 |
| 7. | ආදායම් බදු වියදම් | | | | |
| 7.1 | වර්තමාන ආදායම් බදු | | | | |
| | වර්ෂයේ සාමාන්‍ය කටයුතු සඳහා ප්‍රවර්තන බදු වියදම් | 1,195,154 | 1,045,826 | - | - |
| | ඉකුත් වසර සඳහා ප්‍රවර්තන බදුවල ඌන / (අධි) ප්‍රතිපාදන | 122,836 | (455,417) | (27,469) | - |
| | | 1,317,990 | 590,409 | (27,469) | - |
| 7.2 | විලම්බිත ආදායම් බදු | | | | |
| | විලම්බිත බදු අයකිරීම් / (ප්‍රතිවර්තනය) (සටහන් 25) | (895,984) | 1,207,593 | (995,517) | 1,325,265 |
| | ආදායම් ප්‍රකාශයෙහි වාර්තා කළ ආදායම් බදු වියදම් | (895,984) | 1,207,593 | (995,517) | 1,325,265 |

2011 අප්‍රේල් 01 සිට අවුරුදු 05ක් ලංකා විදුලිබල මණ්ඩලය ආදායම් බද්දෙන් නිදහස් කර ඇත.

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

2014 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා (සියළුම මූල්‍ය ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින්)

8 දේපල, පිරියත සහ උපකරණ

8.1 සමූහය

8.1.1 සින්නක්කර වත්කම්

දළ ධාරණ අගය

ඇගයීම හෝ පිරිවැය මත

| | 2014.01.01ට ශේෂය ප්‍රතිප්‍රකාශිත | එකතු කිරීම් / මාරු කිරීම් / පවරා ගැනීම් | ප්‍රත්‍යාගණන වැඩිවීම / (අඩුවීම) | විකිණීමට ඇති වත්කම් මාරුකිරීම | අපහරණය / මාරු කිරීම් | ගැලපීම් | 2014.12.31ට ශේෂය |
|---|---|---|---|---|---|---|---|
| සින්නක්කර ඉඩම් | 10,588,792 | 175,134 | 279,688 | - | (16,663) | 6,257 | 11,033,208 |
| කල්බදු ඉඩම් | 2,883 | - | - | - | (2,883) | - | - |
| ගොඩනැගිලි | 14,735,747 | 1,074,607 | 28,646 | - | (220,195) | (35,442) | 15,583,363 |
| සිවිල් වැඩ | 190,094,307 | 2,674,251 | - | - | - | - | 192,768,558 |
| යන්ත්‍ර හා පිරියත | 4,551,792 | 192,228 | - | - | (801,742) | - | 3,942,278 |
| බල උත්පාදන පිරියත | 192,485,008 | 1,487,100 | - | - | (1,738) | - | 193,970,370 |
| සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ රැහැන් | 428,084,982 | 28,561,749 | - | - | (5,331,357) | (292,680) | 451,022,694 |
| මෝටර් වාහන | 5,998,750 | 1,264,461 | - | (4,685) | (249,884) | (28,642) | 6,980,000 |
| අනෙකුත් සැපයුම් යටිතල | 19,546,883 | 612,169 | - | - | (60,262) | - | 20,098,790 |
| කාර්යාල සහ අනෙකුත් උපකරණ | 2,507,693 | 300,092 | - | - | (195,219) | (5,736) | 2,606,830 |
| ලී බඩු සහ සවිකිරීම් | 208,389 | 15,003 | - | - | (2,184) | - | 221,208 |
| යන්ත්‍ර සහ මෙවලම් | 6,179,450 | 350,233 | - | - | (7,284) | (2,648) | 6,519,751 |
| බහාලුම් අංගන | 6,744 | - | - | - | - | - | 6,744 |
| | 874,991,420 | 36,707,027 | 308,334 | (4,685) | (6,889,411) | (358,891) | 904,753,794 |

8.1.2 ව්‍යාපෘති වත්කම්

දළ ධාරණ අගය

| ඇගයීම හෝ පිරිවැය මත | 2014.01.01 ට ශේෂය ප්‍රතිප්‍රකාශිත | එකතු කිරීම් / මාරු කිරීම් / පවරා ගැනීම් | ප්‍රත්‍යාගණන වැඩිවීම / (අඩුවීම) | විකිණීමට ඇති වත්කම් මාරුකිරීම | අපහරණය / මාරු කිරීම් | ගැලපීම් | 2014.12.31 ට ශේෂය |
|---|---|---|---|---|---|---|---|
| සින්නක්කර ඉඩම් | 117,230 | 677 | - | - | - | (5,550) | 112,357 |
| ගොඩනැගිලි | - | 313,024 | - | - | (313,024) | - | - |
| සිවිල් වැඩ | - | - | - | - | - | - | - |
| යන්ත්‍ර සහ පිරියත | - | - | - | - | - | - | - |
| බල උත්පාදන පිරියත | - | 4,252,086 | - | - | (4,252,086) | - | - |
| සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ රැහැන් | - | 4,714,241 | - | - | (4,714,241) | - | - |
| මෝටර් රථ | 577,770 | 459,158 | - | - | (234,117) | - | 802,811 |
| කාර්යාල සහ අනෙකුත් උපකරණ | 50,886 | 3,846 | - | - | (1,093) | (340) | 53,299 |
| ලී බඩු සහ සවිකිරීම් | 19,182 | 562 | - | - | (29) | - | 19,715 |
| යන්ත්‍ර සහ මෙවලම් | 5,613 | 7,303 | - | - | - | (42) | 12,874 |
| | 770,681 | 9,750,897 | - | - | (9,514,590) | (5,932) | 1,001,056 |

8.1.3 කල්බදු වත්කම්

| ඇගයීම හෝ පිරිවැය මත | 2014.01.01 දිනට ශේෂය ප්‍රතිප්‍රකාශිත | එකතු කිරීම් / මාරු කිරීම් / පවරා ගැනීම් | ප්‍රත්‍යාගණන වැඩිවීම / (අඩුවීම) | විකිණීමට ඇති වත්කම් මාරුකිරීම | අපහරණය / මාරු කිරීම් | ගැලපීම් | 2014.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|---|
| මෝටර් රථ | 361,936 | 153,735 | - | - | (41,663) | 1,670 | 475,678 |
| | 361,936 | 153,735 | - | - | (41,663) | 1,670 | 475,678 |
| ක්ෂය කළ හැකි වත්කම්වල මුළු අගය | 876,124,037 | 46,611,659 | 308,334 | (4,685) | (16,445,664) | (363,153) | 906,230,528 |

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

2014 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා (සියළුම මූල්‍ය ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින්)

### 8.1.4 කරනු ලබන ඉදිකිරීම්

| | 2014.01.01 දිනට ශේෂය ප්‍රතිප්‍රකාශිත | වර්ෂය තුළ වැඩිවීම | ප්‍රත්‍යාග ණනයේ දී අගය වැඩිවීම / (අඩු වීම) | දේ.පි. උ ට මාරු කිරීම | ප්‍රතිවර්ගීකරණය / මාරු කළ | 2014.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ | 167,063,486 | 63,498,081 | - | (30,325,376) | (4,905,451) | 195,330,740 |
| මුළු දළ ධාරක වටිනාකම | 167,063,486 | 63,498,081 | - | (30,325,376) | (4,905,451) | 195,330,740 |

### 8.1.5 ක්ෂය වීම

| සින්නක්කර වත්කම් | 2014.01.01ට ශේෂය ප්‍රතිප්‍රකාශිත | වර්ෂය සඳහා අයකිරීම | ප්‍රත්‍යාග ණනයේ දී අගය වැඩිවීම / (අඩු වීම) | විකිණීමට ඇති වත්කම් මාරුකිරීම | අපහරණය / මාරු කිරීම් | ගැලපීම් | 2014.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|---|
| සින්නක්කර ඉඩම් | - | - | - | - | - | | - |
| කල්බදු ඉඩම් | 732 | 37 | - | - | (769) | - | - |
| ගොඩනැගිලි | 4,561,007 | 465,269 | (43,806) | - | (93,071) | (75) | 4,889,324 |
| සිවිල් වැඩ | 57,524,095 | 2,229,274 | - | - | - | - | 59,753,369 |
| යන්ත්‍ර සහ පිරියත | 1,774,065 | 336,188 | - | - | (800,047) | - | 1,310,206 |
| බල උත්පාදන පිරියත' | 110,376,961 | 5,665,611 | - | - | - | - | 116,042,572 |
| සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ රැහැන් | 180,780,097 | 13,491,202 | - | - | (2,448,128) | (1,401) | 191,821,770 |
| මෝටර් වාහන | 2,617,691 | 969,480 | - | (2,139) | (109,139) | (20,824) | 3,455,069 |
| අනෙකුත් සැපයුම් යටිතල | 11,965,370 | 715,288 | - | - | (34,513) | - | 12,646,145 |
| කාර්යාල සහ අනෙකුත් උපකරණ | 1,620,756 | 264,110 | - | - | (75,551) | (5,156) | 1,804,159 |
| ලී බඩු සහ සවිකිරීම් | 114,142 | 38,267 | - | - | (1,486) | 48 | 150,971 |
| යන්ත්‍ර සහ මෙවලම් | 2,037,259 | 862,248 | - | - | (2,366) | 1 | 2,897,142 |
| බහාලුම් අංගන | 5,058 | 1,686 | - | - | - | - | 6,744 |
| | 373,377,233 | 25,038,660 | (43,806) | (2,139) | (3,565,070) | (27,407) | 394,777,471 |

### 8.1.6 ව්‍යාපෘති වත්කම් ක්ෂය වීම

| ව්‍යාපෘති වත්කම් | 2014.01.01ට ශේෂය ප්‍රතිප්‍රකාශිත | කෙරීගෙන යන ගිණුමට අය කිරීම / මාරු කිරීම | ප්‍රත්‍යාග ණනයේ දී අගය වැඩිවීම / (අඩුවීම) | විකිණීමට ඇති වත්කම් මාරුකිරීම | අපහරණ / මාරු කිරීම් | ගැලපීම් | 2014.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|---|
| සින්නක්කර ඉඩම් | - | - | - | - | - | - | - |
| ගොඩනැගිලි | - | - | - | - | - | - | - |
| සිවිල් වැඩ | - | - | - | - | - | - | - |
| යන්ත්‍ර සහ පිරියත | - | - | - | - | - | - | - |
| බල උත්පාදන පිරියත | - | - | - | - | - | - | - |
| සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ රැහැන් | - | - | - | - | - | - | - |
| මෝටර් රථ | 303,283 | 157,156 | - | - | (54,771) | - | 405,668 |
| කාර්යාල සහ වෙනත් උපකරණ | 39,553 | 4,365 | - | - | (364) | 100 | 43,654 |
| ලී බඩු සවිකිරීම් | 16,261 | 924 | - | - | - | - | 17,185 |
| යන්ත්‍ර සහ මෙවලම් | 664 | 1,695 | - | - | - | (1) | 2,358 |
| | 359,761 | 164,140 | - | - | (55,135) | 99 | 468,865 |

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

**2014 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා** **(සියළුම මූල්‍ය ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින්)**

**8.1.7 ක්ෂය වීම**

| කල්බඳු වත්කම් | 2014.01.01ට ශේෂය ප්‍රතිප්‍රකාශිත | එකතු කිරීම් / මාරු කිරීම් / අත්පත්කර ගැනීම් | ප්‍රත්‍යාග ණනයේ දී අගය වැඩි වීම / (අඩු වීම) | විකිණීමට ඇති වත්කම් මාරුකිරීම | අපහරණ / මාරු කිරීම් | ගැලපීම් | 2014.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|---|
| මෝටර් රථ | 96,350 | 75,145 | - | - | (4,494) | 22,523 | 189,524 |
| | 96,350 | 75,145 | - | - | (4,494) | 22,523 | 189,524 |
| මුළු ක්ෂය | 373,833,344 | 25,277,944 | (43,806) | (2,139) | (3,624,699) | (4,785) | 395,435,859 |

**8.1.8 ශුද්ධ පොත් අගය**

| | 2014 | 2013 |
|---|---|---|
| ඇගයීම හෝ පිරිවැය මත | 510,794,669 | 502,290,693 |
| කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ | 195,330,740 | 167,063,486 |
| දේපල, පිරියත සහ උපකරණවල මුළු ධාරණ අගය | 706,125,409 | 669,354,179 |

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

2014 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා (සියළුම මූල්‍ය ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින්)

8 දේපල, පිරියත සහ උපකරණ

8.2 මණ්ඩලය

8.2.1 සින්නක්කර වත්කම්

දළ ධාරණ අගය

| ඇගයීම හෝ පිරිවැය මත | 2014.01.01 ට ශේෂය ප්‍රතිප්‍රකාශිත | එකතු කිරීම් / මාරු කිරීම් / අත්පත්කර ගැනීම් | විකිණීමට ඇති වත්කම් මාරුකිරීම | අපහරණය / මාරු කිරීම් | ගැලපීම් | 2014.12.31 ට ශේෂය |
|---|---|---|---|---|---|---|
| සින්නක්කර ඉඩම් | 9,169,771 | 85,709 | - | (16,663) | 6,257 | 9,245,074 |
| කල්බදු ඉඩම් | - | - | - | - | - | - |
| ගොඩනැගිලි | 13,867,109 | 1,074,120 | - | (221,190) | (35,442) | 14,684,597 |
| සිවිල් වැඩ | 190,094,307 | 2,674,251 | - | - | - | 192,768,558 |
| පිරියත සහ උපකරණ | 433,609 | 164,629 | - | - | - | 598,238 |
| බල උත්පාදන පිරියත | 192,485,008 | 1,487,100 | - | (1,738) | - | 193,970,370 |
| සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ රැහැන් | 428,084,982 | 28,561,749 | - | (5,331,357) | (292,680) | 451,022,694 |
| මෝටර් රථ | 5,182,892 | 964,586 | (4,685) | (225,501) | (28,642) | 5,888,650 |
| අනෙකුත් යටිතල සැපයුම් | - | - | - | - | - | - |
| කාර්යාල සහ වෙනත් උපකරණ | 1,831,387 | 234,882 | - | (187,355) | (5,736) | 1,873,178 |
| දැව භාණ්ඩ සහ සවි කිරීම් | 207,307 | 13,966 | - | (2,184) | - | 219,089 |
| යන්ත්‍ර සහ මෙවලම් | 3,922,137 | 350,233 | - | (7,284) | (2,648) | 4,262,438 |
| | 845,278,509 | 35,611,225 | (4,685) | (5,993,272) | (358,891) | 874,532,886 |

8.2.2 ව්‍යාපෘති වත්කම්

දළ ධාරණ අගය

| ඇගයීම හෝ පිරිවැය මත | 2014.01.01 ට ශේෂය ප්‍රතිප්‍රකාශිත | එකතු කිරීම් / මාරු කිරීම් / අත්පත් කර ගැනීම් | විකිණීමට ඇති වත්කම් මාරුකිරීම | අපහරණය / මාරු කිරීම් | ගැලපීම් | 2014.12.31 ට ශේෂය |
|---|---|---|---|---|---|---|
| සින්නක්කර ඉඩම් | 117,230 | 677 | - | - | (5,550) | 112,357 |
| ගොඩනැගිලි | - | 313,024 | - | (313,024) | - | - |
| සිවිල් වැඩ | - | - | - | - | - | - |
| පිරියත සහ යන්ත්‍ර | - | - | - | - | - | - |
| බල උත්පාදන පිරියත | - | 4,252,086 | - | (4,252,086) | - | - |
| සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ රැහැන් | - | 4,714,241 | - | (4,714,241) | - | - |
| මෝටර් රථ | 577,770 | 459,158 | - | (234,117) | - | 802,811 |
| කාර්යාල සහ වෙනත් උපකරණ | 50,886 | 3,846 | - | (1,093) | (340) | 53,299 |
| දැව භාණ්ඩ සහ සවි කිරීම් | 19,182 | 562 | - | (29) | - | 19,715 |
| යන්ත්‍ර සහ මෙවලම් | 5,613 | 7,303 | - | - | (42) | 12,874 |
| | 770,681 | 9,750,897 | - | (9,514,590) | (5,932) | 1,001,056 |

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

2014 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා (සියළුම මූල්‍ය ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින්)

### 8.2.3 කල්බදු වත්කම්

| ඇගයීම හෝ පිරිවැය මත | 2014.01.01 ට ශේෂය ප්‍රතිප්‍රකාශිත | එකතු කිරීම් / මාරු කිරීම් / අත්පත් කර ගැනීම් | විකිණීමට ඇති වත්කම් මාරුකිරීම | අපහරණය / මාරු කිරීම් | ගැලපීම් | 2014.12.31 ට ශේෂය |
|---|---|---|---|---|---|---|
| මෝටර් වාහන | 357,659 | 153,735 | - | (41,663) | 1,670 | 471,401 |
| | 357,659 | 153,735 | - | (41,663) | 1,670 | 471,401 |
| ක්ෂය විය හැකි වත්කම්වල මුළු අගය | 846,406,849 | 45,515,857 | (4,685) | (15,549,525) | (363,153) | 876,005,343 |

### 8.2.4 ඉදිවෙමින් පවතින

| | 2014.01.01 ට ශේෂය ප්‍රතිප්‍රකාශිත | වර්ෂය තුළ වියදම් | දේ.පි.උ. ට මාරු කරන ලදී | ප්‍රතිවර්ගීකරණය / මාරු කරන ලදී | 2014.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ | 162,138,561 | 58,088,188 | (29,634,035) | (78,941) | 190,513,773 |
| මුළු දළ ධාරණ අගය | 162,138,561 | 58,088,188 | (29,634,035) | (78,941) | 190,513,773 |

### 8.2.5 ක්ෂය වීම

| ඇගයීම හෝ පිරිවැය මත | 2014.01.01 ට ශේෂය ප්‍රතිප්‍රකාශිත | වසර සඳහා අයවීම | විකිණීමට ඇති වත්කම් මාරුකිරීම | අපහරණය / මාරු කිරීම් අත්හරින ලද | ගැලපීම | 2014.12.31 ට ශේෂය |
|---|---|---|---|---|---|---|
| සින්නක්කර ඉඩම් | - | - | - | - | - | - |
| කල්බදු ඉඩම් | - | - | - | - | - | - |
| ගොඩනැගිලි | 4,359,984 | 450,444 | - | (93,955) | (75) | 4,716,398 |
| සිවිල් වැඩ | 57,524,095 | 2,229,274 | - | - | - | 59,753,369 |
| පිරියත සහ යන්ත්‍ර | 332,266 | 82,261 | - | - | - | 414,527 |
| බල උත්පාදන පිරියත | 110,376,961 | 5,665,611 | - | - | - | 116,042,572 |
| සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ රැහැන් | 180,780,097 | 13,491,202 | - | (2,448,128) | (1,401) | 191,821,770 |
| මෝටර් රථ | 2,100,126 | 864,382 | (2,139) | (84,756) | (20,824) | 2,856,789 |
| අනෙකුත් සැපයුම් යටිතල | - | - | - | - | - | - |
| කාර්යාල සහ වෙනත් උපකරණ | 1,087,744 | 226,843 | - | (67,702) | (5,156) | 1,241,729 |
| දැව භාණ්ඩ සහ සවිකිරීම් | 106,861 | 37,144 | - | (1,485) | 48 | 142,568 |
| යන්ත්‍ර සහ මෙවලම් | 1,609,540 | 796,283 | - | (2,366) | 1 | 2,403,458 |
| | 358,277,674 | 23,843,444 | (2,139) | (2,698,392) | (27,407) | 379,393,180 |

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

**2014 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා** **(සියළුම මූල්‍ය ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින්)**

**8.2.6 ක්ෂය වීම**

**ව්‍යාපෘති වත්කම්**

| ඇගයීම හෝ පිරිවැය මත | 2014.01.01 ට ශේෂය ප්‍රතිප්‍රකාශිත | කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ ගිණුමට මාරු කිරීම | විකිණීමට ඇති වත්කම් මාරුකිරීම | අපහරණය / මාරු කිරීම් අත්හරින ලද | ගැලපීම | 2014.12.31 ට ශේෂය |
|---|---|---|---|---|---|---|
| සින්නක්කර ඉඩම් | - | - | - | - | - | - |
| ගොඩනැගිලි | - | - | - | - | - | - |
| සිවිල් වැඩ | - | - | - | - | - | - |
| පිරියත සහ යන්ත්‍ර | - | - | - | - | - | - |
| බල උත්පාදන පිරියත | - | - | - | - | - | - |
| සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ රැහැන් | - | - | - | - | - | - |
| මෝටර් රථ | 303,283 | 157,156 | - | (54,771) | - | 405,668 |
| කාර්යාල සහ වෙනත් උපකරණ | 39,553 | 4,365 | - | (364) | 100 | 43,654 |
| දැව භාණ්ඩ සහ සවිකිරීම් | 16,260 | 924 | - | - | - | 17,184 |
| යන්ත්‍ර සහ මෙවලම් | 664 | 1,695 | - | - | (1) | 2,358 |
| | 359,760 | 164,140 | - | (55,135) | 99 | 468,864 |

**8.2.7 ක්ෂය වීම**

| කල්බදු වත්කම් | 2014.01.01 ට ශේෂය ප්‍රතිප්‍රකාශිත | එකතු කිරීම් / මාරු කිරීම් / අත්පත් කර ගැනීම් | විකිණීමට ඇති වත්කම් මාරුකිරීම | අපහරණය / මාරු කිරීම් අත්හරින ලද | ගැලපීම | 2014.12.31 ට ශේෂය |
|---|---|---|---|---|---|---|
| මෝටර් රථ | 93,142 | 75,145 | - | (4,494) | 22,523 | 186,316 |
| | 93,142 | 75,145 | - | (4,494) | 22,523 | 186,316 |
| සම්පූර්ණ ක්ෂය වීම | 358,730,576 | 24,082,729 | (2,139) | (2,758,021) | (4,785) | 380,048,360 |

**8.2.8 ශුද්ධ පොත් අගයන්**

**ඇගයීම හෝ පිරිවැය මත**

| | 2014 | 2013 |
|---|---|---|
| සින්නක්කර ඉඩම් | 9,357,431 | 9,287,000 |
| කල්බදු ඉඩම් | - | - |
| ගොඩනැගිලි | 9,968,199 | 9,507,125 |
| සිවිල් වැඩ | 133,015,189 | 132,570,212 |
| පිරියත සහ යන්ත්‍ර | 183,711 | 101,342 |
| බල උත්පාදන පිරියත | 77,927,798 | 82,108,047 |
| සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ රැහැන් | 259,200,924 | 247,304,885 |
| මෝටර් රථ | 3,429,004 | 3,357,254 |
| අනෙකුත් සැපයුම් යටිතල | - | - |
| කාර්යාල සහ වෙනත් උපකරණ | 641,094 | 754,977 |
| දැව භාණ්ඩ සහ සවිකිරීම් | 79,051 | 103,368 |
| යන්ත්‍ර සහ මෙවලම් | 1,869,496 | 2,317,546 |
| බහාලුම් අංගන | 285,085 | 264,516 |
| | 495,956,982 | 487,676,272 |
| | | |
| කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ (8.2.9) | 190,513,772 | 162,138,561 |
| දේපල, පිරියත සහ උපකරණවල මුළු ධාරණ අගය | 686,470,754 | 649,814,833 |

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

**2014 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා** **(සියළුම මූල්‍ය ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින්)**

**8.2.9 කෙරීගෙන යන කොන්ත්‍රාත් ව්‍යාපෘති 2014 දෙසැම්බර් 31 දිනට පහතින් නිරූපනය වේ.**

| | 2014 | 2013 |
|---|---|---|
| ජනන ව්‍යාපෘති | 14,962,260 | 13,128,296 |
| සම්ප්‍රේෂණ ව්‍යාපෘති | 3,851,958 | 3,294,002 |
| බෙදාහැරීම් ව්‍යාපෘති | 31,402,469 | 25,375,486 |
| ඉහළ කොත්මලේ ජල විදුලි ව්‍යාපෘතිය | 200,843 | 1,075,942 |
| කොළඹ නගර විදුලි බෙදාහැරීම් සංවර්ධන ව්‍යාපෘතිය | 1,402,388 | 4,143,863 |
| බ්‍රෝඩ්ලන්ඩ් ජලවිදුලි බලාගාර ව්‍යාපෘතිය | 1,534,193 | |
| පුත්තලම් ගල් අඟුරු ව්‍යාපෘතිය | 107,992,770 | 90,815,482 |
| ත්‍රිකුණාමලය ගල් අඟුරු ව්‍යාපෘතිය | 2,084,723 | 505,039 |
| අති.සා. (ව්‍යාපෘති) | 26,229,148 | 23,481,958 |
| විදුලක්පාය ව්‍යාපෘතිය | 380,175 | 296,315 |
| යාපනය බල උත්පාදන පිරියත | 4,913 | 4,298 |
| වෙනත් (වැඩපල හා උපකාරක සේවා) | 19,382 | 17,880 |
| මහ කොළඹ සම්ප්‍රේෂණ සහ බෙදාහැරීම් හානි අවම කිරීමේ ව්‍යාපෘතිය | 448,550 | - |
| **කෙරීගෙන යන වැඩවල මුළු වටිනාකම** | 190,513,772 | 162,138,561 |

**8.2.10 සියලුම මෝටර් රථමණ්ඩලයේ ස්වාධීන තාක්ෂණික කමිටුවක් මගින් 2011.01.01 දිනට සාධාරණ අගය මත ගන්නා ලදී.**

**8.2.11 දේපල පිරියත උපකරණ මණ්ඩලයට සම්බන්ධ කිසිඳු වගකීමකට බැඳී නොමැත.**

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

2014 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා (සියළුම මූල්‍ය ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින්)

8 දේපල, පිරියත සහ උපකරණ (ඉතිරි කොටස)

8.3 2013 දෙසැම්බර් 31ට ඉටුවෙමින් පැවති ප්‍රාග්ධන වැඩ පහත දැක්වේ

| | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|
| ව්‍යාපෘති | 2014 | 2013 | 2014 | 2013 |
| ජනන ව්‍යාපෘති | 14,962,260 | 13,128,296 | 14,962,260 | 13,128,296 |
| සම්ප්‍රේෂණ ව්‍යාපෘති | 3,851,958 | 3,294,002 | 3,851,958 | 3,294,002 |
| බෙදාහැරීමේ සමූහ ව්‍යාපෘති | 31,402,469 | 25,375,486 | 31,402,469 | 25,375,486 |
| ඉහළ කොත්මලේ ජල විදුලි ව්‍යාපෘතිය | 200,843 | 1,075,942 | 200,843 | 1,075,942 |
| කොළඹ නගරයේ විදුලි බල බෙදාහැරීම සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | 1,402,388 | 4,143,863 | 1,402,388 | 4,143,863 |
| බ්‍රෝඩ්ලන්ඩ් ජලවිදුලි බලාගාර ව්‍යාපෘතිය | 1,534,193 | - | 1,534,193 | - |
| පුත්තලම ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘතිය | 107,992,770 | 90,815,482 | 107,992,770 | 90,815,482 |
| ත්‍රිකුණාමලය ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘතිය | 2,084,723 | 505,039 | 2,084,723 | 505,039 |
| අති.සා. (ව්‍යාපෘති) | 26,229,148 | 23,481,958 | 26,229,148 | 23,481,958 |
| විදු ලක්පාය ව්‍යාපෘතිය | 380,175 | 296,314 | 380,175 | 296,314 |
| යාපනය විදුලිබල බලාගාරය | 4,913 | 4,298 | 4,913 | 4,298 |
| වෙනත් (W/AS) | 19,382 | 17,880 | 19,382 | 17,880 |
| මහ කොලඹ සම්ප්‍රේෂණ සහ බෙදාහැරීම් හානි අවම කිරීමේ ව්‍යාපෘතිය | 448,550 | - | 448,550 | - |
| කෙරීගෙන යන වැඩ - LECO | 561,369 | 405,426 | - | - |
| කෙරීගෙන යන වැඩ - LTL | 4,250,430 | 4,514,332 | - | - |
| කෙරීගෙන යන වැඩ - SLE | 5,168 | 5,168 | - | - |
| කෙරීගෙන යන වැඩවල මුළු වටිනාකම | 195,330,740 | 167,063,486 | 190,513,772 | 162,138,561 |

8.4 **ලංකා විදුලිබල මණ්ඩලය**

ස්වාධීන තාක්ෂණික කණ්ඩයක් විසින් 2011.01.01 දිනට සාධාරණ ඇගයීමකට පාත්‍ර කරන ලදී. මණ්ඩලයේ කිසිදු වගකීමක් උදෙසා දේපල පිරියත හා උපකරණ ඇපයට තබා නැත.

8.5 **සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම**

වෙළඳපොළ සංසන්දනාත්මක ක්‍රමය පදනම් කරගනිමින් 2014-12-31 මුදල් වර්ෂයේදී ඉඩම් සහ ගොඩනැගිලි වල සාධාරණ අගය ප්‍රති අගැයීමක් මගින් නිර්ණය කරන ලදී. මෙම ඇගයීම සිදු කරන ලද්දේ මෙවැනි කාර්යයන් පිලිබඳ අවරුදු 30කට වඩා වැඩි පළපුරුද්දක් ඇති පිළිගත් ස්වාධීන වරලත් තක්සේරු කරුවෙකු වන පි. පි. ටි. මොහිදීන් මහතා විසින්ය. තක්සේරු කිරීම කරන ලද්දේ, වෙළඳපොල පවතින මිල ගණන් යටතේ වෙනස් වන පාරිසරික තත්වයන් භූගෝලීය පිහිටීම හා දේපල ස්වභාවයට අනුකූලව එක් එක් අයිතම වලට සැලකිය යුතු ගැලපීම් සිදුකිරිමෙනි.

| ජංගම වගකීම් | | | | |
| වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | 78,248,057 | (179,502) | (245,941) | 77,822,614 |
| ගෙවිය යුතු ලාභාංශ | 491,648 | - | - | 491,648 |
| සම්බන්ධිත පාර්ශ්ව වලට ගෙවිය යුතු මුදල් | - | - | - | - |
| පොලී සහිත ණය සහ ණය ගැනීම් | 19,737,766 | 5,310 | (1,345,271) | 18,397,805 |
| ගෙවිය යුතු ආදායම් බදු | 1,113,114 | - | (2,043) | 1,111,071 |
| මුළු ජංගම වගකීම් | 99,590,585 | (174,192) | (1,593,255) | 97,823,138 |
| මුළු ස්කන්ධය සහ වගකීම් | 832,413,730 | (36,282,033) | (1,976,006) | 794,155,691 |

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

2014 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා (සියළුම මූල්‍ය ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින්)

29.3.2 2013.12.31. දිනට සමූහයේ පෙර වර්ෂය සඳහා ගැළපුම් වල බලපෑම.

විස්තීරණ ආදායම් ප්‍රකාශ

| | 2013<br>ප්‍රතිප්‍රකාශ කිරීමට පෙර | 2013<br>මණ්ඩලයේ ගැළපීම් | 2013<br>LTL ගැළපීම් | 2013<br>ප්‍රතිප්‍රකාශකළ පසු |
|---|---|---|---|---|
| අඛණ්ඩ මෙහෙයුම් | | | | |
| ආදායම | 203,289,681 | - | (4,521,965) | 198,767,716 |
| විකුණුම් පිරිවැය | (173,084,741) | 1,416,840 | 4,227,812 | (167,440,089) |
| දළ ලාභය/ (අලාභ) | 30,204,940 | 1,416,840 | (294,153) | 31,327,627 |
| වෙනත් ආදායම් සහ ලාභ | 6,876,585 | - | - | 6,876,585 |
| බෙදාහැරීමේ පිරිවැය | (60,362) | - | - | (60,362) |
| වෙනත් | (332,648) | - | 178,967 | (153,681) |
| පරිපාලන වියදම් | (4,429,154) | - | 1,000 | (4,428,154) |
| මෙහෙයුම් ලාභ/ (අලාභ) | 32,259,360 | 1,416,840 | (114,186) | 33,562,015 |
| මූල්‍ය ආදායම් | 2,406,799 | - | (10,084) | 2,396,715 |
| මූල්‍ය පිරිවැය | (13,157,110) | 2,211,720 | 116,159 | (10,829,231) |
| මූල්‍ය පිරිවැය - ශුද්ධ | (10,750,311) | 2,211,720 | 106,075 | (8,432,516) |
| ඒකාබද්ධ ව්‍යාපාරයෙන් අලාභ කොටස | (8,975) | - | - | (8,975) |
| බදු ගෙවීමට පෙර ලාභ/ (අලාභ) | 21,500,075 | 3,628,560 | (8,111) | 25,120,524 |
| ආදායම් බදු වියදම | (590,409) | - | - | (590,409) |
| විලම්බිත බදු ගාස්තු / (ප්‍රත්‍යාවර්තන) | (5,629,743) | 4,422,150 | - | (1,207,593) |
| අඛණ්ඩ මෙහෙයුම් මගින් වර්ෂය සඳහා ලාභ/(අලාභ) | 15,279,923 | 8,050,710 | (8,111) | 23,322,522 |
| සුළු කොටස් හිමි අයිතිය | (1,937,847) | - | 5,146 | (1,932,701) |
| වර්ෂය සඳහා ලාභය / (අලාභ) | 13,342,076 | 8,050,710 | (2,965) | 21,389,821 |

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

2014 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා (සියළුම මූල්‍ය ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින්)

29.3.3 2012.12.31. දිනට සමූහයේ පෙර වර්ෂය සඳහා ගැළපුම් වල බලපෑම.

මූල්‍ය තත්ව ප්‍රකාශනය

| | 2012 ප්‍රතිප්‍රකාශ කිරීමට පෙර | 2012 මණ්ඩලයේ ගැළපීම් | 2012 LTL ගැළපීම් | 2012 ප්‍රතිප්‍රකාශකළ පසු |
|---|---|---|---|---|
| වත්කම් | | | | |
| ජංගම නොවන වත්කම් | | | | |
| දේපල පිරියත සහ උපකරණ | 637,656,973 | (1,261,263) | (1,126,438) | 635,269,272 |
| කල්බදු ඉඩම් සඳහා ගෙවූ වාරිකය | 5,903 | - | - | 5,903 |
| අස්පෘශ්‍ය වත්කම් | 22,025 | - | - | 22,025 |
| පරිපාලිත සමාගම්වල ආයෝජන | - | - | - | - |
| බද්ධ ව්‍යාපාරවල ආයෝජන | 84,121 | - | - | 84,121 |
| කල්බදු ලැබිය යුතු දෑ | - | - | - | - |
| වෙනත් ජංගම නොවන මූල්‍ය වත්කම් | 4,864,344 | - | 807,980 | 5,672,324 |
| රක්ෂණ සංචිතවල ආයෝජන | 4,433,045 | - | | 4,433,045 |
| මුළු ජංගම නොවන වත්කම් | 647,066,411 | (1,261,263) | (318,458) | 645,486,690 |
| **විකිණීම සඳහා ඇති ජංගම නොවන වත්කම්** | - | - | - | - |
| ජංගම වත්කම් | | | | |
| භාණ්ඩ තොග | 32,597,217 | - | (69,201) | 32,528,016 |
| වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ | 75,305,058 | (6,142,007) | (1,538,924) | 67,624,127 |
| සම්බන්ධිත පාර්ශව වලින් ලැබිය යුතු මුදල් | - | - | - | - |
| වෙනත් ජංගම මූල්‍ය වත්කම් | - | - | - | - |
| ආපසු ලැබිය යුතු බදු | 14,186,296 | - | (309,744) | 13,876,552 |
| | 261,569 | - | - | 261,569 |
| මුදල් සහ බැංකු ශේෂ | 5,717,455 | - | (27,746) | 5,689,709 |
| සම්පූර්ණ ජංගම වත්කම් | 128,067,595 | (6,142,007) | (1,945,615) | 119,979,973 |
| මුළු වත්කම් | 775,134,006 | (7,403,270) | (2,264,073) | 765,466,663 |

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

**2014 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා** **(සියළුම මූල්‍ය ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින්)**

**29.3.3 2012.12.31. දිනට සමූහයේ පෙර වර්ෂය සඳහා ගැළපුම් වල බලපෑම.**

මූල්‍ය තත්ව ප්‍රකාශනය

| | 2012<br>ප්‍රතිප්‍රකාශ කිරීමට පෙර | 2012<br>මණ්ඩලයේ ගැළපීම් | 2012<br>LTL ගැළපීම් | 2012<br>ප්‍රතිප්‍රකාශකළ පසු |
|---|---|---|---|---|
| **ස්කන්ධය සහ වගකීම්** | | | | |
| ප්‍රාග්ධනය සහ ස්කන්ධය | | | | |
| දායක ප්‍රාග්ධනය | 110,765,779 | 96,265 | - | 110,862,044 |
| සංචිත | 32,259,936 | (1,261,263) | (192,619) | 30,806,054 |
| රඳවාගත් ලාභ / (අලාභ) | 65,424,008 | 7,074,268 | - | 72,498,276 |
| මූල සංවිධානයේ ධාරකයෝ | 208,449,723 | 5,909,270 | (192,619) | 214,166,374 |
| සුළු කොටස් හිමියන්ගේ අයිතිය | 15,945,107 | - | (181,612) | 15,763,495 |
| මුළු ස්කන්ධය | 224,394,830 | 5,909,270 | (374,231) | 229,929,869 |
| ජංගම නොවන වත්කම් සහ විලම්බිත ආදායම් | | | | |
| පොලිය සහිත ණය සහ ණය ගැනීම් | 303,095,370 | - | (214,896) | 302,880,474 |
| පාරිභෝගික තැන්පතු | 8,899,445 | - | - | 8,899,445 |
| ප්‍රතිපාදන හා අනෙකුත් විලම්භිත වගකීම් | 4,123,375 | - | (260) | 4,123,115 |
| විලම්බිත ආදායම | 58,285,116 | - | | 58,285,116 |
| විලම්බිත බදු | 34,602,781 | (13,312,540) | | 21,290,241 |
| මුළු ජංගම නොවන වගකීම් හා විලම්බිත ආදායම | 409,006,087 | (13,312,540) | (215,156) | 395,478,391 |
| ජංගම වගකීම් | | | | |
| වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | 91,914,118 | - | (250,622) | 91,663,496 |
| ගෙවිය යුතු ලාභාංශ | 19,322 | - | - | 19,322 |
| සම්බන්ධිත පාර්ශව වලට ගෙවිය යුතු මුදල් | - | - | - | - |
| පොලී සහිත ණය සහ ණය ගැනීම් | 42,993,281 | - | (1,418,420) | 41,574,861 |
| ගෙවිය යුතු ආදායම් බදු | 6,806,368 | - | (5,644) | 6,800,724 |
| මුළු ජංගම වගකීම් | 141,733,089 | - | (1,674,686) | 140,058,403 |
| මුළු ස්කන්ධය සහ වගකීම් | 775,134,006 | (7,403,270) | (2,264,073) | 765,466,663 |

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

2014 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා (සියළුම මූල්‍ය ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින්)

**30 ඇපයට තැබූ වත්කම්**

ලංකා විදුලිබල මණ්ඩලය

ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට වත්කම් ඇපයට තබා නොමැත

**30.1 සී/ස ලංකා විදුලි (පුද්ගලික) සමාගම**

වගකීම් සඳහා ඇප වශයෙන් පහත සඳහන් වත්කම් ඇපයට තබා ඇත.

| වත්කම්වල ස්වභාවය | වගකීමේ ස්වභාවය | ඇපයට තබා ඇති ධාරණ වටිනාකම 2014 | 2013 | ඇතුළත් විෂය |
|---|---|---|---|---|
| ස්ථාවර තැන්පතු | මහජන බැංකුවේ බැංකු අයිරා පහසුකම් | 45,500 | 45,500 | ජංගම සහ ජංගම නොවන වෙනත් ආයෝජන |
| ස්ථාවර තැන්පතු | මහජන බැංකුවේ කුඩා සහ මධ්‍යම ප්‍රමාණ ණය යෝජනා ක්‍රම | 117,347 | 94,143 | |
| ස්ථාවර තැන්පතු | SMIB බැංකුව සහ HDFC බැංකුවේ බැංකු පහසුකම්වල කුඩා ණය යෝජනා ක්‍රම | 797,585 | 631,762 | |

**30.2 සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම**

පොලී සහිත ණය ගැනීම් සහ සමූහයේ අදාළ සමාගම්වල ණයවර ලිපි පහසුකම් සඳහා ඇප වශයෙන් පහත සඳහන් වත්කම් ඔඩපනය කර ඇත.

| වත්කම්වල ස්වභාවය | වගකීමේ ස්වභාවය | ඇපයට තබා ඇති ධාරණ වටිනාකම 2014 | 2013 | ඇතුළත් විෂය |
|---|---|---|---|---|
| නිශ්චල දේපල | ණය ගැනීම් සහ ණය දීම් සඳහා ප්‍රථම උකස් තැබීම | 73,739 | 91,503 | ගොඩනැගිලි, දේපල, පිරියත සහ උපකරණ |
| **ලක්දනව් සමාගම සහ එහි ඒකාබද්ධ පාලනයට යටත් ස්ථිති** | | | | |
| ආයෝජන | බැංකු ඇප මත උකස් තැබීම | 477,304 | 434,370 | වෙනත් ජංගම මූල්‍ය වත්කම් |
| කෙටි කාලීන ආයෝජන | බැංකු අයිරාව - හෙළදනව් | 1,115,513 | - | වෙනත් ජංගම මූල්‍ය වත්කම් |
| කෙටි කාලීන ආයෝජන | බැංකු අයිරාව - රාජ් ලංකා | 263,720 | - | වෙනත් ජංගම මූල්‍ය වත්කම් |
| **ඒකාබද්ධ ව්‍යාපාර සමාගම් - හෙළදනව් සමාගම** | | | | |
| ඉඩම්, ගොඩනැගිලි, පිරියත සහ යන්ත්‍ර සහ වෙළඳ ලැබිය යුතු මුදල් | කෙටි කාලීන ණය | 1,549,408 | 1,549,408 | ගොඩනැගිලි, දේපල, පිරියත සහ උපකරණ |
| **පවන් දනව් (පුද්ගලික) සමාගම** | | | | |
| සුළං බල පිරියත, සින්නක්කර ඉඩම් සහ බදු ඉඩම් | ප්‍රාථමික සමගාමී උකස් බැඳීම | 1,413,900 | 1,413,900 | දේපල, පිරියත සහ උපකරණ |
| සාමාන්‍ය කොටස් 51%ක් එල්ටීඑල් හෝල්ඩින්ග්ස් සතුය | ප්‍රාථමික සමගාමී උකස් බැඳීම | 485,000 | 485,000 | ප්‍රකාශිත ප්‍රාග්ධනය |
| | සමාගම වෙනුවෙන් LTL හෝල්ඩිංග්ස් පුද්ගලික සමාගමෙන් සමූහ ඇප සහතිකය | 2,466,000 | - | දේපල, පිරියත සහ උපකරණ |

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

**2014 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා** **(සියළුම මූල්‍ය ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින්)**

**31 මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට පසු සිදුවීම්**

සමූහයේ මූල්‍ය ප්‍රකාශවල ගැලපීම් හෝ හෙළිකිරීම් අවශ්‍ය වන සැලකිය යුතු සිදුවීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට පසුව සිදුවී නැත.

**32 අසම්භාව්‍යයන්**

**32.1 මණ්ඩලය**

2014.12.31 දිනට අභියාචනාධිකරණය, ශ්‍රේෂ්ඨාධිකරණය ඇතුළු කම්කරු උසාවියේ ලංවීම වග උත්තරකරු කරමින් නඩු පවරා තවමත් අවසන් නොවූ නඩු කටයුතු මත අසම්භාව්‍ය වගකීම පැනනැගී ඇත. මෙම සියළු නඩු මණ්ඩලයට අවාසි සහගත ලෙස තීරණය වනු ඇතැයි සිතිය නොහැකි වුව ද, එසේ තීරණය වුවහොත් ඇතිවන අසම්භාව්‍ය වගකීම රුපියල් මිලියන 167.5 කි.

**32.2 සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම**

(අ) සමාගම 2008 ජූලි 01 දින සිට පිරිවැටුම් බදු ගෙවීම් අත්හිටුවා තිබුණි. 2008 ජූලි 01 දින සිට 2011 දෙසැම්බර් 31 දක්වා නොගෙවා තිබූ පිරිවැටුම් බදු ප්‍රමාණය රු. මිලියන 273.7ක් විය (2013 රු. මිලියන 273.7). කෙසේ වෙතත් අදාළ බදු බලධාරීන්ගෙන් පැහැදිලි ලිඛිත නිදහස් කිරීමක් සමාගමට ලැබී නොතිබුණි. මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශවල ප්‍රතිපාදන සලසා නැත.

(ආ) ව්‍යාපාරය විසින් තක්සේරු කරන ලද රුපියල් මිලියන 10.04 (2013 මිලියන - 33.61) උපරිමයකට යටත්ව වර්ෂ අවසානයේදී නඩු 12 (2013 - 13) ක විත්තිකාර වගඋත්තරකරු ලෙස බැදී සිටියි. එහි සහතික වටිනකම් නොමැති වුවත් වර්තමාන තොරතුරු පදනම් කොට ගෙන අධ්‍යක්ෂ මණ්ඩලයේ විශ්වාසයට අනුව ඉහත නීති ක්‍රියා පටිපාටිය තුලින් මූල්‍ය ස්ථායිතාවයට, ද්‍රවශීලත්වයට හෝ මෙහෙයුම් තත්වයට ප්‍රමාණාත්මකව සලකා බැලීමේදී අහිතකර ලෙස බලනොපානු ඇත. ඒ අනුව මේ සම්බන්ධයෙන් කිසිදු වගකීමක් සඳහා මූල්‍ය ප්‍රකාශන වල ප්‍රතිපාදනයක් කර නොමැත.

**32.3 සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම**

**අසම්භාව්‍ය නෛතික හිමිකම්**

**සීමාසහිත හෙළදනව් සමාගම**

**ජනන බලපත්‍රයක් ඉල්ලා සිටීමට ඇති සුදුසුකම්**

2007 වර්ෂයේ අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත කර ඇති සමාගමක් මෙගා වොට් 25 ට වැඩි විදුලිබලය නිපදවන කළ, එම සමාගමට මූල්‍ය විෂයය භාර ඇමතිතුමාගේ අනුදැනුම ඇතිව මහා භාණ්ඩාගාරයේ ලේකම් මහතා තීරණය කර ඇති කොටස් සංඛ්‍යාවක් අයත් වන අතර, එම සමාගම රජය හෝ පොදු සමායතනයක් හෝ රජයට 50%ට වැඩි කොටස් හිමි සමාගමක් හෝ එබඳු සමාගමක පරිපාලිත සමාගමක් වන්නේ නම්, 2009 වර්ෂයේ අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනතේ අංක 9 (1) (ඇ) වගන්තිය යටතේ එම සමාගමට විදුලිබල ජනන බලපත්‍රයක් ඉල්ලීමට සුදුසුකම් ඇත.

දැනට නිත්‍යානුකූලව 2003 සැප්තැම්බර් 26 දින ලබාගත් ජනන බලපත්‍රයක් සහිතව මෙහෙයුම් සිදුකරන සීමාසහිත හෙළදනව් සමාගම ද, 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ ජනන බලපත්‍රයක් ඉල්ලා සිටියේය. 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ ඉහත සඳහන් වගන්තිය යටතේ ජනන බලපත්‍රයක් ඉල්ලා සිටීමට හෙළදනව් සමාගමට සුදුසුකම් නැති බව ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිසම හෙළදනව් සමාගමට දැන්වීය. ඒ සමගම පවත්නා ස්වාධීන බලශක්ති නිෂ්පාදකයන් (හෙළදනව් ඇතුළු) මෙම අවශ්‍යතාවයෙන් නිදහස් කිරීමට නව විදුලිබල පනත සංශෝධනය කිරීමට ශ්‍රී ලංකා රජය අදහස් කරන බව දැනගන්න ඇත.

මේ සම්බන්ධයෙන් හෙළදනව් සමාගම විසින් නෛතික උපදෙස් විමසා ඇත. ඒ අනුව බලශක්ති මිලට ගැනීමේ ගිවිසුම සහ ක්‍රියාත්මක කිරීමේ ගිවිසුමෙහි "නීතියෙහි වෙනස් වීම්" වගන්තිය යටතේ නෛතික ප්‍රතිකර්ම සහ වන්දි ගෙවීමක් ඉල්ලා සිටීමට හෙළදනව් සමාගමට අයිතියක් ඇති බව හෙළදනව් සමාග මට දන්වා ඇත.

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

2014 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා (සියළුම මූල්‍ය ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින්)

33 ප්‍රාග්ධන බැඳීම්

33.1 මණ්ඩලය

| | 2014 | 2013 |
|---|---|---|
| මණ්ඩලය අනුමත කළ නමුත් ගිවිසුම්ගත කර නැති | - | 44,294 |
| ගිවිසුම්ගත කර ඇති ප්‍රතිපාදන සලස්වා නැති | - | 2,216,267 |
| **එකතුව** | - | 2,260,561 |

33.2 **සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම**

සමාගම දේපල, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම වෙනුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට (2013 - නැත) ප්‍රමාණාත්මක මිලදී ගැනීම් බැඳීම් ඇතිකර නොතිබුණි.

33.3 **සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම**

කල්බදු

සමූහය බදු ගැනුම්කරුවෙකු ලෙස මූල්‍ය කල්බදු බැඳීම් හෙළිදරව්ව-සටහන් අංක 21.5

සමූහය බදු ගැනුම්කරුවෙකු ලෙස මූල්‍ය කල්බදු ලැබිය යුතු දෑ හෙළිදරව්ව - සටහන් අංක 12

ණයවර ලිපි

| පරිපාලක / පරිපාලිත / ඒකාබද්ද ව්‍යාපාර සමාගම් | බැංකුව | 2014 | 2013 |
|---|---|---|---|
| එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම | හැටන් නැෂනල් බැංකුව | - | 2,009 |
| සීමාසහිත ලක්දනව් | හැටන් නැෂනල් බැංකුව | - | 32,904 |
| සීමාසහිත හෙළදනව් | හැටන් නැෂනල් බැංකුව | 126,928 | 4,530 |
| එල්ටීඑල් ගැල්වනයිසර් (පුද්ගලික) සමාගම | හැටන් නැෂනල් බැංකුව | - | 5,249 |
| ලංකා ඉන්ඩස්ට්‍රියල් ප්‍රොඩක්ට්ස් ඉංජිනියරින් | හැටන් නැෂනල් බැංකුව | - | 4,740 |
| එල්ටීඑල් ට්‍රාන්ස්ෆෝමර්ස් (පුද්ගලික) සමාගම | හැටන් නැෂනල් බැංකුව | - | 6,867 |
| එල්ටීඑල් ට්‍රාන්ස්ෆෝමර්ස් (පුද්ගලික) සමාගම | මහජන බැංකුව | 41,410 | 50,237 |
| | | 168,338 | 106,536 |

ඇපය

| පරිපාලක / පරිපාලිත / ඒකාබද්ද ව්‍යාපාර සමාගම් | බැංකුව | 2014 | 2013 |
|---|---|---|---|
| එල්ටීඑල් ට්‍රාන්ස්ෆෝමර්ස් (පුද්ගලික) සමාගම | හැටන් නැෂනල් බැංකුව | - | 21,629 |
| එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම | හැටන් නැෂනල් බැංකුව | - | 481,571 |
| එල්ටීඑල් ගැල්වනයිසර් (පුද්ගලික) සමාගම | හැටන් නැෂනල් බැංකුව | 608,978 | 5,248 |
| සීමාසහිත ලක්දනව් | හැටන් නැෂනල් බැංකුව | | 513,656 |
| එල්ටීඑල් ට්‍රාන්ස්ෆෝමර්ස් (පුද්ගලික) සමාගම | මහජන බැංකුව | 857,545 | 7,091 |
| එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම | සිටි බැංකුව | 97,303 | 56,612 |
| සීමාසහිත ලක්දනව් | කොමර්ෂල් බැංකුව | 477,286 | 430,444 |
| සීමාසහිත ලක්දනව් | සිටි බැංකුව | - | 71,989 |
| සීමාසහිත ලක්දනව් (සීමාසහිත හෙළදනව්) | සම්පත් බැංකුව | - | 135,294 |
| සීමාසහිත ලක්දනව් (සීමාසහිත හෙළදනව්) | ජාතික සංවර්ධන බැංකුව | - | 135,294 |
| | | 2,041,112 | 1,858,828 |

පරිපාලිත සමාගමක් විසින් ලබාගත් ණයක් සඳහා රු. 400,000,000/-ක සංස්ථාපිත ඇපයක් එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම විසින් ලබාදී ඇත. (2013: රු. 400,000,000/-)

හෙළදනව් සමාගම සඳහා ඉන්ධන මිලදී ගැනීමට පහසුකම් සැලසීමට රු.මිලියන 150 බැගින් වූ ආයතනික ඇපකර 2ක් සමූහයේ පරිපාලිතයන් වූ ලක්දනව් සමාගම විසින් සම්පත් බැංකුව සහ ජාතික සංවර්ධන බැංකුවට නිකුත් කරන ලදී.

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

2014 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා (සියළුම මූල්‍ය ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින්)

**33.4 කල්බදු බැඳීම් ක්‍රියාත්මක කිරීම - සමූහය කල්බදු ලබා ඇති කල්හී**

**සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම**

**ස්වභාවය**

ලංකා ඉන්ඩස්ට්‍රියල් එස්ටේට් සමාගම සමග දැනට ක්‍රියාත්මකව පවතින 30 අවුරුදු කල්බදු ගිවිසුමකට සමාගම අත්සන් තබා ඇත. එහි පැවැත්ම 1998 ජුනි 01 සිට 2028 මැයි 31 දක්වා වේ.

| | 2014 | 2013 |
|---|---|---|
| අවුරුද්දක් ඇතුළත | 12,230 | 12,230 |
| අවු 01 ට වැඩි අවු 05ට නොවැඩි | 36,689 | 48,919 |
| | 48,919 | 61,149 |

කල්බදු කුලී වසර 5කට වරක් අළුත් කරනු ලැබේ. එබැවින් ක්‍රියාත්මක වන කල්බදු බැඳීම 2013 ජුනි 30 දක්වා පමණක් ප්‍රකාශිතය.

**සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම**

සමාගම ඔවුන්ගේ බණ්ඩාරගම පිහිටි භූමිය හා පරිශ්‍රය ඇතුලත්ව වැද්දුම් හා සවිකිරීම් සඳහා සී/ස ඇන්ටි ලෙකෝ මිටරින් (පුද්ගලික) සමාගම සමග වාණිජ්‍ය කල්බදු ගිවිසුමකට ඇතුලත් වී ඇති අතර, මෙහි ඉතිරි අවුරුදු 9 ක කාලය සඳහා අවලංගු කළහැකි වගන්තියක් ඇතුලත් වේ.

ඉදිරියේදී බලාත්මක වන සේ කුලී ගාස්තු සංශෝධනය පිලිබඳ වගන්තියක් අවසන් කල්බදු වල අඩංගු වන අතර එය ඉදිරි කාලයේදී ලැබිය යුතු පවත්නා අවම කුලියට අදාලව උද්ධමන අනුපාතිකය මත පදනම් වේ. එය දෙසැම්බර් 31 දිනට අවලංගු කළහැකි කල්බදු ලෙස පහත පරිදි වේ.

| | 2014 | 2013 |
|---|---|---|
| අවුරුද්දක් ඇතුලත | 4,500 | 4,500 |
| අවුඃ 01ට වැඩි අවු 05ට නොවැඩි | 18,000 | 18,000 |
| අවුඃ 05ට වැඩි | 16,875 | 22,669 |
| | 39,375 | 45,169 |

අවම කල්බදු ගෙවීම සහ ගිවිසුමේ අඩංගු උද්ධමන ගැලපීම පමණක් හෙළිදරවු කිරීමේ වටිනාකම තුල අඩංගු වන අතර පුරෝකථනය කිරීමට නොහැකි වූ ඉදිරි උද්ධමන අනුපාතික මෙහි අන්තර්ගතව නොමැත.

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

**2014 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා** **(සියළුම මූල්‍ය ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින්)**

33.5 අනෙකුත් බැදීම්

ලක්දනවි සාමාගම

WCPL හි ණයගැතියන් මූල්‍යකරණයෙදී ඇතිවන වැරදි හෝ කෙරවලපිටිය බලශක්ති ව්‍යාපෘතියෙහි ඇති වන තාක්ෂණික දෝෂ වැනි වැරදි තිබුනද ලංවිම, WCPL හි ලාභාංශ ලැබීම වලට සමාන ලාභාංශ ප්‍රමාණයක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට බැදී සිටියි.

**(අ) ලංකා විදුලිබල මණ්ඩලය සමග බලශක්ති මිලට ගැනීමේ ගිවිසුම්**

අවම වශයෙන් සහතික වී ඇති විදුලිබල ප්‍රමාණය (MGEA) වන KWH 698,417,280 සැපයීමට සමාගමට නොහැකි වුවහොත්, ඌනතාවය අනුව

| ඌනතාවය | ඇවර කළ අලාභ ප්‍රමාණය |
|---|---|
| MGEA 10%ට වැඩි සහ MGEA 25% දක්වා | ධාරිතා අය කිරීම 15% |
| MGEA 25%ට වැඩි | ධාරිතා අය කිරීම 25% |

**(ආ) ලංකා ඛනිජ තෙල් සංස්ථාව සමග ඇති ඉන්ධන සැපයුම් ගිවිසුම**

සමාගම, සැපයුම් උපලේඛනය (වෙනස් වීමට යටත්) යටතේ ඉන්ධන භාර ගැනීමට අපොහොසත් වුවහොත් සහ / හෝ මෙම ගිවිසුම යටතේ බැදීම්වලට අනුකූල නොවුවහොත්, එම අපොහොසත් වීම හෝ නොහැකියාව හේතු කොට ගෙන සෘජුව හෝ විශේෂිතව සිදුවන පිරිවැය, වියදම්, හානි හා පාඩු සමාගම විසින් දින 30ක් ඇතුළත ගෙවිය යුතුය. කෙසේ වෙතත් මෙම ගිවිසුම යටතේ සමාගමේ වගකීම වර්ෂයකට USD 500,000කට සීමාකර ඇත.

ඉන්ධන සැපයුම් ගිවිසුමේ 3.5 (ඇ) වගන්තිය යටතේ පහත සඳහන් බැංකුවල ලංකා ඛනිජ තෙල් සංස්ථාව වෙනුවෙන් බැංකු ඇපකර සමාගම විසින් ස්ථාපනය කර ඇත.

| | |
|---|---|
| ජාතික සංවර්ධන බැංකුව | 300,000 |
| සම්පත් බැංකුව | 300,000 |

**( ඇ ) ලක්දනවි සමාගම සමග ඇති මෙහෙයුම් සහ නඩත්තු ගිවිසුම**

මෙම ගිවිසුම අනුව, නිම කළ අවසාන දිනයට පසු ගෙවිය යුතු ස්ථාවර ගාස්තුව වර්ෂයකට USD 625,000/- ක් වන අතර, එය මාසිකව වාරික ලෙස ගෙවනු ලැබේ. මෙම ගිවිසුම කල්පිරීමට පෙර අවසාන කළහොත් ඉතිරි කාල සීමාවේ එක් එක් ඉතිරි වර්ෂයට අතිරේක ඩොලර් 2,000,000/- ක් හෝ එම කාල සීමාවේ කොටසකට ප්‍රමාණානුකූලව සමාගම, ලක්දනවි සමාගමට ගෙවීමට බැදී සිටී.

විචල්‍ය ගාස්තුව ජනනය කළ ශුද්ධ බලශක්ති නිමැවුම මත පදනම් වේ.

(ඈ) සීමාසහිත එල්ටීඑල් ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගම සමග ඉන්ධන ප්‍රවාහන ගිවිසුම

කාල සීමාව තුළ දී ඉන්ධන ප්‍රවාහනය සඳහා එල්ටීඑල් ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගම සමග සමාගම ගිවිසුමකට එළඹෙන ලදී. ගිවිසුම ප්‍රකාරව, සැලැස්මේ දැක්වෙන බලශක්ති ජනනය ආරම්භ කළ දිනයේ සිට මාසයකට USD / 10,500 ක ස්ථාවර ගාස්තුවක් සමාගම ගෙවිය යුතුය.

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

**2014 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා** **(සියළුම මූල්‍ය ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින්)**

**34 සම්බන්ධිත පාර්ශ්ව හෙළිකිරීම්**

**34.1 මණ්ඩලය**

**34.1.1 ගිවිසුම්වලට අධ්‍යක්ෂවරුන්ගේ සබඳතා**

ඩබ්ලිව්. බී. ගනේගල මහතා 2013.03.01 දින සිට 2015.01.13 දින දක්වා ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපති දරමින් සිටින අතර ලංකා විදුලිබල මණ්ඩලයේ පරිපාලිත සමාගම් වන සී/ස ලංකා විදුලිය (පුද්ගලික) සමාගම, ලංකා ට්‍රාන්ස්ෆොමර් (පුද්ගලික) සමාගම, සී/ස ලංකා කෝල් (පුද්ගලික) සමාගම, ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම සහ බද්ධ ව්‍යාපාරයක් වන සී/ස ත්‍රිකුණාමලයේ පවර් (පුද්ගලික) සමාගම් හීද අධ්‍යක්ෂක ධුරය දරමින් සිටි.

මහාචාර්ය කේ. කේ. සී. කේ. පෙරේරා මහතා 2014.03.20.දින සිට 2015.01.09 දින දක්වා ලංකා විදුලිබල මණ්ලයේ උප සභාපති වරයෙකු හැටියට සේවය කරන ලදී.

කේ. අයි. ඩී. පී. කුලරත්න මහතා ක්‍රියාකාරී අධ්‍යක්ෂක වශයෙන් 2013.03.01 දින සිට 2015.01.12 දින දක්වා සේවය කරන ලද අතර ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂක ධුරයද දැරිය.

ඩබ්. ඩී. ජයසිංහ මහතා 2013.08.13 දින සිට 2014.06.22 දින දක්වා අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් සේවය කළ අතර විරිතමුල්ල මහතා සහ එම්. ටී. අයි. වී. අමරසේකර මහත්මිය පිළිවෙලින් 2013.03.01 දින සිට 2015.01.09 දින දක්වා සහ 2013.05.10 දින සිට 2015.01.23 දින දක්වා සේවය කරන ලදී.

පළාත් පාලන සහ ප්‍රාදේශීය සභා අමාත්‍ය ලේකම් ආර්. ඒ. ඒ. කේ. රණවක මහතා ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂක මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස 2013.03.06 දින සිට 2015.01.23 දින තෙක් ද ටී. ඩී. එස්. පී. පෙරේරා මහතා ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂක මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස 2014.07.02. දින සිට 2015.01.23 දින තෙක්ද පත් කරනා ලදී.

34.1.2 පහත සඳහන් ආශ්‍රිත සමාගම් සමඟ පහත සඳහන් ගනුදෙනු මණ්ඩලය විසින් සිදුකරන ලදී.

| | 2014 | 2013 |
|---|---|---|
| අ) භාණ්ඩ හා සේවා විකිණීම | | |
| විදුලිය විකිණුම - අධි සැපයුම ලෙකෝ | 24,825,526 | 25,663,119 |
| ආ) භාණ්ඩ හා සේවා මිලට ගැනීම | | |
| සීමාසහිත එල්ටීඑල් ට්‍රාන්ස්ෆෝමර්ස් (පුද්ගලික) සමාගම | 644,946 | 588,532 |
| සීමාසහිත එල්ටීඑල් ගැල්වනයිසර් (පුද්ගලික) සමාගම | 157,616 | 42,044 |
| සී/ස ඇන්ටි ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගම | 399,712 | 377,473 |
| සීමාසහිත නිවිදු (පුද්ගලික) සමාගම | - | 134,642 |
| සීමාසහිත නිවිදු ඇසුපිනෙල්ලා (පුද්ගලික) සමාගම | - | 195,877 |
| සී/ස ලංකා කෝල් (පුද්ගලික) සමාගම | 17,859,091 | 10,677,327 |

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

**2014 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා** **(සියළුම මූල්‍ය ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින්)**

**34.1.3 රජය සමග සහ රජය හා සම්බන්ධිත පාර්ශවයන් සමග ගනුදෙනු**

ලංකා විදුලිබල මණ්ඩලය ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් සෘජුවම පාලනය කරන හෙයින්, ශ්‍රී ලංකා ආණ්ඩුව ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් පාලනය කරනු ලබන්නා වූ ද, ඒකාබද්ධව පාලනය කරනු ලබන්නා වූ ද, සුවිශේෂී ලෙස බලපෑම් කරනු ලබන්නා වූ ද, ආණ්ඩුව සම්බන්ධිත වෙනත් ඒකකයන්, ශ්‍රී.ලං.ගි.ප්‍ර. 24 ," සම්බන්ධිත පාර්ශව හෙළිකිරීම්" වගන්තිය අනුව සම්බන්ධිත පාර්ශවයන් හැටියට ලංකා විදුලිබල මණ්ඩලය සැලකිල්ලට ගෙන ඇත.

ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකා ආණ්ඩුව සහ වෙනත් සම්බන්ධිත ඒකක සමග ගනුදෙනු, සැකසීම් සහ එකඟතාවලට එළඹෙන අතර සුවිශේෂී ගනුදෙනු පහත දැක්වෙන පරිදි වාර්තා කරනු ලැබේ

| | ගනුදෙනුවේ ස්වභාවය | 2014 | 2013 |
|---|---|---|---|
| ලංකා ඛනිජ තෙල් සංස්ථාව | ඉන්ධන මිලට ගැනීම | 46,581,657 | 29,425,498 |
| පොදු ව්‍යවසාය දෙපාර්තමේන්තුව | ව්‍යාපෘති ණය ලබා ගැනීම | 18,808,911 | 25,094,618 |
| මහජන බැංකුව | බැංකු ණය ලබාගැනීම | 17,000,000 | 37,000,000 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | බැංකු ණය ලබාගැනීම | 10,000,000 | - |

**34.1.4 ප්‍රධාන කළමනාකරණ පිරිස් සමග ගනුදෙනු**

වැදගත් සම්බන්ධිත පාර්ශ්වීය හෙළිකිරීම් පහත දැක්වේ.

(i) අධ්‍යක්ෂවරුන්ට ණය

මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන්ට ණය ලබා දී නැත.

(ii) ප්‍රධාන කළමනාකරණ පිරිස්වල පාරිශ්‍රමික

සමාගමේ ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා සමාලෝචිත වර්ෂය තුළ දරන්නට සිදු වූ පාරිශ්‍රමිකය රු.2,224,000/- (201 - රු. 2,270,000/-) ක් වේ.

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

2014 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා (සියළුම මූල්‍ය ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින්)

**34.2 සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම**

වැදගත් සම්බන්ධිත පාර්ශවීය හෙළිකිරීම් පහත දැක්වේ.

**34.2.1 පරිපාලක සහ සම්බන්ධිත ඒකක සමග ගනුදෙනු**

| | සමාගමේ නම සහ සම්බන්ධය | | | | | |
|---|---|---|---|---|---|---|
| | ලංවිම පරිපාලක සංවිධානය | | LTL ESOT වෙනත් සම්බන්ධිතයන් | | LTL ESOT LTD ඒකකය කෙරෙහි සුවිශේෂ බලපෑම් | |
| | 2014 | 2013 | 2014 | 2013 | 2014 | 2013 |
| **ගනුදෙනුවේ ස්වභාවය** | | | | | | |
| **ජනවාරි 01 වන දිනට** | 449,333 | 1,653,822 | (477,648) | (55) | - | 54,000 |
| භාණ්ඩ හා සේවා විකිණීම | 14,110,069 | 2,366,406 | - | - | - | - |
| හෙළදනවී සමාගමෙන් ආරම්භක ලැබියයුතු දෑ | 3,435,647 | - | - | - | - | - |
| ප්‍රකාශිත ලාභාංශ | (315,000) | (1,259,748) | (136,908) | (678,008) | (135,050) | (593,892) |
| EPC විකුණුම් | 55,699 | 820,929 | - | - | - | - |
| හිලව් කළ අත්තිකාරම් | (8,943) | 25,637 | - | - | - | - |
| ගෙවූ ලාභාංශ | - | 1,259,748 | - | 200,360 | - | 539,892 |
| වර්ෂය තුළ ලැබීම් | (14,956,671) | (4,417,462) | 477,648 | 55 | - | - |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | 2,770,134 | 449,332 | (136,908) | (477,648) | (135,050) | - |

**පරිපාලක සංවිධානය**

සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගමෙහි සාමාන්‍ය කොටස් 63% (2013 - 63%) ක් ලංවිම සතුය.

**සමාගම කෙරෙහි සුවිශේෂී බලපෑමක් ඇති ඒකකය**

සීමාසහිත එල්ටීඑල් එම්ප්ලෝයීස් ෂෙයර්ස් ඕනර්ෂිප් ට්‍රස්ට් ලිමිටඩ්, එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගමෙහි සාමාන්‍ය කොටස් 27% (2013 - 27%) ක් අයත් වේ. ඔවුනට ඒකකයේ මූල්‍ය සහ මෙහෙයුම් ප්‍රතිපත්ති තීරණ වලට සහභාගීවීමේ බලයක් ඇත.

**වෙනත් සම්බන්ධිත ඒකකයන්**

සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගමෙහි ආස්ථිතියෙහි සාමාන්‍ය කොටස් 10% (2013 - 10%)ක් එල්ටීඑල් සේවක කොටස් හිමිකාරිත්වය සතුය.

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

**2014 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා** **(සියළුම මූල්‍ය ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින්)**

**34.2.2 ශ්‍රී ලංකා රජය සහ රජය සම්බන්ධිත ඒකකයන් සමග ගනුදෙනු**

සමූහයෙහි පරිපාලක සංවිධානය සෘජුවම ශ්‍රී ලංකා රජය විසින් පාලනය කරන හෙයින්, ශ්‍රී ලංකා රජය ද, ශ්‍රී ලංකා රජය විසින් පාලනය කරන, ඒකාබද්ධව පාලනය කරන, සුවිශේෂි ලෙස බලපෑම් කරන රජය සම්බන්ධිත ඒකක, ශ්‍රී.ලං.ගි.ප්‍ර. 24 "සම්බන්ධිත පාර්ශව හෙළිකිරීම" අනුව සම්බන්ධිත පාර්ශ්ව හැටියට සමූහය සැලකිල්ලට ගනී.

සමූහය ශ්‍රී ලංකා රජය සහ එහි වෙනත් සම්බන්ධිත ඒකක සමග ගනුදෙනු විධිවිධාන ගිවිසුම් ආදියට එළඹෙයි. ඒවා අතුරෙන් සුවිශේෂී ගනුදෙනු පහත දැක්වේ.

| | ගනුදෙනුවේ ස්වභාවය | 2014 | 2013 |
|---|---|---|---|
| ලංකා ඛනිජ තෙල් සංස්ථාව | ඉන්ධන මිලට ගැනීම | 4,310,589 | 3,894,113 |
| මහජන බැංකුව | ආයෝජන | 1,716,586 | 1,759,877 |
| ලංකා බැංකුව | ආයෝජන | 3,280,055 | 3,096,305 |
| හැටන් නැෂනල් බැංකුව | ආයෝජන | 3,044,003 | 3,328,937 |

තවදුරටත් ශ්‍රී ලංකා රජය හා ඊට සම්බන්ධිත පාර්ශවයන්ට අයත් සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු හා සම්බන්ධ පහත ඇති විස්තරාත්මක ගනුදෙනු ඇතුලත් කරන ලදී.

අදායම් බදු දෙපාර්තුමේන්තුවට සහ රේගු දෙපාර්තුමේන්තුවට කළ ව්‍යවස්ථාපිත ගෙවීම. බදු හා තීරුබදු

දුරකථන,විදුලිය හා ජලය යන උපයෝගිතාවයන් අයත් වූ ගෙවීම්.

සේවක විශ්‍රාමික ප්‍රතිලාභ සේ.අ.අ. සහ සේ.භා.අ. සදහා කළ ගෙවීම්.

ශ්‍රී ලංකා රක්ෂණ නීති ගත සංස්ථාවේ රක්ෂණ වාරික සදහා කළ ගෙවීම්.

**34.2.3 සමාගමේ හෝ මවු සමාගමේ ප්‍රධාන කළමනාකරණ සේවක පිරිස සමග ඇති ගනුදෙනු**

ව්‍යාපාරික කටයුතු සැලසුම් කිරීම, සංවිධානය හා මෙහයවීම හා සම්බන්ධික අධිකාරිය සහ වගකීම් දරණ පුද්ගලයන් ප්‍රධාන කළමනාකරණ සේවක පිරිස ලෙස හදුන්වයි. මෙවැනි ප්‍රධාන කළමනාකරණ සේවක පිරිස අතර අධක්ෂක මණ්ඩල සාමාජිකයින්, මවු සමාගමේ අධක්ෂක මණ්ඩල සාමාජිකයින් සහ ප්‍රධාන විධායක නිලධාරීන් අඩංගුය. මොවුන් හා මොවුන්ගේ සමීප සාමාජිකයන්ගේ යම් ගණුදෙනු පවතීද එම ස්වාධීන ගණුදෙනු හා සම්බන්ධ තොරතුරු පහත හෙළිදරව් කිරීම්වල අඩංගුවේ

**අ) ප්‍රධාන කළමනාකරණ පිරිස සඳහා වන්දි**

| | 2014 | 2013 |
|---|---|---|
| කෙටි කාලීන සේවක ප්‍රතිලාභ | 38,615 | 33,000 |
| පසු සේවා රැකියා ප්‍රතිලාභ | 3,981 | 4,775 |
| | 42,596 | 37,775 |

ඉහත සඳහන් වන්දි ගෙවීමට අමතරව සමාගම කළමනාකරණ පිරිස් වලට මුදල් නොවන ප්‍රතිලාභ එම පිරිස් සමග අත්සන් තබන සේවා ගිවිසුම් මගින් සපයනු ලැබේ.

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

2014 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා (සියළුම මූල්‍ය ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින්)

**34.3 සීමාසහිත ලංකා විදුලිබල සමාගම (පුද්ගලික)**

සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම් පිළිබඳ සුවිශේෂී විස්තර පහත දැක්වේ.

**34.3.1 සමාගම පහත සඳහන් ආශ්‍රිත සමාගම් සමග පහත සඳහන් ගනුදෙනු සිදු කළේය.**

| | පරිපාලක සමාගම ලංකා විදුලිබල මණ්ඩලය | | වෙනත් ප්‍රමුඛ කොටස් හිමියෝ / මහා භාණ්ඩාගාරය | | පරිපාලිත සමාගම් සහ වෙනත් ආශ්‍රිත සමාගම් | |
|---|---|---|---|---|---|---|
| | 2014 | 2013 | 2014 | 2013 | 2014 | 2013 |
| ජනවාරි 01වන දිනට ශේෂය | (1,202,326) | 1,909,314 | 56,027 | 132,593 | 99,310 | 121,296 |
| විදුලි බලය මිලට ගැනීම | (20,050,127) | (20,520,953) | - | - | - | - |
| විදුලි බලය සඳහා ගෙවීම | 23,817,792 | 17,695,919 | - | - | - | - |
| ADB ණය ආපසු ගෙවීම | - | (575,000) | (56,027) | (76,566) | - | - |
| ගත් ණය සඳහා පොලිය | - | - | 5,351 | 15,329 | - | - |
| උපචිත වියදම් | (307,288) | (1,011,606) | - | - | - | - |
| පොලී ගෙවීම | - | - | (5,351) | (15,329) | - | - |
| ප්‍රකාශිත ලාභාංශ | - | - | (28,054) | - | - | - |
| ගෙවූ ලාභාංශ | - | - | 28,054 | - | - | - |
| භාණ්ඩ විකිණීම | - | - | - | - | 211,737 | 189,184 |
| භාණ්ඩ මිලදී ගැනීම | 24,462 | - | - | - | (248,599) | (211,170) |
| මුලික ණය වාරික ලැබීම | (1,560,000) | - | - | - | - | - |
| ලං.වි.ම. ට දුන් ණය | - | 1,300,000 | - | - | - | - |
| ලැබියයුතු ණය පොලිය | 389,545 | - | - | - | - | - |
| ණය පොලිය ලැබීම් | (359,933) | - | - | - | - | - |
| දෙසැම්බර් 31ට ශේෂය | 752,125 | (1,202,326) | - | 56,027 | 62,448 | 99,310 |

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

2014 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා (සියළුම මූල්‍ය ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින්)

**34.3.2 ශ්‍රී ලංකා රජය සහ රජය සම්බන්ධිත ඒකකයන් සමග ගනුදෙනු**

ලංකා විදුලිබල මණ්ඩලය ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් සෘජුවම පාලනය කරන හෙයින්, ශ්‍රී ලංකා ආණ්ඩුව ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් පාලනය කරනු ලබන්නා වූ ද, ඒකාබද්ධව පාලනය කරනු ලබන්නා වූ ද, සුවිශේෂී ලෙස බලපෑම් කරනු ලබන්නා වූ ද, ආණ්ඩුව සම්බන්ධිත වෙනත් ඒකකයන්, ශ්‍රී.ලං.ගි.ප්‍ර. 24," සම්බන්ධිත පාර්ශව හෙළිකිරීම්" වගන්තිය අනුව සම්බන්ධිත පාර්ශවයන් හැටියට ලංකා විදුලිබල මණ්ඩලය සැලකිල්ලට ගෙන ඇත.

සමූහය ශ්‍රී ලංකා ආණ්ඩුව සහ වෙනත් සම්බන්ධිත ඒකක සමග ගනුදෙනු, සැකසීම් සහ එකඟතාවලට එළඹෙන අතර සුවිශේෂී ගනුදෙනු පහත දැක්වෙන පරිදි වාර්තා කරනු ලැබේ.

| | ගනුදෙනුවේ ස්වභාවය | 2014 | 2013 |
|---|---|---|---|
| භාණ්ඩාගාරයෙන් ලබාදුන් පාලක ණය | ණය සහ ලැබියයුතු දෑ | 570,000 | 570,000 |
| මහජන බැංකුව | තැන්පතු | 162,847 | 151,046 |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | ආයෝජන සහ සේවකයන්ට ලබාදුන් ණය | 55,521 | 54,580 |

තවදුරටත් ශ්‍රී ලංකා රජය හා ඊට සම්බන්ධිත පාර්ශවයන්ට අයත් සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු හා සම්බන්ධ පහත ඇති විස්තරාත්මක ගනුදෙනු ඇතුලත් කරන ලදී.

මහජන බැංකුව හා ලංකා බැංකුව සමග බැංකු ගණුදෙනු පවත්වාගෙන යාම හා නඩත්තුව

ව්‍යවස්ථාපිත ගෙවීම්, බදු හා තීරුබදු ගෙවීම්

සේවක විශ්‍රාම පාරිතෝෂික, EPF සහ ETF ගෙවීම.

දුරකථන, විදුලිය හා ජලය යන උපයෝගිතාවයන් අයත් වූ ගෙවීම්.

ශ්‍රී ලංකා රක්ෂණ නීති ගත සංස්ථාවේ මෝටර්රථ වාහන රක්ෂණ වාරික සඳහා කළ ගෙවීම්.

**34.3.3 සමාගම පරිපාලක ආයතනය හෝ සමාගමේ ප්‍රධාන කළමනාකරණ පිරිස් සමග කළ ගනුදෙනු**

සමාගම එහි පරිපාලක සංවිධානයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් සහ සාමාන්‍යාධිකාරී ඇතුළු අංශ ප්‍රධානීන් ද ප්‍රධාන කළමනාකරණ පිරිස් හැටියට නිර්වචනය කිරීමට සමාගම තීරණය කර ඇත.

| **ප්‍රධාන කළමනාකරණ පිරිස සඳහා වන්දි** | 2014 | 2013 |
|---|---|---|
| අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු සහ කෙටි කාලීන ප්‍රතිලාභ | 1,316 | 536 |
| වෙනත් ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා පාරිශ්‍රමික | - | - |
| **ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා වන්දි ගෙවීම්වල එකතුව** | 1,316 | 536 |

# විගණකාධිපති වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ඊඑච්/ඒ/සීඊබී/එෆ්ඒ/2014
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2016 අප්‍රේල් 20 දින

සභාපති,

ලංකා විදුලිබල මණ්ඩලය

ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන හා ලංකා විදුලිබල මණ්ඩලයේ සහ එහි පරිපාලිත සමාගම්වල 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

2014 දෙසැම්බර් 31 දිනට ලංකා විදුලිබල මණ්ඩලයේ (ලංවිම) හා එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශන, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලංකා විදුලිබල මණ්ඩලයේ (ලංවිම) මූල්‍ය ප්‍රකාශන හා ලංකා විදුලිබල මණ්ඩලයේ හා එහි පරිපාලිත සමාගම්වල ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1969 අංක 31 දරන පනතින් සංශෝධිත 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 49(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. පරිපාලිතයන්හි මූල්‍ය ප්‍රකාශන අදාළ පරිපාලිතයන්හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගම් විසින් විගණනය කරන ලදි. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රීලංගිප්‍ර/ ජාමුවාප්‍ර) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ.එම අවදානම් තක්සේරුකිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

# විගණකාධිපති වාර්තාව

ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2 මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

(අ) තත්ත්වාගණනය කළ මතය - මණ්ඩලය

මෙම වාර්තාවේ 2.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

(ආ) තත්ත්වාගණනය කළ මතය - සමූහය

මෙම වාර්තාවේ 2.2 හා 2.3 ඡේදවල දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ලංකා විදුලිබල මණ්ඩලයේ (CEB) සහ එහි පරිපාලිතයන්හි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 2.2 සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

මණ්ඩලයේ පරිපාලිත සමාගම්වල විගණිත මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම්වලට ගෙන තිබුණි. එම පරිපාලිත සමාගම්වල නම් සහ මණ්ඩලයේ අයිතිය පහත දැක්වේ.

| පරිපාලිතයේ නම | අයිතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|
| සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම | 63 |
| සීමාසහිත ලංකා කෝල් (පුද්ගලික) සමාගම | 60 |
| සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම | 55.2 |
| සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජිස් (පුද්ගලික) සමාගම | 100 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගමේ පරිපාලිතයක් වන සීමාසහිත හෙළදනව් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගමේ 2014 වර්ෂය සඳහා විගණිත මූල්‍ය ප්‍රකාශනවල අවධාරණය කර තිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමාසහිත ලංකා කෝල් (පුද්ගලික) සමාගමේ විගණිත මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ මාස 09 ක ප්‍රමාදයක් සහිතව 2015 දෙසැම්බර් 28 දින දීය. විගණකවරුන් විසින් පහත සඳහන් කරුණු අවධාරණය කර ඇත.

(i) ප්‍රමාණවත් ලිඛිත සාක්ෂි නොමැති වීම හේතුවෙන් එකතුව රු.මිලියන 502.9 ක් වූ වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ශේෂ විගණනයේදී සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

(ii) ප්‍රමාණවත් ලිඛිත සාක්ෂි නොමැති වීම හේතුවෙන් එකතුව රු.මිලියන 809.7 ක් වූ වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂ හා රු.මිලියන 16.9 ක් වූ ලැබිය යුතු බදු පිළිබඳ නිරවද්‍යතාවය, අයකර ගැනීමේ හැකියාව හා සම්පූර්ණත්වය විගණනයේදී තහවුරු කළ නොහැකි විය. තවද දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් එවන ලද රු. මිලියන 152.5 ක් වූ අතිරේක තක්සේරු කිරීම් පිළිබඳ දැන්වීම් ලිපි සම්බන්ධයෙන් සමාගම අදාළ පියවරයන් ගෙන තිබුණේද යන්න තහවුරු කර ගත නොහැකි විය.

# විගණකාධිපති වාර්තාව

(iii) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ශේෂය සමග ආරම්භක ශේෂය නොගැලපෙන බැවින් 2014 ජනවාරි 01 දිනට රු.මිලියන 63 ක් වූ ආදායම් බදු වගකීම පිළිබඳ නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කළ නොහැකි විය.

## 2.3 මණ්ඩලයේ (ලං වි ම) මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.3.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී ලං ගි ප්‍ර/ ශ්‍රී ලං මූ වා ප්‍ර) සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **ශ්‍රී ලං ගි ප්‍ර 01, මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ ශ්‍රී ලං ගි ප්‍ර 16, දේපල, පිරියත හා උපකරණ** - මණ්ඩලය එහි ප්‍රධාන හා නඩත්තු කාර්යයන් අගය කිරීම සඳහා තථ්‍ය රේටයන් වෙනුවට සම්මත රේටයන් යොදා ගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස එකතුව රු.5,923,454,349 ක් වූ ශුද්ධ ද්‍රව්‍ය මිල විචලනය, ශ්‍රම රේට විචලනය හා පොදු කාර්ය විචලනය ඉහත ප්‍රමිතියේ විධිවිධානවලට පටහැනිව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය නිශ්චය කර ගැනීමේදී ගිණුම්ගත කර තිබුණි. තවද තථ්‍ය රේටයන් වෙනුවට සම්මත රේටයන් යොදා ගැනීම මඟින් මණ්ඩලයේ ප්‍රධාන හා නඩත්තු කාර්යයන් අගය කිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල පහත සඳහන් විෂයයන්ද අඩුවෙන් හෝ වැඩියෙන් දක්වා තිබුණි. විස්තර පහත දැක්වේ.

| ගිණුම් විෂයය | වැඩියෙන් දක්වා ඇති මුදල<br>රු.මිලියන | අඩුවෙන් දක්වා ඇති මුදල<br>රු.මිලියන |
|---|---|---|
| වර්ෂය සඳහා ලාභය හා සමාලෝචිත වර්ෂය අවසානයට ස්කන්ධය | 561 | - |
| දේපල, පිරියත හා උපකරණ | 4,324 | 7.2 |

(ආ) **ශ්‍රී ලං ගි ප්‍ර 08, ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් හා දෝෂ** - 2011 වර්ෂයේදී රු.මිලියන 9.4 කින් වැඩියෙන් ඇස්තමේන්තු කර තිබූ උපචිත විදුලි සංදේශ වියදම ප්‍රමිතියේ දක්වා ඇති පරිදි අතීතානුයෝගීව රඳවා ගත් ඉපැයුම් ශේෂයේ යළි දැක්වීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේ ආදායමට සටහන් කර තිබුණි.

(ඇ) **ශ්‍රී ලං ගි ප්‍ර 19, සේවක ප්‍රතිලාභ** - පාරිතෝෂික ප්‍රතිලාභ ගෙවීම මත පැනනගින අනාගත වගකීම් වෙනුවෙන් පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන මණ්ඩලය විසින් ආයෝජනය කළ යුතු වුවද, මේ සම්බන්ධයෙන් මණ්ඩලය විසින් ප්‍රමාණවත් ආයෝජනයන් පවත්වා ගෙන නොතිබුණි.

මීට අමතරව විගණනය විසින් කරන ලද ගණනය කිරීම්වලට අනුව, 2014 වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගත් විශ්‍රාම වියදම්වලට අදාළව ප්‍රවර්තන සේවා පිරිවැය, පොළී පිරිවැය හා ආයෝජන මත ප්‍රතිලාභ රු.641,107,797 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) **ශ්‍රී ලං ගි ප්‍ර 20, රජයේ ප්‍රදාන සඳහා ගිණුම් තැබීම සහ රජයේ ආධාර හෙළිදරව් කිරීම** - ග්‍රාමීය විදුලි බලය ලබා දීමේ වැඩසටහන් ඇතුළත් විදුලිබලය උත්පාදනය, සම්ප්‍රේෂණය හා බෙදාහැරීම් වැඩසටහන් සඳහා මණ්ඩලයට ලැබුණු විදේශ ආධාර හා ප්‍රාග්ධන ප්‍රදාන, දීර්ඝ කාලයක් දායක ප්‍රාග්ධනය ලෙස සලකා තිබුණද එම ප්‍රදාන කිහිපයක් මහා භාණ්ඩාගාරය විසින් ප්‍රාග්ධන දායකය ලෙස සලකා නොතිබුණි. තවද මහා භාණ්ඩාගාරය විසින් පිළියෙල කරන ලද 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, මණ්ඩලය සඳහා මුළු ප්‍රාග්ධන දායකය රු.බිලියන 258 ක් විය. කෙසේ වුවද එය මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල රු.බිලියන 289 ක් ලෙස දක්වා තිබුණි. රු.බිලියන 31 ක වෙනස සැසඳීම සඳහා පියවර ගෙන නොතිබුණි.

(ඉ) **ශ්‍රී ලං ගි ප්‍ර 39, මූල්‍ය උපකරණ, හඳුනාගැනීම හා මැනීම** - කලාප 02 සහ 03 හි සැපයුම්කරුවන් සඳහා ගෙවිය යුතු මුදල තහවුරු කර ගැනීම සඳහා සම්මත මිල යොදා ගැනීම ප්‍රමිතියේ විධිවිධානවලට අනුකූල නොවීය. එහි ප්‍රතිඵලයක් ලෙස 2014 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ ජංගම වගකීම් රු.මිලියන 88.2 කින් වැඩියෙන් දක්වා තිබුණි.

### 2.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව, විශේෂ අවස්ථා සඳහා ආලෝකය සැපයීම සම්බන්ධයෙන් එවකට විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුදල රු.9,394,437 ක බැර ශේෂයක් වූ අතර ලබා ගත හැකි වූ තොරතුරු මත විගණනය විසින් සිදුකරන ගණනය කිරීම් අනුව ලැබිය යුතු තථ්‍ය මුදල රු.1,065,998 ක් විය. එබැවින් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වෙනත් ණයගැතියන් රු.10,460,435 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) එක් එක් අංශ අතර මාරු කරන ලද දේපල, පිරියත හා උපකරණ (දේ.පි.උ) වටිනාකම මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල ශුන්‍ය අගයක් විය යුතුය. කෙසේ වුවද 2014 වර්ෂය තුළ අභ්‍යන්තර මාරු කිරීම්, පිටතට මාරු කිරීම් හා කෙරීගෙන යන වැඩ වෙනත් අංශ වලට මාරු කිරීම්වලට අදාළව රු.296,060,351 ක නොසැසඳු වෙනස්කම් නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක්

# විගණකාධිපති වාර්තාව

ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන හා 2014 දෙසැම්බර් 31 දිනට අන්තර් අංශ ජංගම ගිණුම් සැසඳුම් ප්‍රකාශනයේ දැක්වෙන දේපල, පිරියත හා උපකරණවල නිරවද්‍යතාවය සහ විශ්වාසදායී බව විගණනයේදී තහවුරු කළ නොහැකි විය.

(ඇ) රු.1,782,778,237 ක් හා රු.1,093,769,100 ක් වූ පිළිවෙලින් පොදු කාර්ය අයකිරීම් හා ශ්‍රම රේට විචලනය සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහය තහවුරු කර ගැනීමේදී ගිණුම්වලට ගෙන නොතිබුණි. එබැවින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දැක්වෙන මෙහෙයුම් කාර්යයන්ගෙන් ජනිත වූ මුදල් රු.2,876,547,337 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සත්‍යාපනයේදී හානි වූ තොග ලෙස හඳුනාගන්නා ලද එකතුව රු.මිලියන 33.3 ක් වූ තොගවල වටිනාකම, සත්‍යාපනයේදී යොදාගන්නා ලද ප්‍රතිපත්ති පිළිබඳ අසංගතභාවය හේතුවෙන් ගිණුම්වල ගලපා නොතිබුණි. එබැවින් වත්කම් හා හිමිකම් සමාන මුදලකින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) පුත්තලම ගල් අඟුරු විදුලි බල පිරියත අදියර II හා III මෙහෙයුම් සමාලෝචිත වර්ෂයේ පිළිවෙලින් මාර්තු සහ සැප්තැම්බර් මාස වල ක්‍රියාත්මක කර තිබුණි. කෙසේ වුවද ඒ සඳහා දරන ලද රු. මිලියන 115,068.23 ක මුළු පිරිවැය ප්‍රාග්ධනිත කිරීමෙන් තොරව කෙරීගෙන යන වැඩ ගිණුමේ පැවතුණි.

එමෙන්ම 2014 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 131 ක පිරිවැයකට නිම කරන ලද විදුලි බල කාර්යයන් 178 ක් මණ්ඩලයේ දේපල, පිරියත හා උපකරණ ලෙස ගිණුම්ගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන දේපල, පිරියත හා උපකරණ වටිනාකම සහ ඒ සඳහා ක්ෂය වෙන්කිරීම අඩුවෙන් දක්වා තිබූ අතර කෙරීගෙන යන වැඩ වටිනාකම එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) තවද උත්පාදන අංශයට අයත් සහ දැනටමත් මෙහෙයුම් ආරම්භ කරන ලද පහත සඳහන් පුනරුත්ථාපන ව්‍යාපෘති සඳහා දරන ලද පිරිවැය ප්‍රාග්ධනිත කරනු වෙනුවට 2014 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබුණි. විස්තර පහත දැක්වේ.

| ව්‍යාපෘතියේ නම | වටිනාකම<br>රු | නිම කළ දිනය |
|---|---|---|
| විමලසුරේන්ද්‍ර හා නව ලක්ෂපාන පුනරුත්ථාපන ව්‍යාපෘතිය | 8,217,944,865 | 2014 අගෝස්තු 20 |
| පැරණි ලක්ෂපාන පුනරුත්ථාපන ව්‍යාපෘතිය | 4,704,222,351 | 2014 අප්‍රේල් 03 |
| | 12,922,167,216 | |

(උ) ලක්විජය විදුලිබල පිරියතෙහි ජැටිය හා වරායෙහි ආර්ථිකමය ප්‍රයෝජනවත් ජීව කාලය පිළිවෙලින් වර්ෂ 100 ක් හා වර්ෂ 30 ක් විය. එසේ වුවද ඒවා තනි වත්කම් ලෙස මණ්ඩලය සලකා තිබූ අතර ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල ඒ සඳහා ක්ෂය ප්‍රතිපාදනය කර තිබුණි.

එමෙන්ම මණ්ඩලයට අනුව, ඉහත විදුලිබල පිරියත යටතේ "සුපවයිසරි කන්ට්‍රෝල් ඩේටා ඇක්විෂිසන්" (SCDA) සහ "ඩී එෆ් ආර්" පද්ධතිවල (DFR Systems) ආර්ථිකමය ප්‍රයෝජනවත් ජීව කාලය වර්ෂ 15 කි. කෙසේ වුවද පිරියතෙහි (තාප) ආර්ථිකමය ප්‍රයෝජනවත් ජීව කාලය වර්ෂ 25 ක් විය.

ඉහත අඩුපාඩු හේතුවෙන්, දේපල පිරියත හා උපකරණවල 2014 දෙසැම්බර් 31 දිනට ක්ෂය සහ ධාරණ අගය රු.58,721,367 කින් හා රු.176,134,102 කින් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) ලක්විජය විදුලිබල මධ්‍යස්ථානයේ (LVPS) ගබඩාවල උපකරණ හා අමතර කොටස් වටිනාකම භෞතිකව පරීක්ෂා කර ගිණුම්ගත කර නොතිබුණි. කෙසේ වුවද විදේශ මුදල් වටිනාකමින් හඳුන්වා දී තිබූ එම විෂයයන්ගෙන් කොටසක් 2014 දෙසැම්බර් 31 දිනට පවතින රේටයට රුපියල්වලට පරිවර්තනය කිරීමේදී එය රු.මිලියන 115 ක් බව නිරීක්ෂණය විය.

(එ) 2013 අප්‍රේල් 20 සිට බලපැවැත්වෙන පරිදි ලංකා විදුලිබල මණ්ඩලය සමග වූ ගිවිසුම අනුව ලංකා ඛනිජ තෙල් සංස්ථාව විසින් හිඟ ශේෂය මත පොලී ලෙස අයකර තිබූ රු.මිලියන 753.6 ක මුදලක් ගිණුම්ගත කර නොතිබුණි. ඊට අමතරව ලංකා ඛනිජ තෙල් සංස්ථාවට ගෙවිය යුතු රු. 1,467,800 ක මුදලක් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ඒ) කැළණිතිස්ස විදුලිබල පිරියතෙන් (AES Kelanitissa Power Plant) 2014 දෙසැම්බර් 31 දිනට වර්ෂ 3 කට වැඩි කාලයක් අයකිරීමෙන් තොරව පැවතුණු රු.මිලියන 1,368.9 ක් වූ ලැබිය යුතු ශේෂයක් ලංකා ඛනිජ තෙල් සංස්ථාවෙන් ලැබිය යුතු ශේෂයක් ලෙස සාවද්‍යව ගිණුම්ගත කර තිබුණි.

(ඔ) වර්ෂය අවසාන තොග ශේෂය සත්‍යාපනය සම්බන්ධයෙන් ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගමක් විසින් ඉදිරිපත් කරන ලද තොග සත්‍යාපන වාර්තාවට අනුව වාලච්චේන හි විශාල නඩත්තු ගබඩාවල රු.මිලියන 100.1 ක තොග ඌනතාවයක් තිබූ අතර පසුව එය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන තොගයට ගලපා තිබුණි.

# විගණකාධිපති වාර්තාව

කෙසේ වුවද විගණන වාර්තාවේ වාර්තා කරන ලද තොග ඌනතාවය නිවැරදි නොවන බව අනාවරණය විය. එබැවින් 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන තොග සමාන මුදලකින් අඩුවෙන් දක්වා තිබුණි.

## 2.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන බෙදාහැරීම් කලාප 01,02,03 සහ 4 හි වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂ පිළිවෙලින් රු. මිලියන 1,787.4 ක්, රු. මිලියන 206 ක්, රු. මිලියන 182.7 ක් හා රු. මිලියන 23 ක් වර්ෂ 3 කට වැඩි කාලයක් අයකර ගැනීමෙන් තොරව හිඟ හිට පැවතුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට වර්ෂ 2 කට වැඩි කාලයක් හිඟ හිට පැවති රු.මිලියන 440.6 ක තොග සැපයුම් ණයගැති ශේෂය හා එකතුව රු. මිලියන 1,492 ක සාමාන්‍ය සැපයුම් ණයගැති ශේෂ අයකර ගැනීමට මණ්ඩලය විසින් විධිමත් පියවර ගෙන නොතිබුණි.

(ඇ) 2014 දෙසැම්බර් 31 දිනට වර්ෂ 05 කට වැඩි කාලයක් හිඟ හිට පැවති ලංකා ඛනිජ තෙල් සංස්ථාවට (CPC) ගෙවිය යුතු රු. මිලියන 7 ක ශේෂය සම්ප්‍රේෂණ අංශයේ ණයහිමි ශේෂය තුළ ඇතුළත් වී තිබුණි. තවද සපුගස්කන්ද හරහා දිවෙන 132 කි.වො සම්ප්‍රේෂණ රැහැන වෙනත් ස්ථානයකට මාරු කිරීම සඳහා ලංකා ඛනිජ තෙල් සංස්ථාව විසින් 1997 මැයි 26 දින ලංකා විදුලිබල මණ්ඩලයට මෙම මුදල ගෙවා තිබුණි. මෙම කාර්යය 2014 දෙසැම්බර් 31 දින වන විටත් නිමකර නොතිබූ අතර මෙම මුදල නිරවුල් කිරීම සඳහා කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඈ) වෙස්ට් කෝස්ට් විදුලිබල පිරියත සඳහා ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම, වෙස්ට් කෝස්ට් විදුලිබල පිරියත විවෘත කිරීමේ උත්සවය සඳහා ගෙවූ හා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SEA) යටතේ කුඩා ජල විදුලිබල සංවර්ධකයින්ට ගාස්තු ගැලපීම සඳහා ගෙවූ එකතුව රු. මිලියන 911.4 ක මුදලක් කිසිදු අයකිරීම් ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් තොරව 2014 දෙසැම්බර් 31 දිනට වර්ෂ 5 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි.

(ඉ) වර්ෂ 5 කට වැඩි කාලයක් ලංකා විදුලි සමාගමෙන් (LECO) ලැබිය යුතු රු.මිලියන 12.9 ක් සම්බන්ධයෙන් විධිමත් පියවර ගෙන නොතිබුණි. තවද කලාප 02 හි වර්ෂ 05 කට වැඩි කාලයක් හිඟ හිට පැවති රු.මිලියන 7.6 ක් වූ අවසන් ගිණුම් ශේෂය සහ "අත්හිටුවීම" (Abeyance) ලෙස වාර්තා කරන ලද රු. මිලියන 13.6 ක් අයකර ගැනීම සඳහා මණ්ඩලය විසින් පසු විපරම් කටයුතු සිදු කර නොතිබුණි.

(ඊ) "නිකුත් කිරීම්" ලෙස නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කාර්යාලයේ (WPS 01) විවිධ ණයගැතියන්හි ඇතුළත් රු.මිලියන 18.9 ක මුදලක් අසාමාන්‍ය ස්වරූපයේ විය.

## 2.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඌව පළාත් කාර්යාලයට අයත් රු. මිලියන 38 ක් වටිනා ඉඩම් 12 ක ඉඩම් ඔප්පු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) වත්කම් යටතේ ඇතුළත් කරන ලද රු. 14,238,758 ක් වටිනා මෝටර් වාහන 08 ක් මණ්ඩලයේ භෞතිකව නොතිබූ බව නිරීක්ෂණය විය.

## 2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) 1969 අංක 17 දරන ලංකා විදුලි බල මණ්ඩල පනත

(i) **47(1)(ආ) වගන්තිය** - මෙම වගන්තියේ විධිවිධාන අනුව, මණ්ඩලය විසින් ලබාගන්නා ලද ණය ආපසු ගෙවීමට අදාළව මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරය සමඟ නිදන් අරමුදලක් ස්ථාපිත කර පවත්වා ගත යුතුය. ඒ අනුව ණය නිදහස් කිරීමේ සංචිතයක් ස්ථාපිත කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද, එය 2000 වර්ෂයේ සිට යාවත්කාලීන කර නොතිබුණි. 2014 දෙසැම්බර් 31 දිනට එම සංචිත ගිණුමේ ශේෂය රු.මිලියන 17,447 ක් විය.

(ii) **47(2)(අ) වගන්තිය** - මණ්ඩලයේ චංචල හා නිශ්චල දේපලවල ක්ෂය ආවරණය කර ගැනීම සඳහා මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරය සමඟ ක්ෂය සංචිතයක් ස්ථාපිත කර පවත්වා ගත යුතුය. කෙසේ වුවද එම අවශ්‍යතාවයට පටහැනිව, 2000 දෙසැම්බර් 31 දක්වා වාර්ෂිකව රු.මිලියන 1 ක් මාරු කිරීම මඟින් මණ්ඩලය විසින් එහි මූල්‍ය ප්‍රකාශනවල ක්ෂය සංචිතයක් ඇති කර තිබූ අතර ඉන්පසු කිසිදු ප්‍රතිපාදනයක් සිදු කර නොතිබුණි. එදිනට සමුච්චිත ශේෂයක්ව පැවති රු.මිලියන 23 ක

# විගණකාධිපති වාර්තාව

මුදල කිසිදු සමාලෝචනයකින් තොරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩව ඉදිරියට ගෙනැවිත් තිබුණි.

(iii) 47 (2) (ආ) **වගන්තිය** - මණ්ඩලයේ මූල්‍ය ස්ථාවරත්වය තහවුරු කර ගැනීම සඳහා හා මණ්ඩලය විසින් වරින්වර තීරණය කරනු ලබන වෙනත් එවැනි අරමුණු සඳහා ආදායම් මුදල්වලින් ප්‍රාග්ධන වැඩ සඳහා මූල්‍යයනය කිරීමේ අරමුණින් මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරය සමඟ එක්ව පොදු සංචිතයක් ස්ථාපිත කර පවත්වා ගත යුතුය. කෙසේ වුවද එම අවශ්‍යතාවයට පටහැනිව මණ්ඩලය විසින් එහි මූල්‍ය ප්‍රකාශනවල වෙනත් ප්‍රාග්ධන සංචිතයක් ස්ථාපිත කර තිබූ නමුත් 2000 වර්ෂයේ සිට එය යාවත්කාලීන කර නොතිබුණි. 2014 දෙසැම්බර් 31 දිනට එම සංචිත ගිණුමේ ශේෂය රු.මිලියන 165.45 ක් විය.

(ආ) ඉහත පනතේ 46 වගන්තියේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටසේ 11 (අ) හා (ආ) වගන්තිවල විධිවිධානවලට පටහැනිව මණ්ඩලය විසින් 1989 වර්ෂයේ සිට එක් එක් වර්ෂය අවසානයේදී දළ ස්ථාවර වත්කම් මුළු වටිනාකමින් සියයට 0.1 ක දායකයක් පදනම් කරගෙන 2014 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 5,654 ක් වූ එහි අරමුදල් ඉන්ෂුවරන්ස් එස්ක්‍රෝ අරමුදලේ ආයෝජනය කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මණ්ඩලයේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළදී මණ්ඩලයේ හා සමූහයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය පිළිවෙලින් රු. මිලියන 12,446 ක හා රු. මිලියන 6,223 ක බදු පූර්ව ශුද්ධ පාඩුවක් වූ අතර එයට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ ලාභය පිළිවෙලින් රු. මිලියන 22,265 ක් හා රු. මිලියන 25,121 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ පිළිවෙලින් රු. මිලියන 34,711 ක හා රු. මිලියන 31,344 ක පිරිහීමක් දැක්වුණි.

ජල විදුලිබල උත්පාදන ජලාශවල අඩු ජල මට්ටමක් පැවතීම හේතුවෙන් 2013 වර්ෂයේ ජල විදුලිබල උත්පාදනය ගි.වො.පැ. 6,906 ට සාපේක්ෂව 2014 වර්ෂයේදී ජල විදුලිබල උත්පාදනය ගි.වො.පැ. 2,372 කින් හෙවත් සියයට 34 කින් අඩු වී තිබීම නිසා ගි.වො.පැ. 459 ක වැඩි වූ ඉල්ලුම සපුරා ගැනීම සඳහා ස්වාධීන විදුලිබල නිෂ්පාදකයින්ගෙන් හා සීමාසහිත ලංකා කෝල් (පුද්ගලික) සමාගමෙන් පිළිවෙලින් රු. මිලියන 37,997 ක සහ රු. මිලියන 6,354 ක තාප හා ගල් අඟුරු උත්පාදනය මිලදී ගැනීම නිසා වියදම වැඩිවීම මෙම පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ) මූල්‍ය තත්ත්වය

ලබාගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්වය පිළිබඳ විශේෂිත තත්ත්වයන් පහත වගුවෙන් දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනට | | |
|---|---|---|---|
| **විෂයය** | **2014**<br>**රු . මිලියන** | **2013**<br>**රු. මිලියන** | **විචලනය**<br>**ප්‍රතිශතය %** |
| ජංගම නොවන වත්කම් | 693,166 | 656,000 | 6 |
| ජංගම වත්කම් | 76,494 | 93,435 | (18) |
| මුළු වත්කම් | 769,660 | 749,435 | 3 |
| ජංගම බැරකම් | 82,309 | 92,698 | (11) |
| **කාරක ප්‍රාග්ධනය** | (5,815) | 737 | (889) |
| යෙද වූ මුළු ප්‍රාග්ධනය | 687,351 | 656,737 | 5 |
| ජංගම - නොවන බැරකම් | 307,329 | 430,008 | (29) |
| **හිමිකම්** | 380,022 | 226,729 | 68 |

සමාලෝචිත වර්ෂයේ මුළු වත්කම් පෙර වර්ෂයට සාපේක්ෂව 3% කින් වැඩි වී තිබුණි. මේ අතර පෙර වර්ෂයේ රු. මිලියන 737 ක ධන අගයක් වූ ශුද්ධ ජංගම වත්කම් වලට සාපේක්ෂව 2014 වර්ෂයේදී එය රු. මිලියන 5,815 ක සෘණ අගයක් බවට පත් වී තිබුණු අතර සියයට 889 ක අඩුවීමක් එයින් නියෝජනය විය. ජංගම වත්කම් අඩුවීම සඳහා ණය අයකර ගැනීමේ ක්‍රියාවලිය වැඩිවීම පමණක් නොව වැඩ පූර්ව අත්තිකාරම් අයකර ගැනීමද ප්‍රධාන හේතුව විය.

2014 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ මුළු ප්‍රාග්ධන යෙදවුම්වලින් සියයට 32 ක් හෙවත් රු.බිලියන 220 ක් ණය ගැනීම් මගින් මූල්‍යයනය කර තිබූ අතර පෙර වර්ෂයේ ණය ගැනීම් කොටස සියයට 54 ක් විය.

# විගණකාධිපති වාර්තාව

(ආ) මුළු විස්තීර්ණ ලාභය / (පාඩුව) විශ්ලේෂණය

විදුලි බල මිලදී ගැනුම් ගිවිසුම්වල කොන්දේසි ප්‍රකාරව, ප්‍රමාණවත් ජල විදුලි බල උත්පාදනයක් තිබෙන අවස්ථාවකදී වුවද, ස්ථාවර පිරිවැය දැරීම වැළැක්විය නොහැක. එහි ප්‍රතිඵලයක් ලෙස සාමාන්‍ය මහජනතාව සඳහා අඩු පිරිවැයකට විදුලිබල ඒකකයක් සැපයීම සඳහා වූ එහි ඉතා වැදගත් අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වූ තත්ත්වයක් මණ්ඩලයට නොතිබුණි. 2013 වර්ෂයේ ඒකක පිරිවැය වූ රු.16.94 ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඒකක පිරිවැය රු. 19.97 ක් වූ අතර එක් ඒකකයක් විකුණු මිල රු.18.50 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා ගණනය කරන ලද මෙහෙයුම් පාඩුව පහත පරිදි වේ.

| වර්ගය | ලාභය/ (පාඩුව) රු.මිලියන | ලාභය/ (පාඩුව) සඳහා දායකය ප්‍රතිශතය% |
|---|---|---|
| ගෘහස්ථ | (16,140) | (111) |
| ආගමික | (809) | (06) |
| පොදු කාර්යයන් | 17,687 | 122 |
| කර්මාන්ත | (11,295) | (77) |
| රජය | (135) | (1) |
| හෝටල් | 60 | 0 |
| වීථි අලෝකකරණය | (2,152) | (15) |
| ලං වි ස සඳහා විකුණුම් | (1,820) | (12) |
| මුළු විස්තීර්ණ පාඩුව | (14,604) | 100 |

ඒ අනුව මණ්ඩලයේ පාඩුවට එරෙහිව වැඩිම ධනාත්මක දායකය සපයා තිබුණේ පොදු කාර්යයන් හා හෝටල් අංශයන්ය. ගෘහස්ථ හා කර්මාන්ත අංශයන් සඳහා ගාස්තු එම අංශයන්හි පාඩුව දැරීම සඳහා වැඩිම ඍණාත්මක දායකය වූ අතර එහි මුළු දායකය 188% ක් විය. ලංකා විදුලි සමාගමට විකුණුම්ද මණ්ඩලයේ පාඩුව සඳහා අහිතකර දායකයක් දක්වා තිබූ අතර එය පාඩුවෙන් 12%ක දායකයක් විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### (අ) විදුලිබල උත්පාදනය හා ඍජු පිරිවැය

සමාලෝචිත වර්ෂය තුළ විදුලිබල උත්පාදනය සහ විදුලිබල උත්පාදනය හා විදුලිබල මිලදී ගැනුම් සඳහා දරන ලද ඍජු පිරිවැය පිළිබඳ සාරාංශය පෙර වර්ෂය සමඟ සසඳා පහත වගුවලින් දැක්වේ.

(i) විදුලිබල උත්පාදනය

| ප්‍රභවය | වර්ෂය තුළ විදුලිබල උත්පාදනය | | වැඩිවීම/ (අඩුවීම) | |
|---|---|---|---|---|
| | 2014 | 2013 | | |
| | ගි වො පැ | ගි වො පැ | ගි වො පැ | ප්‍රතිශතය |
| ජල විදුලි | 4,534 | 6,906 | (2,372) | (34) |
| තාප | 4,305 | 3,260 | 1,045 | 32 |
| ගල් අඟුරු | 3,202 | 1,469 | 1,733 | 118 |
| සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති | 315 | 263 | 52 | 20 |
| එකතුව | 12,356 | 11,898 | 458 | 4 |

(ii) විදුලිබල උත්පාදනය හා විදුලිබලය මිලදී ගැනීම සඳහා දරන ලද ඍජු පිරිවැය

| විෂයය | දරන ලද ඍජු පිරිවැය | | | |
|---|---|---|---|---|
| | 2014 | | 2013 | |
| | රු. මිලියන | ප්‍රතිශතය | රු. මිලියන | ප්‍රතිශතය |
| ඉන්ධන | 46,582 | 22 | 29,425 | 18 |
| විදුලිබල මිලදී ගැනුම් | 101,149 | 48 | 80,308 | 48 |
| ගල් අඟුරු | 17,031 | 8 | 10,677 | 6 |
| මෙහෙයුම් හා නඩත්තු | 24,913 | 12 | 26,196 | 16 |
| ක්ෂය | 21,174 | 10 | 20,319 | 12 |
| එකතුව | 210,849 | 100 | 166,925 | 100 |

# විගණකාධිපති වාර්තාව

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

* 2014 හා 2013 වර්ෂ සඳහා පිළිවෙලින් සියයට 78 ක් හා සියයට 72 ක් වූ මුළු මෙහෙයුම් පිරිවැය විදුලිබල මිලදී ගැනුම් හා උත්පාදනය සඳහා සෘජුවම අදාළ වූ බව අනාවරණය විය.

* සමාලෝචිත වර්ෂය තුළ සියයට 26 කින් සෘජු පිරිවැය වැඩි වී තිබුණද පෙර වර්ෂය සමග සැසඳීමේදී විදුලිබල උත්පාදනය වැඩි වී තිබුණේ සියයට 4 කින් පමණක් විය.

(ආ) විදුලිබල ඒකකයක් සඳහා ලාභය/ (පාඩුව)

පසුගිය වර්ෂ 5 තුළ එක් විදුලිබල ඒකකයක් විකිණීමෙන් ලැබුණු සාමාන්‍ය ලාභය/ (පාඩුව) පහත වගුවෙන් දැක්වේ. පෙර වර්ෂයේ එක් ඒකකයකින් ලාභය රු. 2.22 ක් වූ අතර එයට ප්‍රතිරූපීව ප්‍රවර්තන වර්ෂයේ එක් ඒකකයකට වාර්තා වූ පාඩුව රු.1.47 ක් බව අනාවරණය විය.

| වර්ෂය | සාමාන්‍ය විකුණුම් මිල කි වො පැ 1 කට රු. | සාමාන්‍ය පිරිවැය කි වො පැ 1 කට රු. | එක් ඒකකයකට ලාභය/ (පාඩුව) රු. |
|---|---|---|---|
| 2014 | 18.50 | 19.97 | (1.47) |
| 2013 | 17.93 | 15.71 | 2.22 |
| 2012 | 15.66 | 21.50 | (5.84) |
| 2011 | 13.22 | 15.59 | (2.37) |
| 2010 | 13.16 | 13.02 | 0.14 |
| 2009 | 13.13 | 14.71 | (1.58) |

## 4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

### 4.2.1 ලක් විජය විදුලි බලාගාරයේ මෙහෙයුම්

මේ සම්බන්ධයෙන් පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(i) ගල් අඟුරු තොග මට්ටම්, එනම් යළි ඇණවුම් මට්ටම, උපරිම තොග මට්ටම, අවම තොග මට්ටම, යළි ඇණවුම් ප්‍රමාණය ආදිය දක්වමින් ලක් විජය විදුලි බලාගාරය විසින් තොග ලේඛන පවත්වා නොතිබුණි. තවද පහත දැක්වෙන අඩුපාඩු හේතුවෙන් ගල් අඟුරු මෙහෙයවීම සඳහා පවත්වා තිබූ පොත් හා වාර්තාවල නිරවද්‍යතාවය හා විශ්වාසදායී බව තහවුරු කළ නොහැකි විය.

* ගල් අඟුරු තුළු මුව (intake) ගණනය කිරීම් විශ්වාසදායී නොවීම.

* පිරියත සඳහා විශ්වාසදායී යෙදවුම් ක්‍රමාංකනයක් නොතිබීම.

* නැවෙන් බෑමේදී සීමාසහිත ලංකා කෝල් (පුද්ගලික) සමාගම (LCC) හෝ ලංකා විදුලිබල මණ්ඩලය විසින් නියාමනය සිදු කර නොතිබීම.

* ඉංජිනේරුවන්ගේ පාලනයට යටත්ව ගබඩාකරු විසින් තොග පාලනය කරනු වෙනුවට වාර්තා සටහන් කිරීමේ කාර්යයක් පමණක් සිදුකර තිබීම.

(ii) සමාලෝචිත වර්ෂයේ පළමු මාස නවය තුළදී භාවිතා කළ ගල් අඟුරු මෙට්රික් ටොන් 181,016 ක් තොග වාර්තාවලට ගෙන නොතිබූ බව අනාවරණය විය.

(iii) ලක් විජය විදුලි බලාගාරයේ ගල් අඟුරු අංගණයේ පවත්නා ගබඩා ධාරිතාවය මෙට්රික් ටොන් 738,720 ක් විය. මාසික සාමාන්‍ය ගල් අඟුරු පරිභෝජනය මෙට්රික් ටොන් 195,000 ක් වන හෙයින් මෙම තොග අංගණය මාස 3.788 ක අවශ්‍යතාවයට පමණක් ප්‍රමාණවත් වේ. කෙසේ වුවද සෑම වර්ෂයකම අප්‍රේල් සිට සැප්තැම්බර් දක්වා (මාස 6 ක්) මෝසම් සුළං කාලය වන බැවින්, අහිතකර කාලගුණ තත්ත්වය හා මුහුදේ තත්ත්වය හේතුවෙන් ගල් අඟුරු බෑමට නොහැකි වේ. එබැවින් කාල පරිච්ඡේදය සඳහා වන මුළු ගල් අඟුරු අවශ්‍යතාවය ගබඩා කිරීම සඳහා ප්‍රමාණවත් ගබඩා ධාරිතාවයක් නොතිබුණි.

(iv) පුද්ගලික සමාගමක් විසින් 2014 දෙසැම්බර් 31 දිනට ගල් අඟුරු තොගය භෞතිකව සත්‍යාපනය කර තිබුණු අතර එම සමාගම විසින් නිකුත් කරන ලද වාර්තාවට අනුව, රු.මිලියන 375.5 ක් වටිනා ගල් අඟුරු මෙට්රික් ටොන් 32,323 ක අතිරික්තයක් සත්‍යාපනය සිදුකරන ලද කණ්ඩායම විසින් හඳුනාගෙන තිබුණි. කෙසේ වුවද ගල් අඟුරු මෙහෙයුම්වල අඩුපාඩු හේතුවෙන් එකී අතිරික්තය ගිණුම්ගත කර නොතිබුණි.

# විගණකාධිපති වාර්තාව

(V) විගණනය විසින් කරන ලද ගණනය කිරීම් අනුව, විදුලිබලය උත්පාදනය සඳහා නිකුත් කරන ලද ගල් අඟුරු ප්‍රමාණය හා 2014 වර්ෂය තුළ විදුලිබලය උත්පාදනය සඳහා පරිභෝජනය කල යුතු වූ ගල් අඟුරු ප්‍රමාණය අතර රු.මිලියන 2,144 ක වෙනසක් නිරීක්ෂණය විය.

4.2.2 ගල් අඟුරු ප්‍රසම්පාදනයේ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) නැව්ගත කිරීම් 3 ක් මත ලැබුණු ගල් අඟුරු දළ තාපජනක වටිනාකම (Gross Calorific Value) පිරියතෙහි සම්මත අගයන්ට වඩා අඩු වී තිබුණි. එබැවින් පටවන වරායේ සැපයුම්කරුගේ තත්ත්ව පරීක්ෂක විසින් නිකුත් කරන ලද වාර්තාව නිවැරදි නොවන අතර එම පරීක්ෂකවරයා ඉන්දියානු අධිකරණය මගින් අසාධුලේඛනගත කර තිබූ බවද තවදුරටත් නිරීක්ෂණය විය.

(ආ) දළ තාප ජනක වටිනාකම අඩු ගල් අඟුරු පරිභෝජනය හේතුවෙන් දළ තාප ජනක වටිනාකම (Gross Calorific Value) අඩු ගල් අඟුරු මෙට්‍රික් ටොන් 143,932 ක්වූ තොගය දහනයෙන් හා මෙගා වොට් 25 ක විදුලිබල ඌනතාවය සඳහා අතිරේකව වෙනත් විකල්ප බලශක්ති ප්‍රභවයන්ගෙන් සැපයීම නිසා ලංකා විදුලිබල මණ්ඩලයට රු. 345,168,000 ක පාඩුවක් දැරීමට හා රු. මිලියන 507.6 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි.

(ඇ) නැව්ගත කිරීම් අංක 16 හා 17 ට අදාළව මාස 06 ක් තුළ මෙට්‍රික් ටොන් 29,896 ක කෙටි සැපයීම් සඳහා ලංකා කෝල් සමාගම හා ලංකා නැව් සංස්ථාව (CSC) එකඟ වී තිබුණද, 2012 අප්‍රේල් 04 කෙටි සැපයීම් දින සිට එසේ සිදු කිරීමට ඔවුන්ට නොහැකි වී තිබුණි. කෙටි සැපයීමක වටිනාකම රු. මිලියන 654.2 ක් විය.

තවද, ඔවුන්ට කරන ලද වැඩිපුර ගෙවීම අයකර ගැනීමට ලංකා විදුලිබල මණ්ඩලය විසින් 2014 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු පියවරක් ගෙන නොතිබූ අතර බැංකු අයිරා පොලිය පදනම්ව ප්‍රාග්ධනය වෙන්කර තැබීමේ ඇස්තමේන්තුගත ආවස්ථික පිරිවැය රු.මිලියන 228.9 ක් විය.

(ඈ) පිරියත සඳහා නිර්දේශිත වටිනාකමට අඩු දළ තාපජනක වටිනාකම සහිත ගල් අඟුරු යොදා ගැනීමේදී, එම පිරියත දෝෂ වගකීම් කාලයට යටත් හෙයින් උපදේශකවරයාගෙන් හෝ නිෂ්පාදකවරයාගෙන් ඒවා යොදා ගැනීම පිළිබඳව උපදෙසක් සාමාන්‍යාධිකාරී විසින් ලබා ගත යුතුය. කෙසේ වුවද අදාළ නිලධාරීන්ගෙන් එවැනි උපදෙසක් ලබාගැනීම පිළිබඳව විගණනයේදී නිරීක්ෂණය නොවිය. තවද 2012 දෙසැම්බර් 21 දිනැති නීතිපතිවරයාගේ ලිපිය මගින් උපදෙස් ලබා දුන් පරිදි සාවද්‍ය තීරණවලට එළඹි පාර්ශවයන්ගෙන් මණ්ඩලය විසින් දරන ලද පාඩුව අයකර ගැනීමට ලංකා විදුලිබල මණ්ඩලය විසින් 2015 ජුලි මස අවසානය වන විටත් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඉ) ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලය හා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සම්මත ප්‍රසම්පාදන කමිටුව විසින් ලංසුකරුවන් දෙදෙනෙකුගේ මිල වෙනස්කිරීම් මත ගන්නා ලද සාවද්‍ය තීරණවල ප්‍රතිඵලයක් ලෙස ගල් අඟුරු සැපයීම සඳහා නුසුදුසු සැපයුම්කරුවකු තෝරා ගෙන තිබූ අතර ඒ සඳහා මණ්ඩලයට රු.මිලියන 263.5 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි.

(ඊ) ලංකා විදුලිබල මණ්ඩලය හා ලංකා කෝල් සමාගම අතර එළඹි ගිවිසුම් අනුව, ගල් අඟුරු බර තැබීම් පිරිවැය තීරණය කිරීම ලංකා කෝල් සමාගමේ ගිණුම සඳහා විය. ගල් අඟුරු බර තීරණය කිරීම සඳහා ලංකා කෝල් සමාගම විසින් පුද්ගලික සමාගමක් තෝරා ගෙන තිබුණි. එහෙත් ලංකා කෝල් සමාගම විසින් තෝරා ගැනීම සිදුකර තිබූ හෙයින් එම සමාගමේ ස්වාධීනත්වය ප්‍රශ්නගත වේ. කෙසේ වුවද ගල් අඟුරු මෙහෙයුම්වලට අදාළව ලංකා කෝල් සමාගමේ සියලුම වියදම් ලංකා විදුලිබල මණ්ඩලයෙන් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි. මේ අතර බර තීරණය කිරීම සඳහා සහතිකය ඍජු සනාථ කිරීමක් ලෙස ලංකා විදුලිබල මණ්ඩලයට යවනු නොලැබේ.

(උ) ගල් අඟුරු අංගණයේ ගල් අඟුරු තොග හෝ නැවේදී ගල් අඟුරු තොග භෞතිකව සත්‍යාපනය කිරීමට ගල් අඟුරු තොග මැනීම සඳහා ජාත්‍යන්තරව භාවිතා කරන ක්‍රමෝපාය හෝ ශිල්පීය ක්‍රම ලංකා විදුලිබල මණ්ඩලය විසින් අනුගමනය කර හෝ හඳුනාගෙන නොතිබුණි.

එහි ප්‍රතිඵලයක් ලෙස, පැටවීමේ හා බෑමේ වරායන්හිදී ලංකා නැව් සංස්ථාව සහ ස්වාධීන මැනීම් නියෝජිතයෙකු විසින් කරන ලද මැනීම් භාරගැනීම පිළිබඳ නිරවද්‍යතාවය හා විනිවිදභාවය පිළිබඳ විගණනයේදී විශ්වාසදායීව පිළිගත නොහැකි විය. තවද බර කිරන යන්ත්‍රය (Weight Bridge) නිරවද්‍ය නොවන බවත්, එය අලුත්වැඩියා කිරීම සඳහා හෝ ගල් අඟුරුවල බර නිරවද්‍යව මැනීම සඳහා මණ්ඩලය විසින් විකල්ප ක්‍රමවේදයක් භාවිතා කිරීමට කටයුතු කර නොතිබූ බවත් විගණනයේදී නිරීක්ෂණය විය. එබැවින් ඉන්වොයිස් කරන ලද ප්‍රමාණය හා බෑමේ ප්‍රමාණයන් අතර සැලකිය යුතු වෙනස්කම් තිබුණි. ඉන්වොයිස් කරන ලද ප්‍රමාණය මණ්ඩලයේ තොග වාර්තාවලට ගෙන තිබූ බැවින් ගල් අඟුරු තොගයේ ප්‍රමාණය හා වටිනාකමේද නිරවද්‍යතාවය සැකසහිත විය.

(ඌ) සාමාන්‍යයෙන් ගල් අඟුරු ප්‍රසම්පාදනය සඳහා ඉදිරිපත් කරන ව්‍යාපාරික ඉන්වොයිසි පදනම් කරගෙන ලංකා විදුලිබල

# විගණකාධිපති වාර්තාව

මණ්ඩලය විසින් ණයවර ලිපි වටිනාකම ලංකා කෝල් සමාගමට ගෙවනු ලැබේ. බොහෝ අවස්ථාවලදී එම වටිනාකම් තථ්‍ය ඉන්වොයිස් මුදලට වඩා වැඩි වී තිබුණි. තවද වැඩිපුර ගෙවන ලද මුදල් නිරවුල් කිරීම සඳහා ලංකා කෝල් සමාගම විසින් සැලකිය යුතු දීර්ඝ කාලයක් ගෙන තිබුණි. උදාහරණයක් ලෙස අංක 43 හා 44 දරන නැව්ගත කිරීම් සඳහා වැඩිපුර ගෙවන ලද මුදල නිරවුල් කිරීමට පිළිවෙලින් දින 196 ක් හා දින 171 ක් ගෙන තිබුණි. වර්ෂයකට සියයට 14 ක රේටයක් වූ බැංකු අයිරා පොලිය මත පදනම්ව නිරවුල් නොකරන ලද වැඩිපුර ගෙවීම සඳහා ගණනය කරන ලද ප්‍රාග්ධනය වෙන් කර තැබීමේ, ආවස්ථික පිරිවැය රු. මිලියන 6.7 ක් විය.

(එ) 2014 සැප්තැම්බර් 10 සිට 2015 අප්‍රේල් 29 දක්වා කාලය සඳහා ඇස්තමේන්තුගත ගල් අඟුරු අවශ්‍යතාවය මෙට්‍රික් ටොන් 2,170,000 ක් විය. එසේ වුවද ලංකා කෝල් සමාගම මෙට්‍රික් ටොන් 1,859,738 ක් පමණක් සපයා තිබූ හෙයින්, මෙට්‍රික් ටොන් 310,262 ක ගල් අඟුරු ප්‍රමාණයක ඌනතාවයක් විය. එබැවින් පිරියතෙහි සම්පූර්ණ ධාරිතාවය මෙහෙයුම් කළ නොහැකි වූ අතර උපරිම විදුලිබල ප්‍රමාණයද උත්පාදනය කළ නොහැකි විය. එබැවින් ක්‍රියාකාරී දින 113 කට සමාන කි.වො.පැ 807,974,993 ක්, මණ්ඩලයට අහිමි වී තිබුණු අතර ලක්විජය විදුලිබල මධ්‍යස්ථානය හරහා බෙදා නොහැරීම හේතුවෙන් ඒකක වර්ධක පිරිවැය කි වො පැ 1/ රු. 18 ක් වේ. එබැවින් මුළු පාඩුව රු.මිලියන 14,543.5 ක් විය.

(ඒ) 2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතන චක්‍රලේඛයේ 4.2 මාර්ගෝපදේශයට හා 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛයට අනුව, විධිමත් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර වාර්ෂිකව අනුමත කර ගත යුතුය. කෙසේ වුවද මණ්ඩලයේ පහසු මෙහෙයුම් කටයුතු හා මූල්‍ය කටයුතු තහවුරු කර ගැනීම සඳහා එවැනි ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඔ) ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විධිමත් ක්‍රියාත්මක වීමක් තහවුරු කර ගැනීම සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල විකුණුම් පිරිවැය යටතේ ගිණුම්ගත කරන ලද රු. 15,697,500,000 ක් වටිනා ලංසු 03,04 හා 05 ට අදාළව ලංසු ලැබීමේ ලැයිස්තුව, ලංසු විවෘත කිරීම පිළිබඳ සටහන්, තාක්ෂණික ඇගයීම් වාර්තා, ප්‍රසම්පාදන කමිටු වාර්තා ආදී විස්තර විගණනයට ඉදිරිපත් කිරීමට ලංකා කෝල් සමාගමට නොහැකි වී තිබුණි.

4.2.3 විදුලිබලය තොග සැපයුම සඳහා ඇප තැන්පතු

මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) තොග පාරිභෝගිකයන්ගේ ණය අවදානම අවම කිරීම සඳහා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කාර්යාලයේ (බස්නාහිර පළාත දකුණ) විදුලිබල තොග පාරිභෝගිකයින් 123 දෙනෙකුට අදාළව වටිනාකම රු.මිලියන 45.7 කට ඇප තැන්පතු ලබාගෙන නොතිබූ බව විගණන නියැදි පරීක්ෂණවලට අනුව අනාවරණය විය. 2014 දෙසැම්බර් 31 දිනට එම පාරිභෝගිකයන්ගෙන් හිඟ හිටි ශේෂය රු. මිලියන 89.1 ක් විය.

(ආ) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කාර්යාලයේ (බස්නාහිර පළාත දකුණ - 1) තොග පාරිභෝගිකයින් 568 දෙනෙකු විසින් පවත්වා ගෙන යන වර්තමාන ඇප තැන්පතු වටිනාකම, වර්තමාන ප්‍රතිපත්තිය අනුව පවත්වා ගත යුතු වටිනාකමට වඩා රු.මිලියන 848.4 කින් අඩු වී තිබුණි. 2014 දෙසැම්බර් 31 දිනට එම පාරිභෝගිකයින්ගෙන් ඇප තැන්පතුව ඉක්ම වූ හිඟ මුදල රු.මිලියන 413.5 ක් විය.

(ඇ) අක්‍රීය ලෙස (අයකර ගත නොහැකි) දැනටමත් හඳුනාගෙන ඇති ගිණුම් අයත් ගනුදෙනුකරුවන් 15 දෙනෙකුගෙන් හිඟ රු.මිලියන 3.2 ක් වූ මුදලක් ප්‍රමාණවත් ඇප තැන්පතු නොවීම හේතුවෙන් බොහෝ දුරට මණ්ඩලයට පාඩුවක් විය හැකිය.

4.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.2 ඡේදයට අනුව, සියලුම රාජ්‍ය ව්‍යවසායයන් සියලුම ප්‍රධාන මෙහෙයුම්, ආවරණය කර, ක්‍රමානුකූලව සංශෝධනය කර හා යාවත්කාලීන කර ස්වකීය පද්ධති/ අත්පොත් තබා ගත යුතුය. කෙසේ වුවද 1987 වකවානුවේදී පිළියෙල කරන ලද මණ්ඩලයේ පරිපාටි සංග්‍රහයන් මණ්ඩලය විසින් සංශෝධනය කර යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) 2014 වර්ෂය තුළ විදේශ පුහුණුව සඳහා විදේශගත වූ නිලධාරීන්ට මණ්ඩලය විසින් රු.839,800 කට සමාන එජඩො 6,460 ක මුදලක් ගෙවා තිබුණු අතර 2015 සැප්තැම්බර් 14 වන විටත් එය අයකරගෙන නොතිබුණි.

(ඇ) 2014 දෙසැම්බර් 31 දිනට වර්ෂ 4 කට වැඩි කාලයක් නැගෙනහිර පළාතේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කාර්යාලයේ පැවති හානි වූ තොග ලෙස හඳුනාගත් රු. 8,632,412 ක් වටිනා තොග අපහරණය කිරීමට මණ්ඩලය විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඈ) වටිනාකම රු. 125,248,220 ක් වටිනා විදුලිබල කාර්යයන් 118 ක්, එම කාර්යයන් කාර්යක්ෂම ආකාරයෙන් නිම කිරීමට සුදුසු

# විගණකාධිපති වාර්තාව

ක්‍රියාමාර්ග ගැනීමෙන් තොරව වර්ෂ 05 කට වැඩි කාලයක් කෙරීගෙන යන වැඩ ලෙස පැවතුණි.

(ඉ) ලංකා ඛනිජතෙල් සංස්ථාව විසින් සපයන ලද රු. 9,159,247 ක් වටිනා හිඟ ඉන්ධන සැපයීම සම්බන්ධයෙන් වූ කරුණ 2014 දෙසැම්බර් 31 වන විටත් විසඳා ගෙන නොතිබුණි.

(ඊ) නොරච්චෝලෙයි ධීවරයන් සමග ගැටුම අවම කරගැනීමට අදාළව පුත්තලම කලපුව හරහා සම්ප්‍රේෂණ රැහැන් ඇදීම සඳහා පළාත් පාලන ආයතන හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අත්තිකාරම් ලෙස ගෙවන ලද රු. 103,491,574 ක මුදලක් ප්‍රාග්ධනීත කිරීමේ අරමුණ සහිතව කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්වල හඳුනාගෙන තිබුණි. එහෙත් මෙම වියදම්වල සාධාරණත්වය, විනිවිදභාවය හා ගණන් දීමේ වගකීම තහවුරු කරගැනීමට කිසිදු සාක්ෂියක් හෝ ප්‍රභව ලියවිල්ලක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ඉන් එම ආයතනයන්ට ලබාදෙන ලද රු. 18,391,574 ක මුදලක් ඒවා ලබාදෙන ලද අරමුණ සඳහා භාවිතා කිරීමෙන් තොරව 2015 ජුනි 25 දිනට මාස 06 කට වැඩි කාලයක් බැංකු ජංගම ගිණුම්වල නිෂ්කාර්යව පැවතුණි. එබැවින් එම ගෙවීම්වල තථ්‍ය අවශ්‍යතාවය විගණනයේදී සැක සහිත වේ.

(උ) 2003 හා 2009 වර්ෂවලදී සිදු වූ සිවිල් ගැටුම් හේතුවෙන් හානි වූ මණ්ඩලයට අයත් වත්කම්වලට ආදේශ කිරීම සඳහා රක්ෂණ සංචිත ගිණුමේ ආයෝජනයෙන් රු. මිලියන 1,324.9 ක මුදලක් ආපසු ලබාගෙන තිබුණි. එම වත්කම් ආදේශ කිරීම සඳහා දරන ලද පිරිවැය රු. මිලියන 1,261.2 ක් වුවද, වැඩියෙන් ආපසු ලබා ගන්නා ලද රු. මිලියන 63.7 ක මුදල යළි ආයෝජනය කිරීම සඳහා 2014 දෙසැම්බර් 31 දක්වාත් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

තවද, වැඩිපුර ආපසු ලබා ගන්නා ලද තථ්‍ය මුදල යළි ආයෝජනය කිරීමේ අරමුණ සඳහා ආදේශ කරන ලද වත්කම් සඳහා දරන ලද පිරිවැයෙහි ඇතුළත් මිල විචලනය, වෙනම හඳුනාගෙන නොතිබුණි.

(ඌ) ගල් අඟුරු නැව්ගත කිරීම්වලට අදාළව ජෙටි මෙහෙයුම් කටයුතුවල අකාර්යක්ෂමතාවය හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ ලංකා විදුලි බල මණ්ඩලය විසින් ගෙවන ලද මුළු ප්‍රමාද ගාස්තු රු. මිලියන 27.4 ක් වූ අතර ගෙවිය යුතු තථ්‍ය මුදල තක්සේරු කිරීමෙන් තොරව සීමාසහිත ලංකා කෝල් (පුද්ගලික) සමාගම විසින් කරන ලද ඉල්ලීම පරිදි ප්‍රමාද ගාස්තු සඳහා අත්තිකාරම් ලෙස රු. මිලියන 182 ක මුදලක් තවදුරටත් ගෙවා තිබුණි. මේ අතර විගණනය විසින් කරන ලද ගණනය කිරීම් අනුව එම කාල පරිච්ඡේදය සඳහා ගෙවිය යුතු මුදල රු. මිලියන 47.8 ක් විය. එවැනි අන්දමේ පාඩු අවම කරගැනීම සඳහා විධිමත් පියවරක් ගෙන නොතිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය.

## 4.4 නිෂ්කාර්ය වත්කම්

පහත සඳහන් නිෂ්කාර්ය වත්කම් විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) 2009 වර්ෂයේදී ගල් අඟුරු මෙහෙයුම් කටයුතු සඳහා මණ්ඩලය විසින් මිලදී ගන්නා ලද රු. 1,005,333,192 ක් වටිනා බත්තල් හා ටග් බෝට්ටු 2014 දෙසැම්බර් 31 දිනට වර්ෂ 5 කට වැඩි කාල පරිච්ඡේදයක් නිෂ්කාර්යව පැවතුණු අතර 2014 වර්ෂයේදී ඒවා විකුණා දැමීමට තීරණය කර තිබුණි. කෙසේ වුවද 2014 දෙසැම්බර් 31 වන විටත් මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ග යක් ගෙන නොතිබුණි.

(ආ) 2009 වර්ෂයේදී පුත්තලම ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘතිය අදියර 1 සඳහා ලබා ගන්නා ලද විදේශ ණය උපයෝජනය කරමින් රු. මිලියන 36.5 කට මණ්ඩලය විසින් ප්‍රසම්පාදනය කරන ලද බවුසර් පහක් අරමුණු කළ කාර්යය සඳහා උපයෝජනය කර නොතිබූ අතර මේ දක්වා වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමෙන්ද තොරව නිෂ්කාර්යව පැවතුණි.

## 4.5 අවිධිමත් ගෙවීම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009 සිට බලපැවැත්වෙන ලෙස ඊළඟ වැටුප් සංශෝධනයේ සිට උපයනවිට ගෙවීම් බදු බැරකම සේවකයින්ට අදාළ කිරීම සඳහා ගන්නා ලද 2007 දෙසැම්බර් 13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව මණ්ඩලය විසින් එහි සේවකයින් වෙනුවෙන් උපයන විට ගෙවීම් බදු ගෙවා තිබුණි. 2010 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් 31 දක්වා මණ්ඩලය විසින් ගෙවන ලද එකතු කළ අගය මත බදු ප්‍රමාණය රු.මිලියන 1,407 ක් විය.

(ආ) 1994 ජුනි 04 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ දක්වා ඇති පරිදි අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සඳහා වරින් වර විවිධ සේවක දීමනා 39 ක් ගෙවා තිබුණි. 2013 වර්ෂයේදී එසේ ගෙවන ලද රු. මිලියන 642 ක දීමනාවලට සාපේක්ෂව 2014 වර්ෂයේදී රු. මිලියන 849 ක් වූ එවැනි දීමනා ගෙවා තිබූ බව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය විය.

(ඇ) ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය සඳහා "විදුලක්පාය" නමැති යෝජිත ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කාර්යයන්,

# විගණකාධිපති වාර්තාව

2014 ඔක්තෝබර් 07 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගන්නා ලද තීරණය මත වහාම බලපැවැත්වෙන පරිදි අත්හැර දමා තිබුණි. කෙසේ වුවද ඉදිකිරීම අත්හැර දැමීම සඳහා හේතු අධ්‍යක්ෂ මණ්ඩල තීරණයේ ඇතුළත් කර නොතිබුණු අතර විගණනය සඳහා ලබා ගැනීමටද නොහැකි විය. ඉදිකිරීම අත්හැර දැමීම් දිනය දක්වා පිරිවැය රු. මිලියන 380 ක් වූ අතර ඒ සඳහා දරන ලද සම්පූර්ණ පිරිවැය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 4.6 හඳුනානොගත් පාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගල් අඟුරු ගොඩබෑම් මෙහෙයුම් කටයුතු සඳහා සුදුසු නොවූ ලක් විජය විදුලිබල මධ්‍යස්ථානයට අයත් ටග් බෝට්ටු දෙකක්, බත්තල් තුනක් සහ එක් ලයින් බෝට්ටුවක් 2009 වර්ෂයේ සිට ත්‍රිකුණාමලය හා කොළඹ වරායන්හි ගාල් කර තිබුණි. කෙසේ වුවද ව්‍යාපෘති අධ්‍යක්ෂ හා ලංවීම නියෝජිතයෙකුගේ නිර්දේශය සහිතව රේඛීය අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘතිය සඳහා ලබාගත් විදේශ ණයවලින් එම ලයිටරින් උපකරණ විදුලිබල මණ්ඩලය විසින් මිලදී ගෙන තිබුණි. පහත විස්තර දැක්වෙන පරිදි එම නිලධාරීන්ගේ වැරදි තීරණ මත විදුලිබල මණ්ඩලයට රු. මිලියන 1250.1 ක පාඩුවක් දැරීමට සිදුවිය.

| විස්තරය | මුදල (රු.) |
|---|---|
| මිලදී ගැනීම් පිරිවැය | 1,074,244,082 |
| ලයිටරින් උපකරණ වලට අදාළ වියදම (නඩත්තු) | 55,600,510 |
| නැංගුරම් ලෑම සඳහා ලංකා නැව් සංස්ථාවට ප්‍රතිපූර්ණය කරන ලද වියදම් | 120,265,270 |
| එකතුව | 1,250,109,862 |

(ආ) මණ්ඩලයට අයත් වාලච්චේන විශාල නඩත්තු ගබඩාවේ සේවය කළ පුද්ගලික ආරක්ෂක සමාගමක ආරක්ෂක භටයකු විසින් සොරකම් කරන ලද ජල මෝටරයක් ඇතුළුව අස්ථානගත වූ දේපල වටිනාකම රු. 1,610,203 ක් විය.

(ඇ) බාල තත්ත්වයේ වීම හේතුවෙන් තත්ත්ව පරීක්ෂකවරුන් විසින් ප්‍රතික්ෂේප කරන ලද, ග්‍රාමීය විදුලිබල ව්‍යාපෘතිය සඳහා ඉරාන ණය මත ප්‍රසම්පාදනය කරන ලද "විද්‍යුත් පරිවාරක" (insulator) වටිනාකම රු. 6,387,630 ක් විය. එම වැරදි ප්‍රසම්පාදනය වෙනුවෙන් මණ්ඩලය විසින් ගනු ලැබූ එකම ක්‍රියා මාර්ගය වුයේ ඒවා කොටුගොඩ බඩු ගබඩාවට මාරු කිරීම පමණක් විය.

(ඈ) 2014 වර්ෂයේ භෞතික සත්‍යාපනයේදී හඳුනා ගන්නා ලද රු. 85,670,920 ක් වටිනා ඩීසල් ඌනතාවය සඳහා හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද එම ඌනතාවය පිළිබඳව විමර්ශනය කර නොතිබුණි.

## 4.7 මතභේදයට තුඩුදෙන කරුණු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය සංස්ථා හා මණ්ඩල ඇතුළත් සියලුම රාජ්‍ය අංශයේ සංවිධානවල මූල්‍ය හා පරිපාලනය සම්බන්ධයෙන් සංගත පරිපාටි හා පරිචයන් පවත්වා ගැනීමට වරින් වර රජය විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර චක්‍රලේඛ හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විදුලිබල මණ්ඩලයේ පරිපාලන රීති වශයෙන් අනුගමනය නොකරන්නේ නම්, ඔවුන්ට ඒවා අදාළ නොවන බවත්, 1969 අංක 31 දරන පනතින් සංශෝධිත 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතට අනුකූලව තත්ත්වය පවත්වා ගෙන තිබුණු බවත් විගණනයේදී නිරීක්ෂණය විය. එවැනි උදාහරණ කිහිපයක් පහත දැක්වේ.

(i) 1990 මාර්තු 09 දිනැති අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව මණ්ඩලය විසින් වාර්ෂිකව නුපුහුණු හා අර්ධ පුහුණු සේවකයින් ලිපිකරුවන්, කැෂියර්වරුන්, ගබඩාපාලකවරුන්, යතුරු ලියන්නන්, රියදුරන්, කාර්යාල සහායකයින්, කම්කරුවන් ලෙස චක්‍රලේඛ මඟින් දක්වා ඇති පරිදි, පුවත්පත් දැන්වීම්, ගැසට් නිවේදන ආදිය මඟින් සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් දීප ව්‍යාප්තව ඉල්ලුම්පත් කැඳවීමෙන් තොරව බඳවා ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ සේවකයින් 333 දෙනෙකු එම ආකාරයට බඳවා ගෙන තිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස අදාළ තනතුරුවලට වඩාත් දක්ෂ පුද්ගලයන් බඳවා ගැනීමේ අවස්ථාව මණ්ඩලය විසින් අහිමි කරගෙන තිබුණි.

(ii) 1998 මාර්තු 08 දිනැති අංක 130 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව, සියයට 10 සිට සියයට 14 දක්වා පොලියකට වාහන ණය ලබා දීම වෙනුවට මණ්ඩලය විසින් සියයට 4.2 ක පොලියකට වාහන ණය ලබා දී තිබුණි. ප්‍රබල ද්‍රවශීලතා ගැටලුවලට මණ්ඩලය මුහුණ දී ඇති නමුත්, කිසිදු පාලනයකින් තොරව සේවක ණය ගෙවා ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය.

# විගණකාධිපති වාර්තාව

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට රක්ෂණ සංචිත අරමුදලේ ශේෂය හා රක්ෂණ සංචිත ආයෝජන අරමුදල අතර නිරීක්ෂණය වූ රු. මිලියන 4,099 ක ඌනතාවය මණ්ඩලයේ ස්වයං රක්ෂණ ප්‍රතිපත්තිය ප්‍රකාරව ආයෝජනය කර නොතිබුණි. එවැනි ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් ක්‍රියාත්මක කිරීම සඳහා මණ්ඩලයේ විධිමත් මූල්‍ය කළමනාකරණයක් ක්‍රියාත්මක නොවීය.

(ඇ) වර්ෂ ගණනාවක් සඳහා ලංකා විදුලි සමාගමට මණ්ඩලය විසින් විදුලිබලය විකුණා තිබූ අතර ලංකා ඛනිජ තෙල් සංස්ථාවෙන් ඉන්ධන මිලදී ගෙන තිබුණි. එක් එක් ආයතන සමඟ කරදරයකින් තොරව ක්‍රියාත්මක කිරීම තහවුරු කර ගැනීම සඳහා මෙම පාර්ශවයන් දෙක සමඟ විකුණුම් හා මිලදී ගැණුම් ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

(ඈ) මාගේ පෙර වර්ෂ විගණන වාර්තාවල වාර්තාකරන ලද පරිදි පහත සඳහන් කරුණු සඳහා ගන්නා ලද කිසිදු පියවරක් 2014 වර්ෂයේදී ද නිරීක්ෂණය නොවීය.

* සමාන ඒකකයකින් ඉදිරිපස රියදුරු කුටි (cab) ආදේශ කිරීම (වාහන 24)
* පාවිච්චි කරන ලද A 2 T ක්‍රේන් දේශීයව සවි කිරීම (වාහන 2)
* මුල් කැබ් කොටස වෙනුවට පාවිච්චි කරන ලද කැබ් වලින් ආදේශ කිරීම (වාහන 2)
* මුල් ඉදිරිපස කැබ් කොටස හා පසුපස ට්‍රේ කොටස් පාවිච්චි කරන ලද විවිධ වර්ගයේ කැබ් සහ ට්‍රේ වලින් ආදේශ කිරීම (වාහන 1)
* පාවිච්චි කරන ලද කොටස්වලින් ඉදිරිපස කැබ් කොටස් හා පසුපස ට්‍රේ කොටස් ආදේශ කිරීම. (වාහන 1)
* ක්‍රේන් එකක් දේශීයව සවි කිරීම (වාහන 1)

තවද මණ්ඩලය සතු හා කුලියට ගන්නා ලද වාහන සම්බන්ධයෙන් විධිමත්ව යාවත්කාලීන කරන ලද දත්ත පදනමක් නොතිබුණි. එබැවින් වාහන නඩත්තුව සඳහා 2014 වර්ෂයේදී රු. 216,773,402 ක් දැරීමේ සාධාරණත්වය විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.

(ඉ) බද්ධ ව්‍යාපාර සමාගමක් වූ ත්‍රිකුණාමලය විදුලිබල සමාගමෙහි සියයට 50 ක අයිතිය ලංකා විදුලිබල මණ්ඩලය සතු වුවද, එහිදී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වයෙන් තුනෙන් එක් සාමාජිකත්වයක් පමණක් මණ්ඩලයට වෙන් කර තිබුණි. එබැවින් තීරණ ගැනීමේදී අනෙක් සාමාජිකයන්ගේ වාසියට අදාළව තීරණ ගැනීමේ හැකියාව ඉතා ඉහළ විය.

## 4.8 මානව සම්පත් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ බඳවා ගැනීම් යෝජනා ක්‍රමය (SOR) දීර්ඝ කාලයක් යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) 2012 වර්ෂය සඳහා මණ්ඩලය විසින් අනුමත කරන ලද කාර්ය මණ්ඩල සැලැස්ම අභිබවා සේවකයන් 3655 ක් අනු කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන තිබුණි. අනු කොන්ත්‍රාත් පදනමින් බඳවා ගන්නා ලද සේවක සංඛ්‍යාව මණ්ඩලයේ මුළු සේවක සංඛ්‍යාවෙන් සියයට 20 ක් විය.

(ඇ) අනුමත සේවක සංඛ්‍යාවෙන් පහත සඳහන් තනතුරු 2014 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු වී පැවති අතර එම පුරප්පාඩුවලින් බොහොමයක් කොන්ත්‍රාත් පදනම මත හා අනු කොන්ත්‍රාත් පදනම මත පුරවා තිබුණි.

| සේවක වර්ගය | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව | කොන්ත්‍රාත්/ මිනිස්බල පදනම මත බඳවා ගැනීම් |
|---|---|---|
| විධායක | 367 | 09 |
| මධ්‍යම මට්ටමේ තාක්ෂණික සේවය | 164 | 29 |
| ලිපිකරු හා සමාන්තර සේවක වර්ගය | 509 | 1,174 |
| කාර්යාල සේවක වර්ගය | 47 | 179 |
| රියදුරු | 28 | 535 |
| පුහුණු තාක්ෂණික සේවය | 647 | 805 |
| අර්ධ පුහුණු තාක්ෂණික සේවය | 1,690 | 213 |
| වෙනත් පුහුණු ශ්‍රේණි | 34 | 8 |
| **එකතුව** | 3,486 | 3,843 |

(ඈ) නුපුහුණු ක්ෂේත්‍ර සේවය සඳහා අනුමත සේවක සංඛ්‍යාව 1356 කින් ඉක්මවා තිබුණි.

# විගණකාධිපති වාර්තාව

(ඉ) උසස්වීම් සඳහා සලකා බලන එකම කරුණ ජ්‍යෙෂ්ඨත්වය වූ අතර අනුප්‍රාප්තික සැලැස්මක් නොවීය. උසස් තනතුරු සඳහා උසස්වීම් ඉතා කෙටිකලකදී එනම් අර්ධ වර්ෂයකට අඩු කාලයක් තුළදීත් ලබා දී තිබූ අතර එය මණ්ඩලයට අයහපත් පරිචයක් විය. එබැවින් එය අස්තිත්වයට නොව සේවකයාට ප්‍රතිලාභී වූ බව නිරීක්ෂණය විය.

(ඊ) මානව සම්පත් අංශයේ ප්‍රධාන තනතුර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්) වන නමුත් එම තනතුර වෙනත් සේවාවලට විශේෂයෙන් විදුලි ඉංජිනේරුවරු සඳහා විවෘත වීමට හැකිවන පරිදි බඳවා ගැනීමේ පරිපාටියේ (SOR) එම තනතුර සඳහා අවශ්‍ය මානව සම්පත් සුදුසුකම් හා පළපුරුද්ද විශේෂයෙන් සඳහන් කර නොතිබුණි. එම නිසා දැනට පවත්නා බඳවා ගැනීම් පරිපාටිය සම්පූර්ණ හා නිවැරදි ලෙස සැලකිය නොහැක.

(උ) තනතුරු දෙකක් අතර නොගැලපීමක් ඇති කරමින් මණ්ඩලයේ පිරිස් කළමනාකරණ අංශයේ ප්‍රධාන ඉංජිනේරු තනතුර (මානව සම්පත් ප්‍රතිපත්ති) ඇති කර තිබුණි.

(ඌ) පවත්නා බඳවා ගැනීම් පරිපාටියට (SOR) අනුව, මානව සම්පත් නිලධාරී (HRO) සේවයේ මුළු කාර්ය මණ්ඩලයෙන් සියයට 50 ක් බාහිරව පුරවන අතර එම ප්‍රතිශතය වර්ෂයෙන් වර්ෂයට සියයට 85 ක් දක්වා වැඩි කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, මණ්ඩල ඉතිහාසයේ දීර්ඝම කාලයක් ඉංජිනේරුවරුන් දෙදෙනෙකු විසින් පිරිස් අංශයේ ප්‍රධාන කාර්යයන් ආවරණය කරන බැවින් හා එම අංශයේ 4 ශ්‍රේණියට ඉහළ තනතුරු මානව සම්පත් ක්ෂේත්‍රය හැර වෙනත් සේවා වලට විවෘතව තිබූ බැවින්, එම බාහිරව බඳවා ගන්නා සේවකයින්ට උසස්වීම් යෝජනාක්‍රමයේ පැහැදිලි උසස්වීම් මාර්ගයක් ඇති බවට නිරීක්ෂණය නොවීය.

(එ) මානව සම්පත් කළමනාකරු (HRM) හා මානව සම්පත් නිලධාරී (HRO) සෘජුවම බඳවා ගැනීම සඳහා 100 කට වැඩි ප්‍රමාණයක් සේවකයන් සිටින ආයතනයක මානව සම්පත් ක්ෂේත්‍රයේ අවශ්‍යවන වර්ෂ 06 ක පළපුරුද්ද මෙම ආයතනයේ කටයුතු කළ යුතු මුළු සේවක සංඛ්‍යාව සමග සැසඳීමේදී ප්‍රමාණවත් නොවීය.

## 5. යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

### 5.1 අයවැය පාලනය

අයවැය හා තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මුදල් පනතේ 13(7)(අ) වගන්තිය ප්‍රකාරව නිකුත් කරනු ලබන මාගේ විස්තරාත්මක වාර්තාව මඟින් මණ්ඩලයේ සභාපතිගේ අවධානයට යොමු කරනු ලැබේ. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) වත්කම් කළමනාකරණය

(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු මුදල්

(ඇ) ඉන්වෙන්ට්‍රි පාලනය හා තොග කළමනාකරණය

(ඈ) මානව සම්පත් කළමනාකරණය

(ඉ) ගිණුම් කරණය හා මූල්‍ය කළමනාකරණය

(ඊ) ආයෝජන හා පරිපාලිතයන් පිළිබඳ පාලනය

(උ) ව්‍යාපෘති කළමනාකරණය හා පාලනය

(ඌ) අයවැය පාලනය

(එ) සේවක ණය

(ඒ) විදුලිබල මිලදී ගැනුම් කළමනාකරණය

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

ලංකා විදුලිබල මණ්ඩලයේ හා එහි පරිපාලිතයන්හි 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

දැන ගැනීම සඳහා

1.3 විගණකගේ වගකීම

දැන ගැනීම සඳහා

1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

දැන ගැනීම සඳහා

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

(අ) තත්ත්වාගණනය කළ මතය - මණ්ඩලය

දැන ගැනීම සඳහා

(ආ) තත්ත්වාගණනය කළ මතය - සමූහය

දැන ගැනීම සඳහා

2.2 සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

(අ) සීමාසහිත හෙළදනව් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව

ලංකා විදුලිබල මණ්ඩලය (ලංවිම) සීමාසහිත හෙළදනව් සමාගම (එල්ටීඑල් හෝල්ඩින්ස් සමාගමේ පරිපාලිතයකි) අතර එළඹි 2009 මැයි 9 දිනැති විදුලිබලය මිලදී ගැනුම් ගිවිසුමට (PPA)අනුකූලව, හෙළදනව් විදුලිබල පිරියතෙහි මෙගාවොට් 100 ක මෙහෙයුම් 2014 දෙසැම්බර් 8 දින අවසන් විය. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 05 අනුව, හෙළදනව් සමාගමේ දේපල පිරියත හා උපකරණ ද ජංගම වත්කම් යටතේ වර්ගීකරණය කර ඇත. කරුණාකර සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාග මේ 2014 දෙසැම්බර් 31 දිනට විගණිත මූල්‍ය ප්‍රකාශනවල පිටු අංක 10 හි සටහන් 2.1 හා පිටු අංක 32 හි සටහන් අංක 4 බලන්න.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලංකා කෝල් (පුද්ගලික) සමාගමේ විගණිත මූල්‍ය ප්‍රකාශන මාස 09 ක ප්‍රමාදයක් සහිතව 2015 දෙසැම්බර් 28 දින පහත සඳහන් කරුණු සමග විගණනයට ඉදිරිපත් කර තිබුණි.

i රු.මිලියන 502.9 ක වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂය සත්‍යාපනය කිරීමට නොහැකි විය.

ii වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂයන්ගේ නිරවද්‍යතාවය, අයකර ගැනීමේ හැකියාව හා සම්පූර්ණත්වය.

iii රු.මිලියන 63 ක ලැබිය යුතු ආදායම් බදු බැරකම පිළිබඳ නිරවද්‍යතාවය.

2015 වර්ෂයේ ගිණුම්වල මෙම කාරණය නිවැරදි කිරීමේ අරමුණින් 2016 මැයි 03 දිනැති අංක CEB/FM/AFM(Corp)/Acct (con) දරන ලංවිම සභාපතිගේ ලිපිය මගින් මෙම කරුණු ලංකා කෝල් සමාගමේ සභාපතිගේ දැනගැනීම සඳහා යොමු කරන ලදී.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

## 2.3 මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන (ලංවිම) පිළිබඳ අදහස් දැක්වීම

### 2.3.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී ලං ගි ප්‍ර/ ශ්‍රී ලං මූ වා ප්‍ර) සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති

#### (අ) ශ්‍රී ලං ගි ප්‍ර 01 සහ ශ්‍රී ලං ගි ප්‍ර 16 - මණ්ඩලය එහි ප්‍රාග්ධනය හා නඩත්තු කාර්යයන් අගය කිරීමේදී තථ්‍ය රේටයන් වෙනුවට සම්මත රේටයන් යොදා ගනු ලැබීම.

ලංකා විදුලිබල මණ්ඩලයේ ගිණුම්වල 2014 දෙසැම්බර් 31 දිනට ද්‍රව්‍ය මිල විචලනය, ශ්‍රම රේට (labour rate) විචලනය හා පොදුකාර්ය විචලනයට අදාළ ශේෂයන් පහත පරිදි වේ.

| අංශය | ශේෂය (A-B-C) (රු.) | ද්‍රව්‍ය මිල විචලනය (A) | ශ්‍රම රේට විචලනය (B) | පොදු කාර්ය අයකරගැනීම (C) |
|---|---|---|---|---|
| බෙදාහැරීම් අංශය 1 | 2,115,813,779 | 1,286,851,960 | 216,693,727 | 612,268,092 |
| බෙදාහැරීම් අංශය 2 | 1,678,857,756 | 893,457,883 | 379,246,763 | 406,153,110 |
| බෙදාහැරීම් අංශය 3 | 1,246,747,541 | 601,620,275 | 279,388,779 | 365,738,487 |
| බෙදාහැරීම් අංශය 4 | 882,035,273 | 393,597,931 | 190,719,788 | 297,717,554 |
| එකතුව | 5,923,454,349 | 3,175,528,049 | 1,066,049,056 | 1,681,877,244 |
| මුළු ශේෂයෙන් ප්‍රතිශතය (%) | | 54 | 18 | 28 |

##### ද්‍රව්‍ය මිල විචලනය

ඉන්වෙන්ට්‍රි අගය කිරීමට සම්මත පිරිවැය ක්‍රමය යොදා ගැනීමේදී එහි ප්‍රතිඵල පිරිවැයට ආසන්නවේ නම් එම ක්‍රමය යොදාගැනීමට ශ්‍රී ලං ගි ප්‍ර 02 මගින් අනුමත කෙරේ. සංකීර්ණ බව මගහැරීම සඳහා කළමනාකරණ තීරණ පරිදි හා කාර්යයන් පිළිබඳ පිරිවැයවල ඒකාකාරී බව පවත්වා ගැනීම සඳහා ඉන්වෙන්ට්‍රි අගය කිරීම සඳහා ලංවිම විසින් සම්මත මිල ක්‍රමය යොදා ගනු ලැබේ.

##### ශ්‍රම රේට විචලනය

පවත්නා වැටුප් පරිමාණයන් මත පදනම්ව ගණනය කරන ප්‍රාග්ධන කාර්යයන් සඳහා සම්මත රේටයකට ශ්‍රමය ගිණුම්ගත කිරීම ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රතිපත්තිය වේ. එබැවින් ඉහත පරිදි තථ්‍ය රේටයන් සමග සැලකිය යුතු විචලනයන් එයින් නියෝජනය නොවේ. එබැවින් ප්‍රධාන වශයෙන් කාර්යයන් සඳහා ඇස්තමේන්තු කරන ලද ප්‍රමාණයන් (පැය ගණන) හේතුවෙන් පවත්නා වෙනස (18%) පැන නැගී ඇත.

##### පොදුකාර්ය පිරිවැය විචලනය

එක් එක් කාර්යයන් සඳහා පොදුකාර්ය පිරිවැයද සම්මත රේටයන් යොදා ගනිමින් හඳුනාගෙන ඇති අතර වාර්ෂිකව ලංවිම විසින් ප්‍රාග්ධන හා ප්‍රාග්ධන නොවන කාර්යයන් විශාල සංඛ්‍යාවක් සිදු කරන හෙයින් මෙය ලංවිම සඳහා වඩාත් අදාළ වේ.

#### (ආ) ශ්‍රී ලං ගි ප්‍ර 08 - වැඩියෙන් ඇස්තමේන්තු කරන ලද රු. මිලියන 9.4 ක විදුලි සංදේශ වියදම රඳවා ගත් ඉපැයුම්වලට ඇතුළත් කිරීමෙන් තොරව ආදායම් ප්‍රකාශනයේ සටහන් කිරීම.

ශ්‍රී ලං ගි ප්‍ර 08 ට අනුව, ඇස්තමේන්තු සංශෝධනයක් පෙර කාල පරිච්ඡේදයට අදාළ නොවන අතර එය දෝෂයක් නිවැරදි කිරීමක්ද නොවේ.

රු. 9,569,079.33 ක පෙර වර්ෂ (2011) විදුලි සංදේශ උපචිතයන් සඳහා ප්‍රතිපාදනය කර තිබූ නමුත් වියදම රු. 69,896.39 ක් විය. වැඩිපුර ප්‍රතිපාදනය කර තිබූ රු. 9,499,182.94 ක මුදල ප්‍රමාණාත්මකභාවය පිළිබඳ විනිශ්චය කර ප්‍රවර්තන වර්ෂයේ (2014) අදාළ වියදම්වල අඩුවීමක් ලෙස ගිණුම්ගත කරන ලදී.

#### (ඇ) ශ්‍රී ලං ගි ප්‍ර 19 - සේවක ප්‍රතිලාභ

ශ්‍රී ලං ගි ප්‍ර 19 අනුව, අවදානම අඩු කිරීම සඳහා ව්‍යවසායක් විසින් සැලසුම් කරන ලද වගකීම්වලට අනුව සැලසුම් කරන ලද වත්කම් ස්ථාපිත කළ යුතුය. කෙසේ වුවද, බාහිරව ආයෝජනය කිරීම සඳහා ලංවිම කළමනාකරණය කිසිදු ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන නොතිබුණු අතර, එය නියෝගාත්මක අවශ්‍යතාවයක් ලෙස ශ්‍රී ලං ගි ප්‍ර 19 මගින්ද හඳුන්වා දී නැත.

අපගේ වාර්තාවලට අනුව, 2014 වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගන්නා ලද විශ්‍රාම වියදම්වලට අදාළව ප්‍රවර්තන සේවා පිරිවැය, පොලී පිරිවැය හා ආයෝජන මත ප්‍රතිලාභ නිවැරදිව දක්වා ඇති අතර, එබැවින් කිසිදු අඩුවෙන් දැක්වීමක් නොවේ.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

(ඈ) ශ්‍රී ලං ගි ප්‍ර 20 -රජයේ ප්‍රදාන ගිණුම්ගත කිරීම හා රජයේ ආධාර හෙළිදරව් කිරීම

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් විසින් එවන ලද 2015.09.30 දිනැති අංක පීඊ/ප්‍රාග්ධන/2014/1 දරන ලිපිය අනුව, ග්‍රාමීය විදුලිබල ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදනවලට අදාළව රු. බිලියන 31 ක් ලංවිම සඳහා ප්‍රදානයක් ලෙස සපයන ලද බව දන්වා තිබූ අතර එය භාණ්ඩාගාර පොත්වලද සටහන් කර තිබුණි.

(ඉ) ශ්‍රී ලං ගි ප්‍ර 39 - මූල්‍ය උපකරණ, හඳුනාගැනීම හා මැනීම

2015 ගිණුම්වල පවත්නා දුර්වලතා නිවැරදි කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

2.3.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වෙනත් ණයගැතියන් රු.10,460,435 කින් අඩුවෙන් දැක්වීම

ලංවිම පොත් අනුව, ආරක්ෂක ලාම්පු වෙනුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් ලැබිය යුතු ශේෂය රු. 9,394,437.00 ක් වූ අතර ගෙවිය යුතු ශේෂයක් ලෙස විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලද එම ශේෂය නිරූපනය වේ.

එබැවින් මෙම මුදල පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා ආරක්ෂක ලාම්පුවලට අදාළ වන අතර එය අපගේ පොත්වල බැර ශේෂයක් නොව ලැබිය යුතු ශේෂයක් වේ. එබැවින් ලැබිය යුතු ශේෂය අඩුවෙන් දැක්වීමක් සටහන් කර නැත.

(ආ) 2014 වර්ෂය තුළ අභ්‍යන්තර මාරු කිරීම්, පිටතට මාරු කිරීම් හා කෙරීගෙන යන වැඩ වෙනත් අංශවලට මාරු කිරීම්වලට අදාළ නොසැසඳු වෙනස්කම්

එක් එක් අංශ අතර දේපල, පිරියත හා උපකරණ මාරු කිරීම් විමසුමේ දක්වා ඇති පරිදි සමස්තයක් ලෙස ලංවිම හි ශුන්‍ය අගයක් විය යුතු බවට එකඟ වේ.

කෙසේ වුවද එම මාරුකිරීම් සටහන් කිරීමේ පවත්නා පරිචයට අනුව, ශුන්‍ය අගයක් වෙනුවට ශේෂයක් නිරූපනය වේ. තවද දිගු කාලයක් නිරවුල් නොවී හිඟ හිට පැවති රු.2,130,069 හැර වෙනත් සංක්‍රමණ ශේෂයන් වර්ෂය අවසානයට නොවන බව අවධාරණය කෙරේ. ඒ අනුව, කාල පරිච්ඡේදය තුළ සියලු දේපල, පිරියත හා උපකරණ මාරු කිරීම් නිවැරදිව සටහන් කර ඇති බව තහවුරු වේ.

කෙරීගෙන යන වැඩ මාරු කිරීම් වලින් නිමකරන ලද කාර්යයන් දේපල, පිරියත හා උපකරණවලට මාරුකිරීම් මෙන්ම වෙනත් අංශවලට මාරු කිරීම් නිරූපනය වේ. උදාහරණයක් ලෙස ව්‍යාපෘති අංශය විසින් ජනන, සම්ප්‍රේෂණ හෝ බෙදාහැරීම් අංශයන්ට මාරුකිරීමට අවශ්‍ය වන සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති සඳහන් කළ හැක. වෙනස පිළිබඳ සාරාංශගත උපලේඛනය හා එයට හේතු පහත පරිදි වේ.

| අංශය | අභ්‍යන්තර මාරු කිරීම | | වෙනස |
|---|---|---|---|
| | ඇතුළට (රු.) | පිටතට (රු.) | |
| බෙදාහැරීම් අංශය 01 | 271,436 | - | 271,436 |
| ජනන අංශය | 3,974,764,663 | - | 3,974,764,663 |
| සම්ප්‍රේෂණ | 2,501,769 | - | 2,501,769 |
| ව්‍යාපෘති | 20,218,860 | 3,967,041,202 | (3,946,822,342) |
| සම්ප්‍රේෂණ අංශය සමඟ ව්‍යාපෘති ගැලපීම | 265,367,414 | - | 265,367,414 |
| මූලස්ථාන කාර්යාලය | 227,391 | 249,980 | (22,589) |
| **එකතුව** | 4,263,351,533 | 3,967,291,182 | 296,060,351 |

බෙදාහැරීම් අංශය 01 - රු. 271,436 ක අභ්‍යන්තර මාරු කිරීම

බෙදාහැරීම් අංශය 01 හි රු. 271,436 ක මුදල මාරු කිරීම තුළ වත්කම් කළමනාකරණ අංශයෙන් ලැබුණු වායු සමීකරණ කාර්යයන් ඇතුළත්ය. එය වත්කම් කළමනාකරණ අංශයේ ගිණුම්වල ප්‍රාග්ධන නොවන කෙරීගෙන යන වැඩ මාරු කිරීම ලෙස සලකා තිබූ අතර එය දේපල, පිරියත හා උපකරණ පිටට මාරු කිරීමක් නොවේ.

මූලස්ථාන අංශය - රු. 249,980 ක පිටතට මාරු කිරීම

මූලස්ථාන අංශයේ පිටතට මාරු කිරීමක් ලෙස දැක්වෙන රු. 249,980 මුදල තුළ මෘදුකාංග 2 ක් මිලදී ගැනීම ඇතුළත් වන අතර එය බෙදාහැරීම් අංශ 04 ට මාරු කිරීමකි. බෙදාහැරීම් අංශ 04 හි මෙය "ඍජු මිලදී ගැනීම්" පේළියෙහි සටහන් කර තිබූ අතර ඇතුළට මාරු කිරීම් පේළිය යටතේ නොවේ.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

## මූලස්ථාන අංශය - රු. 227,391 ක අභ්‍යන්තර මාරු කිරීම

මූලස්ථාන අංශයේ රු. 227,391 ක අභ්‍යන්තර මාරු කිරීම් මුදල තුළ වත්කම් කළමනාකරණ අංශයෙන් ලැබුණු වායුසමීකරණ කාර්යයන් ඇතුළත්ය. එය වත්කම් කළමනාකරණ අංශයේ ගිණුම්වල ප්‍රාග්ධන නොවන කෙරීගෙන යන වැඩ පිටතට මාරු කිරීම් ලෙස සලකා තිබුණි.

## ජනන අංශය - රු.3,974,764,663 ක අභ්‍යන්තර මාරු කිරීම

ජනන අංශයේ රු. 3,974,764,663 ක අභ්‍යන්තර මාරු කිරීම් මුදල තුළ ඉහළ කොත්මලේ විදුලිබල පිරියත ව්‍යාපෘතියෙන් (ව්‍යාපෘති අංශය) රු. 3,967,041,202 ක් වූ වත්කම් මාරු කිරීම් ඇතුළත්ය. රු. 7,723,461 ක් වූ වෙනස ව්‍යාපෘති අංශයේ කෙරීගෙන යන වැඩ පිටතට මාරු කිරීම් හි ඇතුළත්ය.

## සම්ප්‍රේෂණ අංශය - රු. 2,501,769 ක අභ්‍යන්තර මාරු කිරීම

සම්ප්‍රේෂණ අංශයේ මාරු කිරීම් මුදල වෙන් වශයෙන් පහත පරිදි වේ.

| අංශය | මුදල (රු.) |
|---|---|
| වත්කම් කළමනාකරණ අංශය | 1,301,869.00 |
| බෙදාහැරීම් අංශය 03 | 6,600.00 |
| බෙදාහැරීම් අංශය 04 | 1,193,300.00 |
| | 2,501,769.00 |

රු. 1,301,869 ක් වූ අභ්‍යන්තර මාරු කිරීම් මුදල තුළ වත්කම් කළමනාකරණ අංශයෙන් ලැබුණු වායු සමීකරණ කාර්යයන් ඇතුළත් වේ. එය වත්කම් කළමනාකරණ අංශයේ ප්‍රාග්ධන නොවන කෙරී ගෙන යන වැඩ ගිණුම් වේ.

රු. 6,600 ක්වූ අභ්‍යන්තර මාරු කිරීම් මුදල තුළ බෙදාහැරීම් අංශ 03 හි උප මධ්‍යස්ථාන හා හුවමාරු අංගණවල (switch yard) වල කොටසක් ඇතුළත් වේ.

අභ්‍යන්තර මාරු කිරීම් ලෙස දැක්වෙන රු. 1,193,300 ක මුදල තුළ බෙදාහැරීම් අංශ 04 න් ලැබුණු යන්ත්‍රෝපකරණ ඇතුළත් වූ නමුත් එය බෙදාහැරීම් අංශ 04 හි ලෙජරයේ පිටතට මාරු කිරීම් ලෙස වාර්තා කර තිබුණි.

## ව්‍යාපෘති අංශය - රු. 20,218,860 ක අභ්‍යන්තර මාරු කිරීම

ව්‍යාපෘති අංශයේ බ්‍රෝඩ්ලැන්ඩ්ස් ජල විදුලිබල මාරු කිරීම් ව්‍යාපෘති, ත්‍රිකුණාමලය ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘති වැනි ව්‍යාපෘති අතර වත්කම් මාරු කිරීම් රු. 20,218,860 ක අභ්‍යන්තර මාරු කිරීම් මුදල තුළ ඇතුළත්ය. එක් එක් පිටතට මාරු කිරීම් ව්‍යාපෘති කෙරීගෙන යන වැඩ මඟින් සිදුකර තිබුණද ව්‍යාපෘති අංශයේ දේපල, පිරියත හා උපකරණ උපලේඛනයට සමතාව මාරු කිරීම්වල ඇතුළත් කර තිබුණි.

## සම්ප්‍රේෂණ අංශය - රු. 265,367,414 ක අභ්‍යන්තර මාරු කිරීම

රු. 265,367,414 ක් වූ අභ්‍යන්තර මාරු කිරීම ව්‍යාපෘති අංශයෙන් වත්කම් මාරු කිරීම තුළ ඇතුළත් වූ අතර ව්‍යාපෘති අංශයේ ගිණුම්වල ගැලපීමක් ලෙස එය සලකා තිබුණි.

## (ඇ) වර්ෂයේ මුදල් ප්‍රවාහය නිශ්චය කිරීමේදී සමහර විෂයයන් ගිණුම්ගත නොකිරීම.

| විෂයය | මුදල (රු.) |
|---|---|
| පොදු කාර්ය අයකර ගැනීම | 1,782,778,237 |
| ශ්‍රම රේට විචලනය | 1,093,769,100 |

### පොදු කාර්ය පිරිවැය අයකර ගැනීම් - රු. 1,782,778,237

පොදු කාර්ය අයකර ගැනීම යනු ප්‍රාග්ධන කාර්යයන් හා පිරිවැය අයකර ගැනීමේ කාර්යයන් (CR Jobs) වලට අන්තර්ග්‍රහණය කරන ලද පොදු කාර්ය පිරිවැය කොටසක් වේ. අන්තර්ග්‍රහණය කිරීමට හේතුව වන්නේ ප්‍රාග්ධනිත වත්කම් සඳහා අංශයේ අදාළ

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

කාර්යයන් සිදු කිරීම සඳහා දරන ලද පරිපාලන හා පොදු කාර්ය පිරිවැය වලින් කොටසක් වෙන්කිරීමයි. සෑම වර්ෂයකම පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය සඳහා ලංවිම හි ස්ථාපිත කරන ලද සම්මත රේටය යොදා ගැනීම මඟින් එක් එක් විශේෂිත කාර්ය සඳහා ඇස්තමේන්තු කරන ලද ශ්‍රම පැය පදනම් කරගෙන පිරිවැය අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

පොදුකාර්ය පිරිවැය ඇතුළත් පිරිවැය අයකර ගැනීම් කාර්යයන් (CR Jobs) මත මුළු පිරිවැය ගනුදෙනුකරු සඳහා සටහන් කරන අතර එබැවින් පිරිවැය අයකරගැනීම් කාර්යයන්හි පොදුකාර්ය පිරිවැය කොටස මුදලින් උපලබ්ධි වේ. එබැවින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කිසිදු ගැලපීමක් සිදු කිරීම අවශ්‍ය නොවේ. ලංවිමට අයත් ප්‍රාග්ධන කාර්යයන්ගේ පොදු කාර්ය පිරිවැය කොටස මුදල් මඟින් උපලබ්ධි නොවන අතර එය මුදල් නොවන ගැලපීමක් ලෙස සැලකේ. එබැවින් ඉදිරියේදී පිරිවැය අයකර ගැනීම් කාර්යයන් (CR Jobs) හා ලංවිමට අයත් ප්‍රාග්ධන කාර්යයන් අතර පොදුකාර්ය පිරිවැය අයකර ගැනීම් ප්‍රමාණය වෙන් කිරීමට හා එය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ගැලපීම් කිරීමට ඇති හැකියාව පිළිබඳව පරීක්ෂා කිරීමට කටයුතු කරනු ලැබේ.

ශ්‍රම රේට විචලනය - රු.1,093,769,100

නඩත්තු කාර්යයන්, කෙරීගෙන යන වැඩ හා දේපල, පිරියත, උපකරණ සඳහා ගැලපීම් කළ යුතු ශ්‍රම රේට විචලන කොටස වෙනම හඳුනාගත නොහැකි අතර එබැවින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එම ගැලපීම කරනු නොලැබේ.

(ඈ) රු.මිලියන 33.3 ක හානි වූ තොග

විගණකවරුන් විසින් හඳුනාගන්නා ලද විෂයයන් 2014 වර්ෂය සඳහා තොග සත්‍යාපනයේදී හානි වූ තොග ලෙස හඳුනා ගෙන නොතිබුණි. එබැවින් ඒ සඳහා ප්‍රතිපාදනයන් සිදු නොකරන ලදී.

(ඉ) පුත්තලම ගල් අඟුරු විදුලි බල පිරියත අදියර II හා III මෙහෙයුම් කිරීමෙන් පසු දරන ලද රු. මිලියන 115,068.23 ක මුදල කෙරීගෙන යන වැඩ ගිණුමේ දැනටමත් පැවතීම

වත්කම් සංරචකගත කිරීම සඳහා ශ්‍රී ලං ගි ප්‍ර 16ට අනුකූල වන පරිදි පුත්තලම ගල් අඟුරු විදුලි බල පිරියත (PCPP) ට අදාළව වත්කම් සංරචකගත කිරීම සඳහා ප්‍රතිපත්තිය තීරණය කිරීමට මූල්‍ය කළමනාකරු විසින් කමිටුවක් පත්කර ඇති අතර, පුත්තලම ගල් අඟුරු විදුලිබල පිරියත අදියර II හා III මාරු කිරීම වෙනුවෙන් එම සංරචකයන්හි ජීව කාලය හා පිරිවැය හඳුනා ගැනීම එයට ඇතුළත් වේ.

සංරචකගත කිරීම් ක්‍රමවේදය හා ප්‍රතිපත්තිය අවසන් වූ වහාම එම මුළු වත්කම් උත්පාදන අංශයේ පොත්වල ගිණුම්ගත කරනු ලැබේ.

(ඊ) විමලසුරේන්ද්‍ර නව ලක්ෂපාන හා පැරණි ලක්ෂපාන ව්‍යාපෘතිවල පුනරුත්ථාපන පිරිවැය ප්‍රාග්ධනිත කිරීමෙන් තොරව කෙරීගෙන යන වැඩ ලෙස පැවතීම.

මෙම සියලු පුනරුත්ථාපන ව්‍යාපෘති 2015 වර්ෂයේදී ප්‍රාග්ධනිත කරනු ලැබේ.

(උ) ලක් විජය විදුලිබල පිරියතෙහි ජැටිය සහ වරාය සඳහා වෙනස් ආර්ථිකමය ප්‍රයෝජනවත් ජීව කාලයන් තිබීම (පිළිවෙලින් වර්ෂ 100 හා 30 ක්)

වත්කම් සංරචකගත කිරීම් සඳහා ශ්‍රී ලං ගි ප්‍ර 16 ට අනුකූල වන පරිදි ගල් අඟුරු විදුලිබල පිරියත සංරචකගත කිරීම සඳහා හා නිමකරන ලද වත්කම් ලක්විජය විදුලිබල මධ්‍යස්ථානයට මාරු කිරීමට නිර්දේශයන් සඳහා මාර්ගෝපදේශයක් පිළියෙල කිරීමට උත්පාදන, සම්ප්‍රේෂණ හා ව්‍යාපෘති අංශයන්හි මූල්‍ය නිලධාරීන්ගෙන් සමන්විතව කමිටුවක් ලංවිම, මූල්‍ය කළමනාකරු විසින් පත්කරන ලදී.

ඉහත කමිටුවේ ප්‍රතිඵල ලද විගසම ඒ අනුව අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

(ඌ) ලක් විජය විදුලිබල මධ්‍යස්ථානයේ (LVPS) ගබඩාවල පැවති උපකරණ හා අමතර කොටස් විශාල සංඛ්‍යාවක් අගය කර ගිණුම් ගත නොකිරීම.

ලක් විජය විදුලි බල මධ්‍යස්ථානය එහි මෙහෙයුම් කටයුතු සඳහා ආරම්භක අදියරයක පැවතීමෙන් මුල් උපකරණ නිෂ්පාදකගෙන් (Original Equipment Manufacturer) පිරියතෙහි කොටසක් ලෙස ලැබුණු අමතර කොටස් පිළිබඳ නුහුරු බව හා පළපුරුද්ද නොමැති වීම මෙම කරුණු සඳහා බලපෑ ප්‍රධාන හේතූන් ලෙස හඳුනාගෙන ඇත. කෙසේ වුවද ඒ සඳහා ඇතුළත් අමතර කොටස් හඳුනාගෙන ලැයිස්තුගත කර ඇත. විධිමත් භෞතික තොග සත්‍යාපනයක් නුදුරු කාලයේදී සිදු කරනු ලැබේ.

(එ) ලංකා ඛනිජතෙල් සංස්ථා හිඟ ශේෂය අඩුවෙන් ඇස්තමේන්තු කිරීම.

2013 සැප්තැම්බර් 30 දින භාණ්ඩාගාර ලේකම් විසින් සභාපතිත්වය දරන ලද රැස්වීමේදී ගන්නා ලද තීරණය ප්‍රකාරව ගෙවිය යුතු ඉන්වොයිස් වටිනාකම මත පොලිය 2013 අප්‍රේල් 20 සිට බලපැවැත්වෙන පරිදි ගෙවීමට (ණය කාලපරිච්ඡේදයෙන් බැහැරව) තීරණය කර තිබුණි.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

කෙසේ වුවද රු. 753,610,829 ක් වූ ප්‍රමාද වූ පොලී ගෙවීම ලංවිම විසින් 2013 අප්‍රේල් 20 දිනට පෙර මිලදී ගන්නා ලද ඉන්ධන වලට අදාළ වේ. එබැවින් ලංකා ඛනිජ තෙල් සංස්ථාවට පොලි ගෙවීම් ප්‍රමාද ගෙවීමකට ලංවිම වගකීමකට නොබැඳේ.

(ඒ) AES කැළණිතිස්ස සමාගමෙන් (AES Kelanitissa Power Plant) ලැබිය යුතු ශේෂයක් ලංකා ඛනිජතෙල් සංස්ථාවෙන් ලැබිය යුතු ශේෂයක් ලෙස සාවද්‍යව ගිණුම් ගත කිරීම.

මෙම ශේෂය 2015 ජනවාරි මාසයේදී නිවැරදි කර ඇත.

(ඔ) වාලච්චේනහි විශාල නඩත්තු ගබඩාවල තොග ඌනතාවය

සත්‍යාපන දිනයට භාණ්ඩ ලැබීම් පත් හා ඇණවුම් නියෝගයන් නිකුත් නොකිරීම හේතුවෙන් මෙම ඌනතාවය දැක්වේ. මෙම ඌනතාවය පරීක්ෂා කර පසුව භාණ්ඩ ලැබීම් පත් හා ඇණවුම් නියෝගයන් නිකුත් කිරීම මඟින් නිවැරදි කර ඇත.

2.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) අය කර ගැනීමෙන් තොරව වර්ෂ 3 කට වැඩි කාලයක් හිඟ හිට පැවති වෙළඳ හා අනිකුත් ලැබිය යුතු ශේෂ (රු. මිලියන 2,199)

විගණකවරුන්ගේ වාර්තාවේ සඳහන් ලැබිය යුතු වෙනත් මුළු ලැබීම් ශේෂයෙන් රු. මිලියන 1,545 මුදල RE 8 ව්‍යාපෘතිය යටතේ ලබා දෙන ලද වැඩ පූර්ව අත්තිකාරම වන අතර ලංවිම සාමාන්‍යාධිකාරී අමතන ලද 2014 නොවැම්බර් 04 දිනැති අංක පීඊ/ඩීඊවී/01/04/2008 දරන විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ (MOPE) ලේකම්ගේ උපදෙස් පරිදි ප්‍රගති ගෙවීම්වලට එරෙහිව හිලව් කරනු ලැබේ.

තවත් රු. මිලියන 188 ක්, පවත්නා බෙදාහැරීම් රැහැන් වලින් ඉවත්කරන ලද ට්‍රාන්ස්ෆෝමර් වටිනාකමට අදාළ වන අතර අලුත්වැඩියා නිමකරන තුරු හෝ අපහරණය කරන තුරු තාවකාලිකව සටහන් කරන ලද මුදලකි. කෙසේ වුවද මෙම ගිණුම්ගත කිරීම තවදුරටත් සමාලෝචනය කිරීමට අවශ්‍ය වන බව සොයාගෙන ඇත. එබැවින් මූල්‍ය කළමනාකරු විසින් මෙම ගිණුම්ගත කිරීම පිළිබඳ නැවත සොයා බලා ඒ අනුව අවශ්‍ය කටයුතු කිරීමට අදාළ පාර්ශවයන්ට දන්වා ඇත.

ඊට අමතරව රජයේ හා පුද්ගලික ආයතනයන් සඳහා වෙළඳ හා වෙනත් ණයගැති දිගුකාලීන හිඟ ශේෂ නියාමනය කර අයකර ගැනීමට අඛණ්ඩව අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

(ආ) දිගු කාලයක් හිඟ හිට පැවති තොග හා සාමාන්‍ය සැපයුම් ණයගැති ශේෂ අයකර ගැනීම සඳහා විධිමත් පියවර නොගැනීම

හිඟ ණය අයකර ගැනීම සඳහා සියලුම බෙදා හැරීම් අංශයන් ඔවුන්ගේ සාමාන්‍ය කාර්යය ක්‍රියාවලියේ කොටසක් ලෙස අදාළ ක්‍රියාමාර්ග ගනු ලැබේ.

දිගු කාලයක් සඳහා හිඟව පවතින ශේෂයන්ගෙන් බොහොමයක්, පාරිභෝගිකයන් සමඟ ආරවුල් හේතුවෙන් අධිභාර, පොලී ආදිය ඇතුළත් හිඟ හිට පවතින ශේෂයන් වේ. අදාළ අවස්ථාවලදී බේරුම්කාර මණ්ඩල හා නීති අංශයේ සහාය සහිතව සිහිකැඳවීම් ලිපි, අවසාන නිවේදන, නීතිමය ක්‍රියාමාර්ග ගැනීම හා විසන්ධි කිරීම් නියෝග ආදී ක්‍රියාමාර්ග ගනු ලැබේ.

තවද 2014 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැතියන් පිළිබඳ කාල විශ්ලේෂණය අනුව, මුළු වෙළඳ ණයගැති ශේෂයෙන් 4% කින් පමණක් වර්ෂ 2 කට වැඩි ණයගැතියන් නියෝජනය වන අතර 85% ක් මාස තුනකට අඩු වෙළඳ ණයගැති ශේෂයෙන් නියෝජනය වේ.

(ඇ) වර්ෂ 05 කට වැඩි කාලයක් පරිශේෂව පැවති ලංකා ඛනිජ තෙල් සංස්ථාව සඳහා ණයහිමි ශේෂය

සම්ප්‍රේෂණ රැහැන මාරු කිරීම සඳහා ලංකා ඛනිජ තෙල් සංස්ථාව විසින් රු.7,000,000 මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද ලංකා ඛනිජ තෙල් සංස්ථාවට එම කාර්යය කිරීමේ අවශ්‍යතාවයක් නොවූ හෙයින් එම කාර්යය සිදු නොකරන ලදී. එබැවින් එම මුදල, ආපසු ගෙවීම සඳහා ගෙවීම් වවුචර මුල් පිටපත ලංකා ඛනිජ තෙල් සංස්ථාව විසින් ඉදිරිපත් කළ යුතුය. එතෙක් එම ශේෂය ගිණුම්වල ණයහිමියෙකු ලෙස දැක්වේ.

(ඈ) වෙස්ට් කෝස්ට් විදුලිබල පිරියත හා සුනිත්‍ය බලශක්ති අධිකාරිය යටතේ කුඩා ජල විදුලිබල සංවර්ධකයින්ට අදාළව එකතුව රු. මිලියන 911.4 ක මුදල වර්ෂ 5 කට වැඩි කාලයක් හිඟ හිට පැවතීම.

වෙස්ට් කෝස්ට් විදුලිබල පිරියත (කෙරවළපිටිය) ඒකාබද්ධ විදුලිබල පිරියතෙහි විවෘත කිරීමේ උත්සවයේ වියදම් සම්බන්ධයෙන් ගනුදෙනු සඳහා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයට ගෙවීමක් කරන ලදී. මෙම වියදම් අමාත්‍යාංශය විසින් ප්‍රතිපූර්ණය කළ යුතුය.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

සිහි කැඳවීම් ලිපියක් 2013 ඔක්තෝබර් 1 දින යවන ලද නමුත් පිළිතුරක් නොලැබුණි. නැවත 2015 ඔක්තෝබර් 8 දින නව සිහි කැඳවීමක් යවන ලදී.

පුනර්ජනනීය බලශක්තිය සඳහා පිරිවැය පදනම සකස් කිරීමේ අවස්ථාවේදී අත්හරින පිරිවැයෙන් 90% කට සමාන කොටසක් පමණක් ලංවිම විසින් දැරිය යුතු බව තීරණය කර තිබුණි. ගාස්තු පදනම මත සම්පූර්ණ මුදල ලංවිම විසින් ගෙවිය යුතු බවත් 90% ක අත්හරින පිරිවැයට වැඩි අතිරික්ත මුදල සුනිත්‍ය බල ශක්ති අධිකාරිය විසින් ප්‍රතිපූර්ණය කළ යුතු බවට තවදුරටත් එකඟ වී තිබුණි. ප්‍රතිපූර්ණය කළ යුතු මුදල සුනිත්‍ය බල ශක්ති අධිකාරියට ලංවිම විසින් මාසිකව දක්වනු ලැබේ. 2010/12/31 දිනට ලැබිය යුතු එම මුදල රු. 897,025,999 කි.

සිහි කැඳවීම් ලිපියක් 2013 ඔක්තෝබර් 1 දින යවා තිබුණද පිළිතුරක් නොලැබුණු හෙයින් නව සිහි කැඳවීම් ලිපියක් 2015 ඔක්තෝබර් 08 දින යවන ලදී. එසේම ගෙවීම නිරවුල් කරන තුරු බලශක්ති උත්පාදනය මිලදී ගැනීම සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරියට ගෙවීම් අත්හිටු වීමට තීරණයක් ද ගන්නා ලදී.

(ඉ) ලංකා විදුලි සමාගමෙන් (LECO) ලැබිය යුතු වර්ෂ 05 කට වැඩි කාලයක් වූ දිගුකාලීන හිඟ ශේෂය

ලංකා විදුලි සමාගම සමඟ පැවති දිගුකාලීන හිඟ ශේෂ පිළිබඳ විස්තර අධ්‍යයනය කිරීම සඳහා සභාපති විසින් කමිටුවක් පත්කරන ලද අතර කමිටු වාර්තාව ලද වහාම අවශ්‍ය පියවර ගනු ලැබේ.

(ඊ) "නිකුත් කිරීම්" ලෙස නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (WPS 01) යටතේ වූ අසාමාන්‍ය ස්වරූපයේ විවිධ ණයගැතියන්

අභ්‍යන්තර මාරු කිරීම් ලෙස එක් පිරිවැය මධ්‍යස්ථානයකින් තවත් පිරිවැය මධ්‍යස්ථානයකට භාණ්ඩ නිකුත් කිරීමේදී අවසාන ලැබීමේදී භාණ්ඩ ලැබීම් පත්‍රිකා සකස් කරනු ලැබේ. කෙසේ වුවද, භාණ්ඩ ලැබීම් පත්‍රිකාවේ පිටපතක් ගණකාධිකාරී වෙත ලැබෙන තෙක් අදාළ නිකුත් කිරීම නොසැසඳු ලෙස තොග ලෙජරයේ පවතින අතර නිකුත් කිරීම් පාර්ශවය විසින් එය ලැබිය යුතු ලෙස තාවකාලිකව සටහන් කර පසුව එය නිරවුල් කරනු ලැබේ.

2.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) ඌව පළාත් කාර්යාලයට අයත් රු. මිලියන 38 ක් වටිනා ඉඩම් 12 ක ඉඩම් ඔප්පු විගණනයට ඉදිරිපත් නොකිරීම

2015 මාර්තු 13 දිනැති අංක DGM(AM&C)Land Survey/2014 දරන ලිපිය ප්‍රකාරව ලංවිම අයිතිය සතු ඉඩම් හඳුනා ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, මැනුම් සැලසුම් පිළියෙල කිරීම සඳහා තවදුරටත් කටයුතු කිරීමට 2015 මාර්තු 03 දිනැති DGM(Uva)/HRO/EA/Lands දරන ලිපිය මගින් ඒ පිළිබඳ විස්තර DGM(AM&C) වෙත යවන ලදී.

ඒ අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග සිදු කරනු ලැබේ.

(ආ) රු.14,238,758 ක් වටිනා මෝටර් වාහන 08 ක් වත්කම් යටතේ ඇතුළත් කර ඇති අතර මණ්ඩලයේ භෞතිකව නොතිබුණු බව නිරීක්ෂණය විය.

මෙම වාහන විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය (MOPE) වෙත මුදා හරින ලදී. එම වාහන පිළිබඳව විස්තර සොයා ගැනීමට දැනටමත් පියවර ගෙන ඇත. වාහන පිළිබඳ පසු විපරම් කටයුතු සිදු කරමින් පවතින අතර ඉදිරියේදී නිවැරදි කරනු ලැබේ.

2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

(අ) 1969 අංක 17 දරන ලංකා විදුලි බල මණ්ඩල පනත;

(i) 47(1)(ආ) වගන්තිය - ණය නිදහස් කිරීමේ සංචිතය

කාල පරිච්ඡේදය තුළදී ලංවිම විසින් අත් විඳින අඛණ්ඩ මෙහෙයුම් පාඩු හේතුවෙන් 2000 වර්ෂයේ සිට ණය නිදහස් කිරීමේ සංචිතය සඳහා වෙන් කිරීම් කර නොතිබුණි. එම සංචිතය සඳහා අදාළ අරමුදල් වෙන්කිරීමට ගනු ලබන තීරණය ලංවිම මුදල් ප්‍රවාහ තත්ත්වය මත රඳා පවතී. කෙසේ වුවද 47(1) (ආ) වගන්තිය කිසිදු වාර්ෂික දායකයක් පැහැදිලිව සඳහන් නොකරන අතර වාර්ෂික දායකය තීරණය කිරීමට මණ්ඩලයට අවසර දී ඇත.

මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් විගණන කමිටුවට යොමු කරන ලදී. 2015 මැයි 25 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී, 2014 දෙසැම්බර් 15 දින පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ කමිටු සටහන් තහවුරු කරන ලදී.

(ii) 47(2)(අ) වගන්තිය - මණ්ඩලය විසින් ක්ෂය සංචිතයක් ස්ථාපිත කර ඇති නමුත් 2000 වර්ෂයෙන් පසු කිසිදු ප්‍රතිපාදනයක් කර නොතිබීම.

ලංවිම දරන ලද අඛණ්ඩව පාඩුවල, ප්‍රතිඵලයක් ලෙස මෙම සංචිතයද යාවත්කාලීන නොකරන ලදී. 2000 වර්ෂය දක්වා උපයන

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

ලද ලාභවලින් අරමුදල් වෙන්කිරීම මගින්, 47(2)(අ) වගන්තිය ප්‍රකාර ක්ෂය සංචිතයද ස්ථාපිත කර ඇත. කෙසේ වුවද එම මුදල බාහිරව ආයෝජනය කර නැත.

මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව විගණන කමිටුවට යොමු කරන ලදී. 2015 මැයි 25 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී 2014 දෙසැම්බර් 15 දින පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ කමිටු සටහන් තහවුරු කරන ලදී.

(iii) 47(2)(ආ) වගන්තිය - වෙනත් ප්‍රාග්ධන සංචිතයක් මණ්ඩලය විසින් ස්ථාපිත කර තිබුණද 2000 වර්ෂයේ සිට යාවත්කාලීන කර නොතිබුණි.

සෘණාත්මක මුදල් ප්‍රවාහ තත්ත්වය හා ලංවීම විසින් දරන ලද අඛණ්ඩ පාඩු හේතුවෙන් 2000 වර්ෂයේ සිට මෙම සංචිතය සඳහාද ප්‍රතිපාදනයක් කර නොතිබුණි.

මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් විගණන කමිටුවට යොමු කරන ලදී. 2015 මැයි 15 දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී, 2015 දෙසැම්බර් 14 දින පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ කමිටු සටහන් තහවුරු කරන ලදී.

(ආ) ඉන්ෂුවරන්ස් එස්ක්‍රෝ අරමුදලේ ප්‍රමාණවත් නොවූ ආයෝජනය

ඕනෑම අවස්ථාවක සිදුවන පාඩුවක් හානිකරණය කිරීමේ කාර්යය සඳහා කඩිනමින් අවශ්‍ය වන අරමුදල් සඳහා මෙම ඉන්ෂුවරන්ස් එස්ක්‍රෝ අරමුදල ඇති කරන ලදී. 1987 ලෝක බැංකුව සමග කරන ලද සාකච්ඡා වලට අනුව, අඩු අවදානම් මූල්‍ය ආයතනයක ආයෝජනය සඳහා මණ්ඩලය විසින් තීරණය කරන ලදී. එබැවින් මෙම ඉන්ෂුවරන්ස් එස්ක්‍රෝ අරමුදල මහජන බැංකුවේ ක්‍රියාත්මක වේ.

මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් විගණන කමිටුවට යොමු කරන ලදී. 2014 දෙසැම්බර් 15 දිනැති විගණන කමිටු වාර්තාව මගින් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවේ නිර්දේශය සලකා බලන ලද අතර අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවේ සඳහන් අදාළ සංචිතයන් පවත්වා ගැනීමට එකඟ වන ලදී.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

දැනගැනීම සඳහා

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ) මූල්‍ය තත්ත්වය

දැනගැනීම සඳහා

(ආ) මුළු විස්තීර්ණ ලාභය/ (පාඩුව) විශ්ලේෂණය

දැනගැනීම සඳහා

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

(අ) විදුලි බල උත්පාදනය හා සෘජු පිරිවැය

දැනගැනීම සඳහා

(ආ) විදුලි බල ඒකකයක් සඳහා ලාභය/ (පාඩුව)

දැනගැනීම සඳහා

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

4.2.1 ලක් විජය විදුලි බලාගාර මධ්‍යස්ථානයේ මෙහෙයුම්

i. ගල් අඟුරු තොග මට්ටම් දැක්වීම සඳහා ලක් විජය විදුලි බලාගාර මධ්‍යස්ථානය (LVPS) විසින් තොග ලේඛන පවත්වා නොතිබුණි.

ගල් අඟුරු විදුලිබල මධ්‍යස්ථානයක, කාලය විචලනය වන නොයෙක් පද්ධති පරාමිතීන් සමඟ පරිභෝජන ප්‍රමාණය විචලනය වන හෙයින් පරිභෝජන ක්‍රියාවලියට පෙර ගල් අඟුරු අවශ්‍යතාවය එවිය නොහැකිය. එම ගල් අඟුරු ප්‍රමාණය පරිභෝජනය කිරීමෙන් පසු ගල් අඟුරු අවශ්‍යතාවය තීරණය කිරීම සතියක් පාසා සිදු කරනු ලැබේ.

* ස්වාධීන මැනුම්කරුවකු විසින් දළ මැනීම් සටහනක් යොදා ගනිමින් ගල් අඟුරු ප්‍රමාණය පටවන වරායේදී ගණනය කරනු ලැබේ. කර්මාන්තයේ ගල් අඟුරු ප්‍රමාණය මැනීම සඳහා එය පිළිගත් ක්‍රමයකි.

* නැවෙන් බෑමේදී ලංවිම කාර්ය මණ්ඩලය විසින් ජෙටියේදී අඛණ්ඩව නියාමනය කරනු ලැබේ.

* ලක් විජය විදුලි බල මධ්‍යස්ථානයේ ගල් අඟුරු අවශ්‍යතා ක්‍රියාවලිය ක්‍රියාත්මක වන අතර විදුලි බල මධ්‍යස්ථානයේ සතියක ගල් අඟුරු අවශ්‍යතාවය ඇණවුම් පත්‍රිකාවක් මඟින් ගබඩා භාරකරුගෙන් මෙහෙයුම් ඉංජිනේරු විසින් ඉල්ලා යවනු ලබන අතර ගබඩා භාරකරු ඇණවුම නිකුත් කරනු ලැබේ. ඇණවුම් පත්‍රිකා අනුව ගබඩා භාරකරු තොග මට්ටම යාවත්කාලීන කරන අතර පද්ධතිය නිවැරදිව පවත්වා ගැනීම සඳහා සියලු අදාළ පාර්ශවයන්ට උපදෙස් දෙනු ලැබේ.

ii. මුල් මාස 9 තුළ උපයෝජනය කරන ලද ගල් අඟුරු මෙට්‍රික් ටොන් 181,016 ක් තොග වාර්තාවලට ගෙන නොතිබුණි.

විමසුමේ දැක්වෙන සංඛ්‍යා දෙකම එකම දත්ත පදනම් කරගෙන තිබූ හෙයින් හා ඒවා සමාන වන හෙයින් එහිදී ගණනය කිරීමේ දෝෂයක් විය හැක.

iii. මුළු ගල් අඟුරු අවශ්‍යතාවය ගබඩා කිරීම සඳහා ප්‍රමාණවත් ගබඩා ධාරිතාවයක් ලබා ගැනීමට නොමැත.

දැනටමත් ගල් අඟුරු ගබඩා කිරීමේ අංගණය සඳහා අවශ්‍ය අතිරේක ප්‍රදේශය ලක් විජය විදුලි බලාගාරය විසින් හඳුනා ගෙන ඇත. ලබාගත හැකි වූ විස්තර අනුව, අප්‍රේල් මැද සිට සැප්තැම්බර් මැද දක්වා වූ අකාලය (off season) සඳහා ගල් අඟුරු ගබඩා කිරීමට MMT 1.21 දක්වා ගල් අඟුරු අංගණය ව්‍යාප්ත කිරීම ප්‍රමාණවත් වේ. ගල් අඟුරු අංගණය ව්‍යාප්ත කිරීමේ වැඩවලට අදාළව ආරම්භක පියවරයන් දැනටමත් ගෙන ඇත.

iv. අතිරේක ගල් අඟුරු තොගය

ගල් අඟුරු තොග ලැබෙන කාලය තුළදී ගල් අඟුරු තොග ගොඩගැසීම ඉතා විශාල වූ අවස්ථාවක 2014 දෙසැම්බර් 31 දින ගල් අඟුරු තොග භෞතික සත්‍යාපනය සිදු කර තිබුණු හෙයින් එය එම සමීක්ෂණයේ නිරවද්‍යතාවයට බලපා ඇත. එබැවින් 2015 ජුනි 18 දින නැවතත් භෞතික තොග සත්‍යාපනයක් සිදු කරන ලද අතර එහි ප්‍රතිඵල වූයේ පොත් අගයට වඩා 0.9% ක වැඩිවීමක් පමණි. (අනුමත වෙනස 5% ක් වේ) නැව් මඟින් ගෙනෙන ගල් අඟුරු තොගය ජාත්‍යන්තර ස්වාධීන මැනීම් අධිකාරිය විසින් දළ මැනීමක් මඟින් ගණනය කරනු ලැබේ.

v. විදුලි බල උත්පාදනය සඳහා නිකුත් කරන ලද ගල් අඟුරු ප්‍රමාණය හා විදුලි බලය උත්පාදනය සඳහා තිබිය යුතු ගල් අඟුරු ප්‍රමාණය අතර රු. මිලියන 2,144 ක වෙනස

ගණනය කිරීම සඳහා ශුද්ධ බලශක්ති උත්පාදනය විමසුමේ යොදාගෙන තිබූ නමුත්, මෙය දළ උත්පාදනය ලෙස නිවැරදි විය යුතුය.

තවද ලබාගත් වටිනාකම සැලසුම් වටිනාකමක් පමණි. කි.වො.පැයක් නිෂ්පාදනය සඳහා ගල් අඟුරු පරිභෝජනය ගල් අඟුරුවල ගුණය මත පදනම් වේ. ප්‍රධාන වශයෙන් ගල් අඟුරු පරිභෝජනයේදී තාපජනක අගය, ගල් අඟුරුවල තෙතමනය බලපානු ලැබේ.

ඊට අමතරව, විදුලිබල පද්ධතියේ අවශ්‍යතාවයන් හේතුවෙන් පසුගිය වර්ෂයේ අඩු ධාරිතාවයක් මත පිරියතයන් ක්‍රියාත්මක වී තිබුණු අතරසැලසුම් අගයට (design value) වඩා ගල් අඟුරු පරිභෝජනය වැඩිවීමට එය හේතුවක්ද වී තිබුණි.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

4.2.2 ගල් අඟුරු ප්‍රසම්පාදනයේ අඩුපාඩු

(අ) නැව් ගත කිරීම් 3 ක් මත ලැබුණු ගල් අඟුරුවල දළ තාපජනක වටිනාකම (GCV) පිරියතෙහි සම්මත අගයට වඩා අඩුවීම.

ගල් අඟුරු සැපයුම්කරුගේ ගිවිසුම අනුව, පටවන වරායේ හා බෑමේ වරායේදී වාර්තා දෙක අතර ගල් අඟුරුවල තත්ත්ව විශ්ලේෂණය සම්බන්ධයෙන් විශාල වෙනසක් අනාවරණය වීමේදී ලංවිම විසින් නම් කරන ලද පරීක්ෂණ අධිකාරියට පටවන වරායේ තීරක සාම්පලය (Umpire Sample) යවනු ලැබේ.

ඒ අනුව, 18, 19 හා 20 නැව් සඳහා වූ තීරක සාම්පල ලංවිම විසින් නම් කරන ලද සුදුසු පරීක්ෂකවරයකුට යවන ලද අතර ඔවුන්ගේ පරීක්ෂණ වාර්තා අනුව සපයන ලද ගල් අඟුරුවල තත්ත්වය පිළිගත හැකි මට්ටමේ පැවතුණි. පටවන වරායන්වල තීරක සාම්පල පරීක්ෂණ වාර්තා අනුව, දළ තාප ජනක වටිනාකම් (GCV) පිළිවෙලින් 6069, 5931 හා 6069 වූ අතර ඒවා සියල්ල පිළිගත හැකි තත්ත්වයේ විය. විගණන වාර්තාවේ සඳහන් ඉන්දියානු අධිකරණය මඟින් අසාධුගත කිරීම ලංකා ගල් අඟුරු සමාගම නොදනී.

(ආ) දළ තාප ජනක වටිනාකම අඩු ගල් අඟුරු පරිභෝජනය හේතුවෙන් ලංවිමට රු. මිලියන 345 ක පාඩුවක් දැරීමට සිදු වීම හා දළ තාප ජනක වටිනාකම අඩු ගල් අඟුරු පරිභෝජනයෙන් වූ විදුලි බල උත්පාදනයේ ඌනතාවය සම්පූර්ණ කිරීම සඳහා විකල්ප බලශක්ති ප්‍රභවයන් යොදා ගැනීම හේතුවෙන් රු. මිලියන 507.6 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදුවීම.

අතිරේක ගල් අඟුරු පරිභෝජන පාඩුව දළ තාප ජනක වටිනාකම අඩු ගල් අඟුරු නැව්ගත කිරීම් තුනකදී ලක් විජය විදුලි බලාගාර මධ්‍යස්ථානය විසින් කරන ලද ඇස්තමේන්තුවක් පමණි. එසේම ලක් විජය විදුලි බල මධ්‍යස්ථානය විසින් සැපයීම් කළ නොහැකි බලශක්තිය සැපයීම සඳහා විකල්ප පිරියතක් තෝරා ගැනීමේ පිරිවැය සඳහා එය ඇස්තමේන්තු කරන ලදී.

බෑමේ වරායේ ගල් අඟුරු සාම්පල විශ්ලේෂණයට අනුව, ඉහත සඳහන් නැව් ගත කිරීම් තුන දළ තාප ජනක වටිනාකම අඩු ගල් අඟුරු ලෙස හඳුනාගන්නා ලදී. මෙම නැව් ගත කිරීම් තුන පිළිබඳව පැටවීම් වරායේ පරීක්ෂණ වාර්තාව අනුව ඒවා පිළිගත හැකි තත්ත්වයේ පැවතුණි.

සාමාන්‍යයෙන් සාම්පල ලබා ගැනීමේදී එක් එක් සාම්පල කොටස් දෙකකට බෙදනු ලැබේ. එක් කොටසක් සාම්පල විශ්ලේෂණ පරීක්ෂණ පහසුකම් සඳහා යොදා ගනී. ඉතිරි කොටස යොමුගත සාම්පලය ලෙස පවතී. එබැවින් බෑමේ වරායේදී ගල් අඟුරු සාම්පල විශ්ලේෂණ සහතිකයේ දළ තාප ජනක අගය අඩු ලෙස දැක්වේ නම් ගිවිසුම අනුව පටවන වරායේ යොමුගත සාම්පලය, (reference sample) ප්‍රතිඵලය පරීක්ෂා කිරීම සඳහා විශ්ලේෂණය කරනු ලැබේ. යොමුගත සාම්පල විශ්ලේෂණය ලංකා විදුලි බල මණ්ඩලය (CEB) විසින් නම් කරන ලද ස්වාධීන පරීක්ෂණ අධිකාරියක් මඟින් සිදු කර ඇත. යොමුගත සාම්පල විශ්ලේෂණය මඟින් වටිනාකම පිළිගත හැකි මට්ටමක බව දක්වා තිබූ අතර ලංවිම හා ලංකා කෝල් සමාගම අතර ගල් අඟුරු සැපයීම සඳහා කොන්ත්‍රාත් ගිවිසුමට අනුකූලව මිල ගැලපීම් සිදු කර ඇත.

(ඇ) කෙටි සැපයීම් හා නැව්ගත කිරීම් අංක 16 හා 17 සඳහා වැඩිපුර ගෙවීම

සැපයුම්කරු ඉතිරි ප්‍රමාණය සැපයීමට මෙන්ම ණයවර ලිපි මත වැඩිපුර ගෙවූ මුදල ආපසු ගෙවීමටද කැමැත්තෙන් සිටි අතර ගිවිසුම යටතේ සැපයිය යුතු වෙනත් නැව්ගත කිරීම් දෙකක් සැපයීමට ලංකා කෝල් සමාගම විසින් ඔවුන්ට ඉඩදී ඇත.

කෙසේ වුවද, මෙම සැපයුම්කරුගෙන් වෙනත් කිසිදු නැව්ගත කිරීම් භාර ගැනීමට ලංවිම සූදානම් නොවීය. නීතිමය උපදෙස් සඳහා මෙම කරුණ ලංකා කෝල් සමාගම විසින් නීතිපතිට යොමු කරන ලද අතර ඒ අනුව නීතිමය උපදෙස් ලබා ගැනීමට කටයුතු කරන ලදී. ආරවුල පිළිබඳ මිත්‍රශීලී නිරවුල් කිරීමක් සඳහා වූ ලංකා කෝල් සමාගම විසින් ඉදිරිපත් කරන ලද යෝජනා කිහිපයක් ප්‍රතික්ෂේප කරන ලදී.

ඉන්පසු මේ සම්බන්ධයෙන් පහත සඳහන් පියවරයන් ගන්නා ලදී.

* සන්ඩේ ලීඩර් පුවත්පතේ තොරතුරු දැන්වීමක තිබූ නැව්ගත කිරීම්වලට (16,17,18) අදාළව "Sucofindo" නමින් වූ ස්වාධීන පරීක්ෂණ බලධාරියකු විසින් නිකුත් කරන ලදැයි සඳහන් පරීක්ෂණ වාර්තාව පිළිබඳ සත්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා නීතිපති විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සහාය ඉල්ලා ඇත. ඒ අනුව ඉල්ලීම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇති අතර විමර්ශනයන් ඔවුන් සිදු කරන ලදී. කෙසේ වුවද මෙතෙක් කිසිදු වාර්තාවක් ලංකා කෝල් සමාග මට ලැබී නැත.

* මෙම සැපයුම්කරු විසින් සපයන ලද බාල තත්ත්වයෙන් යුත් ගල් අඟුරුවල යොදාගැනීමේ ප්‍රතිඵලයක් ලෙස ලංවිම විසින් දරන ලදැයි යන පාඩුවට සහාය සඳහා විශේෂඥවරුන්ගෙන් වාර්තාවක් ලබා ගැනීමට නීතිපති ඉල්ලා ඇත. ඒ අනුව මේ සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා ලංවිම විසින් කමිටුවක් පත්කරන ලද අතර, ලංවිම ඉල්ලීමට සහාය වශයෙන් සාක්ෂි ඇති බවට තහවුරු කළ නොහැක.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

* "Sucofindo" පරීක්ෂණ වාර්තාවේ සත්‍යතාවය සොයා ගැනීම සඳහා තොරතුරු සොයා ගැනීමට කණ්ඩායමක් ඉන්දුනීසියාවට යැවීමටට යෝජනා කරන ලදී. කෙසේ වෙතත් මේ වෙනතුරු එවැනි කණ්ඩායමක් ඉන්දුනීසියාවට යවා නැත. මේ අතර CSCL මගින් කරන ලද ඉල්ලීමට කරන ලද ප්‍රතිචාරයක් වශයෙන් ඉන්දුනීසියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් අපනයන සහතිකය ඉදිරිපත් කරන අවස්ථාවේ ඉන්දුනීසියානු රේගුවට "Sucofindo" පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් නොකළ බවට ඉන්දුනීසියාවේ මුදල් අමාත්‍යාංශය විසින් සහතික කරන ලද ලිපියක් ඉදිරිපත් කර ඇත.

* පොලිස් මූලස්ථානයේ විශේෂ විමර්ශන ඒකකය විසින් විමර්ශනයක් සිදු කරන ලද අතර, ඒ අවස්ථාවේ ලංකා කෝල් සමාග මේ අධ්‍යක්ෂවරුන් ලෙස කටයුතු කළ අධ්‍යක්ෂවරුන්ට විරුද්ධව නඩුවක් ගොනු කර ඇත.

* සැපයුම්කරු සමඟ ගිවිසගත හැකි නිරවුල් කිරීමක් සඳහා අනුමැතිය ලබා ගැනීමට වරාය හා නාවික අමාත්‍යාංශයක සමඟ එක්ව අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම සඳහා කටයුතු සම්පාදනය කිරීමට CSCL නිලධාරීන්ට විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් විසින් උපදෙස් දී ඇත.

## (ඈ) උපදේශකවරුන්ගේ උපදෙස් ලබා නොගැනීම හා පාඩු අයකර ගැනීමට ක්‍රියා නොකිරීම

බැමේ වරායේදී ගල් අඟුරු සාම්පල විශ්ලේෂණය අනුව, දළ තාප ජනක අගය අඩු ගල් අඟුරු හඳුනා ගෙන ඇත. මෙම නැව් ගත කිරීම් වලට අදාළව පටවන වරායේ පරීක්ෂණ වාර්තාවේ දළ තාප ජනක අගය පිළිගත හැකි මට්ටමේ තිබුණි.

සාමාන්‍යයෙන් සාම්පල ලබා ගැනීමේදී, එම සාම්පල කොටස් දෙකකට බෙදා එයින් එක් සාම්පලයක් පරීක්ෂණ ආයතනය විසින් විශ්ලේෂණය සඳහා යොදා ගනු ලැබේ. ඉතිරි කොටස යොමුගත සාම්පලය ලෙස තබා ගැනේ. එබැවින් බැමේ වරායේදී ගල් අඟුරු සාම්පලය විශ්ලේෂණය කිරීමේදී දළ තාප ජනක අගය අඩු ගල් අඟුරු සාම්පලයක් ලෙස නිරීක්ෂණය වේ නම් ගිවිසුම අනුව පටවන වරායේ යොමුගත සාම්පලය විශ්ලේෂණය කිරීමට ඉඩ සැලසේ.

ලංවිම (CEB) විසින් නම් කරන ලද ස්වාධීන පරීක්ෂණ අධිකාරියක් විසින් යොමුගත සාම්පලය විශ්ලේෂණය කර ඇත. යොමුගත සාම්පල විශ්ලේෂණයේදී පිළිගත හැකි මට්ටමට තිබූ අතර ලංවිම සහ ලංකා කෝල් සමාගම අතර කොන්ත්‍රාත් ගිවිසුමට අනුකූලව ගල් අඟුරු සැපයීම සඳහා මිල ගැලපීම් සිදු කර ඇත

## (ඉ) වැරදි සැපයුම්කරුවකු පත්කර ගැනීම හා අතිරේක පිරිවැයක් දැරීම

අමාත්‍ය මණ්ඩලය පත්කරන ලද ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය, ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලය විසින් අමාත්‍ය මණ්ඩලයට කරන ලද නිර්දේශය මත පදනම් වේ.

## (ඊ) බර තීරණය කිරීමේ සහතිකය ඍජු සනාථ කිරීමක් ලෙස ලංවිමට යවනු නොලැබීම.

බර තීරණය කිරීම ස්වාධීන මැනුම්කරුවකු විසින් පත්කරන ලද සුදුසුකම්ලත් වෘත්තිකයින් විසින් සිදු කරන අතර සියලුම සහතික ලංකා කෝල් සමාගම විසින් ලංවිමට ඉදිරිපත් කරනු ලැබේ. එම ලියකියවිලිවල පිටපත් විගණකවරුන්ගේ පරීක්ෂාවට ලංකා කෝල් සමාගමෙන් ලබා ගත හැක.

## (උ) ගල් අඟුරු තොගය මැනීම සඳහා ජාත්‍යන්තරව භාවිතා කරන ක්‍රමෝපාය හෝ ශිල්පීය ක්‍රම ලංවිම විසින් අනුගමනය කර හෝ හඳුනාගෙන නොතිබීම.

සහතික ලත් මැනුම්කරුවකු විසින් ගල් අඟුරු අංගණයේ තොග සමීක්ෂණය වර්ෂයකට වරක් සිදු කරනු ලැබේ. එසේම ගල් අඟුරු නැව්ගත කිරීම් ස්වාධීන පරීක්ෂණ අධිකාරියක් විසින් සමීක්ෂණය කරනු ලැබේ.

## (ඌ) ලංවිම විසින් සිදු කරන ලද වැඩිපුර ගෙවීම් හා වැඩිපුර ගෙවන ලද මුදල් නිරවුල් කිරීම සඳහා ලංකා කෝල් සමාගම විසින් දිගු කාලයක් ගත කිරීම.

පාඩුව ගණනය කිරීම සඳහා වගුවේ තිබූ දිනයන් නිවැරදි නොවේ. තථ්‍ය දිනයන් පහත පරිදි වේ.

| | නැව්ගත කිරීම් 3 | නැව්ගත කිරීම් 44 |
|---|---|---|
| ණයවර බිල්පත්‍ර නිරවුල් කිරීමේ දිනය | 2014-03-10 | 2014-03-28 |
| වැඩිපුර ගෙවන ලද මුදල හසෘෂජබ විසින් ලංකා කෝල් සමාගමට ආපසු ගෙවූ දිනය | 2015-08-04 | 2014-08-04 |
| ලංකා කෝල් සමාගම විසින් ලංවිමට ගෙවූ මුදල | 2014-08-07 | 2014-08-07 |

ඉහත කරුණු අනුව, වැඩිපුර ගෙවන ලද මුදල් NRIPL විසින් ආපසු ගෙවීමේදී නුවමනා ප්‍රමාදයක් තිබුණද ලංකා කෝල් සමාගම පාර්ශවයෙන් බලන විට ප්‍රමාදයක් සිදු වී නොතිබුණි.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

(එ) ගල් අඟුරු සැපයීමේ ඌනතාවය හා අදාළ පාඩු

ලක් විජය විදුලි බලාගාරය සඳහා ගල් අඟුරු කෙටි සැපයුම් සඳහා පහත කරුණු දායක වී ඇත.

1. ටෙන්ඩර් ප්‍රදානය කිරීමේ ප්‍රමාදය
2. පැටවීම් වරායේ හා බෑමේ වරායේදී වූ අහිතකර කාලගුණය හේතුවෙන් ප්‍රමාදය
3. රළු මුහුදු තත්ත්වයන් හේතුවෙන් නැව් යාත්‍රා කිරීමේ ප්‍රමාදයන්
4. නැව්වල ගල් අඟුරු බෑමේ උපකරණවල අඩුපාඩු
5. ජෙටියේදී ක්‍රේන්වල හා ගෙනයන පටිවල (conveyor belts) අඩුපාඩු

(ඒ) ලංකා කෝල් සමාගම හා ලංවිම විසින් විධිමත් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

අතිරේක සාමාන්‍යාධිකාරී (ජනන) විසින් ලංකා කෝල් සමාගමට (LCC) තාප ගල් අඟුරු අවශ්‍යතාවය (උදා: 2015/2016) මාසික පදනම මත දන්වනු ලැබේ. ලංවිම අවශ්‍යතාවය පදනම් කරගෙන ලංකා කෝල් සමාගම විසින් ගල් අඟුරු සැපයුම්කරුට ඇනවුම් කරනු ලැබේ.

(ඔ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ විධිමත් ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් විස්තර ඉදිරිපත් කිරීමට ලංකා කෝල් සමාගම අසමත් වී තිබුණි.

ගල් අඟුරුවල සම්පූර්ණ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අමාත්‍ය මණ්ඩලය පත් කරන සම්මත ප්‍රසම්පාදන කමිටුවේ (SLAPC) මග පෙන්වීම යටතේ සිදු කරනු ලැබේ. ලැයිස්තුගත කරන ලද සියලු ලියකියවිලි ලංකා කෝල් සමාගමෙන් හෝ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයෙන් ලබා ගත හැක.

4.2.3 විදුලි බල තොග සැපයුම්කරුවන්ගෙන් ඇප තැන්පතු තබා ගැනීම

(අ) තොග විදුලිබල සැපයුම්කරුවන් 123 ක ගෙන් ඇප තැන්පතු ලබා නොගැනීම.

විගණන නියැදි පරීක්ෂණයේදී, බිල් කිරීම් පද්ධතියේ කාල විශ්ලේෂණ වාර්තාව යොදාගෙන ඇප තැන්පතු තැබීම පිළිබඳව පරීක්ෂා කරන ලද අතර එහිදී සමහර ඇප තැන්පතු තැබීම් නියමිත පරිදි යාවත්කාලීන කර නොතිබුණි.

අවශ්‍ය ඇප තැන්පතු ප්‍රමාණය නොගෙවන ලද ගනුදෙනුකරුවන්ට ගෙවීම් කිරීම සඳහා ඉල්ලීම් ලිපි යැවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

(ආ) තොග පාරිභෝගිකයන් 568 ක් විසින් පවත්වාගෙන යන වර්තමාන ඇප තැන්පතු වටිනාකම ප්‍රමාණවත් නොවීම.

පාරිභෝගිකයින්ගෙන් තොග සැපයුම් තැන්පතු සමාලෝචනය කිරීම සඳහා හා ඔවුන්ගේ කොන්ත්‍රාත් ඉල්ලුමට ගැලපෙන පරිදි ඇප තැන්පතුව වැඩි කිරීම සඳහා ඔවුන්ට දැන්වීමටද ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත.

(ඇ) අවසන් කර ඇති (අයකරගත නොහැකි) ලෙස දැනටමත් හඳුනාගෙන ඇති ගිණුම් අයත් තොග පාරිභෝගිකයින් 15 දෙනෙකුගේ ඇප තැන්පතු මට්ටම ප්‍රමාණවත් නොවීම හේතුවෙන් එය බොහෝ දුරට මණ්ඩලයට පාඩුවක් විය හැකිය.

පහත සඳහන් ගිණුම් 09 ට අදාළව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා ලංවිම නීති අංශයට දන්වා යවා ඇත.

| | ප්‍රදේශය | ගිණුම් අංකය | ශේෂය (රු.) |
|---|---|---|---|
| 01 | රත්මලාන | 2170000062 | 45,845.42 |
| 02 | | 2170000127 | 42,947.59 |
| 03 | | 2170000453 | 72,985.12 |
| 04 | | 2170000658 | 1,973,804.15 |
| 05 | | 2170000174 | 12,109.34 |
| 06 | | 2170001530 | 150,525.67 |
| 07 | | 2170001808 | 2,819.02 |
| 08 | කළුතර | 4470000213 | 33,164.41 |
| 09 | | 4470000825 | 683,814.37 |

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

පහත සඳහන් ගනුදෙනුකරුවන්ගේ ඇප තැන්පතුවල ශේෂයන් අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත.

| | ප්‍රදේශය | ගිණුම් අංකය | ශේෂය (රු.) |
|---|---|---|---|
| 01 | රත්මලාන | 2170000070 | 6,000.00 |
| 02 | දෙහිවල | 3870001313 | 4,903.86 |
| 03 | | 3870001062 | 126,910.39 |
| 04 | කළුතර | 4470000302 | 42,464.10 |
| 05 | | 4470001252 | 29,635.03 |
| 06 | | 4470000922 | 7,243.32 |

4.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) මණ්ඩලය විසින් එහි පද්ධති / අත්පොත් සංශෝධනය කර යාවත්කාලීන කර නොතිබීම.

පද්ධති අත්පොත්වල වගන්ති අඛණ්ඩව චක්‍රලේඛ මගින් අවශ්‍ය අවස්ථාවලදී යාවත්කාලීන කරනු ලැබේ. සංශෝධනයක් සඳහා ඉතා අවශ්‍ය වූ මාරු කිරීම් පිළිබඳ අත්පොත යළි කෙටුම්පත් කර ඇති අතර වෘත්තීය සමිතිවල අදහස් දැක්වීම්/ යෝජනා සඳහා වෘත්තීය සංගම් අතරට නිකුත් කරන ලදී.

තවද ක්‍රියාත්මක වන සියලුම ක්‍රියාකාරී ක්‍රමෝපාය හා කාර්ය ක්‍රම ක්‍රියාවලි සමාලෝචනය සඳහා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයෙකු යටතේ වෙනම ශාඛාවක් පිහිටුවන ලදී. මෙය අතිරේක සාමාන්‍යාධිකාරී (ආයතනික ක්‍රමෝපාය) යටතේ පිහිටුවා ඇත.

(ආ) විදේශීය පුහුණු සඳහා යවන ලද නිලධාරීන්ට ගෙවන ලද වැඩිපුර ගෙවීම් හා ඒවා අයකර නොගැනීම.

සභාපති හා සාමාන්‍යාධිකාරී හැරුණු විට අනිකුත් ලංවිම සේවකයන් සඳහා විදේශ පුහුණු සඳහා ඒකාබද්ධ දීමනා 2014.09.05 දින භාණ්ඩාගාර ලේකම්ගෙන් ලැබුණු උපදෙස් මත බලපැවැත්වෙන පරිදි 2010 ඔක්තෝබර් 11 දිනැති අංක MOFP/01/2010/01 දරන චක්‍රලේඛයට අනුව 11 වර්ගය යටතේ ගෙවා ඇත.

(ඇ) නැගෙනහිර පළාතේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට වර්ෂ 4 කට වැඩි කාල පරිච්ඡේදයක් පැවති හානි වූ තොග අපහරණය කිරීම සඳහා කටයුතු නොකිරීම.

අපහරණය කළ යුතු තොග හඳුනා ගැනීම සඳහා කමිටුවක් පත් කරන ලද අතර කමිටුවේ වාර්තාව ලැබුණු වහාම අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

(ඈ) කෙරීගෙන යන වැඩ තත්ත්වයේ පවතින විදුලි බල කාර්යයන් 118 ක් වර්ෂ 05 කට වැඩි කාලයක් පැවතීම.

| අංශය | කාර්යයන් ගණන | වටිනාකම (රු.) |
|---|---|---|
| බෙදාහැරීම් අංශය 2 | 3 | 4,714,160 |
| බෙදාහැරීම් අංශය 3 | 115 | 120,534,060 |
| එකතුව | 118 | 125,248,220 |

විගණන වාර්තාව අනුව, කෙරීගෙන යන වැඩ තත්ත්වයෙන් වූ බස්නාහිර පළාත උතුරහි (WPN)වර්ෂ 05 කට වැඩි කාලයක් බෙදාහැරීම් අංශය 2හි පැවති කාර්යයන් 3 ක් හඳුනාගන්නා ලදී. ක්‍රියාවලිය ඉක්මණින් සම්පූර්ණ කිරීම සඳහා WPN වාණිජ ඉංජිනේරු වෙතට මෙම කාර්යයන් පිළිබඳ විස්තර භාර දෙන ලදී.

බෙදාහැරීම් අංශය 3 සඳහා විගණන විමසුමේ පෙන්වා දී තිබූ මුදල් බස්නාහිර පළාත දකුණ (WPS II) ට අදාළ වේ. WPS II තැනීම් ශාඛාවේ කෙරීගෙන යන වැඩවල දිගුකාලීන පරිශේෂයන් නිරවුල් කිරීම සඳහා 2015 සැප්තැම්බර් 08 දින කමිටුවක් පත්කරන ලදී. කෙරීගෙන යන වැඩ ශේෂයන් පිළිබඳ ලැයිස්තුව මනාව පරීක්ෂා කිරීමෙන් පසුව කමිටු නිර්දේශයන් අප වෙත ලැබීමෙන් පසුව කෙරීගෙන යන වැඩ ගිණුම්වල පවතින ශේෂය නිරවුල් කිරීම අපේක්ෂා කෙරේ.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

## (ඉ) ලංකා ඛනිජ තෙල් සංස්ථාව විසින් සපයන ලද කෙටි ඉන්ධන සැපයීම සම්බන්ධයෙන් කරුණු 2014 දෙසැම්බර් 31 වන විටත් විසඳා ගෙන නොතිබීම.

2015 ජුලි 29 දින විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් විසින් සභාපතිත්වය දරන රැස්වීමේදී, ප්‍රමාණය පදනම මත 0.25% ක වට්ටමක් ලබා දීම සඳහා තීරණය කර තිබුණි. 2015 ඔක්තෝබර් 19 දින අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් දැනටමත් ඉදිරිපත් කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලද වහාම අදාළ සටහන් සම්මත කරනු ලැබේ.

## (ඊ) නොරොච්චෝලෙයි ධීවරයන් සමඟ ගැටුම අවම කර ගැනීමට අදාළව පළාත් පාලන ආයතන හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට කරන ලද ගෙවීම් සඳහා සාක්ෂි නොවීම.

ධීවරයන් ගණනකගේ විරුද්ධවීම් අඩුකිරීම සඳහා (අවම වශයෙන් සියයට 20% කින්) සහ ව්‍යාපෘතිය සඳහා වැඩි ධීවරයන් ප්‍රමාණයකගේ සහාය දිනා (අවම වශයෙන් 50%) ගැනීම සඳහා ප්‍රදේශයේ (පුත්තලම කලපුවේ පුත්තලම හා නරක්කල්ලි යන පැති දෙකම) යටිතල පහසුකම් සංවර්ධනය, පොදු පහසුකම් වැඩි දියුණු කිරීම හා ධීවරයන්ගේ ජීවන තත්ත්වය සංවර්ධන වැඩසටහන ආරම්භ කරන ලදී.

මෙම කාර්යයන් සඳහා, මණ්ඩලයේ හා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ අනුමැතිය සහිතව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන ලෙස පහත සඳහන් රාජ්‍ය ආයතන පත්කරන ලදී.

| යොමු අංකය | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන | වෙන් කරන ලද මුදල (රු.) |
|---|---|---|
| 01 | පුත්තලම - ප්‍රාදේශීය ලේකම් | 6,000,000 |
| 02 | කල්පිටිය - ප්‍රාදේශීය ලේකම් | 14,000,000 |
| 03 | නගර සභාව - පුත්තලම | 110,000,000 |
| 04 | ප්‍රාදේශීය සභාව - කල්පිටිය | 75,000,000 |

පුත්තලම නගර සභාවට ඔවුන් විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා රු. 83,100,000 ක මුදලක් මුදා හරින ලදී. වැඩසටහනේ අරමුණ හැකි ඉක්මන් කාලය තුළදී ඉටු කර ගැනීම සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීමට පුත්තලම නගර සභාව විසින් අනුමැතිය දෙන ලදී. (ධීවරයන් වැඩි ගණනකගේ සහාය ලබා ගැනීමට හා විරුද්ධවන ධීවරයන්ගේ සංඛ්‍යාව 20% කින් අඩුකිරීමට) විරුද්ධ වීම අවම කරගැනීම සඳහා පුත්තලම නගර සභාවේ පරිශ්‍රමය සාර්ථක වූ අතර පුත්තලම කලපුව හරහා 220 kV සම්ප්‍රේෂණ රැහැන ඉදිකිරීම 2014 නොවැම්බර් මාසයේදී නිම කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලක් විජය බලාගාරයේ යන්ත්‍ර 3 ම (3*300 Mw) ක්‍රියාත්මක වූ අතර දිනකට රු. මිලියන 100 ක පරාසයක විය හැකිව තිබූ පාඩු අවම කර ගැනීමට හැකි විය.

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයට සියලු භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය සඳහා අනුමැතිය ලබා දී තිබූ හෙයින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනවලට මුදා හරින ලද අරමුදල් ඔවුන්ගේ වියදම් ආවරණය කර ගැනීම සඳහා විය. මෙම වියදම්වලට අදාළ සියලු ප්‍රභව ලියකියවිලි ඔවුන් විසින් පවත්වා ගත යුතු විය.

ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට පෙර පුත්තලම හා කල්පිටිය ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ඔවුන්ගේ ගිණුම්වලට අනුමත සම්පූර්ණ ඇස්තමේන්තු මුදලම ලබා ගැනීමේ අවශ්‍යතාවයක් වී තිබුණි. එබැවින් පුත්තලම ප්‍රාදේශීය ලේකම් රු. 5,000,000 ක මුදලක් හා කල්පිටිය ප්‍රාදේශීය ලේකම්ට රු. 5,819,574 ක මුදලක් අනුමත සංවර්ධන කාර්යයන් ආරම්භ කිරීම සඳහා ගෙවීමට සිදු වී තිබුණි.

ආරම්භක වැඩ (සමාජ සමීක්ෂණය, ඇස්තමේන්තු වැඩ, පරිපාලන වියදම්) සිදු කිරීම සඳහා හා දේශීය ධීවරයන්ගේ ජීවන පහසුකම් ඉහළ නැංවීම දිරිගැන්වීම සඳහා ලංවිම විසින් ධීවරයන්ට වූ පොරොන්දුව ඒත්තු ගැන්වීම සඳහා කල්පිටිය ප්‍රාදේශීය සභාවට රු. 7,500,000 මුදලක් ගෙවන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ධීවරයන්ගේ විරුද්ධවීම් අවම වූ අතර ධීවරයන්ගේ අඩු විරෝධයත් සමඟ ව්‍යාපෘති කටයුතු සිදු කිරීමට හැකි විය. විදුලි මාර්ගය ඉක්මණින් නිමකිරීමෙන් වූ ප්‍රතිලාභය බැංකු පොලී හේතුවෙන් මූල්‍ය පාඩුවට වඩා වැඩි විය.

සඳහන් කළ වියදම් වාර්තා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය (පුත්තලම නගර සභාව) විසින් ඉදිරිපත් කරන ලද අතර ප්‍රභව ලියකියවිලි ඔවුන් විසින් පවත්වනු ලැබේ.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

(උ) රක්ෂණ සංචිතය ආයෝජනයෙන් ආපසු ගත් මුදල හා ආදේශ කරන ලද වත්කම්වල පිරිවැය අතර වෙනස

උතුරු පළාතේ ගැටුම් හේතුවෙන් හානි වූ වත්කම් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා රු. 1,324,945,404 ක මුදලක් නිර්දේශ කර තිබුණි. එහෙත් එම හානි වූ වත්කම් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා රක්ෂණ අරමුදලින් ආපසු ලබා ගන්නා ලද තථ්‍ය මුදල් පහත පරිදි වේ.

| ආපසු ලබා ගන්නා ලද වර්ෂය | මුදල (රු.) |
|---|---|
| 2009 | 626,801,059.18 |
| 2010 | 634,462,018.94 |
| | 1,261,263,078.12 |

එබැවින් ආපසු ලබා ගන්නා ලද මුදල ආදේශ කරන ලද වත්කම්වල පිරිවැයට සමාන වේ.

(ඌ) ජෙටි මෙහෙයුම්වලදී අකාර්යක්ෂමතාවය හේතුවෙන් ප්‍රමාද ගාස්තු ගෙවීම

ප්‍රමාද ගාස්තු ගෙවීමට සිදු වූයේ කාලගුණික තත්ත්වයන්, නැව් ගොඩ ගැසීම, ජෙටි ප්‍රමාදයන්, නැව්වල ක්‍රේන්වල බිඳීයාම් වන අතර ප්‍රධාන වශයෙන් ඒ සඳහා දායක වන්නේ කාලගුණික තත්ත්වයන්ය. පෙර අත්දැකීම් පදනම් කරගෙන ජෙටි මෙහෙයුම් වැඩිදියුණු කිරීම සඳහා දැනටමත් කටයුතු කර ඇති අතර පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා මෙම ක්‍රියාවලිය තවදුරටත් අඛණ්ඩව ක්‍රියාත්මක කෙරේ.

ගල් අඟුරු මෙහෙයුම් ලංවිම නව අත්දැකීමක් වන බැවින්, එම කාර්යයන් සඳහා පැහැදිලි නිර්වචනයන් නොමැත. මෙම දුර්වලතා අවම කර ගැනීම සඳහා පසුව කමිටුවක් පත් කරන ලද අතර එම කමිටු වාර්තාව 2015 ජූනි 10 සිට ලබා ගත හැකි වේ. එහි ප්‍රමාද ගාස්තු ගණනය කිරීම පිළිබඳ මග පෙන්වීම් ඇතුළත් වේ. එබැවින් එම මග පෙන්වීම් 2015 ගිණුම්වලද අනුගමනය කෙරේ.

තවද, ප්‍රමාද ගාස්තු අත්තිකාරම් ගෙවීම 2015 මැයි 21 දින කරන ලදී. අවසාන ගෙවීම අවසන් වූ පසු අවශ්‍ය ගිණුම්කරණ සටහන් සිදු කරනු ලැබේ.

4.4 නිෂ්කාර්ය වත්කම්

(අ) 2009 වර්ෂයේදී මිලදී ගන්නා ලද බත්තල් හා ටග් බෝට්ටු වර්ෂ 5 කට වැඩි කාලයක් නිෂ්කාර්යව පැවතීම.

එක් ටග් බෝට්ටුවක් හා බත්තල් 3 ක් විකිණීම සඳහා (බත්තල් 3 ක් හා ටග් බෝට්ටු 1 ක් විකිණීම සඳහා ටෙන්ඩරය ක්‍රියාත්මක වෙමින් පවතී) උත්පාදන අංශය විසින් ක්‍රියාමාර්ග ගන්නා ලදී. ඉතිරි ටග් බෝට්ටුව හා ලයින් බෝට්ටුව පිළිබඳ තක්සේරු වාර්තා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලංවිමට මෙතෙක් ඉදිරිපත් කර නැත.

(ආ) පුත්තලම ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘතිය අදියර 1 යටතේ මිලදීගත් බවුසර් පහක් විදුලිබල පිරියතෙහි උපයෝජනය කර නොතිබූ අතර මේ දක්වා වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමෙන් තොරව නිෂ්කාර්යව පැවතීම.

නිෂ්කාර්ය වත්කම් ලෙස සඳහන් බවුසර් පහ පුත්තලම ගල් අඟුරු විදුලිබල පිරියත ටෙන්ඩරය විසින් පියසැරි අළු (fly ash) ප්‍රවාහනය සඳහා සපයන ලදී. එහෙත් පියසැරි අළු විකිණීම සඳහා ටෙන්ඩරය අනුව, පියසැරි අළු ප්‍රවාහනය සඳහා ගැනුම්කරු විසින් පහසුකම් සලසා ගත යුතුය. එසේම එම බවුසර් ගැනුම්කරුගේ ස්ථානයට දිනපතා පියසැරි අළු ප්‍රමාණය ප්‍රවාහනය සඳහා ප්‍රමාණවත් නොවීය.

එබැවින්, ඉහත සඳහන් බවුසර් පියසැරි අළු ප්‍රවාහනය සඳහා යොදා නොගැණුනි. එහෙත් බවුසර් කිහිපයක් ජල බවුසර් බවට පත්කිරීමට සැලසුමක් තිබූ අතර, ගල් අඟුරු අංගණනයේ දහනය වීම් කටයුතුවලට හා අවශ්‍ය වූ අවස්ථාවලදී අළු ප්‍රවාහනය සඳහා යොදා ගනු ලැබේ.

අදියර II යටතේ එම බවුසර් ලැබී තිබූ අතර දැනට ඒවා ව්‍යාපෘති අංශයේ පොත්වල ව්‍යාපෘති පිරිවැය යටතේ (ප්‍රාග්ධනය - කෙරීගෙන යන වැඩ) පවතී. උත්පාදන අංශයට එම වත්කම් මාරු කළ පසු අදාළ ගිණුම් සටහන් සිදු කරනු ලැබේ.

4.5 අවිධිමත් ගෙවීම්

(අ) ලංවිම විසින් උපයන විට ගෙවීම් බදු ගෙවීම

ලංවිම සේවකයන් උපයන විට ගෙවීම් බදු බැරකමට යටත්වන අවස්ථාවේ සිට සේවකයන්ගේ උපයන විට ගෙවීම් බදු බැරකම ලංවිම විසින් දරනු ලැබේ. මෙය විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයට හා වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවට අවස්ථා කිහිපයකදී දන්වා සිටි අතර සාකච්ඡා කිහිපයක් වෘත්තිය සංගම් සමඟ පවත්වන ලදී. කෙසේ වුවද එකඟතාවයක් ඇති නොවීය. කෙසේ වුවද එය දැනට එකඟ වූ පාරිශ්‍රමිකය වෙනස් කිරීම සඳහා සාමූහික ගිවිසුම උල්ලංඝණය කිරීමක් වන අතර තවදුරටත් නීතිමය අතුරු විපාකයක් නිර්මාණය වනු ඇත.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

(ආ) අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව විවිධ සේවක දීමනා 39 ක් ගෙවීම.

වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශයන් පරිදි ලංවිම සේවකයන්ට දීමනා ගෙවීම සඳහා 2008.04.09 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

(ඇ) "විදුලක්පාය" ඉදිකිරීමේ කටයුතු

"විදුලක්පාය" නමැති යෝජිත ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2014 ඔක්තෝබර් 07 දින ගනු ලැබූ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය විසින් නවත්වා නොමැත. මෙම යෝජිත ගොඩනැගිල්ලේ විකල්ප භාවිතා කිරීම් පිළිබඳ හැකියාවන් සොයා බැලීමට අධ්‍යක්ෂ මණ්ඩලය උපදෙස් දී තිබුණි.

රු. 304,574,338.00 ක මුදලකට (වැට් නොමැතිව) උප ව්‍යුහය ඉදිකිරීම සඳහා ප්‍රදානය කරන කොන්ත්‍රාත්තුව නිම කර ඇත.

ප්‍රගතිය අනුව, මුළු මුදල රු. 288,302,712.07 ක් වූ (වැට් සහිතව) අතුරු ගෙවීම් 06 ක් ගෙවන ලදී. ගෙවීම් 06 පිළිබඳව සියලු ලියකියවිලි ව්‍යාපෘති කාර්යාලයෙන් ලබා ගැනීමට හැකි වේ.

ප්‍රායෝගික සම්පූර්ණ කිරීම පිළිබඳ භාර ගැනීම් සහතිකය කොන්ත්‍රාත්කරුට නිකුත් කරන ලදී.

දෝෂ වගකීම් කාලය 2015 පෙබරවාරි 27 සිට ආරම්භ වේ.

4.6 හඳුනානොගත් පාඩු

(අ) 2009 වර්ෂයේ සිට භාවිතා නොකරන ලද ලක් විජය විදුලි බලාගාරයට අයත් ටග් බෝට්ටු දෙකක්, බත්තල් තුනක් සහ එක් ලයින් බෝට්ටුවක්

එක් ටග් බෝට්ටුවක් හා බත්තල් තුනක් විකිණීම සඳහා උත්පාදන අංශය විසින් ක්‍රියාමාර්ග ගෙන තිබුණි. (බත්තල් 3 ක් හා ටග් බෝට්ටු 1 ක් විකිණීම සඳහා ටෙන්ඩරය ක්‍රියාත්මක වේ.) ඉතිරි ටග් බෝට්ටුවෙහි හා ලයින් බෝට්ටුවෙහි තක්සේරු වාර්තා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලංවිමට මෙතෙක් ඉදිරිපත් කර නැත.

(ආ) වාලච්චේන විශාල නඩත්තු ගබඩාවල අස්ථානගත වූ දේපල

අස්ථානගත වූ ජල මෝටරයේ පිරිවැය මණ්ඩලයේ ගාස්තු 25% ක්ද සහිතව අදාළ පුද්ගලයාගේ 2014 ඔක්තෝබර් සිට 2015 මාර්තු දක්වා කාලයට අදාළ වැටුපෙන් දැනටමත් අයකරගෙන ඇත.

(ඇ) කොටුගොඩ බඩු ගබඩාවට ආපසු යවන ලද බාල තත්ත්වයේ ද්‍රව්‍ය

RE 08 ව්‍යාපෘතිය යටතේ ලැබුණු ද්‍රව්‍ය (Tension Insulators) වගකීම් කාලය තුළ දෝෂ සහිත බව සොයා ගැනුණු අතර ව්‍යාපෘතියේ විෂය පථය අනුව කොන්ත්‍රාත්කරු විසින් ඒවා ආදේශ කළ යුතුය. ගැටලු හේතුවෙන් ආපසු යවන ලද එම පරිවාරක (Tension Insulators) කොන්ත්‍රාත්කරු විසින් ආදේශ කිරීම සඳහා දැනටමත් පියවර ගෙන ඇත.

(ඈ) ඩීසල් තොග ඌනතාවය සඳහා හේතු විගණනයට ඉදිරිපත් නොකිරීම

ලක් විජය විදුලි බලාගාරයේ පොළව යට ඇති සම්පයකට (Sump) ලංකා ඛනිජතෙල් සංස්ථාවෙන් මිලදී ගන්නා ලද ඩීසල් බෑම සිදු කරන අතර එය මෙහෙයුම් අංශයේ හා ගබඩාභාරකරුගේ අධීක්ෂණය යටතේ සිදුවේ. මෙම ඩීසල් නල මාර්ග පද්ධතියක් හරහා ඒකක තුනක බොයිලර් තුනකින් හා ආධාරක බොයිලරයක් මගින් පමණක් භාවිතා කෙරේ.

ගලායන මීටරය කියවීම මත පදනම්ව ප්‍රධාන පාලන කාමරයේ ඩීසල් තොග දත්ත හා cardex හි ඩීසල් තොගයේ දත්ත විශ්ලේෂණය කිරීමෙන් පසු 2014 වර්ෂය සඳහා වූ ඌනතාවය වන ලීටර් 236,017 ක වෙනසක් වූ අතර මෙම ඌනතාවය "cardex" හි නිකුත් කිරීම් සටහන් යාවත්කාලීන කර නොතිබූ හෙයින් සිදු වී තිබුණි.

මෙම විශ්ලේෂණය 2010 හා 2013 වර්ෂ සඳහා සිදු කළ අතර නිවැරදි කිරීම් සඳහා කටයුතු සිදු කරනු ලැබේ.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

4.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

(අ) මූල්‍ය හා පරිපාලන කටයුතුවලට අදාළව ඒකාකාරී පරිපාටි හා පරිචයන් පවත්වා ගැනීම සඳහා රජය විසින් වරින්වර නිකුත් කරන ලද චක්‍රලේඛ ලංවිම පරිපාලන රීති වශයෙන් අනුගමනය කිරීමට ලංවිම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර නොතිබීම.

1969 අංක 31 දරන පනතින් සංශෝධනය කරන ලද 1969 අංක 17 දරන පනත මඟින් ස්වකීය ව්‍යවස්ථාවකින් ස්ථාපිත ලංකා විදුලි බල මණ්ඩලය ව්‍යවස්ථාපිත මණ්ඩලයකි.

රාජ්‍ය සංස්ථා හා මණ්ඩලවලට නිකුත් කරන ලද භාණ්ඩාගාර හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ වලින් බොහෝමයක් ප්‍රතිපත්තිමය කරුණක් වශයෙන් ලංවිම විසින් අනුගමනය කරනු ලැබේ. සමහර අවස්ථාවල, අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීම මඟින් ලංවිම කාර්යයන්වලට අදාළ කරුණු පිළිබඳ භාණ්ඩාගාර චක්‍රලේඛ මෙන්ම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති මාර්ගෝපදේශ අදාළ පරිදි ලංවිම විසින් අනුගමනය කරනු ලැබේ.

(i) සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් දීප ව්‍යාප්තව ඉල්ලුම්පත් කැඳවීමෙන් තොරව නුපුහුණු හා අර්ධ පුහුණු සේවකයින් මණ්ඩලය විසින් බඳවා ගනු ලැබීම.

ලංවිම බඳවා ගැනීම් හා උසස්වීම් පටිපාටිය අනුව, විධායක හා මධ්‍යම මට්ටමේ තාක්ෂණික ශ්‍රේණි සඳහා පුරප්පාඩු ප්‍රතිශත පදනමක් මත බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් පිරවීම අවශ්‍ය වේ. ඉංජිනේරුවන්, ගණකාධිකාරීන් ඇතුළු විධායක ශ්‍රේණි හා විදුලි අධිකාරීන් ආදි මධ්‍යම මට්ටමේ තාක්‍ෂණික ශ්‍රේණි සඳහා ජාතික පුවත්පත්වල දැන්වීම් ප්‍රසිද්ධ කිරීම මඟින් බාහිර අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද ලැයිස්තු මඟින් අනිකුත් සියලුම වර්ගයන් සඳහා ඉල්ලුම්පත් ලබාගෙන ලංවිම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී. බඳවාගැනීම් හා උසස්වීම් යෝජනා ක්‍රමයේ සුදුසුකම් සපුරාලන විධායක ශ්‍රේණියේ නොවන සමහර ඉල්ලුම්කරුවන් සඳහා ලංවිම වෙනුවෙන් රජයේ ආයතනයක් විසින් පවත්වන ලද තරග විභාගයක් සඳහා පෙනී සිටීම අවශ්‍ය වේ. තරගකාරී විභාගයෙන් උසස්ම ලකුණු ලබා ගන්නා ලද ඉල්ලුම්කරුවන් තිබෙන පුරප්පාඩු සංඛ්‍යාව පදනම් කරගෙන ඔවුන්ගේ සුදුසුකම් තහවුරු කර ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීමෙන් පසුව තෝරා ගනු ලැබේ. මෙම සම්පූර්ණ බඳවා ගැනීම් ක්‍රියාපටිපාටිය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/90 විසින් හඳුන්වා දෙන ලද නිර්නායකයට ඉතාමත් සමාන වේ.

(ii) මණ්ඩලය ප්‍රබල ද්‍රවශීලතා ගැටලුවලට මුහුණ දී ඇති නමුත්, කිසිදු පාලනයකින් තොරව සියයට 4.2 ක පොලියකට වාහන ණය සහ සේවක ණය ලබා දී තිබීම.

ආයතන සංග්‍රහයේ දක්වා ඇති කරුණු හා කොන්දේසි ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව ලංවිම සේවකයන් සඳහා සහනදායී පොලී රේටයකට වාහන ණය ලබා දී ඇත.

තවද සේවක ණය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද නියමයන් පමණක් පදනම් කරගෙන සේවකයන්ට දෙනු ලැබේ.

(ආ) රක්ෂණ සංචිත අරමුදල් ශේෂය හා රක්ෂණ සංචිත ආයෝජන අරමුදල අතර නිරීක්ෂණය වූ ඌනතාවය මණ්ඩලයේ ස්වයං රක්ෂණ ප්‍රතිපත්තිය අනුව ආයෝජනය කර නොතිබීම.

රක්ෂණ අරමුදලේ ආයෝජනය නොකිරීම හේතුවෙන් රක්ෂණ සංචිත අරමුදල හා රක්ෂණ සංචිත ආයෝජන අරමුදල අතර රු. මිලියන 4,099 ක ඌනතාවයක් විය. පසුගිය වර්ෂ කිහිපය තුළ පැවති අහිතකර ද්‍රවශීලතා තත්ත්වය හා අඛණ්ඩ පාඩු හේතුවෙන් අරමුදල ආයෝජනය කිරීම සිදු නොකළ අතර ද්‍රවශීලතා තත්ත්වය වැඩිදියුණු වීමත් සමඟ අරමුදලේ ආයෝජනය කිරීම මඟින් මෙම පරතරය ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ. එබැවින් මෙය අවිධිමත් මූල්‍ය කළමනාකරණය හේතුවෙන් නොවේ.

(ඇ) ලංකා ඛනිජතෙල් සංස්ථාව හා ලංකා විදුලි (පුද්ගලික) සමාගම සමඟ විකුණුම් හා මිලදී ගැනුම් ගිවිසුම්වලට එළඹ නොතිබීම.

ලංවිම සම්ප්‍රේෂණ අංශය හා ලංකා විදුලි (පුද්ගලික) සමාගම අතර විදුලිබලය මිලදී ගැනුම් ගිවිසුමකට එළඹීමට ආරම්භයක් ගෙන ඇත. කෙසේ වුවද එය ක්‍රියාත්මක වෙමින් පවතින අතර තවමත් අවසානයකට එළඹී නැත.

(ඈ) වාහන ආදේශ කිරීම හා දේශීයව සවි කිරීම සඳහා කටයුතු කිරීම.

ලංවිම විසින් එක් එක් අංශය සඳහා ස්ථාවර වත්කම් ලේඛන පවත්වනු ලැබේ. ලංවිමට අයත් වාහන පිළිබඳව තොරතුරු දේපල, පිරියත හා උපකරණවල මෝටර් වාහන යටතේ ලබා ගත හැක. වාහන කුලියට ලබා ගැනීමේදී හිමිකාරීත්වය ලංවිම සතු නොවේ. එබැවින් කුලියට ගත් වාහන පිළිබඳව තොරතුරු දේපල පිරියත හා උපකරණ ලෙජරයේ සඳහන් නොවේ.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

කෙසේ වුවද කුලියට ගත් වාහන පිළිබඳව තොරතුරු දැන ගැනීමේ කාර්යය සඳහා වෙනම වාර්තා අංශයන් / ශාඛාවන් මගින් පවත්වාගනු ලැබේ.

ඉන්ධන, රියැදුරු වැටුප් හා වෙනත් පිරිවැය ඇතුළත් කුලියට ගත් වාහනවල මුළු පිරිවැය ලංවිම සතු වාහන සංචිතය නඩත්තු කිරීමට වඩා අඩුවේ. එබැවින් අදාළ අංශයේ ප්‍රධානියාගේ අනුමැතිය සහිතව විශේෂයෙන් මගී ප්‍රවාහනය සඳහා වාහන කුලියට ගැනීමේ ප්‍රතිපත්තිමය තීරණය ගෙන ඇත.

(ඉ) ත්‍රිකුණාමලය විදුලිබල සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්ව තුනෙන් එක් සාමාජිකත්වයක් පමණක් මණ්ඩලයට වෙන් කිරීම.

දැන ගැනීම සඳහා

4.8 මානව සම්පත් කළමනාකරණය

(අ) මණ්ඩලයේ බඳවා ගැනීම් පටිපාටිය (SOR) දිගු කාලයක සිට යාවත්කාලීන නොකිරීම.

බඳවා ගැනීම් හා උසස් වීම් යෝජනා ක්‍රමයේ අවසාන සංස්කරණ කමිටුවක් විසින් පිළියෙල කරමින් ඇති අතර යථා කාලයේදී එය අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබේ.

(ආ) 2012 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සේවක සංඛ්‍යාව අභිබවා සේවකයින් 3655 ක් අනු කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන තිබීම. අනු කොන්ත්‍රාත් පදනමින් බඳවා ගන්නා ලද සේවක සංඛ්‍යාව මණ්ඩලයේ මුළු සේවක සංඛ්‍යාවෙන් 20% ක් විය.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදඅනු කොන්ත්‍රාත් පදනම මත අවශ්‍ය සේවක සංඛ්‍යාව 4759 ක් වූ හෙයින් දැනට අනු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් සංඛ්‍යාව ඊට ඉතා අඩු 3655 සංඛ්‍යාවක් විය. (යොමුව: සේවක සැලැස්ම 2012)

(ඇ) අනුමත සේවක සංඛ්‍යාවෙන් පහත සඳහන් තනතුරු 2014 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු වී පැවති අතර එම පුරප්පාඩුවලින් බොහෝමයක් කොන්ත්‍රාත් හා අනු කොන්ත්‍රාත් පදනම මත පුරවා තිබුණි.

| සේවක වර්ගය | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව | කොන්ත්‍රාත්/ මිනිස්බල පදනම මත බඳවා ගැනීම |
|---|---|---|
| විධායක | 367 | 09 |
| මධ්‍යම මට්ටමේ තාක්ෂණික සේවය | 164 | 29 |
| ලිපිකරු හා සමාන්තර සේවක වර්ග | 509 | 1174 |
| කාර්යාල සේවක වර්ගය | 47 | 179 |
| රියදුරු | 28 | 535 |
| පුහුණු තාක්ෂණික සේවය | 647 | 805 |
| අර්ධ - පුහුණු තාක්ෂණික සේවය | 1690 | 213 |
| වෙනත් පුහුණු ශ්‍රේණි | 34 | 8 |
| **එකතුව** | 3486 | 3843 |

2012 වර්ෂයේ අනුමත සේවක සැලැස්ම අනුව, ලංවිම එහි සේවක අවශ්‍යතාවය පහත පරිදි අනු කොන්ත්‍රාත් පදනම පරිදි ලබා ගැනීමට තීරණය කර තිබුණි.

| | |
|---|---|
| ලිපිකරු අවශ්‍යතාවය | 25% |
| නුපුහුණු සේවා අවශ්‍යතාවය | 60% |
| දත්ත ඇතුළත් කිරීමේ ක්‍රියාකරු, රියදුරු, බිල් කරන්නන් හා කාර්යාල සේවක අවශ්‍යතාවය | 50% |
| කා.කා.ස. අවශ්‍යතාවය | 30% |
| යතුරු ලියන්නන්, පාරිභෝගික සේවා උදව්කරුවන්, දුරකථන යන්ත්‍ර ක්‍රියාකරු හා පිළිගැනීමේ නිලධාරී අවශ්‍යතාවය | 100% |

ඒ අනුව, අනු කොන්ත්‍රාත් වර්ගය යටතේ පුද්ගලයින් 4759 ක් සඳහා ප්‍රතිපාදන ඇත. එහෙත් එම වර්ගයේ යොදා ඇති සේවක සංඛ්‍යාව 3843 ක් වන අතර එය හඳුනා ගත් අවශ්‍යතාවයට වඩා අඩුය.

ස්ථිර කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු ප්‍රගමන ආකාරයකින් පුරවනු ලැබේ.

(ඈ) නුපුහුණු ක්ෂේත්‍ර සේවය සඳහා අනුමත සේවක සංඛ්‍යාව 1356 කින් ඉක්මවීම

බඳවා ගැනීම් හා උසස්වීම් යෝජනා ක්‍රමය අනුව, නුපුහුණු සේවකයන් සඳහා නුපුහුණු ක්ෂේත්‍ර සේවය හා අර්ධ පුහුණු, පුහුණු

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

සේවාවන් වලට බඳවා ගැනීම ඔවුන්ගේ උසස් වීම් සඳහා මාවතකි. එබැවින් පුහුණු හා අර්ධ පුහුණු වර්ගවල විශ්‍රාම යාම, ඉල්ලා අස්වීම ආදියේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවන පුරප්පාඩු එම සේවක වර්ගවල වයසින් වැඩි සේවකයන් ඇති හෙයින් ලංවිම මෙහෙයුම් අවශ්‍යතාවය සලකා බලා නුපුහුණු සේවකයන් බඳවා ගැනීම් මගින් පුරවනු ලැබේ. ඒ අනුව 2014 දෙසැම්බර් 31 දිනට ඉහත සේවක වර්ගවලට අනුයුක්ත කාර්ය මණ්ඩලයේ අතිරික්ත සේවක සංඛ්‍යාවක් නොමැත.

(ඉ) උසස් වීම් සඳහා සලකා බලන එකම කරුණ ජ්‍යෙෂ්ඨත්වය වූ අතර අනුප්‍රාප්තික සැලැස්මක් නොවීම.

ලංවිම බඳවා ගැනීම් හා උසස් වීම් පටිපාටියේ සකස් කර ඇති නිර්නායකයන්ට අනුව තනතුරු පුරප්පාඩු ඇති වූ විට උසස් වීම් හා බඳවා ගැනීම් කරනු ලැබේ.

(ඊ) මානව සම්පත් අංශයේ ප්‍රධාන තනතුර

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්) තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් ලංවිම විසින් පැහැදිලිව හඳුනා ගෙන ඒ අනුව තනතුරට පත් කරන ලදී. පවත්නා බඳවා ගැනීම් හා උසස් වීම් යෝජනා ක්‍රමය පූර්ව ඇගයීමක් කර ඇති අතර එය ඉක්මණින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

(උ) මණ්ඩලයේ පිරිස් කළමනාකරණ අංශයේ ප්‍රධාන ඉංජිනේරු තනතුර (මානව සම්පත් ප්‍රතිපත්ති) නම් වූ තනතුර නොගැලපීමක් නිරූපනය කර ඇත.

ප්‍රධාන ඉංජිනේරු (ප්‍රතිපත්ති) තනතුර සඳහා විශේෂයෙන් හඳුනාගත් රාජකාරී විෂය පථයක් ඇත. මෙම තනතුර වෙනම වෘත්තීය තනතුරු දෙකක් අතර සම්බන්ධතාවක් නොවන අතර නොගැලපීමක්ද නොවේ. මෙම ඒකකය හා තනතුර ලංවිම ප්‍රගමන කාර්යයන් සඳහා කොතෙක් දුරට වැදගත්ද හා ප්‍රයෝජනවත්ද යන්න ප්‍රකට කරුණකි.

(ඌ) පවත්නා බඳවා ගැනීම් පරිපාටියට අනුව, මානව සම්පත් නිලධාරී සේවයේ මුළු කාර්ය මණ්ඩලයෙන් 50% ක් බාහිරව පුරවන අතර, මෙම ප්‍රතිශතය වාර්ෂිකව ක්‍රමයෙන් 85% දක්වා වැඩි කිරීමට සැලසුම් කර තිබීම.

පවත්නා බඳවා ගැනීම් හා උසස් වීම් යෝජනා ක්‍රමය පූර්ව ඇගයීමක පවතී.

(එ) මානව සම්පත් කළමනාකරු හා මානව සම්පත් නිලධාරී සෘජුවම බඳවා ගැනීම සඳහා අවශ්‍ය පළපුරුද්ද

පවත්නා බඳවා ගැනීම් හා උසස් වීම් යෝජනා ක්‍රමය පූර්ව ඇගයීමක පවතී.

## 5. යහපාලනය හා ගිණුම්කටයුතු භාවය

### 5.1 අයවැය පාලනය

තථ්‍ය සංඛ්‍යාවල ප්‍රවණතා විශ්ලේෂණයක් යොදා ගැනීමෙන් ඇතිවන ඇස්තමේන්තු සංඛ්‍යා මත වාර්ෂික අයවැය පිළියෙල කරනු ලැබේ. එබැවින් 2014 වර්ෂයේදී අයවැයගත මෙහෙයුම් වියදම සැලකිය යුතු විචලනයක් දක්වා නොතිබුණි.

කෙසේ වුවද, කාලපරිච්ඡේදය තුළදී පාරිසරික හේතූන්, කාර්මික දුෂ්කරතා, තෙවැනි පාර්ශව බැඳීම් ආදී විවිධ කරුණු හේතුවෙන් ප්‍රාග්ධන වියදම් අයවැයට සාපේක්ෂව ප්‍රාග්ධන තථ්‍ය වියදම සැලකිය යුතු විචලනයන් දක්වා තිබුණි.

ලංවිම මූල්‍ය අංශය විසින් වර්ෂයේ අනුමත අයවැය ලේඛනය සමඟ සෑම මසකම තථ්‍ය මෙහෙයුම් ප්‍රතිඵල සසඳා වාර්තාවක් සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබේ.

ඊට අමතරව, ආයතනික කළමනාකරණ කණ්ඩායම (CMT) විසින් කාර්යසාධන සමාලෝචන වාර්තාවක් මඟින් අනුමත අයවැය සමඟ මෙහෙයුම් හා ප්‍රාග්ධන තථ්‍ය වියදම සමාලෝචනය කරනු ලැබේ.

එබැවින් අයවැයෙන් සිදුවන තථ්‍ය ප්‍රතිඵල පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය හා ලංවිම කළමනාකරණය දැනුවත් වන අතර මෙහෙයුම් හා ප්‍රාග්ධන වියදම පිළිබඳ ඉදිරි තීරණ ගැනීමේදී එය සහායක් වේ.

## 6. පද්ධති හා පාලන

දැනගැනීම සඳහා



සභාපති
ලංකා විදුලිබල මණ්ඩලය

Designed & Printing : www.sharpprintexpo.com

**ලංකා විදුලිබල මණ්ඩලය**
ලිපිනය: නො 50, සර් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 2
ඇමතුම්: දුරකථනය: (011) 232 4471 (8 දක්වා) / ෆැක්ස් (011) 244 9572
වෙබ් අඩවිය: **www.ceb.lk**